

# සෝම හාමුදුරුවෝ

## පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි චරිතාපදානය

# සෝම හාමුදුරුවෝ

## පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි චරිතාපදානය

චරිත කතා යනු පුරාතන වීර කාව්‍ය සම්ප්‍රදායන්ටම අයත් වූවක් සේ බොහෝ දෙනා සිතති. ඊට හේතුව නූතනයේ අපට කියැවීමට ලැබෙන චරිත කතා බොහොමයක කතා නායකයාගේ චරිතය නොමඳ අතිශයෝක්තියට, අති ප්‍රමාණික වීරත්වයට නැංවී තිබීමය.

එහෙත්, එකී ගතානුගතික සම්ප්‍රදායන් පැහැදිලි ලෙසම උල්ලංඝනය කෙරෙන මෙම චරිත කතාව මගින් වර්තමාන අර්බුදකාරී සමාජය වෙතට බෞද්ධ සාර ධර්ම පද්ධතිය පිවිසුවීමේ අභියෝගයට මුහුණ දෙන අධිෂ්ඨාන ශක්තියෙන් සහ නොපසුබස්නා වීර්යයෙන් නූතන තරුණ භික්ෂූන් වහන්සේගේ චරිතයක් වඩාත් භාවපාත්මක ලෙසින් එළි දැක්වේ.

මෑත ඉතිහාසයේ මෙරට පහළ වූ ධර්ම විනය පිළිබඳ මනා පරිචයකින් යුතු විචිත්‍රවත් ධර්ම කථිකයාණන්වහන්සේ නමක ලෙස ජනතා සම්භාවනාවට පත් වන පූජ්‍ය ගංගොඩවිල සෝම ස්වාමීන්වහන්සේ ගේ ළමා විය, තුරුණු සමය සහ පැවිදි ජීවිතයේ පළමු දශක දෙක මුල්කොට ලියැවී ඇති මෙම ග්‍රන්ථය මගින් උන්වහන්සේගේ ජීවන චරිතය විවරණය වන අතරේම සමකාලීන බෞද්ධ ජන සමාජය පිළිබඳ හරවත් දැනුම් සම්භාරයක්ද පාඨකයා වෙත ප්‍රදානය කෙරේ.

**තිලක් සේනාසිංහ**
*මාධ්‍යවේදී*

දයාවංශ ජයකොඩි සහ සමාගම

සෝම හාමුදුරුවෝ - පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි චරිතාපදානය

රු. 180/-

# සෝම හාමුදුරුවෝ

## පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි චරිතාපදානය

ඉන්දු පෙරේරා

ප්‍රකාශනය

දයාවංශ ජයකොඩි සහ සමාගම

දයාවංශ ජයකොඩි සහ සමාගම
101 සහ 112, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.
දුරකථනය 2695773 / ෆැක්ස් 2696653

ISBN-955-551-30 -7

මුද්‍රණය :
දයාවංශ ජයකොඩි සහ සමාගම - මුද්‍රණ ශිල්පියෝ
163/4, සිරිධම්ම මාවත, මරදන, කොළඹ 10.
කාර්යාලය 112, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.

හිමියන්ට හැගිණි. එසේම ඒ ස්ථානයෙහි වේ තුඹස්ද ගණනාවක් විය.

'ඔය තුඹස් ටික මැදිවෙන්න වටේට වට කරන්න...' සෝම හිමියෝ තරුණයන්ට උපදෙස් දුන්හ.

'මේ ප්‍රමාණය ලොකු වැඩි නැද්ද හාමුදුරුවනේ?'

'කොච්චර ලොකු වුණත් කමක් නෑ. ඔය මැදි වුණු හරිය ඔක්කෝම හාරන්න.'

තරුණයනට අවශ්‍ය වූයේ සෝම හිමියන්ගේ මග පෙන්වීම පමණි. ඒ අනුව කටයුතු කරන්නට ඔවුහු සූදනමින් සිටියහ.

තද කබොක් පසකින් යුතු එම පොළව හෑරීම පහසු වූයේ නැත. එහෙත් තරුණයන් පසුබැස්සේද නැත. ඔවුන් කොතරම් වෙර වීරිය යොද වැඩ කර තිබුණේද යත් මහන්සිය නිසාම ඔවුන් කිහිප දෙනකුටම එද රාත්‍රියේ උණ ගැනුණහ.

ධර්මායතනයට සම්බන්ධ ඇතැම් ගිහි පිරිස් 'කොහොමත් ඉතින් දැන් පන්සලට ළිඳක් අවශ්‍යයිනෙ. ඒ හින්ද සෝම හාමුදුරුවො ඕක කරගත්තාවෙ' යැයි පවසා තිබුණි. එහෙත් සෝම හිමියන් තාරුණ්‍ය මතින් කුළු ගැන්වෙන දඩබ්බර හිමි නමක් වශයෙන් සළකමින් උන්වහන්සේගේ කටයුතු නොරිස්සූ පිරිස් මේ සම්බන්ධයෙන්ද විවිධ මත පළ කර සිටියහ.

'මොකක්ද දන්නෙ නෑ ඒ පාර කරන්න හදන්නෙ? ඔය විදියට ළිං කපන්න පුළුවන් නම් මොනවා කරන්න බැරිද? ඕවා ඔහොම ආවාට ගියාට කරන ඒවා නෙමෙයි. ඕවයෙත් සාස්තරයක් තියෙනවා.'

මෙසේ පැවසූ අය එතැනින් නතර වූයේ නැත. අම්පිටියේ රාහුල ලොකු හාමුදුරුවන් යළි ධර්මායතනයට වැඩම කළ පසු උන්වහන්සේගේ හිතද සෝම හිමියන් කෙරෙහි බිඳවන අයුරින් විවිධ දේ පවසා තිබිණි.

නමුත් මේ කිසිවකින් හෝ සැලුණේ සෝම හිමියන් නොවේ.

# 10 සෝම හිමියෝ ආරණ්‍යගත වෙති

ධර්මායතනය සඳහා පානීය ජලය ලබාගත් ළිඳේ තාප්පය ළිඳට කඩා වැටීම අවස්ථාවේ හැටියට සිදුවූ මහත් අකරතැබ්බයක් වශයෙන් ඇතැම් ගිහි පිරිස් සැළකූහ. තාප්පය කඩා වැටුණේ එය යළි පිළිසකර කිරීම සම්බන්ධ අනවශ්‍ය දෙයකට අත ගැසීම නිසා බවත් මේ සියල්ල තරුණ සෝම හිමියන්ගේ දඩබ්බර හිතුවක්කාර ගති නිසා සිදුවූ ප්‍රතිඵල බවත් කිහිප දෙනෙක් පුන පුනාම කීහ. තවත් කුඩා ළිඳක් ධර්මායතන භූමියෙහි පැවැතියත් භික්ෂූන් වහන්සේලා විශාල පිරිසකගේ ජල ප්‍රශ්නය විසඳීමට එය ප්‍රමාණවත් වූයේ නැත.

"හාමුදුරුවනේ, මේකට මහන්සි වෙනවට වඩා අලුතෙන් ළිඳක් කපන එකයි වැඩියෙන්ම හොඳ" තුරුණු සවියේ තරුණයෝ සෝම හිමියන් හමුවේ පැවසූහ. එම අදහසෙහි පිළිගත හැකි සත්‍යතාවයක් පවතින බව සෝම හිමියන්ටද වැටහිණි.

"අපි සුදුසු තැනක් බලමු" සෝම හිමියෝ පෙරමුණ ගත්හ.

ළිං කැපීම සම්බන්ධ චිරාගත සම්ප්‍රදයන් රැසක් ඇතත් ඒ උදෙසා කල්යල් බැලීමට මෙය වේලාව නොවේ. ළිඳක් සඳහා සුදුසු තැනක් බැලීමේදී සෝම හිමියන්ට එක් පැත්තකට අතු බර වී ගිය පල බරවූ පිරුණු කොස් ගසක් දැකිය හැකි විය. අතු බරවී ඇති ආකාරයට ඒ අසල පොළවේ වතුර පැවතිය හැකි බව සෝම

අහම්බෙනි. ඒ අනුව වහාම මේ ළිඳ ඉස පානීය ජල ප්‍රශ්නය විසඳ ගැනීම හදිසි අවශ්‍යතාවයක් සේ සෝම හිමියන්ට දැනිණ.

තමාගේ වැඩ කටයුතුවලට විරුද්ධතා දක්වන පිරිස මොනවා කීවත් කළ යුත්ත නොපිරිහෙලා කළ යුතුය. තුරුණු සවියෙහි තරුණයන් පිරිස කැඳවූ සෝම හිමියෝ ළිඳ පිළිසකර කරගැනීමේ අවශ්‍යතාවය ඔවුන් හමුවේ සැළකර සිටියහ.

'අපි අදම පටන් ගන්නම් හාමුදුරුවනේ' තරුණයෝ එක හඬින්ම කියා සිටියහ.

ඒ අනුව පසුදිනම සියලු දෙනා එක්රැස්ව ළිඳ පිරිසිදු කිරීමේ කටයුත්ත ඇරඹූහ. එහෙත් සිදුවූයේ නොසිතූ දෙයකි. මුළුමනින්ම අලුත්වැඩියා කළ යුතු තත්ත්වයෙන් පැවැති ළිඳේ තාප්පය බිඳී ළිඳ ඇතුළටම කඩා වැටිණි.

'සෝම හාමුදුරුවො මහානායක හාමුදුරුවො නැති අතරෙ හිතුවක්කාර වැඩ කරන්න ගිහින් පන්සලේ ළිඳත් ඉවරයි. අපි මේවට නිස්සද්ද වෙලා බලා හිටියොත් තව මොන මොනවා කරයිද දන්නෙ නැහැ' සමිතියේ ඇතැමෙක් ප්‍රසිද්ධියේ එසේ කීය.

වහාම ඉටු කළ යුතු බැවින් ඒ සඳහා මුදල් අනුමත කර දිය යුතුම බවට උන්වහන්සේ අවධාරණය කර සිටියහ. ශාසන සේවක සමිතියේ කිහිප දෙනකු හැරුණු විට සෙස්සන් සෝම හිමියන්ට හිතවත්ය. ඔවුන්ගේ කැපවීම මත පළමුව ඒ සඳහා රුපියල් දහඅට දහසක මුදලක් අනුමත විණි. ඒ අනුව වහ වහා විහාර මන්දිරයෙහි වැඩ කටයුතු ආරම්භ විය.

'සෝම හාමුදුරුවො තමන්ට ඕන ඕන විදිහට සල්ලි පාස් කරවගෙන නැති නාස්ති කරලා අන්තිමට සිවුරත් දලා යයිද දන්නෙ නෑ?' සමිතියේ එක්තරා පුද්ගලයකු තමන්ට එලෙස පවසා ඇති බවක්ද පසුව සෝම හිමියන්ට දැනගන්නට ලැබී තිබිණි. එහෙත් ඒ කිසිවකින් හෝ සැලුණේ සෝම හිමියන් නොවේ. උන්වහන්සේ එම පුවත සිනාමුසුව ඉවසා දරා ගත්හ.

තමන් මේ කරන කටයුතු ශාසනය සම්බන්ධයෙන් මෙන්ම පොදු ජනතාව සම්බන්ධයෙන්ද වන අනුපමේය සේවාවක් බව සෝම හිමියෝ දනිති. එහෙත්, තමන් පැවිදි වූයේ විහාරස්ථානයක් තුළට වී මෙවන් පොදු වැඩ කටයුතු කරමින් හිඳින්නටදැයි සෝම හිමියන්ට වරින් වරම සිතිණි. තම පරම අභිලාෂය පැවිදි වීමට ලත් දුර්ලභ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගනිමින් සංසාරික විමුක්තිය උදාකර ගැනීමටය. ඒ සඳහා ආරණ්‍යගත වීමේ දැඩි අවශ්‍යතාවයක් සෝම හිමියන්ටද දැනී තිබුණේ බොහෝ කලක සිටමය. එහෙත් මහානායක හිමියන් මෙන්ම රාහුල හිමියන්ද මේ වනවිට වෙනත් ශාසනික යුතුකම් සම්භාරයක් පවරා තිබේ. එබැවින් තමා භාරගත් ඒ වගකීම් සියල්ලද අකුරටම ඉටු කළ යුතුය.

ධර්මායතනයෙහි බීම සඳහා ගත් ජලය කිසියම් ප්‍රබල සෞඛ්‍ය තර්ජනයකට මුල්විය හැකි අපවිත්‍ර ඒවා බව මේ අතර සෝම හිමියන්ට අහම්බෙන් දැනගන්නට ලැබිණි. වතුර ලබාගන්නා ළිඳෙහි 'කම්බි පණුවන්' වෙසෙන බවත්, දිනපතා අලුයමින්ම ධර්මායතනයෙහි කැපකාර දායකයකු වූ 'වෙද මහත්තයා' නමින් හඳුන්වන මැදිවිය ඉක්ම වූ උපාසක මහතා ඒ පණුවන් කිසියම් ආධාරකයකින් ඉවත් කරන බවත් සෝම හිමියන් දුටුවේ

සෝම හිමියන්ගේ මේ ක්‍රියාකාරී බව පඤ්ඤසීහ මහනාහිමියෝද මැනවින් හඳුනාගෙන සිටියහ. ඒ වනවිට ධර්මායතනයෙහි නව විහාර මන්දිරයෙහි වැඩ කටයුතු ආරම්භ වී අතරමග නතර වී තිබිණි. විශාල නිරපරාද වියදමක් දරමින් ගොඩනැගීම ආරම්භ කර ඇණහිට තිබූ එම කටයුත්ත නිම කිරීමේ කාර්යය සෝම හිමියන්ට පැවරීමට උන්වහන්සේ කල්පනා කළහ. නොබෝ දිනකින්, එනම් ජුනි විසි එක් වෙනිදට යෙදෙන තම උපන් දිනයද නිමිති කරගනිමින් දුර බැහැර ප්‍රදේශයක වැඩම කොට ටික කලක් භාවනානුයෝගීව විසීමේ අභිලාෂයක් පඤ්ඤසීහ මහනාහිමියන් තුළ පැවතිණි. ඒ අනුව සෝම හිමියන්ට විහාර මන්දිරය සම්බන්ධ සියලු වැඩ කටයුතු බලා කියා ගැනීම පැවරූ මහනාහිමියන්ද භාවනානුයෝගීව වැඩ විසීම අරමුණු කරගනිමින් දුර බැහැර පෙදෙසකට වැඩම කළහ.

වාස්තු විද්‍යාඥයකු ගෙන්වා ගත් සෝම හිමියෝ එම ගොඩනැගිල්ල තැනිය යුතු ආකාරය, බුදු පිළිමය වැඩ සිටවිය යුතු ආකාරය පිළිබඳව තම අදහස ඔහු හමුවේ ඉදිරිපත් කර සිටියහ. ගිහිව සිටි සමයේදී තම ගජ මිතුරු නිමල් රණසිංහ සමග ඔහුගේ පියාගේ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ පොළවල් වෙත නිතර නිතර යමින්ම ඒවා සම්බන්ධව ඇතිකර ගත් වැටහීම මේ අවස්ථාවේදීත් සෝම හිමියන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නට ඇත. වාස්තු විද්‍යාඥයා සෝම හිමියන්ගේ අදහස ඒකමතිකවම අනුමත කළේ උන්වහන්සේ තුළ ඒ සම්බන්ධයෙන් පවත්නා කුසලතාවය පිළිබඳ විස්මය පළ කරමිනි.

නමුත් මේ සඳහා මුදල් ලබාදිය යුත්තේ ධර්මායතනයේ නිල දයක සභාව වන ශාසන සේවක සමිතිය මගිනි. නමුත් සෝම හිමියන්ගේ මෙම ඍජු ක්‍රියා පිළිවෙත් ශාසන සේවක සමිතියේ ඇතැමුන්ගේ දෝෂ දර්ශනයට ලක්ව තිබිණි. ඇතැමුන් හට සෝම හිමියන්ගේ මෙම කාර්යශූරත්වය පෙනුණේ දඩබ්බරකමක් ලෙසිනි. නමුත් සෝම හිමියන් අධෛර්යයට පත්වූයේ නැත. ශාසන සේවක සමිතියේ භාණ්ඩාගාරික මෙන්ම එවකට සිටි සභාපතිවරයාටත් කතා කොට මහානායක හිමියන් තමන්ට පවරා ගිය කර්තව්‍ය

සපයා ගැනීමේ අසීරුවක් පැන නැගුණහොත් ඒ ගැන වෙනමම සොයා බලා අවශ්‍ය පියවර ගැනීමටද උන්වහන්සේ කටයුතු කළහ.

'නායක හාමුදුරුවන්ගෙ කාලෙවත් නැති නීතිනෙ සෝම හාමුදුරුවො දලා තියෙන්නෙ' ඇතැමුන් ඒ ගැන කතා කළේ අප්‍රසාදයෙනි. එහෙත් දහම් පාසල් සිසුන් තුළ තිබිය යුතු සංවර බව සහ විනයානුකුල බව පිළිබඳව සැළකූ සෝම හිමියන් කවුරු කුමක් කීවත් තම මතය බැහැර කළේ නැත. සෝම හිමියන්ගේ මේ තද නීති රීතිද මෙම දහම් පාසලේ සිසුන් තව කිහිප ගුණයකින් වැඩිවීම සඳහා බලපා තිබිණි. කිහිප දෙනකුට නොරිසි වූ එම වැඩ පිළිවෙල විශාල පිරිසකට රුචි විය.

සිසුන් වැඩිවත්ම දහම් පාසලේ ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයද ඊට සාපේක්ෂව අවම විය. එබැවින් කඩිනම් ගොඩනැගිල්ලක අවශ්‍යතාවය දැනිණි. ඒ සම්බන්ධව සොයා කටයුතු කිරීම ප්‍රධානාචාර්යවරයා වශයෙන් සෝම හිමියන්ගේ වගකීමය. මේ අනුව මූලික ප්‍රතිපාදන වශයෙන් දහම් පාසලේ සෑම සිසු සිසුවියකටම ශත විසි පහ බැගින් ගෙන එන ලෙස දැනුම් දීමක් කෙරිණි. ඉන් රුපියල් නවසියයක මුදලක් එකතු කරගැනීමට හැකිවිය. 'රුපියල් නමසීයකින් කොහොමද ගොඩනැගිල්ලක් හදන්නෙ?' යනුවෙන් සිතා සෝම හිමියන් අධෛර්යයට පත්වූයේ නැත.

'අපි කරන්නෙ මේ දරු පිරිස වෙනුවෙන් ඉතාම යහපත් කාර්යයක්. ඒ හින්ද රුපියල් නමසීයෙන් වැඩේ පටන් ගනිමු. ඊට පස්සෙ ඒක දැක්කම කැමැති ඇත්තො අපට ආධාර කරයි' සෝම හිමියෝ පැවසූහ.

යහපත් අරමුණකින් පටන් ගන්නා කිසිදු කාර්යයක් අසාර්ථක වීමට හේතුවක් නැතැයි යනුවෙන් වූ සෝම හිමියන්ගේ විශ්වාසය තහවුරු කරමින් රුපියන් නවසීයෙන් තැනීම ආරම්භ කළ ගොඩනැගිල්ලට ඉන්පසු රුපියල් ලක්ෂ දහයක් දක්වා ආධාර එකතු විණි. ඒ අනුව එය තවත් අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් ලෙස ධර්මායතනයේ ගොඩනැගිලි සංකීර්ණයට එක්විය.

තරුණ ශීල සමාදනය සහ තුරුණු සවිය වැඩ සටහන මෙම ජනප්‍රියත්වයෙහි උල්පත වූවාට සැක නැත. මෙම යුගය වනවිට එහි ප්‍රධානාචාර්ය පදවිය සෝම හිමියන්ට පවරා ආරණ්‍යගත වීමේ අදහසක් රාහුල හිමියන් තුළ ඇති විය. අව්‍යාජ ශ්‍රමණ ප්‍රතිපදාවන්හි පිහිටීම මතින් සිය අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා කලින් කලට එසේ ආරණ්‍යගත වීම රාහුල හිමියන් තුළ කවදත් පැවැති සිරිතකි. පැලෑනේ වජිරඥාන සහ පරපුර කෙරෙන් මෙබඳු ශ්‍රමණ ආකල්ප අදත් නොනැසී පැවතීම සුවිශේෂත්වයක් සේ පෙනෙයි.

අද අපේ රටේ බොහෝවිට දැකිය හැකිවන්නේ බුද්ධ චීවරය උරදරාගෙන මහේශාඛ්‍ය ලෙසින් විරාජමාන වන්නට වෙර දරන බහු භාණ්ඩික භික්ෂු සමාජයකි. අධි සුඛෝපභෝගී බෙන්ස් වර්ගයේ කාරයක් නොමැතිව ගිහියකුගේ දානයකට වැඩීම පවා ප්‍රතික්ෂේප කරන භික්ෂූන් වහන්සේලා අප සමාජයෙහි වෙසෙති. ඒ අතින් බලන කල අදටත් පැලෑනේ සහ පරපුර අතිශයින් ශ්‍රේෂ්ඨය. අදටත් ඒ බොහෝ හිමිවරු පිණ්ඩපාතයෙන්ම යැපෙති. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ ගහෙන් ගහට පියාඹන කුරුල්ලකු මෙන් භික්ෂුව ලිහිල් පැවතුම් ඇත්තකු විය යුතු බවය. එපරිද්දෙන් වජිරාරාම සහ පරපුරද බහුභාණ්ඩික සුඛෝපභෝගී තත්වයෙන් බැහැර වූ ලිහිල් ශ්‍රමණ ප්‍රතිපද ඇත්තෝ වෙති.

මේ අනුව රාහුල හිමිපාණෝ දහම් පාසලේ ප්‍රධානාචාර්ය තනතුර සෝම හිමියන්ට පවරා ආරණ්‍යගත වූහ. ඒ සඳහා උන්වහන්සේ තෝරාගෙන තිබුණේ වර්තමානයේද දුෂ්කර පෙදෙසක් සේ ගැනෙන අම්පාර දිස්ත්‍රික්කයට අයත් මහඔය පිහිටි වෙහෙරගල ආරණ්‍යයයි.

සෝම හිමියෝ කවදත් විනය නීති තදින්ම ගරු කළහ. එනිසාම දහම් පාසලේ සිසු සිසුවියනට සුදු ජාතික ඇඳුම සහ සුදු ළමා සාරිය අනිවාර්ය කෙරිණි. එක දරුවකුට මේ වර්ගයකින් එක ඇඳුමක් තිබුණත් සෑහේ. එනිසා එවැන්නක් සකස් කරගැනීම බොහෝවිටම අසීරු කටයුත්තක් විය නොහැක. නමුත් යම් සිසුවකුට හෝ සිසුවියකට පවුලේ මුදල් ප්‍රශ්නයක් මත එවැන්නක්

# 9 සෝම හාමුදුරුවන් ගැන දයක කසුකුසු

මහරගම සිරි වජිරඤාන ධර්මායතනය මුල්කොට මේ වනවිට ඇතිවී තිබූ ශාසනික පුනර්ජීවනය මතින් එහි වජිරඤාන දහම් පාසලද අතිශය දියුණු තත්ත්වයකට පත්ව තිබිණි. එවකට මෙහි ප්‍රධානාචාර්ය ධුරය දැරුවේ අම්පිටියේ රාහුල නාහිමිපාණන්ය.

මහරගම සිරි වජිරඤාන ධර්මායතනයේ භික්ෂු අභ්‍යාස මධ්‍යස්ථානය ආරම්භ කිරීම සඳහා පුරෝගාමී වූයේද රාහුල නාහිමිපාණන්ය. ශීලවෘද්ධ, ගුණවෘද්ධ භික්ෂු පරපුරක් බිහිකිරීමේ පරමාර්ථයෙන් පැලැනේ වජිරඤාන මාහිමිපාණන්ගේ අනුශාසකත්වයෙන් මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන්ද සමග එක්වී මෙම භික්ෂු අභ්‍යාස ආයතනය රාහුල හිමිපාණන්ගේ පුරෝගාමීත්වයෙන් ඇරඹෙන ලදුව පසුව එහි රිවි දින දහම් පාසලක්ද අරඹන ලදී.

ඒ හැත්තෑව දශකයේ අග භාගයය. තරුණ සෝම හිමියන් ඉතා කැපවීමෙන් යුතුව දහම් පාසලේ ඉගැන්වීම් කටයුතුවලද නියැලුණි. එවකට මෙය කෙතරම් ජනප්‍රිය තත්ත්වයකට පත්වූයේදැයි කිවහොත් දහම් පාසලට සිසුන් බඳවා ගැනීමේදී අගනුවර ජනප්‍රිය පාසල්වලට මෙන් නියමිත ඇබෑර්තු සංඛ්‍යාවට වඩා කිහිප ගුණයකින් වැඩි ඉල්ලුම් පත්‍ර ප්‍රමාණයක් වසරක් පාසා ලැබෙමින් තිබිණි. සෝම හිමියන් විසින් මෙහෙයවනු ලැබූ ධර්මායතනයේ

කසාද බඳින තත්ත්වයටම සම්බන්ධකම් වැඩි දියුණු කරගෙන කියලා. ගිහියන්ට ආවාහ විවාහ කටයුතු කරගන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ කොතැනකවත් දේශනා කරලා නෑ. අනික විහාරස්ථානයකට ඇවිත් එහි වැඩ කටයුතුවලට දයක වෙන ශීල සමාදනයට සම්බන්ධ වෙන තරුණ තරුණියෝ කියන්නෙ හික්මුණු පිරිසක්. ඔවුන් සුචරිතයෙ පිහිටලා ඉන්න අය. මහපාරේ තැන් තැන්වල රස්තියාදු ගහමින්, වැඩකට නැති පුහු විනෝද කටයුතුවල යෙදෙමින් ඉන්න තරුණ තරුණියන්ගෙ විවාහයකට වඩා මේ විදිහට ගුණ දහමින් හික්මුණු දෙන්නෙකුගෙ විවාහයක් සාර්ථකයි. ඔවුන්ට හොඳ යහපත් දරුවොත් ලැබේවි. ඒ නිසා තරුණයෙක් තරුණියක් කතා කරනවා දැක්ක පමණින් ඒ ගැන අගතිගාමී විදිහට හිතන්න පුරුදු වෙන්න එපා. හැමදෙයක් දිහාම මැදිහත්ව බලන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ.

සෝම හිමියෝ අභීතව ප්‍රකාශ කළමුත් ඇතැමෙක් මේ ප්‍රකාශය මුල් කොට උන්වහන්සේ සමග නොමනාප වූහ.

එල ඇති රැකටය' යනුවෙන් පිරුලක් පවතී. සෝම හිමියන් දක්ෂය, ක්‍රියාශීලීය. එබැවින් උන්වහන්සේගේ කටයුතු දෙස දැස් යොමා බලා සිටි පිරිසද වැඩිය. ඕනෑම කෙනකු කරන කුමන කටයුත්තකදී වුවද යහපත දකින පිරිසක් මෙන්ම අයහපත දකින පිරිසක්ද සිටීම ස්වාභාවිකය. එනිසාම ශාසනික, ජාතික වශයෙන් වන වැඩ කටයුතුවලට යොමුවිය යුත්තේ මල් මෙන්ම ගල් මුල්ද අපේක්ෂාවෙනි. නාහිමිවරුන් දෙපළ සෝම හිමියන්ට මේ කරුණු සැළකර සිටියේ මෙම තරුණ හිමිනම [illegible] යුතුවය. 'සමාජයෙන් එන ගල් මුල් පහරවල් ඉවසන්න බැරි නම් සෝම ඔය වැඩවලින් අයින් වෙන්න' රාහුල නාහිමියන්ගේ ඒ අවවාදය සෝම හිමියන්ට මතකය. දයක දයිකාවන්ගේ රැස්වීමක් උන්වහන්සේ අපේක්ෂා කළේ මෙම තත්ත්වය සියල්ලන්ටම ප්‍රසිද්ධියේ වටහා දෙනු පිණිසය.

'මෙතැන තරුණ තරුණියන් එක්රැස් වෙනවා. ඔවුන් තැන් තැන්වල එකතු වෙලා කතාබහ කරනවා. ඒ සේරම ඇත්තයි. නමුත් ඔවුන් රැස්වෙන්නෙ මේ ස්ථානය ඔවුන්ගෙ තරුණ හැඟීම් පුබුදුවන තැනක් වශයෙන් සළකාගෙන නොවෙයි. බෞද්ධ සදචාර මාර්ගය පිළිගැනීම පිළිබඳ උතුම් අරමුණක් මුල් කරගෙන. මෙතැනට එන තරුණ තරුණියන් වැඩි පිරිසක් ගුණ නුවණින් හික්මුණු අය. එහෙම නැති අයත් යම් ප්‍රමාණයක් ඉන්න පුළුවන්. මම නැහැ කියන්නෙ නැහැ. ඒක සමාජයේ ඕනෑම තැනක පවතින පොදු දෙයක්. නමුත් ඔය කිසිම කෙනෙක් මේ ස්ථානය මුල් කරගෙන තමන්ගේ සුචරිතය කෙළෙසෙන ආකාරයට, විනය විරෝධී ආකාරයට හැසිරෙන එකක් නැහැ' සෝම හිමියෝ කීහ.

මේ තරුණ තරුණියන් කොතෙක් සමීපව කටයුතු කරන්නේද යත් ඔවුන්ගෙන් ඇතැමෙක් දැන් ආවාහ විවාහ වන තත්ත්වයටම ඒ සම්බන්ධකම් වැඩි දියුණු වී ඇති බවටද සමහර වැඩිහිටියන් චෝදනා කරන බව සෝම හිමියන්ට දැනගන්නට ලැබී තිබිණි. ඒ පිළිබඳවත් යම් පැහැදිලි කිරීමක් කරන්නට උන්වහන්සේ මෙය අවස්ථාවක් කරගත්හ.

'සමහරු චෝදනා කරනවා මේ තරුණ තරුණියෝ දැන්

ආකර්ශනයට ලොල් වූ පිරිසකුත් ඊට එකතු වූහ. ඔවුන් මෙහි ක්‍රියාකාරි පුද්ගලයන් වශයෙන් කටයුතු කළද ප්‍රතිපත්ති රැකීම පිණිස ඔවුන් එතරම් උනන්දු වූයේ නැත. මේ වනවිට මහරගම සිරි වජිරඤාන ධර්මායතනයේ තුරුණු සවිය බෞද්ධ සංවිධානය කෙතරම් ජනකාන්ත තත්ත්වයකට පත්වූයේද යත් එය රට පුරා විශාල පිළිගැනීමක් ඇති සංවිධානයක් බවට පත්ව තිබිණි.

අලුතින් එක්වෙන තරුණ පිරිස්වලින් ඇතැමකු තරුණ ශීල සමාදනයට සම්බන්ධ නොවූවත් තුරුණු සවිය වටා රැස්ව සිටින බව සෝම හිමියන්ට පැහැදිලි විය. නමුත් ප්‍රතිපත්ති ගරුක නොවී සුචරිතය මුල්කරගත් සංකල්ප සමාජයට ගෙනයාම කළ නොහැකිය. ඒ බව වටහා ගත් සෝම හිමියෝ තුරුණු සවියට සම්බන්ධ සියලු දෙනාම තරුණ ශීල සමාදනයටත් සහභාගි විය යුතු බව දන්වා සිටියහ. 'මිනිහා නොහදා රට හදන්න බැහැ' යන්න මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන්ගේ මුවගෙහිද නිතර රැව්දෙන ප්‍රබුද්ධ පාඨයකි.

තුරුණු සවිය සහ තරුණ ශීල සමාදනයෙහි ගමන් මග පිළිබඳව ධර්මායතනයට සම්බන්ධ බොහෝ දෙනකුගේ අවධානය යොමුව තිබිණි.

මින් ඇතැමකුට විශේෂයෙන් වැඩිහිටියන්ට සිදුවන ශාසනික මෙහෙය පිළිබඳව සැබෑ වැටහීමක් නොතිබෙන්නට පුළුවන.

තරුණ තරුණියන් පිරිස් වශයෙන් එකට එකතු වී විහාර භූමියෙහි තැනින් තැන සංවාදශීලීව පසුවන විට එය ස්ථානයට නොගැළපෙන්නක් බව සළකමින් කතා කළ වැඩිහිටියන්ද කිහිප දෙනෙක් වූහ. ඒ අනුව 'තුරුණු සවිය' යනු තරුණ තරුණියන්ට රිසි සේ එකතු වන්නට ඉඩ සළසා ගත් යොවුන් සංවිධානයක් වශයෙන් හඳුන්වන්නටද ඇතැමෙක් පෙළඹුණහ. ඒ නිසාම මේ පිළිබඳව පඤ්ඤාසීහ මහ නාහිමියන්ට සේම රාහුල නාහිමියන්ට පැමිණිලි ඉදිරිපත් වූ අවස්ථා කිහිපයක් විණි.

එහෙත්, මෙම නාහිමිවරුන් දෙපළට තරුණ සෝම හිමියන්ගේ අදිටන පිළිබඳ ගැටළු පැනනැගී තිබුණේ නැත. 'ගල් මුල් වදින්නේ

බෞද්ධයන් හට අතිශයින් අරුත් බර අත්දැකීමක් විණි.

සතිපතා විවිධ ස්ථානවල සංවිධානය වූ මෙම සංවාදශීලී ධර්ම දේශනා මාලාව ජනප්‍රිය වූයේ නොසිතූ අන්දමිනි. එම නිසාම දවසින් දවසම ඒ වටා එක්රොක් වන තරුණ පිරිසද වැඩි විය. ඔවුන් ඒ තාක් වටහාගෙන සිටි තෙරුවන් වැඳීම, පන්සිල් ගැනීම, මල් පහන් පිදීම, දෙවියන්ට පින් දීම ආදී වශයෙන් වන අංග කිහිපයකට සීමා වූ බුද්ධාගම තුළ ඊට වඩා බෙහෙවින් ගැඹුරු දර්ශනයක් ගැබ්ව ඇති බව වටහා ගැනීමට ඔවුන්ට හැකිවිය. එමෙන්ම බුදු දහමින් අනුමත කෙරෙන සාරධර්ම ඇසුරින් තමන්ගේ දිවි පෙවෙත්වලට මෙතරම් යහපතක් උදාකරගත හැකි බව ඔවුන් වටහා ගත්තේද සෝම හිමියන්ගේ වාරිකා ධර්ම දේශනා තුළිනි.

සෝම හිමියන් වටා තරුණ පිරිස් දහස් ගණනින් එක් රොක් වූහ. ඔවුහු කෙතෙක් බෞද්ධ සදචාර මාර්ග වෙත යොමුවී සිටියේදැයි කිවහොත් තමන්ගේ නිවසේ උපන් දිනයක් වැනි අවස්ථාවකදී සාම්ප්‍රදායික සම්භාෂණය වෙනුවට ධර්ම සම්භාෂණයක් පැවැත්වීමට පවා පෙළඹුණහ. සම්භාෂණය යනු යහපත් ආකාරයේ සන්නිවේදන ක්‍රියාවලිය. එසේනම් අන් සියලු සම්භාෂණයන්ට වඩා හොඳම සම්භාෂණය වන්නේ ධර්ම සම්භාෂණයය. මේ අනුව ඉන් පෙර වසරවල පැවැත්වූ පස් පවින් ආකුල වූ, මත්පැන් ප්‍රමුඛ අනිකුත් අකුසල කර්මවලට හේතුවන කරුණුවලින් පිරුණු සාද වෙනුවට සදහම් සිසිලෙන් නැහැවුණු උතුම් සම්භාෂණ පවත්වන්නට තරම් මේ තරුණ පිරිස ගුණ දහමින් පෝෂණය වී සිටියහ. වෙනද උපන් දින සම්භාෂණවලදී මත්පැනින් සිහිය විකල් කරගෙන මානසිකවත්, කායිකවත් දුබලව සම්භාෂණය අවසානයේ පිටත්ව ගිය ඔවුන් මෙද ධර්ම සම්භාෂණය අවසානයේ පිටත්ව ගියේ පිරිසිදු නිරවුල් මානසික ශක්තියකින් යුතුව ප්‍රඥාවද පුබුදුවා ගත් වටිනා අත්දැකීම් සම්භාරයක් එකතු කරගත් පිරිසක් ලෙසිනි.

මෙම වැඩ සටහන සාර්ථක වනවිට ප්‍රතිපත්ති ගරු කරන, පිළිපදින පිරිස් මෙන්ම මෙම වැඩ පිළිවෙලෙහි ජනප්‍රියත්වයට,

ආරම්භ කළහ.

මෙහිදී අපූර්වත්වයක් විණි. එය විහාරස්ථානයෙන් විහාරස්ථානයට ගොස් කරන ලද ධර්ම දේශනා මාලාවක් නොවේ. තෝරාගත් නිශ්චිත ස්ථානයක පවත්වනු ලැබූ ධර්ම දේශනාවකි. එය බොහෝ විට සෙවණ සහිත එළිමහන් ස්ථානයක් විය. ඒවා සංවිධානය කළේ තුරුණු සවියෙහි සාමාජික සාමාජිකාවන්ව සිටි තරුණ පිරිස්ය. අසළ නිවසකින් ඉල්ලා ගත් අසුනක සුදු පිරුවටයක් එලා ධර්මාසනය සකස් කරනු ලබයි. ඒ සෝම හිමියන් සඳහාය. ධර්ම දේශනාව විසුරුවා හරිනු ලබන්නේ 'මෙගාෆෝන්' යනුවෙන් හැඳින්වෙන බැටරි බලයෙන් ක්‍රියා කරනු ලබන කරේ ඵල්ලාගෙන යා හැකි කුඩා ජංගම ශබ්දවාහිනී යන්ත්‍රයකිනි. සුළු පිරිස් ඇමතීම පිණිස මෙම උපකරණ ඉන්දියාව ආදී රටවල බහුලව යොදා ගනිති.

මෙම ධර්ම දේශනා ශ්‍රවණය කරන්නට පැමිණි පිරිස අතර සිටි සියලු දෙනාම ධර්ම ශ්‍රවණාභිලාශීන් නොවේ. වැඩි දෙනකු පැමිණියේ මේ අලුත් තාලේ වැඩේ කුමක්ද යන්න දැන ගැනීමට තිබූ කුතුහලයටය.

මෙය බණක මුවාවෙන් ජනතාව හමුවට එන විප්ලවීය තරුණ බලයක් සේ ඇතැමකුට හැඟෙන්නට ඇත. ඒ අනුව සෝම හිමියන් වටා තරුණ පිරිස මෙන්ම වැඩිහිටි පිරිසද රොක් වූහ.

මෙම චාරිකා ධර්ම දේශනා සඳහා සෝම හිමියන් මාතෘකා වශයෙන් තබා ගත්තේද 'සැබෑ බෞද්ධයා යනු කවුද? බෞද්ධ ප්‍රතිපත්ති පිටු දැකීම, මල් පහන් පිදීමෙන් පමණක් බෞද්ධකම රැකගත හැකිද? දෙවියන් යැදීමෙන් මෙලොව යහපත උදාකරගත හැකිද?' වැනි බෞද්ධයාට එදිනෙදා ජීවිතය තුළ අතිශයින් වැදගත් වන සරල දහම් කරුණුය. මෙම ධර්ම දේශනා අවසානයේ පැමිණ සිටි පිරිසට ප්‍රශ්න ඇසීමේ අවස්ථාවද සලසා තිබිණි. ඒ අනුව දහම් කරුණු සම්බන්ධයෙන් පැන නැගෙන සෑම ගැටළුවක්ම නිරාකරණය කරදීමද ඒ අවස්ථාවේදීම සිදුවිය.

මෙය සාම්ප්‍රදායික ධර්ම දේශනා රටාවකට හුරුවී සිටි

# 8

# ගස් සෙවනේ සිට මෙගෆෝනයෙන් දහම් දෙසයි

හැත්තෑ හයේ අවුරුද්දේ වෙසක් මාසයේ එළැඹි දිනයක සෝම සාමණේර හිමියෝ මහරගම සිරි වජිරඥාන ධර්මායතන උපෝසථාගාරයේදී අධිශීල ශික්ෂාවට, එනම් උපසම්පදාවට පත්වූහ. ඒ සෝම හිමියන් පැවිදි බිමට එළඹ දෙවසරකට පසුවය. ඒ වනවිට උන්වහන්සේගේ වයස අවුරුදු විසි අටක් විය.

මේ වනවිට සෝම හිමියෝ ධර්මායතනය තුළ ඉතාමත් කිර්තියට පත්ව සිටි භික්ෂූන් වහන්සේ නමක් වූහ. මේ කීර්තියට වෙසෙසින් මුල් වූයේ උන්වහන්සේ විසින් මහත් උනන්දුවෙන් කරගෙන ආ තරුණ ශීල සමාදනය සහ තුරුණු සවිය ක්‍රියාකාරී තරුණ සංවිධානයයි. බුදු දහම යනු විහාරාරාමවලට සම්බන්ධ කටයුතු, තෙරුවන් වැදීම, මල් පහන් පිදීම වැනි ක්‍රියාකාරකම් මුල් කොට ගත් අභිවාරවිධි පක්ෂය පමණක් වශයෙන් දුටු බොහෝ තරුණ පිරිස් එහි හරය සත්‍ය වශයෙන්ම වටහා ගත්තේ මෙම තරුණ ශීල සමාදනය සහ තුරුණු සවියට සම්බන්ධ වීමෙන් පසුවය.

මේ අනුව ජීවිතය සතර අගතියෙන් කෙලෙසෙන අතරේ නාමික බෞද්ධයන් වශයෙන් සමාජයේ පෙනී සිටීමෙන් බෞද්ධ සදචාර මාර්ගයට පිවිසිය නොහැකි බව වටහා දුන් සෝම හිමියෝ එම තරුණ පිරිසේද උනන්දුව මතින් වාරිකා ධර්ම දේශනා පැවැත්වීම

බෞද්ධ සදාචාර මාර්ගයට යොමු කළ හැකි බව සෝම හිමියෝ දැන සිටියහ. ඒ අනුව නිවහල් ලෙසින් බෞද්ධ සදචාර මාර්ගය දැක්වීම මතින් තරුණ අසහනය පිටු දැකීමේ මෙම සංකල්පය අතිශයින් ප්‍රායෝගික විය.

තිස් පස් දෙනකුගෙන් පමණ සමන්විතව ආරම්භ වූ මහරගම සිරි වජිරඥාන ධර්මායතනයේ තරුණ ශීල සමාදනය ඉතාම කෙටි කලකින් ඉමහත් ජනප්‍රියතාවයකට පත්වන ලකුණු පළ කරන්නට විණි. තරුණ ශීල සමාදන වැඩ සටහනෙහි වූ මෙම නව මුහුණුවරට අනුව නවීන විද්‍යාත්මක චින්තනය සහ බුදු දහම පිළිබඳව සමාජයේ පිළිගැනීමට ලක්වූ විද්වතුන් ගෙන්වා දේශනා පැවැත්වීමද සිදු කෙරිණි. මෙම දේශනා පැවැත්වූ අය අතරින් කැපී පෙනුණු අයකු වූයේ එවකට තරුණ වියේ සිටි මනෝ වෛද්‍යවරයකු වූ දොස්තර ඩී. වී. ජේ. හරිශ්චන්ද්‍රය.

ඒ ඇතුළු තවත් ගිහි පැවිදි විද්වතුන් විශාල පිරිසක් මේ තරුණ ශීල සමාදනයේ දේශනා සඳහා වරින් වර කැඳවා තිබිණි.

තරුණ සෝම සාමනේර හිමියන්ගේ නායකත්වයෙන් ඇරඹී ක්‍රියාත්මක වූ මෙම තරුණ ශීල සමාදනය කොතරම් එකල ප්‍රචලිත වූයේද යත් එය කෙටි කලක් තුළ රට පුරාම ප්‍රසිද්ධ වන තත්ත්වයට පත්විණි. තිස් පස් දෙනකුගෙන් ආරම්භ වූ මෙම ශීල වැඩ සටහනට වසරක් ඉක්මවන විට තරුණ තරුණියෝ දහස් ගණනින් එක් වූහ.

ඒ අනුව බෞද්ධ සාරධර්ම මතින් තරුණ පෙළ මුල් කොට ගත් අධ්‍යාත්මික විප්ලවයක් අරමුණු කරගත් මහරගම සිරි වජිරඥාන ධර්මායතනයේ තරුණ ශීල සමාදන වැඩ සටහන කාගේත් මුවග රැව් දෙන මාතෘකාවක් බවට පත්විණි. සැබැවින්ම එහි සාර්ථකත්වය පිළිබඳ ප්‍රබලතම ක්‍රියාකාරී භූමිකාව වූයේ සෝම සාමනේර හිමියෝය.

යහපත් ප්‍රවණතාවක්. කාලීන ප්‍රවණතාවක්. තරුණ ශීල සමාදනය තුළින් ජනතාව අතරට ගොස් නියම බුදු දහම පතුරුවාලිය හැකි නම් එයම ජනතාවට සදචාර මාර්ගයක් පෙන්වා දීමෙහිලා මහඟු පිටිවහලක් වනු ඇත.

තරුණ පිරිස දෙස හොඳින් බැලූ සෝම හිමියෝ,

'ඔව්, අපි පන්සලේම ඉන්න ඕනෙ නෑ. අපි මේ කටයුත්තට මහමගට බහින්න ඕනෙ. තුන්මං හන්දි, බස් නැවතුම් පොළ, වෙළෙඳ පොළවල් වගේ ජනතාව රැස්වෙන තැන්වල අපි මේ වැඩ පිළිවෙල ක්‍රියාවට නංවන්න ඕනෙ' යි පැවසූහ.

එය ඇසූ තරුණයන්ගේ සිත් තුළ ඇතිවූයේ මහත් පිබිදීමකි. චාරිකා ධර්ම දේශන පැවැත්වීමේ අදහස සෝම හිමියන් තුළ මුලින්ම පැන නැගුණේ ඒ අයුරිනි. මෙම වැඩ සටහන චාරිකා ධර්ම දේශන වශයෙන් නම් කළද මෙය සාම්ප්‍රදායක ධර්ම දේශනා මාලාවක් වශයෙන් පැවැත්වීමේ අදහස සෝම හිමියෝ බැහැර කළහ. ආදියේ සිටම පැවතෙන්නේ භික්ෂූන් වහන්සේ ධර්ම දේශනා පවත්වන අතරතුරදී 'සාධු' කීමත්, 'එහෙමයි හාමුදුරුවනේ' කීමත් පමණි. නූතන සමාජයට ගැලපෙන අන්දමින් මේ සාම්ප්‍රදයික ක්‍රමය බැහැර කරන්නට සෝම හිමියන්ට අවශ්‍යව තිබිණි. එනිසාම ධර්ම දේශනා අතරතුරදී 'එහෙමයි හාමුදුරුවනේ' ආදී වශයෙන් ගැටළු සහගත තැන්වලදී ගැටළු විමසන්නටත්, බණ අසන්නවුන් හට අවස්ථාවක් සලසා දීම සෝම හිමියන්ගේ අභිලාෂය විය. බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනා ස්වරූපයද ඊට අනුරූප බව සූත්‍ර පිටකය ඇසුරින් උන්වහන්සේ වටහා ගෙන තිබිණි. මෙම සංවාදශීලී ධර්ම සාකච්ඡා ශීල සමාදන වැඩ සටහනේ එක් අංගයක් වශයෙන් ඇතුළත් විය. ශීලයෙන් ප්‍රඥවත්, ප්‍රඥවෙන් ශීලයත් පිරිසිදු වන බව බුදු දහමෙහි ඉගැන්වෙන බැවින් ශීල සමාදනය කෙරෙහි ප්‍රමුඛත්වයක් දෙනු ලැබිණ. එහිදී බුදු දහම පිළිබඳව ඕනෑම ගැටළුවක් නොබියව, සිතට එකඟව විමසීමේ නිදහස සෝම හිමියන් එම තරුණයන් හට ලබාදී තිබිණි.

තරුණ පිරිස වෙතින් නැගෙන අනේක විධ ප්‍රශ්නවලට ධර්මානුකූල විසඳුම් ලබාදීම තුළින් බුදු දහමේ හරය වටහා දී

'ස්වාමීන් වහන්ස, අද රටේ එක කොටසක් අයථා ක්‍රමවලින් මුදල් උපයමින් සුඛෝපභෝගී ජීවිත ගත කරනවා. තවත් අතිවිශාල පිරිසක් පෝලිමේ ගිහින්වත් එද වේලට පාන් කෑල්ලක්වත් සපයා ගන්න බැරුව දුක් විඳිනවා. ඒ නිසා අයථා ක්‍රමයට යස ඉසුරු ගොඩ ගසාගෙන ඉන්න අයගෙ ඒ සැප සම්පත්වලින් කොටසක් දිළින්දන්ට බෙදා දෙන්න අපට බැරිද? අපි මේ වෙනුවෙන් විප්ලවයක් කළ යුතුයි.'

තරුණයාගේ වදන්වල මෙන්ම මුහුණේ ඉරියව් තුළින්ද දිස්වූ ආවේගශීලී බව සෝම හිමියෝ හඳුනා ගත්හ. එසේම මෙය තවත් තරුණයන් කිහිප දෙනකුගේ එකඟත්වයෙන් පළවන අදහසක් බවද උන්වහන්සේට වැටහිණ.

'කෙනකුගේ දෙයක් උදුරාගෙන තවත් කෙනකුට දෙන්න බුදු දහමේ ඉඩක් නෑ. නමුත් මේ පවතින සමාජයේ යථා ස්වභාවය එටහා දීමෙන් විචාර බුද්ධියෙන් යුතු ජන සමාජයක් බිහි කරන්න අපිට පුළුවන්. අර විදිහෙ විප්ලවයකින් සිද්ධ වෙන්නෙ විශාල ලේ වැගිරීමක්. අපි විප්ලවයක් කරමු. ඒත් මේක චින්තන විප්ලවයක්. එහෙම නැත්නම් අධ්‍යාත්මික විප්ලවයක්. ඒ වගේම මතක තියාගන්න බුද්ධිමය විප්ලවයකින් උදාවෙන ජයග්‍රහණය තමයි අපිට ලබන්න පුළුවන් උතුම්ම ජය.'

සෝම හිමියන්ගේ ඒ අදහස තරුණ මනස්වලට වඩාත් හොඳින් කා වැදුණි. සාම්ප්‍රදායික ක්‍රමයට වඩා මුළුමනින්ම පරිබාහිර වූ මෙය තරුණයන්ගේ ක්‍රියාත්මක බවත්, විප්ලවීය ස්වභාවයත් බැහැර නොකර ඒ ශක්ති ප්‍රවාහයන්ට ධර්මානුකූල මුහුණුවරක් දීමකි.

'හාමුදුරුවනේ, මේ පන්සල ඇතුළෙ ඉඳන් බණ කිව්වට බණ අහන්න එන්නෙ බොහොම සීමිත පිරිසක් විතරයි. එතකොට අපේ අධ්‍යාත්මික විප්ලව සංකල්පය පොදු ජනතාව අතරට සන්නිවේදනය වෙන්නෙ නෑ. ඒ නිසා අපි මේකටත් උපාය මාර්ගයක් යොදන්න ඕනෑ.'

තරුණයා යළිත් වරක් පැවසීය. ඔහුගේ ආකල්පය ඉතාම

හිස ඔසවමින් පැවැතියේය. ජීවන වියදම අසීමාන්තික ලෙස ඉහළ ගිය අතර අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, රෙදි පිළි පවා හිඟවී ගියේය. 'පැහැබර හෙට දිනක් උදෙසා වර්තමානය කැප කරමු' යන සංවර්ධන සැළසුම් මත මෙවැනි තත්ත්වයක් රටට උදවූ බව පැවසුවද එය සැබෑ නොවන සිහිනයක් බව සාමාන්‍ය ජනතාව දැන ගත්හ.

මේ තත්ත්වය මත නැවතත් ජනතාව තුළ බුදු දහමින් අනුමත කෙරෙන අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම තුළින් පවතින වාතාවරණයට විසඳුමක් ලබාදීමත්, සන්නද්ධ නොවී ගුණ නුවණින් පැසුණු අනාගත පරපුරක් බිහිකිරීම මතින් ඔවුන් ජාතියේ නායකත්වයට ගැළපෙන පිරිසක් බවට පත්කිරීමත් පඤ්ඤාසීහ නාහිමියන්ගේ අභිප්‍රාය විණි.

මේ අනුව යළි තුරුණු සවිය ආරම්භ කිරීම සේම එවකටත් ධර්මායතනයේ පැවැති බාල සහ වැඩිහිටි ශීල සමාදනය අතරට තරුණ ශීල සමාදනයක් තරුණ පිරිස උදෙසා ඇති කිරීමත් උන්වහන්සේගේ බලාපොරොත්තුව විණි. මේ සඳහා පුරෝගාමීව කටයුතු කළ හැකි හොඳම භික්ෂූන් වහන්සේ හැටියට මහ නාහිමියන් දුටුවේ එවකටත් ධර්මායතනය තුළ කීර්තිමත් තත්ත්වයකට පත්ව හුන් සෝම සාමනේර හිමියන්වය. සෝම හිමියන්ගේ ශික්ෂාකාමීත්වය මෙන්ම ක්‍රියාකාරීත්වයද එවන් මෙහෙවරකට බෙහෙවින් යෝග්‍ය බව රාහුල නාහිමියන්ගේද වැටහීම විය.

මේ අයුරින් 1975 ඇසල පුර පසළොස්වක පෝ දින තරුණ ශීල සමාදනය ඇරඹුණු අතර ආරම්භක අවස්ථාවේ තිස්පහක පමණ තරුණ පිරිසක් ඊට සහභාගි වූහ.

එහෙත් මෙය සාම්ප්‍රදායික ශීල සමාදන වැඩ සටහනක් ලෙස පවත්වාගෙන යාම සෝම හිමියන්ගේ අරමුණ නොවීය. එහි තරුණ පිරිසට තම නිදහස් මතවාද විවෘතව ප්‍රකාශ කිරීමට පහසු ඉඩකඩක් සළසා තිබිණි. ඒ නිසාම දිනක් තරුණ හමුවකදී එක් තරුණයෙක් සෝම හිමියන් හා විවාදයකට එළැඹියේය. ඔහු කොළඹ රාජකීය විද්‍යාලයෙන් උසස් පෙළ හදළ අයෙකි.

# 7 තරුණයන් පෙළ යහමගට

මේ කාලය එනම් 1975 වසර වනවිට මෙරට පැන නැගී තිබුණේ කිසියම් අර්බුදකාරී වාතාවරණයකි. විශේෂයෙන් 1971 වසරේදී තරුණ නැගී සිටීමක් මගින් ඇතිවූ සුප්‍රකට අප්‍රේල් කැරැල්ලට හේතුව අප රටේ තරුණ පෙළට යහමග පෙන්වීමට කිසිවකු නොමැති වීම යැයි සමාජයේ බොහෝ දෙනෙක් ආගමික නායකයන්ට චෝදනා කළහ. 'තරුණ අසහනය', 'විප්ලවය', 'ත්‍රස්තවාදය' යන වදන් ශ්‍රී ලාංකික සමාජයේ පාරිභාෂික වදන් අතරට එක්වූයේ මෙම පසුබිම තුළිනි.

නමුත් පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමියන් තරුණ අසහනය හඳුනා ගෙන තිබුණේ මේ කැරැල්ල ඇතිවීමටත් පෙරදීමය. ඒ නිසාම උන්වහන්සේ බෞද්ධ සාරධර්ම සහ බෞද්ධ චින්තනය මත පදනම් වූ 'තුරුණු සවිය' නමැති සංකල්පයක් තරුණයන් ඒකරාශී කරගෙන සිරි වජිරඤාණ ධර්මායතනය මුල්කොට පවත්වාගෙන ගියේ කලකට පෙර සිටමය. නමුත් 1971 කැරැල්ලත් සමගම කවරාකාරයක වුවද තරුණ එකමුතුවක් රජය නොරිස්සූ බැවින් තුරුණු සවිය වැඩ සටහනද අක්‍රියව ගොස් තිබිණි.

1975 වනවිට ජනතා අසහනයට හේතුවන ප්‍රබල හේතු රැසක්

පැත්තකට වැටිණි. ඔහු මෙලොව හැර ගොස් සිටියේය.

මේ තරුණයා මියගිය පුවත සෝම හිමියන්ටද දැනගන්නට ලැබිණි. ඉන් සිතේ මහත් සංවේගයක් ජනිත වුවද අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මය සිහිපත් කළ සෝම සාමණේර හිමියෝ එමගින් ශ්‍රමණ ප්‍රතිපදාව වඩාත් අර්ථවත් කරගැනීමට අදිටන් කරගත්හ.

ඒ වුණත් මං ඔය හතර දෙනාගෙන්ම මං වෙනුවෙන් කරන්න කියලා එකම එක දෙයක් ඉල්ලා හිටිනවා.'

ඒ වනවිට දෑසේ කඳුළු පුරවාගෙන හඬමින්, වැළපෙමින් ඒ තරුණයාට සවන් දෙමින් සිටි ඔවුහු ඔහු කියන්නට උත්සාහ කරන දෙය පිළිබඳව විමසිලිමත් වූහ.

'මං ඉල්ලා හිටින්නෙ මේකයි. මම ජීවත්ව හිටපු කාලෙ මං කොහොමද ජීවත් වුණේ කියලා අම්මලා දන්නවා. අම්මයි, තාත්තයි, නංගියි, මල්ලියි හතර දෙනාම මාව සිහිපත් කරලා අන්න ඒ විදියට ජීවත් වෙන්න. අන්න ඒක තමයි මගේ අන්තිම ඉල්ලීම' ලියුකේමියා රෝගයේ ස්වභාවයට අනුව අවසන් මොහොතට එළැඹෙමින් සිටියද බොහෝ විටම කතා කිරීමේ අපහසුවක් පැන නගින්නේ නැත. එහෙත් තම ජීවිතයෙහි මේ ගෙවෙන්නේ අවසන් මිනිත්තු කිහිපය බව තරුණයා වටහාගෙන තිබේ.

'පුළුවන් නම් සෝම හාමුදුරුවන්ව වැඩම කරවන්න' තරුණයා සිය පවුලේ අයගෙන් ඉල්ලා සිටියේය. එහෙත් මෙම සෝම හිමියන් කවුරුන්ද යන්න පිළිබඳව පවුලේ අයට ප්‍රශ්නයක් වී තිබිණි. උද්ගතව ඇති මේ අවස්ථාවේ හැටියට ඔහු පවසන භික්ෂූන් වහන්සේ සොය සොයා සිටින්නට නොවෙහෙසුණු ඔවුහු නුදුරින් වූ විහාරස්ථානයෙහි වැඩ විසූ භික්ෂූන් වහන්සේ නමක් රෝහල වෙත කැඳවාගෙන ආහ.

මේ වනවිට තරුණයා අසීරුවෙන් ආශ්වාස කරන ආකාරයක් පෙනෙන්නට තිබිණි. තමා අභියස වැඩ හිඳින භික්ෂූන් වහන්සේ දෙස බැලූ තරුණයා 'දැන් ඉතින් මට පන්සිල් සමාදන් වෙන්න ඕනෙ' යි කියමින් දෑත් එකතු කර ගත්තේය.

නමස්කාර පාඨය කියා තෙරුවන්ද වැඳ පන්සිල් පද එකින් එක එම භික්ෂූන් වහන්සේ විසින් සමාදන් කරවන්නට වූහ. අවසන් සිල් පදය සමාදන් වූ තරුණයාගේ මුව එක්වරම නිහඬ විය. දෑත ඉබේ පහතට වැටුණු අතර ගෙල හැරවී මුහුණ කොට්ටයෙන්

සෝම හිමියන් එතැනින් පිටත් වන්නට පෙර ඉල්ලා සිටියේය.

ඒ අනුව ඉන්පසුවත් සෝම හිමියෝ එම තරුණයා හමුවී ඔහු හා කතාබහ කිරීමට පුරුදු වූහ.

ටික දිනකට පසු රාත්‍රියක හදිසියේම එම තරුණයා අසාධ්‍ය තත්ත්වයට එළැඹෙමින් හිඳින බව දන්වා සෝම හිමියන්ට පණිවුඩයක් ලැබිණි. සෝම හිමියන් පිළිකා රෝහලේ එම වාට්ටුවට යනවිටත් ඉතාම අසාධ්‍යව සිටි ඔහුගේ මුඛයෙහි එක් පැත්තකින් රුධිරය බේරී පිටතට වැගිරෙමින් පැවතියේය.

ඔහුගේ එක් අතක් අල්ලා ගත් සෝම හිමියන් ඔහු වෙනුවෙන් පිරිත් සජ්ජායනා කරන්නට විය.

මෙය ලෝක ධර්මතාවයයි. එබැවින් ඒ සම්බන්ධයෙන් සැලීම නොකට යුතුය. පිරිස් සජ්ජායනාව අවසානයේ සෝම හිමියෝ මධ්‍යම රාත්‍රිය එළැඹෙත්ම ආපසු ධර්මායතනයට වැඩම කළහ.

කෙසේ හෝ ඉන්පසු දින දැනගන්නට ලැබුණු පරිදි තරුණයාගේ රෝගය යළිත් සුව අතට හැරී ඇත. 'මට පියවි සිහිය නොතිබුණාට පිරිත් හඬ හොඳට ඇහුණා. ඒ එක්කම මට හිතුණා මේ මගේ අන්තිම මොහොත බව. ඒත් එළිවෙන යාමේ නින්දකින් පිබිදුණා වගේ මට ආයිමත් සිහිය ආවා.' පසුව එම තරුණයා සිය මව හා එසේ කියා තිබිණ. එහෙත් එක් සන්ධ්‍යා යාමයක අසාධ්‍ය තත්ත්වයට පත් මෙම තරුණයා තමන් මරණයේ දෙරකඩ හිඳින බව නියත ලෙසම වටහා ගත්තේය. ඒ නිසාම තමා බැලීමට පැමිණ සිටි මව වෙත හැරුණු ඔහු පියාවත්, නංගී සහ මල්ලීවත් කැඳවාගෙන එන ලෙස මවගෙන් ඉල්ලා සිටියේය.

එම ඉල්ලීම එපරිද්දෙන්ම නොපමාවම ඉෂ්ට විය.

තරුණයා තම සයනය වටා හිඳින මවත්, පියාත්, නැගණිය සහ මල්ලි දෙසත් ඉතා හොඳින් බැලුවේය.

'දැන් මගේ ජීවිත කාලය ඉවරයි. මම මැරුණට පස්සෙ අම්මලා මං වෙනුවෙන් එක එක පින්කම් කරන බව මම දන්නවා.

හිමියෝ ඇසූහ.

'බුදු හාමුදුරුවො දේශනා කරපු විදිහට මේ ලෝකෙ ඉපදුණු හැම සත්ත්වයකුටම ජාති ජරා ව්‍යාධි මරණ කියන තත්ත්වයන් පොදුයි. බුදු බණේ දැක්වෙන ඒ ලෝක ධර්මතාවය අපි කාටත් පොදුයි හාමුදුරුවනේ.'

'මේක තමයි සාංසාරික ස්වභාවය. ඒ කියන්නෙ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම. පුංචි කාලෙ ඉඳලම බණ දහම් ඉගෙන ගෙන, භාවනාව වඩලා මේ තත්ත්වය හොඳින් තේරුම් අරගෙන ඉන්න මම දැන් මේ විදිහෙ රෝගයකට මුහුණ පාලා ඉන්න එක ගැන පුදුම වෙන්නෙවත්, දුක් වෙන්නෙවත් නෑ. මට මේ රෝගය තියන බව දැන ගත්තට පස්සෙ මම මේ රෝගය සම්බන්ධව ලියවුණු පොත්පත් හොයාගෙන මේ රෝගය ගැන හොඳින් කියෙව්වා. දැන් මට මගේ මේ රෝගයේ ස්වභාවය ගැනත් හොඳ අවබෝධයක් තියෙනවා. සැබෑ බෞද්ධයෙක් හැටියට මගේ මේ රෝගය යථාර්ථවාදීව තේරුම් ගන්න මට පුළුවන් වුණා.'

තරුණයාගේ හඬ පැහැදිලිය, සංවරය, නිරවුල්ය. සෝම හිමියන්ගේ සිතෙහි මෙම තරුණයා කෙරෙහි ඇතිවූයේ මහත් ප්‍රසන්න හැඟීමකි. එබැවින් ඔහු නතර කළ තැනින් කෙටි අනුශාසනාවක් කිරීම ඇරඹූ සෝම හිමියෝ ඔහුට මෙසේ කීහ. 'මිනිසුන් හැටියට අප දමනය කළ යුතුම, ඒ වගේම දමනය කිරීමට අමාරුම දේ තමයි හිත. බුදු දහමේ එන පරමාර්ථ දර්ශනය, ඒ කියන්නේ නිර්වාණාවබෝධය ලබන්න පුළුවන් හිත දමනය කිරීමෙන් විතරයි. ඒ අතින් මේ මල්ලී තමන් ලබපු ජීවිතයෙන් විශාල සාර්ථකත්වයක් අත්දැකපු කෙනෙක්. මහා ධන සම්පත් මැද අවුරුදු සීය හමාර සිතේ වහලුන් හැටියට කෙලෙස් හරිතව ජීවත් වන කෙනෙකුට වඩා මල්ලිගේ ජීවිතය දනටමත් සාර්ථකයි.'

'ඔබවහන්සේ ආයෙමත් මේ වාට්ටුවට වැඩියොත් මෙතෙන්ටත් ටිකක් වඩින්න හාමුදුරුවනේ. ඔබවහන්සේත් එක්ක කතා කළාම මගේ හිතේ තියෙන අස්වැසිල්ල තවත් වැඩිවෙනවා.' තරුණයා

පුළුවන්.' ඒ තරුණයා සෝම හිමියන් හමුවේ පවසා සිටියේය.

මෙම තරුණ සාමණේර හිමියන්ට මෙය එක්තරා ආකාරයකින් අලුත් අත්දැකීමකි. මරණය පිළිබඳ මෙතරම් සැහැල්ලුවකින් කතා කරන කෙනකු හමුවුවහොත් එය ඉතාම කලාතුරකින් සිදු වන්නකි. හැරත්, ඒ වනවිටත් වයස විස්සක, විසි දෙකක පමණ වූ තරුණයකු මේ තරම් සැහැල්ලුවෙන් මරණයට මුහුණ දෙන්නට සූදානමින් හිඳීම ඊටත් වඩා අහඹු සිදුවීමකි.

'කොහොමද මල්ලි ඒ වගේ මානසික ශක්තියක් ගොඩ නගා ගත්තෙ?' සෝම හිමියෝ තරුණයාගෙන් විමසූහ.

'හාමුදුරුවනේ, මං මට තේරෙන වයසෙදි ඉඳලම බුදු දහමට අනුව ජීවිතය ගොඩ නගා ගත්තා. මං හොඳට පන්සිල් ආරක්ෂා කළා. මගේ අතින් සිල් පදයක් කැඩුණා නම් ඒක හරිම කලාතුරකින් තමයි. ඒ වගේම මං හොඳට භාවනා කරලා තියෙනවා. ඒ හින්ද මගේ හිත නිරවුල්. ඒ වගේම අස්වැසුම් සහගතයි. මගේ හිත පිරිසිදු හින්ද මට ඉස්කෝලෙ යන කාලෙ වුණත් පාඩම් කරන්න අමුතුවෙන් වෙහෙස මහන්සි වෙන්න වුවමනා වුණේ නෑ. මං පාඩම් කරන කොට ඒ හැම දෙයක්ම මගේ හිත ඇතුළෙ හොඳට තැන්පත් වුණා. ධාරණ ශක්තිය වගේම මතක ශක්තියත් ඉතාම හොඳට ක්‍රියාත්මක වුණා. පොත පතින් ඉගෙන ගත්තු දේවල් නිරවුල්ව මනසට ගලාගෙන ආවා. ඒ නිසා විභාග කියන දේවල් මට අභියෝග බවට පත්වුණේ නැහැ.'

මින් සෝම හිමියන් තුළ ඇතිවුණේ මහත් වූ පැහැදීමකි. මෑතකදී පැවිදි බිමට පිළිපන් සාමණේර හිමිනමක වශයෙන් මේ තරුණයා සම්බන්ධ අත්දැකීම තම ජීවිතයටද විශාල පිටිවහලක් විය හැකි බව සෝම හිමියන්ට මනාව අවධාරණය විය.

'මල්ලි බොහොම පින් දහම් කරන කෙනෙක්. ඒ වගේ කෙනෙක් මේ වගේ වේදනාකාරී රෝග තත්ත්වයකට පත්වීම ගැන ඔයාට මොනවද හිතෙන්නෙ?'

තරුණයාගේ සිතැගි තවදුරටත් පරීක්ෂා කරනු රිසි වූ සෝම

# 6 පරලොව යමින් සිටි මිතුරකු හමුවීම

මහරගම පිළිකා රෝහලේ නේවාසිකව සිටි රෝගී තරුණයාගේ සයනය ඉදිරිපස අසුනින් වාඩි වූ සෝම හිමියෝ ඔහුගේ විස්තර විචාරන්නට පටන් ගත්හ. තරුණයා පැවසූ ආකාරයට ඔහු කුඩා කල සිටම බම්බලපිටියේ වජිරාරාමය ඇසුරේ හැදී වැඩුණු අයෙකි. වජිරාරාම දහම් පාසලේ අධ්‍යාපනය ලැබූ ඔහු සෑම පුර පසලොස්වක පෝ දිනයකටම නොවරදවාම අටසිල් සමාදන්ව ඇත. කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය ලබා පසුව වෛද්‍ය විද්‍යාලයට තේරී වෛද්‍ය සිසුවකු වශයෙන් කටයුතු කරන්නට ඔහුට ඉඩ ලැබී තිබුණේ දෙමසක කාලයක් පමණි. නරක් වූ දතක් ගලවා දැමීමෙන් පසු එතැනින් ලේ ගැලීම නතර නොවුණු නිසා ඒ පිළිබඳව පරීක්‍ෂා කළ වෛද්‍යවරුන්ට ඔහු ලියුකේමියා රෝගයෙන් පෙළෙන බව අනාවරණය කරගත හැකිවිය. ඉන්පසු දිගින් දිගටම ඔහු ප්‍රතිකාර සඳහා යොමුකර ඇති අතර ඒ කිසිවකින්වත් ඔහුගේ රෝගයට නිත්‍ය සුවයක් ලැබී නැත. මේ වනවිට එම තරුණ සිසුවා සිය රෝගයෙහි අවසන් අවස්ථාවට එළැඹ සිටියේය.

'හාමුදුරුවනේ, තව බොහොම ටික දවසයි මගේ ජීවිතය රැදිලා තියෙන්නෙ. ඒත් මට මරණ බයක් දැනෙන්නෙ නැහැ. බොහොම සැනසුම් සැහැල්ලු සිතකින් මරණයට මූණ දෙන්න මට

තරුණයාගේ මුහුණුවර සෝම හිමියන්ටද යන්තමින් මතක තිබිණි. 'මටත් මල්ලිව ටිකක් මතකයි' යනුවෙන් උන්වහන්සේ පැවසූවේ එබැවිනි.

අනතුරුව රෝගියා ඉදිරිපස වූ අසුනෙහි සෝම හිමියෝ වාඩි වූහ.

මහා කුසල සම්භාරයක් අත් වෙ... ...නවෙන දේශනා කොට 'අතීතය පිළිබඳව පසුතැවිලි වී ...ලක් නැති බව පවසා වර්තමානයේ සිහි නුවණින් කටයුතු කිරීමේ වැදගත්කම බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති අන්දම විස්තර කළහ.

එම ධර්මානුශාසනාවට සවන් දුන් පසු එම රෝගියාගේ මුහුණේ එතෙක් නොවුණු අන්දමේ ප්‍රසන්න පෙනුමක් ඇඳී ගියේය. දෑත් එක්කොට සෝම සාමණේර හිමියන්ට නමස්කාර කළ ඔහු 'මගේ හිතේ තිබුණු ගින්දර විශාල ජල කඳකින් නිවිච්ච ලෙස ඔබවහන්සේගේ බුදු බණ ටිකෙන් මගේ හිත සැනසුණා. තව ටික දවසක් වුණත් මං ජීවත් වෙන තුරාවට ඔබවහන්සේගේ මේ ධර්මය පිළිපදිනවා' යැයි මහත් වූ සොම්නසින් පැවසීය.

තවත් එක්තරා දිනෙක සෝම හිමියෝ පිළිකා රෝහලේ වාට්ටුවක ඇඳන් පේළියක් අතරින් ගමන් කරමින් සිටියහ. එහි එක් ඇඳක සිටි තරුණයකුගේ දෙනෙත් සෝම හිමියන් වෙත එල්ල වී තිබිණි. ඔහු බලා සිටි විලාශය නිසාම සෝම හිමියෝ පියවරින් පියවර ගොස් ඔහු අසල නතර වූහ.

තමන් වහන්සේ දෙස ඇසිපිය නොහෙලා බලා සිටින මේ තරුණයාගේ දෙනෙතෙහි දිදුලන කඳුළු සෝම හිමියන්ට පෙනිණි. ඔහුගේ මුහුණේ ඇත්තේ මහත් අසරණ විලාශයකි. ආරෝහ පරිනාහ දේහයෙන් යුතු වුවද ඔහුගේ හිසෙහි එකදු කෙස් ගසක්වත් තිබුණේ නැත. පිළිකා රෝගය සඳහා දෙනු ලබන ප්‍රතිකාර හේතුවෙන් රෝගීන්ගේ කෙස් හැලීම සාමාන්‍යයෙන් සිදුවන්නකි.

'ඇහුවට අමනාප වෙන්න හාමුදුරුවනේ, ඔබවහන්සේ වජිරාරාම දහම් පාසලේ උගන්නපු සෝමරත්න මහත්තයා නේද?'

මහත් උපශාන්ත වූ ස්වරයකින් එම තරුණයා සෝම හිමියන් වෙතින් විමසීය. මුවගින් සිනාවක් පෑ සෝම හිමියෝ 'ඔව්' යැයි පැවසූහ. 'මං ඔබවහන්සේගේ ගිහි කාලෙ වජිරාරාම දහම් පාසලේ ශිෂ්‍යයෙක්. ඔබවහන්සේව මේ විදිහට දැකගන්න ලැබුණාම මගේ හිතට මහ විශාල සහනයක්, සැනසීමක් ලැබුණා.'

ශාක්‍යයන්ට දේශනා කළා. මොකක්ද ඒ උපමාව? ගිතෙල් කලයක් දිය යට තබා බින්දොත් එහි කටු දිය යටට යනවා. ගිතෙල් දිය මතට එනවා. ඒ වගේ ජීවිතය පුරාම කුසල් රැස් කරපු කෙනකුගේ මරණ බිය යටපත් වෙලා කුසල් උඩට මතුවෙනවා. හරියටම ගිතෙල් වතුර මතට එනවා වගේ. ඒ අනුව දැන් ඔය ඇත්තන්ට මෙලොවදීත් සතුටු වෙන්න පුළුවන්, පරලොවදීත් සතුටු වෙන්න පුළුවන්.'

මේ අයුරින් එම රෝගී තැනැත්තාට ධර්මානුශාසනාවක් කළ සෝම හිමියන් ආපසු හැරී එන්නට සූදනම් වෙත්ම එම දේශනාව අසා සිටි යාබද යහනක සිටි රෝගියකු සෝම හිමියන්ගේ අතකින් අල්ලාගෙන ඉකි බිඳිමින් හඬන්නට විණි. ඔහු සැනසූ සෝම හිමියෝ හැඬීමට හේතු කාරණා විමසූහ.

'අනේ හාමුදුරුවනේ, ඔබවහන්සේගේ බණ මාත් අහගෙනයි හිටියෙ. ඒත් මම නම් ඒ විදියට පින් රැස් කරපු කෙනෙක් නෙමෙයි. ඒ නිසා මට මරණ බිය තදින්ම දැනෙනවා. මට තරුණ කාලෙවත් කිසිම පින් දහමක් කරගන්න ලැබුණෙ නෑ. මම පෝස්ට් මාස්ටර් කෙනෙක්, අඹු දරුවො රැකපු එකයි, ගෙවල් හදපු එකයි විතරයි මං කළේ. අනේ හාමුදුරුවනේ, මගේ මරණ මොහොතෙ මට ගැළවුමක් නැද්ද? මාව බේරාගන්න ඔබවහන්සේටවත් බැරිද?'

ඉකිලන අතරේ ඔහු පැවසීය. ඒ තැනැත්තා වෙතට හැරුණු සෝම හිමියෝ ඔහු හටද දම් දෙසන්නට වූහ.

'එහෙම හිතන්න එපා. ධාර්මික ලෙස අඹු දරුවන් රැකීම, නිවැරදි පැවතුම් තුළින් අඹු දරුවන් ආරක්ෂා කිරීම පින් සිත් වඩවන මංගල කාරණයක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා. ඒ වගේම කුසල ශක්තීන් මඳයි කියලා හිත අධෛර්යය කරගන්න එපා. කුසල් වඩවා ගන්න මේ කාලයක් හොඳටම ප්‍රමාණවත්. අද ඉඳලා හොඳින් මෛත්‍රී භාවනාව වඩන්න. තමන්ට අත්වී තිබෙන කායික මානසික වේදනාව කුරා කුහුඹුවකුටවත් අත් නොවේවා කියලා මෛත්‍රිය වඩන්න. එයින්

වරක් මෙම තරණ ශීල සමාදනයට සහභාගි වූ එක් තරුණයකු සෝම හිමියන් බැහැ දැක ‘හාමුදුරුවනේ, මගේ තාත්තා පිළිකාවක් හැදිලා පිළිකා රෝහලේ මේ දවස්වල ඉන්නෙ. ඔබවහන්සේට පුළුවන් නම් ගිය වෙලාවක මගේ තාත්තා හම්බ වෙලා බණ ටිකක් කියන්න’ යි ඉල්ලා සිටියේය. එළැඹි ඊළඟ සති අන්තයේදීම සෝම සාමණේර හිමියෝ එම ඉල්ලීම ඉටු කළහ.

ජීවිතයේ හලතුනා වියෙහි සිටි එම පියාණන් පිළිකා රෝගය නිසා ඒ වනවිට මහත් අසාධ්‍ය තත්ත්වයකට පත්ව සිටියේය. තමන් අභියසට පැමිණි මෙම තරුණ භික්‍ෂූන් වහන්සේ දැක එම පියාණන්ගේ මුහුණේ පැහැදිලි සිනාවක් සටහන් විණි.

‘හාමුදුරුවනේ, මට මගේ මේ මරණාසන්න මොහොතෙ මගේ ජීවිතේ ගැන සතුටු වෙන්න පුළුවන්. මම තරුණ කාලෙ ඉඳලම ලෝභ, ද්වේෂ, මෝහ හුඟාක් දුරටම පාලනය කරගෙන ධාර්මිකව ජීවත් වුණු කෙනෙක්. ඉස්සර මම මගේ යාළුවෙකුත් එක්ක හැම පෝයටම කෝච්චියෙන් අනුරාධපුරේට ගිහින් ශ්‍රී මහා බෝධිය ළඟ සිල් සමාදන් වෙනවා. අපි බෝමළුව අතු ගානවා, පිරිසිදු කරනවා, මෛත්‍රී භාවනාව වඩනවා. ඒත් මං විවාහ වුණාට පස්සෙ නම් මට ඒවා ඒ විදියට කරන්න බැරිවුණා. මම දැන් මරණාසන්න අවස්ථාවට ඇවිල්ලා ඉන්නෙ. ඒත් දැන් පුදුම විදිහට ඒ තරුණ කාලෙ මතකය අවදි වෙනවා. හාමුදුරුවනේ, මම ඒ කාලෙ කරපු දේවල් නිසා මගේ හිතට පුදුම විදියෙ සහනයක් දැනෙනවා. දැන් මම මැරෙන්න බය නැහැ. මරණය කියන්නෙ හැම ජීවිතයකම කෙලවර.’

එම රෝගී පියාණන් සෝම හිමියන්ට කියා සිටියේය. මේ කතාව අසා සිටි සෝම හිමිපාණන් එම අසරණ රෝගී පුද්ගලයා වෙත අංගුත්තර නිකායේ මහානාම සූත්‍රය ඇසුරෙන් ධර්මානුශාසනාවක් කළහ. එම පියාණන් එම ධර්මය ශ්‍රවනය කරන ලද්දේ මහත් සොම්නසකිනි.

‘යම් පුද්ගලයෙක් ජීවිතයේ බොහෝ කාලයක් පින් රැස් කළාම ඒ තැනැත්තාගේ මරණ බිය දුරු වෙනවා. මේ බව බුදුරජාණන් වහන්සේ ඉතාම රමණීය උපමාවක් ගෙනහැර දක්වමින් මහානාම

දිනක් සෝම සාමණේර හිමියන්ද එස්වී තිබිණි. මීට කලින් කිහිප වතාවක්ම එහි ගොස් තිබුණද ඒ පැවිදි වීමට පෙරාතුවය. එහෙත් මෙම ගමන ඒ හිමියන්ගේ ජීවිතය මහත් පෙරැළියකට බඳුන් කිරීමට හේතු විණි.

එම මල හිරු බසිනා සැන්දෑ යාමයේ එහි වැඩම කළ සෝම සාමණේර හිමියන් හට ජීවිතය ඉල්ලා යදින අසරණ රෝගීන්ගෙ පහණු හාත්පස වූ පඬු පැහැ ආලෝකය අපාරින වඩාත් ශෝකාකුලව දිස්විණි. සමහර රෝගියකුගේ මුඛයේ පැන්නක ගසක් වසා වැවෙන පිළිලයක් මෙන් වැඩුණු මස් වැදැල්ලකි. තවත් රෝගීන්ගේ අත්පාවල ඔඩු දිවූ දරුණු පිළිකා වණය. මුලදී මේවා දකින කල පිළිකුලක් දැනුණද තමා ඉගෙන ගත් බණ දහමට අනුව ජාති, ජරා, ව්‍යාධි මරණ පිළිබඳව ධර්මානුකූලව සිහි කළ සෝම සාමණේර හිමියන්ගේ සිතෙන් වහ වහා එම පිළිකුල දුරු වී ගියේය. සංසාරික දුක පිළිබඳව සිහි කළ සෝම සාමණේර හිමියෝ රෝගීන්ගේ කැත කුණු, මළ මූත්‍රා පවා අනපත ගාමින් ඔවුන්ගේ ඇප උපස්ථාන සඳහා රෝහල් කාර්ය මණ්ඩලයට සහයෝගය දුන්හ. මඳ කලක් ගත වෙත්ම සෝම හිමියන් පිළිකා රෝහලේ රෝගීන් අතරත්, රෝහල් කාර්ය මණ්ඩලය අතරත් බෙහෙවින් ජනප්‍රිය හිමිනමක් බවට පත්විණි. නොවෙසේ නම් ප්‍රසන්න පෙනුමින් හා සන්සුන් ඉරියව්වලින් යුතු එම තරුණ හිමි නම රෝහලට අවශ්‍යම අයෙක් බවට පත්විණි.

මේ වනවිට මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමියන්ගෙ උපදේශකත්වයෙන් යුතුව 'තුරුණු සවිය' තරුණ වැඩ සටහන ධර්මායතනයේ ආරම්භ වී තිබිණ. සෝම හිමියන්ගේ ක්‍රියාකාරි බව මෙයට මහඟු අත්වැලක් බව කල්පනා කළ පඤ්ඤාසීහ මහ නාහිමියෝ එහි පැවැති බාල සහ වැඩිහිටි සීල සමාදාන වැඩ සටහන් අතරට තරුණ සීල සමාදන වැඩ සටහනත් එක් කොට එය සෝම හිමියන්ට පැවරූහ. මේ අනුව මුල්ම තරුණ සිල සමාදනය 1975 වසරේ එළැඹි ඇසල පුන් පෝ දිනයෙන් ආරම්භ විය. එම මුල් අවස්ථාවේ පෙහෙවස් සමාදන් වූ තරුණ පිරිස තිස් දෙනෙක් පමණ වූහ.

# 5 පිළිකා රෝගීන්ට උවටැන් කොට දහම් දෙසයි

පැවිදි බිමට පත්වූ මුල් කාලයේ සිටම සෝම සාමණේර හිමියෝ ගුණ දම් වඩන අතරේම ශාසනික කටයුතුවලට මුල පිරූහ. පැවිද්දට පෙර වජිරාරාමයේ දහම් පාසලට සම්බන්ධව සිටියන් පැවිදි වීමෙන් පසු සෝම හිමියෝ තමන් වහන්සේ වැඩ විසූ ධර්මායතනයේ දහම් පාසලෙහි ඉගැන්වීම් කටයුතුවල නිරත වූහ. මේ වනවිට ධර්මායතන දහම් පාසලේ ප්‍රධානාචාර්ය පදවිය හෙබවූයේ අම්පිටියේ රාහුල හිමිපාණන් වහන්සේය. එහි බෙහෙවින් ක්‍රියාකාරී චරිතයක් බවට පත්වූ තරුණ සෝම සාමණේර හිමියන් නිසා රාහුල නාහිමියන්ට දැනුණේ මහත් වූ පහසුවකි.

ඒ කාලයේදීත් ධර්මායතනයේ ස්වාමීන් වහන්සේලා සෑම සති අන්තයකම මහරගම පිළිකා රෝහලට ගොස් රෝගීන් වෙනුවෙන් ධර්මානුශාසනා පැවැත්වීමේ වැඩ සටහනක් ක්‍රියාත්මකව තිබිණි. ඒ සියන වකවානුව වනවිට පිළිකා රෝහල අද මෙන් දියුණු තත්ත්වයක පැවැතියේ නැත. නවීන ඖෂධ සහ විද්‍යුත් ප්‍රතිකාර ක්‍රම අදට වඩා සීමාසහිතව තිබූ එද පිළිකා රෝහල මරු කටක් වශයෙන් මිනිස්සු හැඳින්වූහ. එකල මහරගම පිළිකා රෝහලට ඇතුළු කෙරුණු රෝගීන්ගෙන් ජීවිත දනය ලද්දේ සුළුතරයකි.

පිළිකා රෝහලේ සති අන්ත දිනවල සවස 5.00 ට පැවැත්වෙන්නට නියමිත මෙම ආගමික වතාවත් සඳහා මුල්වරට

ඔහුගේ ධර්ම දේශනාවට මාතෘකාව වූයේද පටිච්ච සමුප්පාදයයි. මෙම ධර්ම දේශනාව වෙනුවෙන් පැමිණ සිටි පිරිසගෙන් ලැබුණේද ඉතාමත් හොඳ ප්‍රතිචාරයකි. මංගල ධර්ම දේශනය කරනු ලබන භික්ෂූන් වහන්සේ නමකට වුවද කිසිදු අසීරුවකින් හෝ පැකිලීමකින් තොරව නොකඩවා පැයක් දේශනයෙහි යෙදීම කළ නොහැක්කකි. නමුත් ගිහියකු වශයෙන් සෝමරත්න තුළ පැවති ඒ හැකියාව දුටු රාහුල හිමියන්ගේ සිතෙහි මහත් සතුටක් ඇති විය.

ඒ අනුව අනාගතයේ මෙරට විචිත්‍ර ධර්ම කථිකයාණන් වහන්සේ නමක වන පෙරනිමිති සෝම හිමිපාණන් පළකොට තිබුණේ පැවිදි වන්නටත් වසර කිහිපයකට පෙරදීමය.

මේ වනවිට ඔහු ධර්මායතනයෙහි ගිහි පැවිදි දෙපිරිස අතරම බෙහෙවින් ප්‍රසාදයට පත්ව සිටි යුගයකි. එබැවින් මෙම තරුණ උපාසක මහතාගේ දම් දෙසුමක් ශ්‍රවණය කිරීමේ අභිලාෂයෙන් ධර්ම ශාලාවේ විශාල පිරිසක් රැස්ව සිටියහ.

නියමිත වේලාව ආසන්න වනවිට එදින පෝය වැඩ සටහනේ න්‍යාය පත්‍රයට අනුව මීළඟ ධර්ම දේශනාව පවත්වනු ලබන්නේ.... ආදී වශයෙන් ශබ්ද විකාශන යන්ත්‍රයෙන් සෝමරත්නගේ නමද ප්‍රචාරය විය.

ඒ දක්වා සිතේ පැවති ආශාව සහ ධෛර්යය කොහේ ගියාදැයි සෝමරත්නට සිතාගත නොහැකි විය. රැස්ව සිටි පිරිස දැකීමෙන්ම ඔහුගේ ළය 'ඩිග් ඩිග්' හඬ නගමින් සැලෙන්නට විණි. ධර්ම ශාලාවෙහි ඉදිරියට යන තම දෙපා ඉදිරියට වඩා පසුපසට ඇදෙන බවක් ඔහුට හැඟුණි. සියල්ලන්ම බලා සිටින්නේ විශාල අපේක්ෂාවක් පෙරදැරිව බව ඔවුන් දෙස බැලූ පමණින්ම පැහැදිලිය. මේ නිසාම සෝමරත්නට දැනුණේ කිසිසේත් මේ කාර්යයට මුහුණ දීමට නොහැකි අන්දමේ ප්‍රබල අපහසුතාවයකි. සිරුර පුරාම දහඩියෙන් නෑවී යමින් තිබිණි. ආපසු යන්නට බැරිකමටම අසීරුවෙන් දෙපා ඇදගෙන ගොස් ඔහු නියමිත අසුන මත වාඩි වූයේය. 'නමෝතස්ස' පාඨය කියා දහම් දෙසීම ආරම්භ කරන්නට සැරසුණි. එහෙත් එපමණි. කලින් සිතාගෙන ආ කරුණු එකක්වත් මොනම ආකාරයකටවත් ඔහුගේ මතකයට නැගුණේම නැත. ඒ සියලු කරුණු බොඳව ගොස් ඇත්තේ ක්ෂණයකිනි. ගත වූයේ තත්පර කිහිපයකි. ස්නානය කළ කලෙක මෙන් ඔහුගේ මුළු සිරුරම දහඩියෙන් නෑවී ගියේය.

'නෑ මං කොහොම හරි කියනවා' යන අධිෂ්ඨානය මීළඟට ඔහු සිත පුරවා ගත්තේය. ඒ අනුව මොහොතක් නිහඬව සිත එකඟ කරගෙන ඊළඟට සිත මතකය ඔස්සේ මෙහෙයවන්නට විය. පුදුමයකි. සියලූ කරුණු එකින් එක මතකයට ගලා ආවේය. එතැනින් ආරම්භ වූ දම් දෙසුම නොකඩවා සම්පූර්ණ පැයම කිසිදු වෙහෙසක් නැතිවම හරවත් ලෙස ඉදිරිපත් කිරීමට හැකිවිණි. එද

පෝදිනකටම සිල් සමාදන් වෙමින්, විහාරස්ථානයෙහි සියලු කටයුතුවලට සහභාගි වෙමින්, බණ දහම් පිළිබඳව මැනවින්ම දැන උගෙනද සිටි තරුණ උපාසකයෙකි.

මේ නිසාම කෙසේ හෝ පුන් පෝදිනෙක ධර්ම දේශනාවක් පැවැත්වීමේ ආශාවෙන් ඔහු කිහිප විටක්ම රාහුල හිමියන් බැහැ දැකීය. එහෙත් එම නාහිමියන් අභියසදී ඔහුට වචන පටලැ වී යයි. එතෙකින්ම ඒ අදහස පසුදිනකට කල් තබන ඔහු නාහිමියන් සමග වෙනත් දේවල් කතාබහ කොට ආපසු පැමිණියේය.

මෙසේ කල්ගත වෙද්දී එක වසරක පුන් පෝ දිනය යෙදී තිබුණේ ජනවාරි 1 වැනි දිනකදීය. මෙදිනට නම් කෙසේ හෝ ධර්ම දේශනාවක් පවත්වමියි යන තිර අදිටනින් යුතුව තරුණ සෝමරත්න රාහුල හිමියන් වෙත ගියේය.

හාමුදුරුවනේ, මට පෝය දවසෙ සිල් ඇත්තන්ට බණක් කියන්න ආසයි' සෝමරත්න කීයේ නතනමිනි.

රාහුල හිමියන් මෙම තරුණයා දෙස හොඳින් බලා සිනාසී,

'බණක් කියන්නද? හා... හා... බොහෝම අගෙයි' යනුවෙන් අනුමත කර සිටියහ.

'කොච්චර විතර වෙලාවක්ද? පැය භාගයක්? පැයක්?' රාහුල හිමියෝ සිනාසී ප්‍රශ්න කළහ.

මෙහි කිසිදු ගැඹුරක් පිළිබඳව වැටහීමක් නොතිබූ සෝමරත්න හාමුදුරුවනේ පැයක් කමක් නැ' යි කීය.

'හා... හා... බොහොම අගෙයි, බොහොම අගෙයි' යනුවෙන් රාහුල හිමියෝ හිස වනා එය අනුමත කළහ.

සිතූ පරිද්දෙන්ම ජනවාරි 01 දට යෙදුණු පුන් පෝද දහවල් 1.30-2.30 දක්වා ධර්මානුශාසනාව සෝමරත්න තරුණයා වෙත පැවරී තිබිණි. එදින ධර්මායතනයේ පෝය වැඩ සටහනටද එය ඇතුළත් විය.

මේ මහා කුසල් සම්භාරය නිමිති කොට බුද්ධ, පසේ බුද්ධ, මහ රහතුන් නිවී සැනසී පැමිණ වදාළ අජරාමර නිවන් සම්පත් ලැබීමට අප සැමට වාසනා වේවා යි ඔවුන් මේ සාමණේර හිමිපාණන් දෙස බලා නොල් මතුළහ.

ඉන්පසු නම වැඩිමල් පුතු වූ සෝම සාමණේර හිමියන්ගේ දෙපා මුල වැටී මේ මාපිය දෙදෙනා සිරිත් පරිදි පසඟ පිහිටුවා වැන්දහ. පැමිණ සිටි පිරිසගේ දෙනෙත් කඳුලින් පිරී ගොස් තිබිණි. නවදූරටත් හෙනෙම මෙතෙක් කල් තමන් දරුවකුද, සොයුරකුද වශයෙන් සැලකූ සෝමරත්න නොවේ. ගංගොඩවිල සෝම හාමුදුරුවන් වහන්සේය. සෝම හිමිපාණන්ගේ ගිහි කල අඟ යහලුවා වූ නිමල් රණසිංහද මෙම පිරිස අතර විය. සෝම හිමිපාණන් වෙත ගිය නිමල්ද උන්වහන්සේ අභියස දණින් වැටී වැන්දේය.

එතැන් පටන් සෝම සාමණේර හිමිපාණන්ගේ නිත්‍ය වාසස්ථානය වූයේ ධර්මායතනයයි. ඉන්පසු උන්වහන්සේ පෙර මෙන් ධර්මායතන දහම් පාසලේ ආචාර්යවරයකු වශයෙන් දිගටම කටයුතු කළ අතර එහි අභිධර්ම පන්තියද කරගෙන ගියහ.

පැවිදි බිමට පිළිපන් ඕනෑම හිමිනමකගේ මංගල ධර්ම දේශනාව පැවැත්වෙන මොහොතද කිසියම් විශේෂිත වූවකි. එයද මංගල අවස්ථාවක් සේ සැලකේ. එහෙත් සෝම සාමණේරයන් සම්බන්ධයෙන් එවැන්නක් නොවිණි. සෝම හිමියන් මංගල ධර්ම දේශනාව පවත්වා තිබුණේ පැවිදි වන්නටත් වසර ගණනකට පෙරදීය.

ගිහිකල දහම් පාසලේ ධර්මාචාර්ය පන්තිවලට උගන්වන අතරේ ධර්මායතනයේ අභිධර්ම පන්තියක්ද කරගෙන ගිය සෝමරත්නට (සෝම හිමියන්ට) ධර්ම දේශනාවක් පැවැත්වීමට තිබුණේ නොතිම් ආශාවකි.

මහණ වීමේ සිතක් තිබුණත් එවකට ඔහු ඒ සඳහා මාපිය අවසර ලබා තිබුණේ නැත. නමුත් ඔහු මේ වනවිට සෑම පුන්

පුතු පන්සලේ දිවි ගෙවූවත්, සුදු ඇඳුමෙන් සැරසී අෂ්ටාංග ශීලය සමාදන් වූ උපාසකයකුව සිටියත්, ඒ මගේම පුතුය යන හැඟීම ඔවුන්ගේ සිත් තුළින් මුළුමණින්ම ඉවත්ව තිබුණේ නැත. එහෙත් මේ සිටින්නේ ඒ පුතුද? නැතහොත් සසර දුක් නිවීම පිණිස නිවන් මගට පිළිපත් බුදු පුතකුද?

සෝමරත්නට පැවිදි වීම සඳහා මුල්ම පිරිකර පූජා කිරීම භාරගෙන තිබුණේ ඩී. අබේසිංහ නමැති ධර්මායතනයෙහි සියලු කටයුතුවලදී ඔහුට ඇප උපකාර කළ මහතෙකි. ඒ සිවුරු පිරිකර දෑතින්ම ගත් සෝමරත්න එය නාහිමියන් වෙත පිරිනමමින් චිරාගත සම්ප්‍රදායට අනුව පැවිද්ද ඉල්ලා මෙසේ ආයාචනා කළේය.

'සබ්බ දුක්ඛ නිස්සරණ

නිබ්බාන සච්චි කරණත්ථාය‍ං

ඉමං කාසාවං ගහෙත්වා....'

ආදී වශයෙන් 'සියලු දුක් නැති කොට නිවනට පිවිසීම පිණිස මේ කසාවත පිළිගෙන මට පැවිද්ද ලබාදෙනු මැනව.' යනුවෙන් තුන්වරක් මේ ආයාචනා පාඨය සෝමරත්නගේ මුවින් පිටවිණි. ඉන්පසු එය උපාධ්‍යායන් වහන්සේ විසින් පිළිගනු ලදුව නැවත වරක් එම ආයාචනා පාඨය කීමෙන් අනතුරුව සෝමරත්නට පැවිදි භාවය හිමිවිණි. රැස්ව සිටි පිරිස වෙතින් නැගුණු සාධු නදින් ධර්මායතන භූමිය පිරී ගියේය.

ගංගොඩවිල සෝම නමින් මෙසේ පැවිදි බිමට පිළිපත් සෝම සාමණේර හිමිපාණන් දෙස උන්වහන්සේගේ මාපියෝ ඇහිපිය නොහෙළා බලා සිටියහ. එය බෙහෙවින් අනුවේදනීය අවස්ථාවකි. එම මෑණියන්ගේ ළය සොවින්ද, තුටින්ද යන්න හරි හැටි වටහා ගත නොහැකි සංකීර්ණ හැඟීම් සමුදයක් මතින් නැගුණු ආවේගයන් තුළින් වේගයෙන් උස් පහත් වන්නට විය. ඒ දෑසින් මොහොතකට කලින් ගලා හැළුණු කඳුළු මේ වනවිට වියළිව ගොසිනි. සම්බුද්ධ ශාසනය උදෙසා පූජා කළ හැකි උතුම්ම සම්පතක් පූජා කළ තමන් දැන් භාග්‍යවන්තියකි.

වැනි ගැඹුරු ධර්ම කොටස් සම්බන්ධයෙන්ද ඔහු තුළ ඇත්තේ පුළුල් දැනුමකි. මේ නිසාම අන් බොහෝ අයට මෙන් ඔහුට වසර කිහිපයක් උපාසක තත්ත්වයෙහි සිටීමට අවශ්‍ය නැත. සෝමරත්න ඉක්මණින් පැවිදි කිරීමේ දෙසක් නැති බව පඤ්ඤාසීහ මහ නාහිමියන් මෙන්ම රාහුල නාහිමියන්ද වටහාගෙන සිටියහ. ඒ අනුව සෝමරත්න උපාසක දිවියට එළැඹ දෙමසක් වැනි ඉතාම කෙටි කලකින්ම ඔහු පැවිදි කිරීම සඳහා නාහිමිවරු තීරණය කළහ. එම සුබ නැකත යෙදී තිබුණේද ඔහු ගිහිගෙයින් නික්ම හරියටම දෙමසක් සපිරෙන දිනයේය. එනම් 1974 සැප්තැම්බර් 20 දටය.

එම සුබ දිනයටද කල් එළැඹෙමින් තිබිණි. සෝමරත්න පසුවූයේ අසමාන අස්වැසුම් සහගත බවකිනි. සැප්තැම්බර් 20 ද උදාවිය.

සෝමරත්නගේ මාපියන්, සොයුරු සොයුරියන් ඇතුළු හතර වරිගයේ නෑදෑයින්, හිතවතුන් ආදී වූ විශාල පිරිසක් එදින හිමිදිරියේම ධර්මායතනයට රැස්ව සිටියහ. එම සුබ මොහොතේ සෝමරත්න ඇතුළු තවත් ළාබාල දරුවන් හතර දෙනකු පැවිදි කිරීමට නියමිතව තිබිණි. උපාධ්‍යායන් වහන්සේ විරාගත ශාසනික සම්ප්‍රදයට අනුව සෝමරත්නගේ හිසකෙස් බෑම සඳහා කරකැත්ත (දැලි පිහිය) ඝත දරා සිටියහ. ඝනව වැඩී තිබූ කෙස් කළඹේ පළමු රොද කැපූ නාහිමියෝ එය සෝමරත්න අත තැබූසේක. එයද සංකේතාත්මක අරුතත් සහිත ශාසනික සම්ප්‍රදයකි. තම හිසෙන් ඉවත් වූ කෙස් රොද අත්ල මත තබා සිටි සෝමරත්න එදෙස බලා සිටියේය. ගිහි ජීවිතයේ බැඳීම් මෙම කෙස් රොද මෙන් දැන් සපුරා ඉවත් කළ යුතුය.

කරකැත්ත වේගයෙන් සෝමරත්නගේ කෙස් වටා දිවෙයි. ඔහුගේ හිසේ සමේ පැහැය ටිකින් ටික මතුවෙයි.

සෝමරත්නගේ මවත්, පියාත් පුතු දෙස බලා සිටියේ දෙනෙතින් රූරා වැටෙන කඳුළු වැල් අතරිනි. මෙතෙක් දෙමසක කලක් තිස්සේ

## 4 සෝමරත්න පැවිදි බිමට

මා පිය සොයුරු සොයුරියන් සහ නෑ හිතවතුන්ගේ දුක් සෝ සුසුම් අතරින් සෝමරත්නගේ අභිනිෂ්ක්‍රමණය සිදු විය. ඉන්පසු අෂ්ටාංග ශීලය සමාදන් වූ උපාසකයකු ලෙසින් සෝමරත්න මහරගම ධර්මායතනයෙහි නතර විණි.

මේ අයුරින් උපාසකයකු ලෙස රැකිය යුතු වත් පිළිවෙත්, වැඩිය යුතු ගුණ දහම්, ප්‍රගුණ කළ යුතු ශාස්ත්‍ර මේ සියල්ලක්ම සෝමරත්න වෙතින් අතපසු නොවී පිළිවෙලින් සිදුවිය.

කලකට ඉහත මඩිහේ පඤ්ඤාසීහ මහා නාහිමියන් ඇතුළු මහා සංඝරත්නයෙහි අනුශාසකත්වයෙන් ඇරඹුණු 'තරුණ සවිය' නමැති තරුණ ආගමික සංවිධානය මහරගම ධර්මායතනයෙහි දීප්තිමත්ව බැබලෙමින් පැවති යුගයක් විණි. මේ වනවිට එය විවිධ හේතූන් මත කැඩී බිඳී තිබූ අතර යළි එය නඟා සිටුවීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරනට නියම සුදුස්සා සෝමරත්න බව පඤ්ඤාසීහ නාහිමියන්ගේ අදහස විය. එහෙත් දැන් ඊට බාධාවක් පවතී. පැවිදි බිමට අවතීර්ණ වීමේ අදහසින් ගිහිගෙයින් නික්ම උපාසක දිවියක් ගත කරන ඔහුට දැන් එවන් කාර්තව්‍යයකට මූලික විය නොහැක. එසේම ඇතැම් තරුණයන් මෙන් නොව සෝමරත්න උපාසක වත් පිළිවෙත් අකුරටම පිළිපදියි. අභිධර්මය

නිරෝගි සුවය ලැබුවාය. එම සුබ දිනයේ හතර වරිගයේම ඥාතීන්ගෙන් සහ හිතමිතුරන්, අසල්වාසීන්ගෙන් සෝමරත්නගේ නිවස පිරී තිබිණි.

අලුයම නා පිරිසිදු වූ සෝමරත්න සුදු ජාතික බැනියමකින් සහ සුදු සරමකින් සැරසී සිටියේය. මුළු නිවසම මළගෙයක බඳු සෝ සුසුම්වලින් පිරී ගොස් තිබිණි. අම්මාගේත්, තාත්තාගේත්, නංගිලා මල්ලිලාගේත් කඳුළින් තෙමී ගිය දෙනෙත් දුටු සෝමරත්න තුළ මහත් වූ සංවේගයක් ජනිත වුවත් තම සුපිරිසිදු අරමුණ පිළිබඳව සිතූ සෝමරත්න කඳුළක් නොසලා සිත දැඩි කරගෙන සිටියේය.

සුබ මොහොත එළැඹිණි.

සෝමරත්න පෙරටු කරගත් සියලු දෙනම නිවසින් පිටතට පැමිණියහ. රැස්ව සිටි සියල්ලන්ගේ කඳුළු දුක් සුසුම් අතරින්ම එලෙසින් සෝමරත්නගේ අභිනිෂ්ක්‍රමණය සිදුවිණි.

යනු ඔහුට දීර්ඝ කාලයකි. මාසයකට වැඩි කලක් ගතවූ මුත් මවගේ උණ තවමත් සුවවී නැත.

මෙවැනි සුබ කටයුත්තක් සඳහා නික්ම යනවිට නැකැත් බැලීම සිරිතකි. සෝමරත්න එබඳු හොඳ දවසක් පිළිබඳව විමසිල්ලෙන් පසුවූයේ එම දවසේ ඇති වැදගත්කම දක්වා එදිනට ගිහිගෙයින් නික්මීමේ අභිප්‍රාය ඇතිවය.

හරියටම මාස දෙකකින් එබඳු සුබ නැකතක් පවතින බව සෝමරත්නට දැන ගත හැකිවිය. එය උපයෝගී කරගනිමින් මාපිය ආශිර්වාදය ලැබ එදිනම ගිහිගෙයින් නික්ම යමියි සෝමරත්න දැඩිව අදිටන් කරගත්තේය.

'මේ දවසෙ හොඳ නැකතක් තියෙනවා අම්මෙ. කාලෙකට පස්සෙ එන හොඳ දවසක් මේක....' සෝමරත්න වරින් වර අම්මාට මතක් කර දුන්නේය.

කෙසේ හෝ පවුලේ සැමගේම එකඟත්වය මැද එදිනට සෝමරත්නගේ නික්මීම තීරණය කෙරිණ.

ඒ සුබ නැකත යෙදී තිබුණේ 1974 වසරේ ජූලි 20 දටය. එහෙත් හැම කෙනකුගේම සිත්වල යම් කුකුසක්, සංවේගයක් පැවතියේ මවගේ අසනීපය පිළිබඳවය. නැකත සකස් කරගෙන ආ පසුව වුවත් රෝගය එපරිද්දෙන්ම යටවෙමින් යළි මතුවෙමින් පැවතියේය. යම් හෙයකින් මෙය එදින වනවිටත් සුව නොවී පැවතිය හොත් සෝමරත්නගේ නික්ම යාමෙන් පසු තව තවත් එය වර්ධනය වනු නියතය.

එහෙත් කිසිවකු කිසිසේත් නොසිතූ පරිද්දෙන් අපූර්වතම දෙයක් සිදුවිය. තම කුසින් බිහිකළ පුතකු බුදු සසුනට පූජා කිරීම සැම මවකටම කරන්නට නොලැබෙන අන්දමේ මහඟු පින්කමකි. ඒ භාග්‍යය හිමිකර ගන්නා තමා ඉතාම වාසනාවන්ත පින්වත් මාතාවක වශයෙන් මඳින් මඳ තම සිත එකඟ කරගැනීමේ හැකියාව මවට හිමිව තිබිණි.

හරියටම ජූලි 20 දට දින දෙකක් ඉතිරිව තිබියදී මව සම්පූර්ණ

මව තවම තින්දේ පසුවෙයි. ඇගේ හිස මත ඔහු අත තැබුවේ මහත් වූ මව් සෙනෙහසකිනි.

'අම්මට සහලෝලා උණ' සෝමරත්න වටපිට බලමින් කීය.

තාත්තා සිය වේදනාව රැය පුරා නිදිවර්ජිතව පසුවෙමින් කඳුළු වැල් මගින් පිටකර හැර කෙසේ හෝ සිත හද ගන්නට ඇත. එහෙත්, විඳවිය නොහැකි දරු පෙම ළය මඩල තුළ තෙරපවාගෙන මහත් පීඩනයකින් කල් ගෙවූ අම්මාගේ ඒ පීඩනය පිටතට මතුවී ඇත්තේ ඇය ගිලන් කරවමිනි.

අම්මාට වෛද්‍ය ප්‍රතිකාර රැගෙන දුන්නද, ඇය ඉන් නිට්ටාවට සුවපත් වන බවක් නොපෙනිණි. මේ වනවිට පවුලේ ඥාතීන්, අසල්වැසියන් සහ හිතවතුන්ද සෝමරත්න පැවිදි වීමට යන පුවතත්, මවගේ අසනීපයත් අසා දැන වරින් වර මේ නිවසට පැමිණ ගියහ. විශේෂඥ වෛද්‍යවරුන් කිහිප දෙනකුටද පෙන්වා මවට ප්‍රතිකාර ලබාදී තිබුණද, ඇගේ උණ වරින් වරම හිස එසවූවා මිස මුළුමනින් සුවපත් වූයේ නැත. ඇය පරීක්ෂා කළ සෑම වෛද්‍යවරයකුම කියා තිබුණේ 'මේ අම්මාට කිසි ලෙඩක් නැහැ' යනුවෙනි. ඇයට අවශ්‍යව තිබුණේ වෛද්‍ය ප්‍රතිකාර නොව මානසික සුවයයි. ඒ මානසික සුවය ලද හැක්කේ ලොකු පුතාගේ අදහස වෙනස් කොට තමන් සමීපයේ රඳවා ගැනීම තුළින් පමණි.

'පුතාට පේනවනෙ අම්මට මේ තියෙන්නෙ හිතේ ලෙඩක්. ඒ නිසා ඔය අදහස දැන්ම ක්‍රියාත්මක කරන්න යන්න එපා. පුළුවන් තරම් අම්මගෙ හිත හදලා ඊට පස්සෙ කරන දෙයක් කරන්න.'

සෝමරත්නට මෙලෙස අවවාද කළ ඥාතීන් අතර එවකට මෙරට සිටි ප්‍රාචීන භාෂා පිළිබඳ මහා පඬිරුවනක් වූ මහාචාර්ය ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතාද විය. එතුමා මෙම පවුලේ ඥාතියෙකි.

මේ සියලු දෙනාගේම අදහස වූයේ ගිහිගෙය හැර යාම වසරකටවත් කල් දමන ලෙසය.

සියල්ලන්ම මෙසේ කීවත් තම පරම පිවිතුරු අධිෂ්ඨානය ඉටුකර ගැනීමට සෝමරත්න කල් යල් බලමින් පසුවිය. වසරක්

නමුත් මේ වැයම ඔහුගේ සිතැගියාවන්ට විරුද්ධව කරනු ලබන පැලැස්තර ඇලවීමක් පමණි. බුදු දහමට අනුව මෙය සාංසාරික පුරුද්දක් විය හැක. එබැවින් හදවත පුරා ඇවිලෙන දරු කැක්කුම ඉවසාගෙන හෝ ඔහුට ආශිර්වාද කරන්නට වෙලාව පැමිණ ඇතැයි පියාට සිතිණි.

'ලොකු පුතා අවුරුදු ගාණක ඉඳලා නේද අපෙන් ඔය අවසරය ඉල්ලන්නෙ? අපි හිත හදගෙන ඒ දරුවගෙ කැමැත්තට ඉඩ දෙමු.'

පුතුට නොඇසෙන පරිදි ඔහු සිය බිරිඳට කීය.

එහෙත් මේ නම් ඇය කිසිසේත් අපේක්ෂා කළ දෙයක් නොවේ. ලොකු පුතා මොනවා කීවත් පියාගේ විරුද්ධත්වය හේතුවෙන් ඒ සිතිවිලි අත්හැර ගනීවි යැයි ඇය නිරතුරුවම අපේක්ෂා කළාය. එහෙත්, දැන් එය නොපිට පෙරලෙමින් පවතී. මෙය කෙසේ වාවා ගන්නදැයි ඇයට තේරෙන්නේ නැත.

එදිනම තම බාල දූ පුතුන්ද කැඳවූ පියා සෝමරත්නගේ මේ අදහස පිළිබඳව ඔවුන්ටද දන්වා සිටියේය. එදින මුළු නිවසේම වූයේ ගුප්ත නිහැඬියාවකි. මුව නිහඬ වුවද ඔවුන්ගේ හදවත් බොහෝ දේ කතා කරන්නට ඇත. අයියා ගිහිගෙයින් නික්ම යන්නට යන ගමන ඔවුන් තම තමන්ට හැකි අයුරින් එසේ විඳ දරා ගනිමින් සිටියා විය හැක.

පුදුම තරමේ සැනසුම් සහගත බවකින් නින්දට ගිය සෝමරත්න පසුදින අවදි වූයේද එම ප්‍රසන්න හැඟුමින්ම යුතුවය. එහෙත් ඔහු අවදි වනවිට පෙරදා වූ නිහැඬියාවට අමතරව මහත් දුක්බර වටපිටාවක් පවතින බව වටහා ගන්නට අසීරු නොවිණි.

තාත්තා නිහඬව කල්පනාහරිතව බලා හිඳියි. ඔහුගේ දෙනෙත් රතුවී ඉදිමී ඇත. එය හඬා වැළපුණ බවට ලකුණුය.

'තාත්තා ඊයෙ මුළු රෑම නිදි නැ. ඉස්සරහා අර ගහක් යටට වෙලා අඬ අඬා ඉඳලා' පවුලේ කෙනකු පවසනු සෝමරත්නට ඇසුණි. ඔහුගේ සිත ශෝකයෙන් බර විය. සෝමරත්න මව සොයා ගියේය.

මේ වනවිට ඔහුගේ සිත පුරා පැතිර තිබුණේ මින් පෙර කිසි දිනෙකත් සිය ජීවිතය තුළ අත් නොවිඳි තරමේ අස්වැසුම් සහගත බවකි. ගතින් තවමත් ගිහියෙකු වුවද, සිතින් පැවිද්දකු බවට පත්ව සිටි සෝමරත්න යළි නිවසට පැමිණියේය.

'අම්මෙ මං රාහුල හාමුදුරුවන්ටත් කිව්වා ඔන්න මං මහණ වෙනවට අම්මලා කැමතියි කියලා' නිවසට පැමිණි විගස මව වෙත සෝමරත්න කීය.

එහෙත් මවගේ දෙනෙතෙහි ඇඳුණේ විස්මයාතුකූල බවකි.

'මොනවා, මං කිව්වද පුතා මහණ වෙනවට කැමතියි කියලා?'

'ඇයි අම්මෙ, අම්මා කිව්වෙ මහණ වෙන එක නරක නෑ කියලා' සෝමරත්නගේ වදන් තුළ වූයේ සැහැල්ලු බවකි.

'ඉතින් පුතේ මං එහෙම කිව්වට පුතාට මහණ වෙන්න කියලා මං කිව්වෙ නැනෙ.'

තමා දුරදිග නොසිතා කියූ වදනක් ඔස්සේ ගොස් පුතු තමා හැරද යාවි යන බියෙන් යුතුව මව කීවේ සැලෙන දෙතොල් අතරිනි.

'දැන් ඉතින් මොකද කරන්නෙ? මං රාහුල හාමුදුරුවන්ටයි, නායක හාමුදුරුවන්ටයි ගිහින් කියලයි මේ ආවෙ.'

මින් සෝමරත්නගේ මව පත්වූයේ මහත් අපහසුතාවයකටය.

'මං දන්නෙ නෑ ඕවා. තාත්තත් එක්ක බේරුමක් කරගන්න' මව කීවේ සැමියා කිසිවිටකත් මේ සඳහා සෝමරත්නට අවසර නොදෙන බව දත් නිසාවෙනි.

පුතුගේත්, බිරිඳගේත් සංවාදය ඒ වනවිටත් නිවසේ සිටි පියාට ඇසෙමින් තිබිණි.

සිය වැඩිමහල් පුතු වසර ගණනාවක සිටම පැවිදි වන්නට අවසර ඉල්ලමින් හිඳින බව පියාට නොරහසකි. දරු දුකට වඩා දුකක් මව්පියනට නැත. එනිසාම පුතු ගිහිගෙට නැවත නොඑන්නටම නික්ම යාම සඳහා වසර ගණනාවක් තිස්සේ දැරූ වෑයම තමන් විසින් ආයාසයෙන් වළකාගෙන තිබිණ.

අෂ්ඨාංග ශීලය සමාදන් වෙලා උපාසකයෙක් විදියට කාලයක් පන්සලේ ගත කරන්න ඕනෙ. ඊටත් පස්සෙයි මහණ වෙන්න ලැබෙන්නෙ. මහණ වුණාට පස්සෙත් සාමණේර නමක් විදිහට ඉඳගෙන රැකිය යුතු දැන කියා ගත යුතු පිළිවෙත් බොහොමයි.'

දරුවකු කෙරෙහි සෙනෙහස මුසු අනුකම්පාවෙන් කරුණු පහදා දෙන දයාබර පියකු මෙන් රාහුල හිමියෝ පැවසූහ.

'එහෙයි හාමුදුරුවනේ, මම ඒ බව දන්නවා.'

'සාමණේර නමකට පිළිපැදිය යුතු වතාවත් බොහොමයි. අතු පතු ගෑම්, කාණු සේදීම් පමණක් නෙමෙයි පන්සලේ පඩික්කම් සේදීම පවා ඒ වතාවත්වලට අයිතියි. දන්නවනෙ සෝමරත්න මහත්තයා.'

රාහුල හිමියන් පැවසුවේ සෝමරත්න අධෛර්යය කරවන අදහසින් නොවේ. සිවුරක් හැඳ විහාරස්ථානයට වී ගෙවන ජීවිතය ආශ්වාදනීය වුවක් වශයෙන් මෙම තුරුණු විය තුළ ඇතැමකුට හැඟෙන්නට පුළුවන. ඒ ඔස්සේ මහණ වෙන්නට සිතුවොත් එම දිවිය ඉතාමත් කෙටි කලකින් එපා වනු නියතය.

'මම මහණ වෙන්න හිතුවෙ මීට අවුරුදු ගණනාවකට කලින් ඉඳලමයි හාමුදුරුවනේ. මං දන්නවා සාමණේර හාමුදුරු නමකගෙ වගකීම් සම්භාරය. ඒ ඕනෑම දෙයක් මට කරන්න පුළුවන් හාමුදුරුවනේ.'

සෝමරත්න පැවසුවේ මහත් වූ උද්‍යෝගයෙන් යුතුවය. රාහුල හිමියන්ට සෝමරත්නගේ දෙනෙතේ දිදුලන අධිෂ්ඨාන ශක්තිය පෙනිණි. මේ තරුණයා මතු මෙරට බුදුදහම රැකගැනීම උදෙසා අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියාකරන හොඳ භික්ෂූන් වහන්සේ නමක් වන බවට රාහුල හිමියන් ඒ වනවිටත් අවබෝධ කරගෙන හිඳින්නට ඇත. උන්වහන්සේ සෝමරත්නට සිය ආශිර්වාදය පළකොට සිටියේ එබැවිනි. මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන්ද බැහැ දැක මෙපුවත දන්වා උන්වහන්සේගේද ආශිර්වාදය ලැබ සෝමරත්න ධර්මායතනයෙන් පිටවිය.

# 3 සෝමරත්න ගිහි ගෙයින් නික්මෙයි

"මහණ වෙන එක නම් නරක දෙයක් නෙවේ" යනුවෙන් අම්මා කීවේ බොරුවට නොවේ. නමුත් එය සෝමරත්නට මහණ වීම සඳහා දුන් අනුමැතියක්ද නොවේ. එසේ වුවද මවගේ එම වදන් තුළින් සෝමරත්නට ලැබුණේ මහත් වූ දිරියකි. අස්වැසිල්ලකි.

ඔහු එදිනම අම්පිටියේ රාහුල හිමියන් බැහැදැකීම සඳහා මහරගම ධර්මායතනයට ගියේය. මෙම ආරංචිය මුලින්ම රාහුල හිමියන් වෙත දැන්වීම සඳහා සෝමරත්නට බලපෑ අනෙක් ප්‍රධානතම හේතුව වූයේ "නරකද පුතා මහණ වුණොත්?" යනුවෙන් ඊට දෙදිනකට පෙර රාහුල හිමියන් විමසා තිබීමය.

"හාමුදුරුවනේ, මං මහණ වෙන එකට අම්මලාගෙන් විරුද්ධත්වයක් නෑ වගේ."

රාහුල හිමියන්ගේ දෙපා වැඳ ඉදිරියෙන් වූ මිටි අසුනේ වාඩිවෙන අතරේම සෝමරත්න කීවේ ප්‍රීතිය උතුරා යන දෙනෙතින් යුතුවය.

එහෙත්, උන්වහන්සේගේ මුහුණේ ඇඳුණේ සතුටක් නොව බැරෑරුම් පෙනුමකි.

"පුතා, මහණ වෙනවයි කියන එක එකපාරටම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. මුලින්ම ගිහිගෙය අතැරලා ඇවිත්

සෝමරත්නගේ මේ වෙනස, ඔහුගේ ගති ගුණ හොඳින් දැන හිඳින නැගණියට නොදැනුණා නොවේ.

'මෙයාට මොනවා වෙලාද මන්ද, බලාගත්තු අතේ බලාගෙන. ලොකු අයියා ඔහොම ඉන්න කොට මට විතරක් පුළුවන්ද මේ හැම එකක්ම තනියෙන් කරන්න?'

නංගීගේ ඒ කතාවෙහි ඇත්තක් තිබේ. ඇගේ කෝපයද සාධාරණය. නංගීට කිසිවක් නොකියාම වෙළෙඳ සලෙන් පිටවූ සෝමරත්න ගෙතුළට පිවිසිණි.

අවේලාවේ නිවසට ආ සිය ලොකු පුතු දැක අම්මාට පුදුම සිතිණි.

පුතුගේ මුහුණේ ඉරියව්ද ඒ තරම් හොඳ නැත. නංගී සමග කුමක් හෝ ගැටුමක් ඇති කර ගත්තේදැයි අම්මා තුළ ඇතිවූයේ සැකයකි.

'මොකද පුතේ, මේ අවේලාවෙ කඩේ වහලත් නැතුව ගෙදර ආවෙ? නංගිත් එක්ක රණ්ඩු වුණාද?' පුතු දෙස විමසිල්ලෙන් බැලූ අම්මා ඇසුවාය.

'එයාලටම ඒවා කරගන්න කියන්න අම්මෙ. මට මේවා ගැළපෙන්නෙ නෑ. කොහොමත් මට මේවට කිසි ආසාවකුත් නෑ. මට හිතෙනවා මේ සේරම දලා ගිහින් මහණ වෙන්න.'

සෝමරත්න තම සිත තුළින් පොබයන පැතුම එසේ යළි අවධාරණය කළේය. තම පුතු කුමක් හෝ නොසතුටකින් පසුවන බව පෙනේ. ඒ නිසා අවස්ථාවේ හැටියට පුතුගේ හිත තවදුරටත් තැලීම නුසුදුසු බැවින් 'මහණ වෙන එක නම් නරක දෙයක් නෙවෙයි තමා' යැයි මව කීවේ වැඩිදුර සිතා බලා නොවේ. ඇයට එය ඉබේම කියවුණි. එසේ කියාගෙනම මව ගෙතුළට ගියමුත් නව පණක් ලද්දක් මෙන් පස්වනක් ප්‍රීතියෙන් පිනා ගිය සෝමරත්නගේ මුවඟට සැනසුම් සුසුමක් නැංවෙන ලද්දේ නිරායාසයෙනි.

හා පිළිසඳර කතාබහේ පසුවෙද්දී රාහුල හිමිපාණන්ට අපූරු අදහසක් පහළ විය.

˙ගනිමුකො බලන්න සෝමරත්න මහත්තයගෙ අත පොඩ්ඩක්.˙

සෝමරත්නගේ දකුණත වෙත නෙත් හෙලූ නාහිමිපාණන් පැවසූ සේක. ඒ අනුව සෝමරත්න සිය දකුණත උන්වහන්සේ වෙත පෑවේය. එම දකුණතේ රේඛා හොඳින් පිරික්සමින් සිටි රාහුල හිමියන්ගේ මුහුණෙහි මදහසක් ඇඳී යනු සෝමරත්නට පැහැදිලිවම පෙනුණි. අනතුරුව ඒ මදහසින්ම සෝමරත්නගේ මුහුණ බැලූ රාහුල හිමියන් විමසුවේ සෝමරත්න කිසිසේත් බලාපොරොත්තු නොවූ පැනයකි.

˙නරකද පුතා මහණ වුණොත්?˙ පුතා යනුවෙන් අමතමින් නාහිමියන්ගේ මුවින් පිටවූ එම වදන් තුළින් සෝමරත්නට දැනුණේ අසමාන වූ සතුටකි. එහෙත් ඒ සමගම ඔහුගේ සිතට ශෝකයක්ද පිවිසුණි. දෙමාපිය අවසරය නොමැතිව කෙසේ නම් මහණකමට එළඹෙන්නද?

˙මං නම් හරිම කැමතියි හාමුදුරුවනේ. මගේ තියෙන එකම බලාපොරොත්තුවත් ඒකයි. ඒත් මගේ දෙමාපියෝ මට ඒකට අවසර දෙන්නෙ නෑ හාමුදුරුවනේ.˙

සෝමරත්න පැවසුවේ කණගාටුවෙනි.

කෙසේ වුවද රාහුල හිමිපාණන්ගේ එම වදන්වලින් සෝමරත්නට ලැබී තිබුණේ නව පනකි. හරියටම කිවහොත් ගං ඉවුරේ නවතා තිබෙන ඔරුවක් යමකු දියඹට තල්ලු කළ විට එය කෙමෙන් චලනය වෙමින් දියඹෙහි ඇදී යන්නාක් මෙනි. මහණකමට තිබූ කැමැත්ත රාහුල හිමියන්ගේ වදන් මතින් නව දළුලා වැඩෙද්දී මිරිහානේ තිබූ තම ව්‍යාපාරික ස්ථානයේ කටයුතු කිරීමට තිබූ උනන්දුව තව දුරටත් ඔහුගේ සිතින් ගිලිහී යන්නට විය. කයින් ගිහියකු වූ තමන් දැන් මනසින් ශ්‍රමණයකු බව සෝමරත්නට හැඟේ. ඒ නිසාම එදිනෙද ව්‍යාපාර කටයුතු ඔහු වෙතින් ගිලිහී යන තත්ත්වයක් උදවිණි.

කටයුතු මෙම විහාරස්ථානයන්හි කවදත් මහ ඉහළින්ම සිදු කෙරිණි. ඒ අනුව පුන් පෝ දිනවල පැවැත්වෙන තරුණ ශීල සමාදනය, වැඩිහිටි ශීල සමාදනය වැනි ශීල සමාදන කටයුතුවලටද අතිවිශාල ජනකායක් නිරතුරුවම සහභාගි වූහ. මෙවැනි කටයුතුවලදී සෝමරත්නත් නොවරදවාම එම ස්ථානවල සිටි අතර පසුව ඔහු ඒවාට නැතිවම බැරි කෙනෙක් බවට පත්ව තිබිණි. විසි වයස්වල පසුවූ යොවුන් තරුණයකු වූ ඔහුගේ ධර්මඥානය මේ වනවිට කොතරම් දියුණු තත්ත්වයට පත්ව තිබුණේද යත් මෙම ශීල සමාදනවලට සහභාගි වූ තරුණ මෙන්ම නුවණින් මුහුකුරා ගිය වැඩිහිටි ගිහි පින්වතුන්ට පවා සෑම පෝ දිනෙකම ධර්මානුශාසනාවක් කිරීමට සෝමරත්නට පැවරී තිබිණි. සෝමරත්නගේ මුහුකුරා ගිය ධර්ම ඥානය පිළිබඳව කිසිවකුටත් ගැටලුවක් නොවිණි. ඒ බව දත් එම විහාරස්ථානවල වැඩ විසූ අධ්‍යාපනය ලබන සාමනේර භික්ෂූන් වහන්සේලා පවා ධර්මය සම්බන්ධ තමන්ට ගැටලු පැන නැගුණු අවස්ථාවලදී "අපි ඕක සෝමරත්න මහත්තයගෙන් අහමු" යැයි කතාවෙන තරමට එම තත්ත්වයෙහි සුබදයී වර්ධනයක් දක්නට ලැබිණි.

මේ අනුව මහණකමට උචිත මාවතක් පිළියෙළ වෙමින් පැවතියද මහණ වීම සඳහා අනිවාර්යයෙන් ලද යුතුවූ මා-පිය අවසරය ලද නොහැකි වීමෙන් මේ අදහස දවසින් දවසම කල් ගියේය. එය ඉටුවන බවට සලකුණක් හෝ නොවීය. අම්මා සමග මේ පිළිබඳව නොයෙක් වර කතා කර තිබුණත්, තාත්තාගෙන් මේ සම්බන්ධ සෘජුව විමසන්නට සෝමරත්න පසුබැවේය. අන් බොහෝ පවුල්වල මෙන් සෝමරත්නලාගේ පවුලේද පියා සහ දරුවන් අතර සම්බන්ධීකරණ කටයුතු සිදුවුණේ මව හරහාය. නමුත් වෙනත් කුමන දේකට වුවද ලද හැකි අනුකූලතාවය මේ වෙනුවෙන් ලද නොහැකි වූයෙන් පියා සමග මේ පිළිබඳව කතා කරන්නට සෝමරත්නද පසුබැවේය.

අම්පිටියේ රාහුල නාහිමිපාණන් වහන්සේ මෙකල බොහෝ විට වැඩ වාසය කළේ මහරගම ධර්මායතනයෙහිය. උන්වහන්සේවද සෝමරත්න තරුණයා සමීපව ඇසුරු කළේය. දිනක් සෝමරත්න

වාර්තාවලට අනුව එය දහතුන් දහසක් බව කියැවුණත් නිල නොවන පිළිගත් වාර්තාවලට අනුව එය එමෙන් පස් ගුණයකි. 89 භීෂණය මෙන් ව්‍යාප්ත නොවුණද, විශාල තරුණ සංහාරයක් මෙහිදීද සිදුවිය.

මෙබඳු ව්‍යසනකාරී වාතාවරණයක් හමුවේ වුවද සෝමරත්නට නිවස හෝ මගතොට සැක කටයුතු හෝ අවදනම් සහගත තැනක් වූයේ නැත. ඔහු වෙනද මෙන්ම තම වුවමනා එපාකම් සඳහා මහ පාරේ එහා මෙහා ගියේය. එහෙත් පොලිසියට ඔහු සැක කටයුතු අයකු වූයේ නැත.

සිය වැඩිමහල් පුතුගේ මේ ක්‍රියාකලාපය ඔහුගේ පියා නිහඬව බලා සිටියේය. විශ්ව විද්‍යාල උපාධියක් නොතිබුණත්, ජීවිතය නමැති විශ්ව විද්‍යාලයෙන් ලද පරිචය හමුවේ තම පුතු පිළිබඳව ඔහුට හොඳින් කරුණු අවබෝධ කරගත හැකි විය.

'ලොකු පුතා එයාගෙ අදහස වෙනස් කරගන්න එකක් නැහැ වගේ?' ඔහු පුතුට නොදැනෙන සේ බිරිඳට පැවසීය.

පුතු තවමත් පැවිදි බිමට එළැඹීම පිළිබඳ අදහසින් සිටින්නේය යන්න ඇසීම පවා මවගේ සිතට මහත් කම්පනයක් දැනවීමට සමත් විය. එහෙත් කිසිවිටක 'උඹ, බං' කියාවත් දරුවකු අමතා නොතිබූ මේ මවට පුතුගේ හිත රිදවීම කිසිසේත් කළ නොහැකිය.

දරුවකු සසුනට පූජා කිරීම හතර වරිගයම නිවන් යන පින්කමක් බව ඇය බණ කතාවලින් අසා තිබිණ. එහෙත් තම දූ දරුවන් පස්දෙනාගෙන් එක දරුවකුවත් පවුලෙන් පිටමං වී යාම ඇයට සිහිනෙන්වත් නොසිතිය හැකි දුක්බදයක දෙයකි. ඒ වියෝ වේදනාව දරන්නට තරම් ඇගේ සිත ශක්තිමත් වූයේ නැත.

මේ කාලය වනවිට සෝමරත්න වජිරාරාමයේත්, ධර්මායතනයේත් සමීපතමයකු බවට පත්ව සිටියේය. කවදත් මෙරට අතිශය කීර්තිමත් පින් බිම් වශයෙන් සලකනු ලබන මෙම විහාරස්ථානවල ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලාගෙන් අඩුවක් නොවිණි. ඒ නිසාම අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ හිමි, අතිපූජ්‍ය නාරද හිමි ඇතුළු නාහිමිපාණන් වහන්සේලාගේ මූලිකත්වයෙන් යුතුව විවිධ ආගමික

පන්සල් ගමන දවසින් දවසම වැඩි දියුණු විය. නිමල්ගේ වෙළෙඳ සල එන්න එන්නම කුඩා වී බිඳ වැටීමක් සිදු නොවූයේ ඔහුගේ බාල සොයුරු සොයුරියන් ඒ පිළිබඳව කැපවීමෙන් සහ උත්සාහයෙන් යුතුව සොයා බලා කටයුතු කිරීමේ හේතුවෙනි. එසේ නොවන්නට ඔහුගේ වෙළෙඳ සල වැසී යාමටද හොඳටම ඉඩකඩ තිබිණි.

මේ තරුණ උපාසක මහතා මීරිහාන ගමට දැන් අමුත්තෙක් නොවේ. දිනපතා සිය නිවසේ සිට මීරිහාන පොලිසිය ඉදිරිපිට වූ පරණ කොට්ටාව පාරෙන් එහා මෙහා ගිය මේ තරුණයාගේ සුවිශේෂත්වය පොලිසියේ නිලධාරීන් පවා දැන සිටියේය.

1971 වසරේ මෙරට හදිසියේම පැන නැගුණු අප්‍රේල් කැරැල්ල ආරම්භ වූයේද මෙසමයේදීමය. අප්‍රේල් 5 දින වැල්ලවාය ඇතුළු පොලිස් ස්ථාන රැසකට ජනතා විමුක්ති පෙරමුණේ ආයුධ සන්නද්ධ පිරිස් විසින් පහර දී තිබිණි. ඒ අනුව එය පොලිසියට තරුණයන්ව නයාට අඳුකොළ මෙන් පෙනුන කාලයක් විය. ඒ නිසාම තරුණයකු නිකරුණේ තබා වුවමනාවකටවත් මහ පාරේ ඇවිද යාම බියකරු වන තත්ත්වයක් උදවී තිබිණ.

වරක් සෝමරත්නලාගේ අසල්වැසි වෙළෙඳ සලක තරුණයකු නිවසේ ඉදිරිපස සිට කිසියම් අවශ්‍යතාවයකට ඉක්මන් ගමනින් ගෙතුළට ගියේය. හරියටම මේ මොහොතේම ඒ නිවස ඉදිරිපස පාරේ ජීප් රථයකින් ගමන් ගනිමින් සිටි පොලිස් නිලධාරීන් කිහිප දෙනකුට මේ තරුණයා පිළිබඳව සැක සිතිණි. ඔහු ගෙතුළට වැදුණේ පොලිස් ජීප් රිය දුටු නිසාවෙන් යැයි ඔවුහු අනුමාන කළහ. වහාම ජීප් රිය ඒ නිවස ඉදිරිපිටම නතර කළ පොලිස් නිලධාරීහු ගෙතුළට පැන එම තරුණයාව අත්අඩංගුවට ගත්හ.

මේ තරුණයා දින ගණනාවක් ආගිය අතක් සොයා ගැනීමට පවා නොහැකි විය. වාසනාවකට මෙන් මෙම තරුණයාට එවකට පැවති සමගි පෙරමුණු රජයේ ප්‍රබලතම ඇමැතිවරයකු හා දුර නෑකමක් තිබිණ. ඒ නිසාම තරුණයාගේ ජීවිතය අනූ නවයෙන් ගැලවිණි. මේ ආකාරයට කිසිදු වරදක් නොකළ අහිංසක තරුණයන්ද රාශියක් එද පොලිසියෙන් මැරුම් කෑහ. නිල

# 2 පැවිද්දට අවසර නොලැබ ගිහි බණ කියයි

අභිධර්මාචාර්ය ඒ. ඩී. එම්. බුද්ධදාස මහතා වෙතින් අභිධර්මය හැදෑරීම නිසා සෝමරත්නගේ ධර්ම ඥානය සම්බන්ධ කඩඉම් වේගයෙන් පුළුල් වන්නට විය. ඒ අනුව ඔහු තමා ළඟ තිබෙන ධර්ම පොත්වලට අමතරව ධර්මායතනයෙන් සහ වජිරාරාමයෙන්ද සපයා ගත් ධර්ම පොත් කියැවූයේ මහත් අභිරුචියකිනි. මදින් මද මෝරා එන පුර සඳක් බඳුව ඔහුගේ ධර්ම ඥානයද කෙමෙන් වැඩෙන්නට විය.

සෝමරත්න මෙසේ අධ්‍යාත්මික සංවර්ධනය ඔස්සේ දිනෙන් දිනම ලෝකෝත්තර පක්ෂයට නැඹුරු වෙද්දී, ඔහුගේ අඹයහළු නිමල් ආර්ථික සංවර්ධනය ඔස්සේ සිය ලෞකික පක්ෂය වැඩි දියුණු කරගනිමින් සිටියේය. ඒ අනුව නුගේගොඩ ඇරඹූ සිය ව්‍යාපාරය සාර්ථක කරගැනීමේ අභිප්‍රායෙන් මහත් උත්සාහයෙන් කටයුතු කළ නිමල්ගේ වජිරාරාමයට යන ගමන් බිමන් පවා මඳක් සීමා වූයේ ඉබේමය. ඒ සඳහා ඕනෑකමක් තිබුණත් කාලය ඔහුට හරස් වී තිබිණි.

සෝමරත්නගේ පැත්තෙන් සිදුවූයේ එහි අනෙක් පැත්තය. බුදු දහමට තිබූ උනන්දුවත්, මහණ වෙන්නට අවසර නොලදත් ඒ පිළිබඳව තිබූ නොසංසිඳෙන ආශාවත් හමුවේ සෝමරත්නගේ

කරුණු එකින් එක අවබෝධ කරගන්නටත් ලැබීමෙන් ඔහු ලැබුවේ අප්‍රමාණ සැනසීම මුසු තෘප්තියකි. එය බුදු දහම තුළින් ලැබෙන අපූරු සංතුෂ්ටියක් ලෙස ඔහු දුටුවේය. ත්‍රිපිටක සජ්ජායනාව අවසන් වනතුරුම නොවරදවාම දවසක් නෑරම ඔහු ඒ පුන්‍ය කටයුත්තට සහභාගි වූයේය.

වජිරාරාමයේ පමණක් නොව සිරි වජිරඥාන ධර්මායතනයෙහි පවා සංඝයා. වහන්සේලා මෙන්ම ගිහි දයකවරුන්ද මේ තරුණ උපාසක මහතාව දැන හඳුනා ගෙන වැඩිකල් නොවිණි. මිරිහානේ ඔහුගේ අසල්වැසියන් පවා මේ නව යොවුන් තරුණයා තුළ පැවැති ආගම දහම කෙරෙහි වූ උනන්දුව දැන සිටියේය. මේ නිසාම සෝමරත්නගේ වෙළෙඳ සැල ප්‍රදේශවාසීන් අතර 'උපාසක මහත්තයාගෙ කඩේ' යනුවෙන් ප්‍රසිද්ධව තිබිණි. දවසින් දවසම මෙලෙස වර්ධනය වෙමින් පැවැති පැවිදි බිමට පිවිසීමේ ආශාව දෙමාපියන්ගේ නොකැමැත්ත මතින් එන්න එන්නම කල් ගියේය. අදහස ඉදිරිපත් කළ හැම මොහොතකම අම්මාගේ පිළිතුර වූයේ 'ඔය අදහසට අපි කොහොමටවත් කැමති නෑ, ඕක හිතින් අත්අැර ගනින් ලොකු පුතේ' යනුවෙනි.

සෝමරත්න ඇතුළු පස් දෙනකුගෙන් යුතු දරු පවුල පෝෂණය කළේ තරමක අසීරුකම් මධ්‍යයේය.

මේ නිසා පියාට යම් සැහැල්ලුවක් ඇතිකර දීමේ අපේක්ෂාව සෝමරත්න තුළත් නොතිබුණාම නොවේ. එමනිසාම මහත් උත්සාහයෙන් කටයුතු කළ සෝමරත්න සොයුරු සොයුරියන්ගේද සහාය ඇතිව පසුව මිරිහානේම වෙළෙඳ සැලක් දමා ගන්නට සමත් විය.

තමාගේ පවුලේ ව්‍යාපාරයන්ට අත ගැසූ පසුව වුවද මුලින් තිබූ ආකල්පය වෙනස් කර ගැනීමට සෝමරත්න අපොහොසත් විණි. මුදල් ලැබෙන්නට ලැබෙන්නට ඒ සඳහා ගිජු වන ස්වභාවයක් මිනිසා තුළ පවතී. එහෙත් එහි එබඳු ඇලීමක් සෝමරත්න තුළ නොවීය. එකල විසූ ඉතාමක් ප්‍රකට ධර්මධරයකු වූ ඒ. ඩී. එම්. බුද්ධදාස මහතා සිය නුගේගොඩ නිවසේ සතියේ අඟහරුවාද දිනවල පැවැත්වූ අභිධර්ම පංතියට සෝමරත්න නොවරදවාම සහභාගි විය. සෑම පුන් පෝ දිනකම වජිරාරාමයේදී සීල සමාදන් ඇතුළු ආගමික කටයුතුවලටද දයක විය. මේ නිසාම අඟහරුවාද දිනවල සවස 5.00 ට පැවැත්වෙන අභිධර්ම පංතියට යාම සඳහා සවස 4.00 ටත්, පුන් පෝ දිනවල දවස පුරාමත් සෝමරත්නගේ වෙළෙඳ සැල වසා තිබිණි. ඒ දිනවල ලැබෙන්නට නියමිත ලාභය අහිමිවීම පිළිබඳ අංශුමාත්‍රයක ළතැවිල්ලක් ඔහුට දැනුණේ නැත.

මහරගම වජිරඥාණ ධර්මායතනයෙහි අලුතින් ඉදිකරන ලද සංඝාවාසය විවෘත කිරීම වෙනුවෙන් ත්‍රිපිටක සජ්ඣායනාවක් ඇතුළු දිනපතා ධර්ම දේශනා පැවැත්වෙන බව සෝමරත්නට දැනගන්නට ලැබුණේ ඔහුගේ නැගණියගෙනි.

'අපිත් යමුද අයියෙ?' නංගී කළ යෝජනාව සෝමරත්න හිස් මුදුනින්ම පිළිගත්තේය.

දිනපතා මීට සහභාගි වන අතරේ තමා කිසියම් විශේෂිත ධර්ම ඥානයක් ලබමින් හිඳින බව සෝමරත්නට මඳින් මඳ පැහැදිලි වන්නට විය. ධර්ම කරුණු එකින් එක සොයන්නත්, ඒ ඔස්සේ

මෙකල වජිරාරාමයේ වැඩි විසූ නුවරඑළියේ විමලතිස්ස නමැති ස්වාමීන් වහන්සේ නමක් තිස්ස බෝසත් ශිෂ්‍ය සම්මේලනය නමින් තරුණ දරුවන් ඒකරාශී කරගෙන ක්‍රියාකාරී සංගමයක් ඇති කරගෙන තිබිණි. මෙහි කුදු මහත් සියලු කටයුතු සෝමරත්න මෙන්ම ඔහුගේ හිත මිතුරු නිමල් සහ තවත් පිරිමි දරුවන් රැසක් මහත් උනන්දුවෙන් සහ කැපවීමෙන් යුතුව ඉටු කළහ. 'මටත් කවදා හෝ පැවිදි බිමට පිවිසෙන්නට ඇත්නම්' යන සිතිවිල්ල අංකුර බීජයක් ලෙසින් රෝපණය වන්නට සෝමරත්නට බලපෑවේ මෙම නුවරඑළියේ විමලතිස්ස හිමියන්ගෙන් ලද ඇසුරයි. එහෙත්, මේ අදහස දෙමව්පියන් හමුවේ ඉදිරිපත් කිරීමේදී සෝමරත්නට ලැබුණේ ඇණුම් බැණුම් පමණි. සොයුරු සොයුරියෝ 4 දෙනකුට අයියා වශයෙන් උපන් තම කුළුඳුල් පුතු ගිහි ගෙයින් නික්මී සසුන් මඟට පිවිසෙනු දැකීම ඒ මාපියන්ගේ සිතට ඉහිලුම් නොදෙන්නක් වන්නට ඇත. එනිසා ඔවුහු හැමවිටම සෝමරත්නගේ ඉල්ලීම බැහැර කළහ.

කෙසේ වුවද හැම ඉරිදවකම වජිරාරාමයට යෑම සෝමරත්න වෙතින් අත් නොහැරිණි. දහම් පාසලේත්, තිස්ස බෝසත් ශිෂ්‍ය සම්මේලනයේත් පොදු කටයුතුවල ඔහු ඉතා උනන්දුවෙන් යුතුව නියැළුණේය. ඔහුගේ නිවසේ පෞද්ගලික පොත් රාක්කය පිරී තිබුණේ පාසල් විෂයන්ට අදාළ පොත පතින් නොව බුදු දහම සම්බන්ධ පොත පතිනි. විවේක ඇති හැම විටකම සෝමරත්න ඒවා එකක් නෑර කියවීය.

සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දීමෙන් පසුව නිමල් රණසිංහ ඔහුගේ පියාගේ උපකාරයෙන් නුගේගොඩ නගරයේ වෙළෙඳ සැලක් දමා ගත්තේ පාසල් අධ්‍යාපනයට ආයුබෝවන් කියමිනි. දිගින් දිගට අධ්‍යාපනය ලබා ඒ ඔස්සේ යම් ස්ථාවරයකට ඒමේ අපේක්ෂාවක් නොව ඉන් මුළුමනින්ම පරිබාහිර මඟක් වෙත සිත යොමුකර තිබූ සෝමරත්න ඊට අවකාශයක් නොලද්දේ තම හිත මිතුරාගේ වෙළෙඳ සැලට වී ඔහුගේ ව්‍යාපාර කටයුතුවලට සහාය දෙන්නට පටන් ගත්තේය.

කොළඹ මහ නගර සභාවේ රැකියාවක නියුතුව සිටි පියා

කියවන්නට කියවන්නට තව තවත් විමසා බැලීමට සිතෙන අන්දමේ අපූරු උනන්දුවක් ඔහු මේ දහම් පොත්පත් ඇසුරින් ලැබීය. මේ උනන්දුව වඩාත්ම දැඩි වූයේ මිරිහානේදී ඔහුට හමුවූ නිමල් රණසිංහ මිතුරා සමග බම්බලපිටියේ වජිරාරාමයේ දහම් පාසලට ඇතුළත් වූ පසුය.

නිමල් රණසිංහ කුඩා වියේ සිටම දහම් පාසල් අධ්‍යාපනය ලැබුවේ වජිරාරාමයෙනි. එම නිසාම එම දහම් පාසලට යාමේ බලවත් කැමැත්තක් සෝමරත්න තුළද ඇතිවිය. පියාගෙන් කරන ලද එම ඉල්ලීමද අප්‍රමාදව ඉටු විණි. වජිරාරාමය තම දහම් පිපාසයට ලද අමා දියක් මෙන් සෝමරත්නට හැඟුණේ එහි ඇතුළු වී වැඩි කලක් යන්නට මත්තෙන්මය.

මේ කාලයේදීම තවත් අපූරු සිද්ධියක් සිදුවිය. ආනන්ද ශාස්ත්‍රාලයේ 6 වන ශ්‍රේණියේ උගනිමින් සිටි සෝමරත්න නොකළ වරදකට වරදකරු වී ගුරුවරයකු වෙතින් දඬුවම් ලැබීය. එය කොතෙක් ඔහුගේ ළමා විය සසල කළේද යත්න, නැවත කිසිදිනෙක එම පාසලට නොයන්නෙමැයි ඔහු දැඩිව අදිටන් කර ගත්තේය. පසුව පියා උනන්දු වී වෙනත් පාසල් කිහිපයකටම යවන ලද ඉල්ලුම්පත්වලට අනුව කොළඹ ඉසිපතන විද්‍යාලයට ඇතුල්වීමේ අවකාශය සෝමරත්නට හිමි විය.

දහම් පාසලේ අධ්‍යාපනය මොන තරම් වුවමනාවකින් කළේද යත් ඉසිපතන විද්‍යාලයේ 8 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන විට වජිරාරාම දහම් පාසලේ පන්තියක් භාරදී එහි ඉගැන්වීම් කටයුතු පැවරීමට සුදුස්සකු වන තරමටම කුඩා සෝමරත්න 'ධර්මධර' වී සිටියේය.

'සෝමරත්න හුඟාක් දක්ෂ ළමයෙක්. ධර්මය ගැන පුළුල් අවබෝධයක් තියෙනවා.' වජිරාරාමයේ ස්වාමීන් වහන්සේලා සෝමරත්නට බියක් සැකක් නැතිවම ඉගැන්වීම් කටයුතු භාර කළේ එසේ පවසමිනි. ඉගැන්වීම මෙන්ම සිසුන් උදෙසා දේශන පැවැත්වීමට තරමටම එවකට ඔහුගේ දහම් දැනුම මුහුකුරා ගොස් තිබිණි.

බිහිවූ තිබුණේ 1948 අප්‍රේල් මස 24 දිනය.

ගංගොඩවිල ගමේ පරණ කැස්බෑව පාරේ ටොනික් මෝල නම් ස්ථානයෙන් හැරී යන විට සෝමරත්නලාගේ ඉඩම් හමුවෙයි. සෝමරත්නගේ පියා කොළඹ මහ නග සභාවේ වෝටර් වර්ක්ස් අංශයේ සේවය කළද, සෝමරත්නගේ සීයලා නම් ඒ ප්‍රදේශයේ ගොඩමඩ ඉඩම් වගා කළ ගොවියෝය. එකල නුගේගොඩ කට්ටිය හන්දියත්, දෙල්කඳ හන්දියත් අතර රේල් පාර අද්දර ඕවිටි පිහිටා තිබූ අතර සීයා සමග ඕවිටට යන්නටත්. එහි වූ පිපිඤ්ඤා, කැකිරි ආදී වශයෙන් වගා කර තිබූ පළදාව නෙලාගෙන එන්නටත් පුංචි සෝමරත්න දැක්වූයේ අසමාන උනන්දුවකි.

ඔහුට ළමා වියේ සිටම පන්සලේ ඇසුරත් නොමඳවම ලැබී තිබිණි. ඊට හේතුව දෙමාපියන්ද පන්සල් ඇසුර ලැබූ පිරිසිදු බෞද්ධයන් වීමය. ගංගොඩවිල සුභද්‍රාරාමය ඔවුන්ට අයත්ව තිබූ පන්සලය. සෝමරත්නට අත් පොත් තබා තිබුණේද සුභද්‍රාරාමයේ එවකට අධිපතිත්වය දැරූ අපවත්වී වදාළ බෝරුක්ගමුවේ දේවමිත්ත ස්වාමීන් වහන්සේ විසිනි. සුභද්‍රාරාමයේ ශ්‍රී රේවත දහම් පාසලෙන් සෝමරත්න බුදු දහම පිළිබඳ අත් පොත් තබා තිබිණි.

සෝමරත්නට වයස අවුරුදු දහයක් තරම් වන කාලයේ ඔහුගේ පියා පදිංචිය වෙනස් කළේය. ගංගොඩවිල එවකට පදිංචිව සිටි ඉඩකඩම් විකුණා දැමූ ඔහු මිරිහාන ජොස්වෙල් පෙදෙසෙන් පර්චස් 36 ක ඉඩමක් රු. 2500/- ට මිලට ගෙන ගෙයක් තනා එහි පදිංචියට ගියේය.

සෝමරත්නට සුමනාවතී සහ සිරිමා නමින් නංගිලා දෙදෙනකුත්, ඩඩ්ලි සහ පද්මසිරි නමින් මල්ලිලා දෙදෙනකුත් වූහ. ගංගොඩවිල සිට පදිංචිය වෙනස් කිරීමෙන් පසු මේ දූ පුතුන්ට දහම් පෝෂණය ලබාදීම පිණිස මිරිහානේ ශ්‍රී රෝහණ දහම් පාසලට ඇතුළත් කිරීමට එම මාපියෝ පියවර ගත්හ.

එවකට කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ අධ්‍යාපන කටයුතු කරගෙන ගියද, විෂය පොත් පත්වලට වඩා බුදු දහම පිළිබඳ පොත්පත් කියවන්නට සෝමරත්න තුළ වූයේ නොමඳ උනන්දුවකි.

ඇහැළ ගස් වසා තිබූ කහ පැහැති මල් කිණිති බිමට නැමී පැමිණෙන පිරිසට ආසිරි පවන් සැලීය. කෙමෙන් සුදු පැහැ ගත් ජනයා පිරෙමින් පැවැති ඒ පින්බිම පුරාම වූයේ අමුතුම මනස්කාන්ත බවකි.

කුල දරුවන් පස් දෙනකු පැවිදි බිමට පිවිසීමේ අති උදර පුන්‍ය කටයුත්තක් සිරි වජිරඥාණ ධර්මායතනයෙහි එම උදෑසන පැවැත්වීමට සියලු කටයුතු සූදනම් වී තිබිණි. මෙකල අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහා නායක පදවිය දරන අති පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය අම්පිටියේ රාහුල නාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් යුතුව මෙම කුල දරුවන් පස්දෙනා පැවිදි කිරීමට නියමිත විය. කුල දරුවන්ගේ දෙමව්පියන්, සොයුරු සොයුරියන් සහ ඥාති හිතමිත්‍රාදීන්ගෙන් විහාර භූමිය පිරී තිබිණ. එම අති උතුම් පුණ්‍ය කටයුත්ත සුභ මුහුර්තියට අනුව ඒ අයුරින් සිදුවෙමින් පැවතිණ.

එහෙත්, මෙහි විශේෂත්වයක් විය. කුල දරුවන් පස්දෙනාගෙන් හතර දෙනකුම ළාබාලයෝය. එක් අයකු පමණක් පැහැයෙන් හා පෙනුමෙන්ද ප්‍රසන්න නව යොවුන් තරුණයෙකි.

'මේ වයසෙ තරුණ පිරිමි ළමයෙක් මහණ වෙන්න හිතුවෙ මොකක් හරි ප්‍රේම සම්බන්ධයක් නිසා හිත කලකිරිලා වෙන්න ඇති' රැස්ව සිටි පිරිසේ වූ ඇතැමෙක් එසේ කතා වෙන්නට ඇත.

නමුත් ඒ වනවිට 26 හැවිරිදිව සිටි සෝමරත්න නමැති ඒ සුවිශේෂ තරුණයා එවන් පසුබිමක් මතින් ගත් ක්ෂණික තීරණයක් නිසා නොව කාලාන්තරයක් තිස්සේ ධර්ම මාර්ගයට පිවිස සපුරාලන ලද සුදුසුකම් සහිතව පැවිදි බිමට පිවිසෙන අයකු බව රැස්ව සිටි සංඝයා වහන්සේලා මෙන්ම පිරිසෙහි වූ බොහෝ දෙනෙක්ද දැන සිටියහ.

ගංගොඩවිල සෝම නමින් එදා ගිහි ගෙය හැරදා පැවිදි මඟට පිළිපන් මෙම සෝමරත්නගේ උපන් ගම නුගේගොඩ ගංගොඩවිල ප්‍රදේශයයි. වීරතුංග ආරච්චිලාගේ දොන් ධර්මදාසගේත්, හෙට්ටිගේ දොන් වාලට් නෝනාගෙත් වැඩිමහල් පුතු වූයේ සෝමරත්නය. ඔහු

# 1 පැවිද්දට ඇළුම් කළ උපාසක මහත්තයා

ඒ 1974 සැප්තැම්බර් 20 වන දිනය. මහරගම හන්දියෙන් දකුණු අත පැත්තට වැටී ඇති දෙහිවල පාර හෙවත් සිරි වජිරඥාන මාවතේ ගොඩිගමුව සුසාන භූමියද පසුකර මඳ දුරක් ඉදිරියට ගිය කල හමුවන්නේ ශාන්ත සුන්දර බවින් අනූන පින් බිමකි. නගරයේ පවතින කලබලකාරී බව වත්, දැඩි උණුසුම වත් එහි නැත. පය තැබූ තැන සිට ගතටත්, සිතටත් අපූරු සිහිල් සුවදායක සැනසුමක් හිමිකර දෙන්නට සමත් මේ පින් බිම අති පූජ්‍ය පැලෑනේ ශ්‍රී වජිරඥාණ මාහිපාණන්ගේ සහ පරපුරට අයත් මහරගම භික්ෂු අභ්‍යාස ආයතනය නමින්ද හැඳින්වෙන සිරි වජිරඥාණ ධර්මායතනයයි.

මේ කියන දවසේ උදේ වරුවේ සුදු ඇඳ ගත් උවැසු උවැසියෝ විශාල පිරිසක් සිරි වජිරඥාණ මාවතේ ඉදිරියට ඇදෙමින් සිටියහ. ඔවුන් මහත් වුවමනාවෙන් යුතුව මේ ඇදෙනුයේ ධර්මායතනයෙහි එදින උදේ වරුවේ පවත්වන්නට නියමිතව තිබූ සුවිශේෂ පුණ්‍යෝත්සවයට සහභාගි වීම සඳහාය.

ධර්මායතනයෙහි පිවිසුම් මාර්ගයෙහි මුලින්ම හමුවුණු පස් පියුමෙන් සැදි පොකුණෙහි රත් පැහැ නෙළුම් මල් පෙති විදහා විකසිතව තිබුණේ ශාන්ත ගමනින් එහි පිවිසෙන මෙම උවැසු උවැසියන් පිළිගන්නට මෙනි. ධර්මායතන භූමියෙහි මඟ දෙපස

මෙම දෙවන මුද්‍රණය:– ශ්‍රී බුද්ධ වර්ෂ 2547 ක් වූ දුරුතු පුර පසළොස්වක ලත් බුද දින හෙවත් 2004 ජනවාරි මස 07 වැනි බදදා

ප්‍රථම මුද්‍රණය:– ශ්‍රී බුද්ධ වර්ෂ 2545 ක් වූ ඉල් මස පුර පසළොස්වක ලත් කිවි දින හෙවත් ක්‍රිස්තු වර්ෂ 2001 නොවැම්බර් මස 30 වන සිකුරාද

දෙවනුව "සෝම හාමුදුරුවෝ" ලිපි පෙළ "ඉරිද ලක්බිම" පත්‍රයෙහි පළකිරීම ඔස්සේ ඒ පිළිබඳ සුවිසල් ජන අවධානයක් යොමු කරවූ එම පත්‍රයේ ප්‍රධාන කර්තෘ සුන්දර නිහතමානි ද මැල් මහතාටත්, එම ලිපි පෙළ සමග පළවූ මා සම්බන්ධ මටද සොයා ගැනීමට අසීරු වූ පැරණි ඡායාරූප කිහිපයක් සොයාගත් මාධ්‍යවේදී තිලක් සේනාසිංහ මහතාටත් පින් දෙමි.

තෙවනුව එම ලිපි පෙළ චරිතාපදානයක් වශයෙන් මුද්‍රණය කොට ප්‍රකාශයට පත්කරවීම ඔස්සේ සමාජ මෙහෙවරක යෙදීමට අදිටන් කළ මෙහි ප්‍රකාශක දයාවංශ ජයකොඩි මහතාටත් පින්දිය යුතු වේ.

අවසානයේ මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමට ඇප උපකාර කළ සියලුම දෙනා හටත් මෙය කියැවීමෙන් ජිවිතයට ඉෂ්ඨාර්ථ සිද්ධියක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන සියලුම දෙනා හටත් ශාසනික වශයෙන්ද වැදගත් මෙහෙවරක් වන මෙහි ප්‍රත්‍යානිසංසය නොමඳවම අත්පත් වේවායි මෙත් සිත් පෙරටුව මම ආශිංසනය කර සිටිමි.

**ගංගොඩවිල සෝම ස්ථවිර**

මහරගම
සිරි වජිරඤාන ධර්මායතනයේදීය.
2001.10.25

එසේම මෙබඳු ජීවිතාභියෝගයකට මුහුණ දීමට මා තුළ ශක්තියක් පිබිදුනේ කෙසේදැයි මා හට නිශ්චයට ඒමට හැකි වුයේද "සෝම හාමුදුරුවෝ" ලිපි පෙළ "ඉරිද ලක්බිම" පත්‍රයෙහි පළවන අතරවාරයේදීය.

පන්සිය පනස් ජාතක පොත මා ගිහිව සිටියදීත්, පැවිදි බවට පත්වූ පසුවත් මහත් අභිරුචියකින් පරිහරණය කරන ලද ග්‍රන්ථයකි. උසස් කාව්‍ය රසයකින් පිරිපුන් මෙම ග්‍රන්ථය මගින් උද්වහනය වන බෝධිසත්ව චරිතයෙහි ඇති නොසැලෙන අධිෂ්ඨාන ශක්තිය සහ නොපසුබස්නා වීර්යය මා ද නොදැනුවත්වම එවකට තුරුණු වියෙහි පසුවූ මගේ හදවතෙහි ප්‍රබල ලෙස සටහන් වූ බව නිසැකය. මෙම ග්‍රන්ථයෙන් විස්තර කෙරෙන කාලසීමාව ඉක්මවා මේ වනවිට මා යම් ස්ථාවරයකට පැමිණ ඇත්නම් එහි පදනම ඉහත සඳහන් බෝධිසත්ව ගුණයන් සිතෙහි ධාරණය කර ගැනීමෙන් ලද ශක්තිය හා ධෛර්යය බව නොපසුබටව මෙහි ලියා තබමි.

නූතන ඉන්දියාවේ සිහින වෙළෙඳුන් මෝඩයන්ගේ මුදල් පසුම්බිවලට තට්ටු කරන තුට්ටු දෙකේ බයිස්කෝප් ඔස්සේ දෙලොව විමුක්තිය දැකීමට බාලයන් පොළඹවන අන්ධභූත සමාජයක් තුළ එබඳු ශ්‍රේෂ්ඨ බෞද්ධ ග්‍රන්ථ හමස් පෙට්ටියට යාම අරුමයක් නොවේ. එහි අනිටු ප්‍රතිඵල මේ වනවිටද අපි භුක්ති විඳිමින් හිඳිමු.

"සෝම හාමුදුරුවෝ" ලිපි පෙළ "ඉරිද ලක්බිම" පත්‍රයෙහි පළවන වකවානුවේ මහරගම ශාසන සේවක සමිතිය සම්බන්ධයෙන් කෙරුණු ඇතැම් සඳහන් කෙරෙහි කිහිප පළක් අපගේ අවධානය යොමු කළ අතර ඉන් පැවසෙනුයේ යම් යම් පුද්ගල චර්යාවන් මිස එම සමිතියේ උදාර අරමුණු පිළිබඳව නොවන බව අවධාරණය කිරීමට අපට සිදුවිය. මහරගම සිරි වජිරඥාන ධර්මායතනයට සම්බන්ධ මහරගම ශාසන සේවක සමිතිය උතුම් ජාතික ශාසනික අරමුණු රැසක් පෙරදැරි කරගත් ශ්‍රේෂ්ඨතම සත් ව්‍යාපාරයක් බවද විශේෂයෙන් තහවුරු කරනු කැමැත්තෙමි. එවන් එකමුතුවක පවා එකී පරමාර්ථවලට පටහැනි පුද්ගලයකු, දෙදෙනකු වරින් වර හෝ දැකිය හැකි වීම ලෝක ධර්මතාවයම මිස අනෙකක් නොවේ.

පුවත්පත් පාඨකයන් තුළ මහත් අභිරුචියක් දනවන අන්දමේ පුවත්පත් ලිපි පෙළක් වශයෙන් මෙම වෘත්තාන්තය ඉදිරිපත් කොට එයම චරිතාපදානයක ස්වරූපයෙන් මෙලෙස පාඨකයන් අතට පත් කිරීමට මහත් උද්‍යෝගයෙන් ක්‍රියා කළ මාධ්‍යවේදිනී ඉන්දු පෙරේරා මහත්මිය හට අප පළමුව පින් දිය යුතුය.

# ගංගොඩවිල සෝම හිමිපාණන්ගේ හැඳින්වීම

1998 වසරේ එක්තරා දිනයෙක මාධ්‍යවේදිනී ඉන්දු පෙරේරා මහත්මිය "ඉරිද ලක්බිම" පත්‍රයෙහි මගේ ජීවිත කතාව සතිපතා කොටස් වශයෙන් පළකරවීම පිළිබඳව මවෙතින් කරුණු විමසා සිටියාය. එහෙත් මගේ ජීවිත කතාව දැන ගැනීමෙන් ඔබගේ පුවත්පත් පාඨකයන් හට සිදුවන යහපත කුමක්දැයි සැහැල්ලු ලෙස විමසූ මම ඊට නිසි පිළිතුරක් නොදුන්නෙමි.

එහෙත්, ඉන්පසු ඇය විසින් කිහිප වරක්ම එම කරුණ මා වෙත ඉදිරිපත් කරනු ලදුව කාගේත් ජීවිත පරිඥානය තීව්‍ර කිරීමට ඉවහල් විය හැකි මගේ ජීවිතය සම්බන්ධ වැදගත් පුනරාවර්ජනයන් කිහිපයක් පමණක් පැවසිය යුතු යැයි මට සිතිණ.

එහෙත්, අවස්ථා කිහිපයකදී පෙරේරා මහත්මිය වෙත අසම්පූර්ණ ලෙසින් පවසන ලද කරුණු සති කිහිපයක් ඇවෑමෙන් "සෝම හාමුදුරුවෝ" යන සිරස්තලය යටතේ චරිතාපදානයක ස්වරූපයෙන් පළවීම ඇරඹෙන ලද්දේ මා අපේක්ෂා නොකළ ලෙසිනි. පසුව ඒ පිළිබඳව කරුණු විමසීමේදී ඇය මා හට ප්‍රකාශ කොට සිටියේ එවන් චරිත කතාවක් ඇරඹීමට ප්‍රමාණවත් කරුණු මගේ කතාබහ තුළින් උකහා ගත හැකිවූ බවය.

කෙසේ හෝ "ඉරිද ලක්බිම" පත්‍රයෙහි එම ලිපි පෙළ පළවීමත් සමගම ඒ පිළිබඳව අප හිතවත් දායක කාරකාදීන් සේම පොදු බෞද්ධ සැදැහැවතුන්ද මහත් උනන්දුවක් පළ කරනු පෙනිණ. විශේෂයෙන් යම් යම් අතීත සිද්ධීනට සම්බන්ධ පාර්ශවකරුවන් ඒ පිළිබඳව දක්වන ලද ප්‍රතිචාර බෙහෙවින්ම ප්‍රිය මනාප විය. එදවස මා හා නොමනාපකම් පෑ බොහොමයක් දැන් මගේ හිතවතුන් වී ඇත. අතීතයේ මා හා ශාසනික වශයෙන් එක්ව ක්‍රියා කළවුන්ගෙන් සමහරෙක් දැන් ජීවතුන් අතරද නැත. එබැවින් ඔවුන්ගේ ඥාතිහු ඒ සිද්ධීන් සිහිපත් කරති.

කෙසේ නමුදු එබඳු පසුබිමක් යටතේ මගේ ජීවිතයේ සෑම වැදගත් සිද්ධියක්ම වසරින් වසර වශයෙන් එම මාධ්‍යවේදිනිය වෙත පැවසීම මැනවැයි මම පසුව තීරණය කළෙමි. එහිදී මවිසින් පුනරාවර්ජනය කරන ලද ඇතැම් අතීත සංසිද්ධීන් සැබැවින්ම මවිසින් මුහුණ දෙන ලද ඒවා නොවේදැයි සිතන විට මා තුළම විස්මයක් පැන නැගී අවස්ථාවන්ද විය.

මම එවැනි දෙයක් ගැන දන්නෙත් නෑ. මගේ රට කිසිම සම්බන්ධයකුත් නෑ. කිසිම මාධ්‍යයකට මගේ කතාව මම එළිකරලත් නෑ" යනුවෙන් පැවසූහ. මා තුළද මේ පිළිබඳව ඇතිවූයේ පුදුමයකි.

රට සති ගණනකට පසුව මම නැවතත් සෝම හිමියන්ගෙන් එම සිද්ධිය මුල් කොට ඔබවහන්සේගේ ජීවිතයේ ශාසනික වශයෙන් වැදගත් මතක සටහන් පුවත්පත සඳහා ගොනුකළ නොහැකිදැයි විමසීමි. "ඒ වගේ මතක සටහන් ලියන එකේ නම් වැරැද්දක් නෑ" යි පැවසූ උන්වහන්සේ ඒ පිළිබඳව ප්‍රථම වතාවට කැමැත්ත පළ කළහ. "සෝම හාමුදුරුවෝ" ලිපි පෙළෙහි ඇරඹුම එයයි.

මෙම ලිපි පෙළ පොතක් වශයෙන් කලඑළි දැක්වීම සඳහා අනුමැතිය ලබාදුන් සුමති සමූහ ව්‍යාපාරයේ සභාපතිනි මිලිනා සුමතිපාල මැතිනිය ඇතුළු කළමනාකාර අධ්‍යක්ෂ මණ්ඩලයට පළමු කොටම මගේ කෘතඥතාවය පුද කරමි.

"සෝම හාමුදුරුවෝ" ලිපි පෙළ "ලක්බිම" පත්‍රයෙහි පළකිරීම පිණිස මහත් උනන්දුවකින් කටයුතු කළ "ඉරිද ලක්බිම" කර්තෘ සුන්දර නිහතමානි ද මෙල් මහතාටද, "රැජිණ" පත්‍රයේ කර්තෘ තිලක් සේනාසිංහ මහතාටද මගේ කෘතඥතාවය හිමි වෙයි.

"සෝම හාමුදුරුවෝ" කෘතියෙහි සෝදුපත් පිරික්සුමේදී මට සහාය දුන් මගේ දියණිය තාරකාවත් මෙහිදී සිහිපත් කළ යුතුය.

මෙහි මුද්‍රණ සහ ප්‍රකාශන වගකීම් භාරගෙන එය ඉතා අලංකාර ලෙස ඉටුකර දුන් මරදනේ දයාවංශ ජයකොඩි සහ සමාගම අධිපති දයාවංශ ජයකොඩි මහතාටත් මම කෘතඥතාවය පුද කරමි.

**ඉන්දු පෙරේරා**

කොළඹ 14,
සී/ස. සුමති පුවත්පත් සමාගමේදීය.
2001.10.26

# සම්පාදිකාවගේ සටහන

මෑත යුගයේ බිහිවූ සුවිශේෂ පුද්ගලයන්ගේ චරිත කතා කිහිපයක්ම මම පුවත්පත් සඳහා කොටස් වශයෙන් ලියා ඇත්තෙමි. ඒ අතරින් රැපිණ පත්‍රයට ලියන ලද 1987 බුත්තලදී සාහසික වෙඩි පහරකින් මියගිය මයිකල් පෝල් රුද්‍රිගු පියතුමා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, කළුතර රිච්මන්ඩ් කාසල් මන්දිරය හිමිව සිටි ආතර් ද සිල්වා විජයසිංහ මුදලිතුමා, ඩී. එස්. සේනානායක විද්‍යාලයේ නිර්මාතෘ සහ සමාරම්භක විදුහල්පති ආර්. අයි. ටී. අලස් මැතිතුමා, ජේ. ආර්. ජයවර්ධන මැතිඳුන්ගේ පුත් රවි ජයවර්ධන මැතිතුමා ආදීන් පිළිබඳ කතා ප්‍රධානය.

මෙබඳු චරිත කතා ලියන විට මා උත්සාහ කළේ ඔවුන්ගේ චරිතවල ඇති යම් යම් සුවිශේෂතා හඳුනාගෙන ඒවා විශ්ලේෂණාත්මක පදනමක් යටතේ පාඨකයන් අතට පත් කිරීමය.

ඔය අතරතුරදී පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන්ගේ ධර්මාවවාදයන් "ලක්බිම" සහ "රැපිණ" පුවත්පතට යොමු කරමින් සිටිනා'තර සෝම හිමියන්ගේ ජීවිත කතාව "ඉරිද ලක්බිම" පුවත්පතට ලියන මෙන් එහි කර්තෘ සුන්දර නිහතමානි ද මෙල් මහතා ඉල්ලා සිටියේය. ඒ පිළිබඳව සෝම ස්වාමීන් වහන්සේට කිහිප වරක්ම කරුණු කිවත්, උන්වහන්සේ ඒ පිළිබඳ තැකීමක් නොකළහ. මේ අතර එවකට මාසිකව පළවෙමින් තිබූ දැනට මුද්‍රණය නොවන සඟරාවක සෝම හිමියන්ගේ සම්පූර්ණ ජීවිත කතාව පළවන බවට පුවත්පත්වල පළවී තිබිණි. ඒ සඟරාවේ මුල් පිටපත සෝම හිමියන් වැඩ වෙසෙන මහරගම සිරි වජිරඥාන ධර්මායතනයේදීම එම හිමියන්ට පිළිගැන්වෙන බවටද පුවත්පත් මගින් ප්‍රසිද්ධ කර හැර තිබිණි. සෝම හිමියන් තම ජීවිත කතාව පිළිබඳව අපට කරුණු නොදක්වනුයේ එම සඟරාවට ඊට අදාළ සම්පූර්ණ තොරතුරු දී ඇති නිසා යැයි කල්පනා කළ මම එය උන්වහන්සේගේ පෞද්ගලික මනාපයක් වශයෙන් සිතා ඒ ගැන අහිතක් නොසිතාම නියමිත දිනයේ එම උත්සවයට සහභාගි වීම පිණිස ධර්මායතනයට ගියෙමි. දහසකට අධික ජනකායක් එදින රැස්ව සිටි අතර එදිනට නියමිත සෝම හිමියන්ගේ ධර්ම දේශනයද අවසන් විණි. එය අවසානයේ උන්වහන්සේ සුපුරුදු ශාන්ත ස්වරයෙන්ම "මගේ ජීවිත කතාව අද එක සඟරාවකින් කලඑළි දක්වන බව සඳහන් කරලා තිබෙනවා. නමුත්

පිට කවරය : දයාන් විතාරණ
පරිගණක අක්ෂර සංයෝජනය : උපුල් ධම්මික

# පිදුම

තථාගත දේශනාව මුල්කොට
වසර දෙදහස් පන්සියයකටත් වැඩි කාලයක් තිස්සේ
අවිච්ඡින්නවපැවත ආ ත්‍රිපිටකය පදනම් කොටගත්
නෛර්යාතික ශ්‍රී සද්ධර්මය හෙවත්
සම්මා සම්බුද්ධ ශාසනය
අනේක විධ වූ මිථ්‍යා දෘෂ්ඨික බලපෑම් වලින්
ආකුල ව්‍යාකුල වෙමින් පැවති
විසිවන සියවසේ අවසන් භාගයේ
මේ ශ්‍රී ලංකා ධරණී තලයේ පහළ වනු ලදුව
ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ස්ථාපිත
මෝහාන්ධකාරය දුරින් දුරු කරලමින්
සම්මා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා
අති උතුම් ශාසනික ජාතික මෙහෙවරක් කොට වදළ
අති පූජ්‍ය ගංගොඩවිල සෝම නම්
ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයාණෝ ශ්‍රී ලංකා වාසී බෞද්ධයන්
කිසිවකුත් අපේක්ෂා නොකළ අයුරකින්
සම්මත වර්ෂ 2003 දෙසැම්බර් 12 වන දින
අපවත් වී වදළ සේක.
උන්වහන්සේගේ අතීත පුනරාවර්ජනයන් ඇසුරින්
මවිසින් සම්පාදිත
"සෝම හාමුදුරුවෝ"
නම් මෙම චරිතාපදානය
පූජ්‍ය පාද ගංගොඩවිල සෝම ශ්‍රේෂ්ඨ
බුද්ධ පුත්‍රයාණන් වහන්සේගේ ශ්‍රී නාමය උදෙසා
මෙසේ පූජා කරමි.

SOMA HAMUDURUVO
(Biography of Ven. Gangodawila Soma Thero)
by

INDU PERERA

Printed and published by
DAYAWANSA JAYAKODY & COMPANY
101 & 112, Ven. S. Mahinda Thero Mawatha,
Colombo 10. Sri Lanka.
Tele - 2695773 Fax - 2696653

E-mail - dayawansa@eureka.lk.
Web Site: www.day jay.com.

U. S. A. Office

DAYAWANSA JAYAKODY & COMPANY (U. S. A.)
131, Banwell Lane,
Mount Laurel, New Jersey 08054 U. S. A.
Tele & Fax 502 212 9154

# සෝම හාමුදුරුවෝ

## පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි චරිතාපදානය

ඉන්දු පෙරේරා

දයාවංශ ජයකොඩි සහ සමාගම
101 සහ 112, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.
දුරකථනය 2695773 / ෆැක්ස් 2696653

ISBN-955-551-30 -7

මුද්‍රණය :
දයාවංශ ජයකොඩි සහ සමාගම - මුද්‍රණ ශිල්පියෝ
163/4, සිරිධම්ම මාවත, මරදාන, කොළඹ 10.
කාර්යාලය 112, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන, කොළඹ 10.

# සෝම හාමුදුරුවෝ

## පූජ්‍ය ගංගොඩවිල සෝම හිමි චරිතාපදානය

ඉන්දු පෙරේරා

ප්‍රකාශනය

දයාවංශ ජයකොඩි සහ සමාගම

හරි ගියොත් එහෙමයි, වැරදුණොත් ඒත් එහෙමයි කියලා හිතාගෙන අපි මේ වැඩේ කරමු සෝම හිමියෝ තරුණයන් දිරි ගැන්වූහ.

මේ වනවිට පඤ්ඤාසීහ මහානායක හිමියෝද යළි ධර්මායතනයට වැඩම කර සිටියහ. ළිඳක තිබූ දැඩි අවශ්‍යතාවය අවබෝධ කරගෙන සිටි මහානායක හිමියෝ සෝම හිමියන්ගේ කටයුතු කෙරෙහි පැහැදී සිටි අතර වරින් වර ළිඳ කපන ස්ථානයට පැමිණ එහි කටයුතු විමසමින් තරුණයන් දිරිමත් කළහ.

එහෙත් සෝම හිමියන් සහ උන්වහන්සේට හිතවත්ව සිටි තුරුණු සවියේ තරුණ පිරිස නොරිස්සූ ඇතැමුන් මීට නොයෙකුත් ආකාරයේ විරෝධතා පෑම දිගින් දිගටම කරගෙන ගියහ. නමුත් ධර්මායතනය අවට වෙසෙන්නන් මේ තත්ත්වය මනාව අවබෝධ කරගෙන තරුණයන්ට ආහාරපාන සැපයීමේ කටයුත්ත භාර ගෙන තිබිණි.

මෙලෙස දිගින් දිගටම ළිඳ කැපෙන කටයුත්ත සිදුවන අතරේ තවත් සුවිශේෂ කාර්යයක් සෝම හිමියෝ නිහඬව සිදු කරමින් සිටියහ.

අප මේ සඳහන් කරන ළිඳ කැපීම සිදුවෙමින් තිබුණේ ජූනි මාසයේ අග භාගයේදී පමණය. ඊට පෙර උදාවූ වෙසක් මාසයේ වෙසක් ධර්ම දේශනාවක් පැවැත්වීමේ කාර්යය සෝම හිමියන්ට පැවරී තිබිණි. වෙසක් දින පැවැත්වෙන ධර්ම දේශනාවන් සාම්ප්‍රදායිකවම බුදු හිමියන්ගේ ඉපදීම, බුදු වීම, පිරිනිවීම යන කරුණු තුන මුල් කරගෙන සිදුවන බැවින් මීට වඩා වෙනස් ධර්ම දේශනාවක් කිරීමේ අදහස සෝම හිමියන් තුළ පැන නැගී තිබිණි. කරුණු සොයා බලද්දී යශෝධරා මහ රහත් තෙරණිය පිරිනිවන් පා තිබුණේද වෙසක් පෝ දිනයක බව උන්වහන්සේට වැටහී ගියේය. ඇය ඉපදී තිබුණේද වෙසක් පෝ දිනයකය.

ඒ අනුව යශෝධරා දේවියගේ අප්‍රමාණ වූ ගුණ සමුදය ඇසුරින් ධර්ම දේශනාවක් කිරීමට උන්වහන්සේ අදිටන් කර ගත්හ. එම ධර්ම දේශනාව කොතෙක් ශ්‍රාවකයන්ගේ සිත ඇද බැඳගෙන

තිබුණේද යත් විශේෂයෙන් කාන්තාවන් දම් දෙසුම ශ්‍රවණය කර තිබුණේද කඳුළු වගුරුවමිනි. එසේම දේශනාව අවසන් වූ පසු "හාමුදුරුවනේ, ඔය කියපු බණ ටිකෙන් පොතක් ලියන්න" යැයි බොහෝ දෙනෙක් ඉල්ලා සිටියහ. තම පළමු කෘතිය කරන අභිප්‍රාය සෝම හිමියන් තුළ පැන නැගුණේ එපරිද්දෙනි.

තරුණයන් ළිඳ කපන අතරවාරයේ මඳ වේලාවක් ඒ කටයුතු අධීක්‍ෂණය කරන සෝම හිමියන් ඉන්පසු තම කුටියට පැමිණ රාහුල මාතා කෘතිය ලියන්නට පටන් ගතියි.

මේ අයුරින් උන්වහන්සේ මාරුවෙන් මාරුවට එම කාර්යයන් දෙකෙහිම නිරත වූහ.

එක් එක් පුද්ගලයන් විවිධ මත පළ කළද සෝම හිමියන්ගේ සිහිනයද, තරුණ පිරිසගේ උත්සාහයද මල් ඵල ගන්වමින් එක් දිනයක ළිඳ හරි මැදින් ජල උල්පතක් මතු විණි. මින් සෝම හිමියන්ගේ මෙන්ම තරුණ පිරිසගේද උද්‍යෝගය වැඩි දියුණු විය. තරුණයෝ දිගින් දිගටම ළිඳ හෑරීමේ කටයුත්තෙහි නිරත වූහ. මෙය නිස්සාර කටයුත්තක් සේ හෙළා දකිමින් අවඥවට ලක් කළ ඇතැමුන් නිරුත්තර කරවමින් තව ටික දිනකින්ම ළිඳේ හතර පැත්තෙන් ජල උල්පත් හතරක් මතු විය. ඉන්පසු තවත් යටට පස හාරද්දී ළිඳේ පැත්තක පස් කුට්ටියක්ද කඩා ගෙන යෝධ ජල උල්පතක් මතු විණි. ළිඳට කොයි තරම් ජලය එකතු වන්නට වූයේ දැයි කිව හොත් ළිඳ කැපීම සඳහා ජලය හින්දවා ගන්නට බැරි තත්ත්වයක් මතුවිය. අවසානයේ වතුර මෝටරයක් සවිකොට රාත්‍රී 10.00 සිට පාන්දර 2.00 පමණ වනතුරු ළිඳේ වතුර ඉසීමේ කටයුත්තේ නිරත වන්නට තරුණයන් හට සිදුවිණි. ඉන්පසු එක් පැත්තකට වතුර පිරෙන්නට සලස්වා අනෙක් පැත්ත කපා යළි ඒ පැත්තට පිරෙන්නට සළස්වා ඉතිරි හරිය කපමින් ළිඳ කැපීමේ කටයුත්ත නිම කෙරිණි. ඉන්පසු සෝම හිමියන්ගේ උපදෙස් පරිදි ළිඳ කඩා වැටීම වළකින්නට අඩියේ සිටම කළු ගලින් බැඳ තාප්පද බන්දවා තිබිණි. ළිඳේ ඇතුළත පළල අඩි විස්සක් විය.

ළිඳ විවෘත කිරීම සහ රාහුල මාතා පොත එළිදැක්වීම යන මේ කටයුතු දෙකම යෙදී තිබුණේ තව දින කිහිපයකින්

එළැඹෙන්නට. නියමිතව තිබූ ඇසල පුන් පෝ දිනටය. තමාට ශාසනික කටයුතු භාර ගෙන එය නොපිරිහෙලා ඉටුකළ හැකි බවට සෝම හිමියන් ඔප්පු කර පෙන්වන දවස වූයේ එයයි.

ධර්මායතන භූමිය බෞද්ධ කොඩි වැල්වලින් සැරසී තිබිණ. පුන් පෝ දිනයේ ශීල සමාදනයට සහභාගි වූ බාල, තරුණ, මහළු පිරිස්වලින්ද භූමිය පිරී ඉතිරී ගොස් පැවතියේය. උත්සවයට සහභාගිවීම සඳහා පැමිණි සුදු වතින් සැරසුණු පිරිසද එපමණටම වූහ. ළිඳ විවෘත වූයේ පළමු පැන් කලය ගෙන මහානායක හිමියන් අතින් බෝධීන් වහන්සේ දෝවනය කොට බෝධි පූජාවක් කිරීමෙන් අනතුරුවය.

ළිඳේ වතුර මෝටරයක ආධාරයෙන් ටැංකියට යවා නල මාර්ගයෙන් විහාර භූමියට ජලය ලබා දුනි. මෙම ටැංකිය බැන්දවීමේ කටයුත්තද සෝම හිමියන් විසින්ම කරවා තිබිණි.

රාහුල මාතා පොතද එළිදැක්වීමෙන් පසු එම උදය වරුව තුළම උත්සවයේ වැඩ කටයුතු නිම විය. දහවල් සපිරිකර සංඝගත දක්ෂිණාවකි. ශාසන සේවක සමිතිය, ශාසනාධාර කාන්තා සමිතිය, තුරුණු සවිය, තරුණ ශීල සමාදනය ආදී වූ ධර්මායතනයට අයත් බෞද්ධ සංගම් රාශියකගේ සහ අතිකුත් ගිහියන්ගේද ආධාර උපකාර ඇතිව මෙම පුණ්‍යෝත්සවය සිදු කෙරිණි.

මෙම කටයුතු මංගල ස්වරූපයෙන් සිදුවෙද්දී සෝම හිමියෝ තවත් කටයුත්තකද නිරතව සිටියහ. ඒ කටයුත්ත ගැන වැඩි දෙනෙක් නොදැන සිටියද නාහිමිවරුන්ට එය රහසක් නොවිණි. දයකකාරකාදීන් භික්ෂූන් වහන්සේලා බැහැ දැකීමට එන අවස්ථාව වනවිට සෝම හිමියෝ තම ගමන් මල්ල සහ සිවුරු පිරිකරද සූදනම් කරගෙන කිසියම් ගමනකට සූදනම්ව සිටියහ. ශාසනික වශයෙන් උන්වහන්සේ ගිහියන් වෙත ඉටුවිය යුතු විශාල වැඩ කොටසක් ඉටු කළේ ධර්මායතනය තුළ වැජඹීමේ අපේක්ෂාවෙන් නොවේ. එය තමන් වෙතින් ඉටුවිය යුතුව තිබූ ශාසනික සේවයක් වශයෙන් සලකා එම අස්වැසිල්ලද සිත දරාගෙන එය අවසන් වූ මොහොතේම දහවල් දනයද වළඳ සෝම හිමියන් මේ සූදනම්

වන්නේ බුදුරජාණන් වහන්සේ අනු දැන වදාළ පරිදි පැවිදි ශික්ෂාවන් සම්පූර්ණ කරගනිමින් තම සංසාර විමුක්තිය සළසා ගන්නා ක්‍රියාමාර්ගයකට එළැඹීමටය.

'සෝම හාමුදුරුවො ආරණ්‍යගත වෙන්න යනවා.'

දයක දයිකාවන් අතරේ හාහෝවක් පැතිරිණි. ඇතැමකු එහි ඇත්ත නැත්ත දැන ගැනීමට නාහිමිවරුන්ගෙන් පවා ඒ පිළිබඳව විමසා තිබිණි. උන්වහන්සේලාද එය සැබෑවක් බව පිළිගත්හ.

'සෝම හාමුදුරුවො මේ විකට මොන තරම් ලොකු වැඩ කොටසක්ද කළේ. ඒත් ඒවා රුස්සන්නෙ නැති මිනිස්සු සෝම හාමුදුරුවන්ගෙ හිත නරක් කළා. ඒක හින්ද වෙන්න ඇති උන්වහන්සෙ ඔය ආරණ්‍යගත වෙන්න යන්නෙ.'

සෝම හිමියන්ට හිතවත් අය එසේ කියනු ඇසිණි.

'අපි නම් හිතන් හිටියෙ මෙතන මූලිකත්වය අරන් ඔය වැඩ කරවනකොට කවදා හරි ස්ථානයේ හිමිකම ගන්න හිතේ තියාගෙන කියලයි. බලන් ගියාම උන්වහන්සෙ එහෙම කෙනෙක් නෙමෙයි. සේරම එක මොහොතකින් අත් ඇරලා දලා ආරණ්‍යගත වෙන්නත් හිතේ මොන තරම් ශක්තියක් තියෙන්න ඕනෙද?'

එසේ කතාබහ වුණු අයද සිටියහ.

සෝම හිමියන් ගැන අහිතකින් තැන් තැන්වල කතාබහ කොට තිබූ තවත් කිහිප දෙනකු උන්වහන්සේව බැහැ දැක,

'හාමුදුරුවනේ, පෘථග්ජනයො හැටියට අපේ අතින් වරදක් වුණා නම් සමාවෙන්න. ඔබවහන්සෙ ආරණ්‍යගත වෙන්න යන්න එපා. මෙහෙම වැඩ හිඳින්න' යි කන්නලව් කළහ.

මේ ඇසූ සෝම හිමියන්ගේ මුහුණේ පැහැබර සිනාවක් ඇඳිනි. උන්වහන්සේ තමා ඉදිරිපිට හිඳින සියලු දෙනා වෙතම කාරුණික බැල්මක් හෙලූහ.

'මං මේ අමනාපෙකින් යන ගමනක් නෙමෙයි. මේවා භික්ෂූන් වහන්සේ නමක් හැටියට අපේ ශ්‍රමණ ප්‍රතිපදවට අයිති දේවල්.'

දහසකට අධික උපාසක උපාසිකාවෝ කිසියම් අවමඟුලකට සහභාගි වූ පිරිසක් මෙන් ශෝකාකුලව සෝම හිමියන් පිටත්ව යන මඟ දෙපසට වී කඳුළු පිරි දෑසින් බලා සිටියහ.

'ඔච්චර දුෂ්කර පළාතක ඔබවහන්සෙ තනියම ඉන්නෙ කොහොමද? ඔබවහන්සේට හුඟක් කරදර විඳින්න වෙයි. ඒ නිසා ඔය අදහස අත හැරගෙන මෙහෙම නවතින්න.'

සෝම හිමියන්ගේ මෙම නික්මීම පිළිබඳව හදිසියේ දැනගත් බොහෝ දෙනෙක් එසේ ඉල්ලා සිටියහ.

'මං පැවිද්දෙක්. මට ඕනෙම තැනක ඉන්නත්, ඕනෙම දුෂ්කර ජීවිතයක් ගත කරන්නත් කිසිම අපහසුවක් නෑ. ශ්‍රමණ ප්‍රතිපදව වඩන භික්ෂුවකට ඒ දෙකේ කිසිම වෙනසක් පේන්න විදියක් නැහැ.'

අපමණ සතුටින් සහ සැහැල්ලු සිතින් යුතුව සෝම හිමියෝ ආරණ්‍යගත වීම සඳහා ධර්මායතනයෙන් නික්මුණහ.

# 11 සෝම හිමියන් ගැන තරුණ පිරිස් කලකිරවන වෑයමක්

උදුවූ එම ඇසල පෝයෙන් පසුව ධර්මායතනයෙහි ප්‍රබල වෙනසක් දක්නට ලැබිණි. තරුණ තරුණියන් දහස් ගණනින් රැස්වෙමින් නිරන්තරව ක්‍රියාකාරීව පැවැති භූමිය එකවරම අක්‍රීයව ගිය ස්වභාවයක් පෙනෙන්නට විය. ඒ ගුප්ත නිහැඬියාව තුළ මුසුව තිබුණේ මහත් ශෝකාකුල බවකි.

වෙනද මේ බිම තුළ උද්‍යෝගයෙන් ක්‍රියාකාරී වන තරුණ පිරිසට ප්‍රබල මාර්ගෝපදේශකයෙක් විය. ඒ කවරකුවක් නොව තරුණ සෝම හිමිපාණෝය. එහෙත් අද ඒ හිමියන් එහි නොමැත. පැවිදි ප්‍රතිපදාවන් වඩවා ගැනීමේ අරමුණින් උන්වහන්සේ ආරණ්‍යගත වූහ. තරුණ තරුණියන්ට දැනුණේ තමන් අතරමං වූ බඳු ස්වභාවයකි.

ධර්මායතනයෙහි මූල්‍ය කළමනාකාරීත්වය ඇතුළු වගකීම් ඊ. සක් ශාසන සේවක සමිතිය වෙතින් නොපිරිහෙලා ඉටු වුවත් ශ්‍රමය බොහෝවිට කැප වූයේ තුරුණු සවිය, තරුණ ශීල සමාදානය සහ දහම් පාසල ඔස්සේ තරුණ පිරිස් තුළිනි. ඒ නිසාම සෝම හිමියන්ගේ නික්ම යාමත් සමගම ඔවුන් තුළ නිරායාසයෙන්ම අක්‍රිය ස්වභාවයක් පිළිබිඹු වන්නට විය.

ඒ සමගම සෝම හිමියන් ආරණ්‍යගත වීම මත විවිධ කටකතාද පැතිරුණි. විශේෂයෙන්ම එහිදී ප්‍රධාන වශයෙන්ම

පැතිර ගිය කතාව වූයේ ශාසන සේවක සංගමයේ සෝම හිමියන්ට විරුද්ධ කිහිප දෙනාගේ කටයුතු හමුවේ කළකිරුණු ඒ හිමියන් ඒ මතින් ස්ථානය හැර ගිය බවකි. එය එසේ නොවන බවට නායක හිමිවරුන් කරන ලද පැහැදිලි කිරීම්ද ඒ තරම් පලක් වූ බවක් නොපෙනිණි. එසේම සෝම හිමියන්ගේ නික්මීමෙන් පසු වැඩිහිටියන්ගෙන් සමන්විත ශාසන සේවක සංගමය සහ තරුණ තරුණියන්ගෙන් සැදුණු තුරුණු සවිය එකට පෑහීමක් සිදුවූයේද නැත. වෙනදට සෝම හිමියන් කළේ ශාසන සේවක සංගමය කළමනාකාරිත්වයෙහි තබාගෙන තරුණ පිරිස එකමුතු කරගෙන ඔවුන්ට මග පෙන්වන්නකු වශයෙන් කටයුතුවල යෙදීමයි. එහෙත් උන්වහන්සේගේ නික්මීමෙන් පසු මේ දෙපිරිස අතර වූ බැඳීම ඇති කළ පුරුක බිඳී යාමෙන් දෙපිරිස තුළ පෑහීමක් නොමැති තත්ත්වයක් උද්ගත විණි.

කෙසේ වුවද තරුණයන් තමන් වෙත නම්මවා ගැනීමට කල්යල් බලමින් සිටි ශාසන සේවක සංගමයේ දෙතුන් දෙනකු හට මෙය ඊට උචිතම අවස්ථාව ලෙස හැඟුණි. ඒ අනුව තෝරාගත් තරුණ තරුණියන් පිරිසක් වෙත බුදු පිළිම රැසක් බෙදා දී තිබුණේ ඔවුන් මෙතෙක් විහාරස්ථානය වෙනුවෙන් කළ සේවයට තුටු පඩුරු පිදීමක් වශයෙන් හඟවමිනි. නමුත් තරුණ පිරිස මින් සෑනසීමට නොහැකි වූ අතර සෝම හිමියන්ගේ ආරණ්‍යගත වීම හේතුකොටගෙන ඔවුන්ගේ සිත් බලවත් ලෙස පෑරී තිබිණ.

මේ අතර තවත් විශේෂ දෙයක් සිදුවිය. සෝම හිමියන් ආරණ්‍යගත වීමට පෙර නිකුත් වූ ඒ හිමියන්ගේ පළමු කෘතිය වූ 'රාහුල මාතා' විශාල පිරිසක් විසින් කියවනු ලදුව, විශේෂයෙන් තරුණ ශීල සමාදනයේ තරුණියෝ යශෝධරා දේවියගේ චරිතයේ උත්තරීතර බව පිළිබඳව වශීවී සිටියහ. ඒ අනුව පැවිදි වී යශෝධරා දේවිය මෙන් ආර්ය මාර්ගයට පිවිසීමට ඔවුන් බොහෝ දෙනකු තීරණය කොට තිබිණි. එපමණටම රාහුල මාතා කෘතිය තුළින් යශෝධරා දේවී චරිතය අතිසංවේදීත්වයකින් යුතුව විවරණය විය.

කෙසේ නමුත් පැවිදි වීම සඳහා යම් පියවරක් ගැනීම මෙම

තරුණියන් හට ගැටලුවක් වී තිබුණේ තම මාර්ගෝපදේශකයාණන් වූ සෝම හිමියන් නොමැති වීමය. අවසානයේ ඔවුහු සෝම හිමියන් විසූ ආරණ්‍යයේ ලිපිනය සොයා දැනගෙන ඊට උපදෙස් පතා උන්වහන්සේට ලිපි ලියන්නට පටන් ගත්හ.

එහෙත් ශාසන සේවක සංගමය සහ විහාරස්ථානයට සම්බන්ධව සිටි කීපදෙනකුට එය සුභ ආරංචියක් වූයේ නැත.

"අන්න මෙහෙ ගෑනු ළමයි සෝම හාමුදුරුවන්ට ලියුනුත් ලියන්න පටන් අරගෙන" යනුවෙන් කටකතා පැතිරෙන්නට විය. ඒ අනුව සෝම හිමියන් උන්හිටි හැටියේ ආරණ්‍යගත වීමට හේතුවද පෙම් පලහිලව්වක් බවට කතාවක් පැතිරුණි.

සෝම හිමියන් පිළිබඳව තරුණියන්ගේ සිත් බිඳවීම සඳහා ඇතැමකු මෙයද ප්‍රයෝජනයට ගන්නට ඇත. තරුණියන් නම්මා ගතහොත් පරිපාලනමය කටයුතුවලට පහසුවකි. එහෙත් එයද ඔවුන් අපේක්ෂා කළ පරිදි ඉටුවූයේ නැත. නමුදු ශාසන සේවක සමිතියේ බහුතරය මෙම ක්‍රියාවන්ට කිසිසේත් සම්බන්ධ නොවූහ.

මේ සියල්ලගෙන් වෙන්වූ සෝම හිමියන් මේ වනවිට වැඩ සිටියේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් පැරණි දිගාමඩුල්ල ප්‍රදේශයෙහි මහඔය, උණු වතුර බුබුල නම් ඈත පිටිසර, දුෂ්කර ගම්මානයෙහි පිහිටි වෙහෙරගල ආරණ්‍යයෙහිය. දුටුගැමුණු යුගයේදී මහරහතන් වහන්සේලා වැඩ සිටි බවට අනුමාන කෙරෙන මෙම පුණ්‍ය භූමිය දැන් ඉතාමත් අප්‍රකටව පවතියි. කටාරන් කොටන ලද ගල්ලෙන්, මහා සංඝරත්නයට පූජා කළ බව දැක්වෙන ලෙන් ලිපිවලින්ද මෙය සමන්විතය. වර්තමානයේ පවා මෙය ඉතා දිළිඳු ගම්මානයකි. වන සතුන්ගෙන් ගහන කැළෑවකට ඔබ්බෙහි පැවැති එය නාගරික ලක්ෂණවලින් ඉතාම දුරස්ව තිබූ අතර මේ වනතුරුත් විදුලි බලය පවා ලැබී නොමැති බෙහෙවින් පිටිසර ප්‍රදේශයකි.

නමුත් සෝම හිමියන්ට මෙය නුහුරු ස්ථානයක් නොවේ. අම්පිටියේ රාහුල නාහිමියන් මින් මඳ කලකට පෙර භාවනානුයෝගීව වැඩ සිටියේත් මේ ස්ථානයෙහිමය. උන්වහන්සේලා මෙහි භාවනානුයෝගීව වැඩ වසමින් පිණ්ඩපාතයෙන් යැපෙමින් ජීවත්

වන්නාහ.

දිළිඳු වුවද, මෙහි විසූ ගැමියෝ දැහැමි බවින්ද, ආගන්තුක සත්කාරයෙන්ද, දිළිඳු වූවෝ නොවූහ. ඔවුහු තමන්ට හැකි අයුරින් මෙහි වෙසෙන ස්වාමීන් වහන්සේලාට දනමාන සැපයූහ. එහෙත් වනගත ප්‍රදේශවල සතුන් දඩයම් කරන හා නීති විරෝධී මත්පැන් ජාවාරම් කරන කිහිප දෙනකු මෙම ස්වාමීන් වහන්සේලා තම කටයුතුවලට බාධාවක් සේ සැලකූ බැවින් උන්වහන්සේලාගේ පැමිණීම නොරිසි වූහ. නොදියුණු අවිහිංසක ගැමියන් සිවුපසයෙන් සංග්‍රහ කරන අතරේ උන්වහන්සේලාව නොරිසි වූ එක් පුද්ගලයකු වරක් රාහුල හිමියන් පිණ්ඩපාතයේ වැඩි මොහොතක උන්වහන්සේගේ පාත්‍රයට ගොම බෙද තිබිණි. අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නයට බුද්ධ කාලයේ පටන් මෙවැනි දේවල් අරුම නොවේ. ඒ නිසාම රාහුල නාහිමියෝද මින් නොසැලුණහ. එම පුද්ගලයා පසුව මානසික විකෘතිතාවයට පත්වනු ලදුව මහත් වද වේදනා විඳින බව රාහුල නාහිමියන්ට සැළවිණි. උන්වහන්සේ ඒ පුද්ගලයා පිළිබඳව මහත් සංවේගයෙන් කතා කළහ. සෝම හිමියන් තම අභිනව වාසස්ථානය වශයෙන් තෝරාගෙන තිබුණේ මෙකී යෝගාශ්‍රමයය.

මෙම යෝගාශ්‍රමයෙහි එක් ගල්ලෙනක් සෝම හිමියෝ සිය වාසය සඳහා තෝරා ගත්හ. උන්වහන්සේ හැරුණු විට එහි වෙනත් කිසිදු භික්ෂූන් වහන්සේ නමක් තබා ආවතේවයට කැපකරුවකුවත් සිටියේ නැත.

සෝම හිමියන් පැවිදි බිමට පත් මුල් කාලයේ තවත් භික්ෂූන් වහන්සේලා සිව් නමකද සමග වරක් මේ බිමට වැඩම කොට තිබිණි. අතීතයේ මහ රහතුන් වැඩ විසූ මේ භූමියෙහි වසර දහස් ගණනක් පැරණි ලෙන්වල පියගැට කාලයාගේ ඇවෑමෙන් කැඩී බිඳී තිබූ අතර සෝම හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා සිව් නම අවට වන ලැහැබෙන් සොයා එකතු කරගත් කුඩා ගල් කුට්ටි තබා ඒවා පිළිසකර කොට ගත්හ. බුදුරජාණන් වහන්සේ 'ආරණ්‍ය ගතෝවා, සුඤ්ඤාගාර ගතෝවා. රුක්ඛමූල ගතෝවා' ආදී වශයෙන් දක්වමින් භික්ෂුවකට වාසය සඳහා සුදුසුම ස්ථාන

වශයෙන් දැක්වූයේ වනපෙත්, කිසිවකු නොමැති පාළු ප්‍රදේශ, සුවිසල් ගස් සෙවනවල් වැනි ස්ථානය. එනිසා නගරාසන්නයේ මහල් ප්‍රාසාද නොව කෙළෙස් තැවීම සඳහා පැවිදි බිමට පිළිපන් භික්ෂූන් වහන්සේ නමකට වඩාත් උචිත වන්නේ එවන් ස්ථානයක්ම බව සෝම හිමියන්ටද වැටහී තිබිණි.

එහෙත්, තමන්ගේ සිව් පසය පිළිබඳව හෝ සෝම හිමියන් හට නිශ්චයක් නොතිබිණි. නමුත් ඒ කිසිවක් පිළිබඳව හෝ උන්වහන්සේ නොතැකුහ. එම වෙහෙරගල පාමුල පිටිසර ගම්මානයෙහි පිඬු සිඟා වඩිමින්, ජීවිතය රැකගෙන මෙම වන අරණ තුළ බවුන් වැඩීම උන්වහන්සේගේ පරම අභිලාෂය විය.

# 12 සර්පයන් සමග ගල් ගෙයක් තුළ

මිනිස් පුළුටක් පවා නොවුණු ඒ පාළු ආරණ්‍ය තුළ සෝම හිමියෝ තනි වූහ. බෙහෙවින්ම දුෂ්කර, කිසිදු පහසුකමකින් තොර වූ නුදුරේ වන ගහනයකින්ද යුතුවූ මෙවන් පෙදෙසක තරුණ භික්ෂූන් වහන්සේ නමක් භාවනානුයෝගීව වැඩ හිඳීම සුවිශේෂ සිද්ධියක් සේ ගම්වැසියෝ කල්පනා කළහ. භික්ෂූන් වහන්සේ නමක් තම ගම් ප්‍රදේශයට පැමිණීම එම අවිහිංසක ගැමියන්ට සතුටක් වුවද උන්වහන්සේ තනිව විසීම මතින් කිසියම් කරදරයකට මුහුණ පැවොත් යන බිය ඇතැමුන් තුළ පැන නැගී තිබිණි.

'මේ භික්ෂූන් වහන්සේ නමකට සුදුසුම ස්ථානයක්. ඒ හින්ද ඒ ගැන බයක් ඇති කර ගන්න වුවමනාවක් නැහැ. අනික මං මෙහාට ආවෙ භාවනා කරන්න. ඒකට තනියම ඉන්න එක තමයි සුදුසුම විදිහ.'

සෝම හිමියෝ පැවසූහ.

ඉතා අළුයමින් අවදි වන සෝම හිමියෝ ඉන්පසු පැය කිහිපයක් යනතුරුම භාවනානුයෝගීව වෙසෙති. ඉන්පසු පොළවට හිරු එළිය එබිකම් කරන යාමය වනවිට මුහුණ දොවා හීලට ගැමියන් ගෙන් ලැබෙන කොළ කැඳ වැනි යමක් පානය කරති. ඒ හැර හීල් දනය වශයෙන් යමක් වැළඳීමක් සිදු නොවේ. ඉන්පසු පාත්‍රයද දෝතින් ගෙන සන්සුන් ගමනින් උන්වහන්සේ පිණ්ඩපාතයෙහි

වඩිති. අධික වියළි දේශගුණයකින් යුතු එම ප්‍රදේශයෙහි යන්තමට හිරු මුදුන් වනවිටත් පවතින්නේ දැඩි උණුසුම් බවකි. එනිසාම එම පොළවෙහි නිරන්තරයෙන් පවතින සුදු වැලි පස යන්තම් හිරු එළිය වැටුණු මොහොතේ සිටම උණුසුම් වන්නට පටන් ගනී. මේ වැලි රත් වන්නට පෙරාතුව පිණ්ඩපාතය ලබා ආපසු වැඩිය යුතුය. නැතහොත් ඒ උණුසුම දෙපා පිළිස්සෙන තරමට දැඩිව දැනේ. එනිසා උදෙන්ම පිණ්ඩපාතයේ වඩින සෝම හිමියෝ යළි ආරණ්‍යයට වැඩම කොට ස්නානයෙන් පසු දනය වළඳති. එම ආරණ්‍ය ගත ජීවිතය තුළ උන්වහන්සේ දන් වැළඳුවේ දිනකට එක් වේලක් පමණි.

මේ ප්‍රදේශයේ දිළිඳු ගැමියන් බොහෝවිටම යැපුණේ ගොවිතැනිනි. ඉතුත් වැඩිපුරම ඒ ප්‍රදේශයේ වගා කෙරුනේ වට්ටක්කා, කෙසෙල් වැනි බෝගය. මේ නිසාම පිණ්ඩපාතයේ වඩින සෝම හිමියන්ටද දනය වශයෙන් වැඩිපුරම ලැබුණේ එබඳු කටුක ආහාරයකි.

පර්වතයෙන් පහළට බැස අද එක් පාරකින් වඩින සෝම හිමියන් හෙට වඩින්නේ වෙනත් පාරකින් වෙනත් ප්‍රදේශයකටය. මේ නිසාම මඳ කලක් ගත වත්ම අද තම නිවස අද්දර පාරෙන් සෝම හිමියන් පිණ්ඩපාතයෙහි වඩින බවට අනුමානය බොහෝ ගැමියන් තුළ පැවති සාමාන්‍ය සිතුවිල්ලක් බවට පත්විය.

කෙසේ වුවද තමන්ගේ වත්කමේ හැටියට පිළියෙල කරන කුමක් හෝ යමක් ඔවුහු මේ හිමි නම වෙත මහත් ශ්‍රද්ධාවෙන් යුතුව පූජා කළහ.

මෙබඳු එක් දිනෙක දිවා කාලයේ හිරු මුදුන් වීමට පෙරාතුව සිය දවල් දනය වැළඳීම සඳහා සෝම හිමියෝ පාත්‍රයද ගෙන පත්කඩය එලා බිම වාඩි වූහ. තුන් වේලටම බත් ආහාරයට ගන්නා එම ප්‍රදේශයේ ගැමියන් පිණ්ඩපාතයේ වඩින සෝම හිමියන්ටද බොහෝ විටම පූජා කරනු ලැබුවේ බත් සමග මොනවා හෝ ව්‍යංජනයන්ය. මෙද දනය වැළඳීමට වූ සෝම හිමියන් බත් සමග තිබූ වට්ටක්කා ව්‍යංජනය වැළඳීමට සැරසුණි. එහෙත් එම වට්ටක්කා ව්‍යංජනය මුවට ගැනීමටත් නොහැකි තරමේ අධික ලුණු රසකින් යුතු විය. එය පිසූ කාන්තාව වැරදීමකින් දෙවරක්

ලුණු යෙදීම නිසා එවැන්නක් සිදුවී ඇති බව සෝම හිමියන්ට හැඟුණි. මෙම දනය වැළඳිය යුතු ආකාරය ගැන සිතූ සෝම හිමියන් තුළ කදිම අදහසක් පැන නැගුණි. එද උන්වහන්සේට තවත් එක් ගැමියකු ඉදුණු කෙසෙල් ඇවරියක්ද පූජා කොට තිබිණි. කෙසෙල් ඇවරියේ ගෙඩි ටික ලෙලි හැර පාත්‍රයට දමා ගත් සෝම හිමියෝ බතුත් සමග කෙසෙල් ගෙඩි හොඳින් අනා ගත්හ. කෙසෙල් ගෙඩි එකතු වීම නිසා ලුණු වැඩි ස්වභාවය අඩුවී එය වැළඳිය හැකි තත්ත්වයට පත්විය. රුක්ෂ ප්‍රතිපදවන් අනුගමනය කරමින් ආරණ්‍යගත වූ උන්වහන්සේ තුළ තමන් වහන්සේ මින් පෙර නොවැළඳූ අන්දමේ එවන් දනයක්ද වැළඳීම මතින් සිත පුරා සතුටු සහගත අස්වැසිලි ස්වභාවයක් ඇතිවී තිබිණි.

මෙම ප්‍රදේශයෙහි යකුන්, භූතයන් වැනි අමනුෂ්‍යයන්ද අරක් ගෙන සිටින බවට තදබල විශ්වාසයක් ගැමියන් තුළ කවදත් පැවතිණි.

බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයෙහිද වනයෙහි භාවනානුයෝගීව වැඩ සිටි භික්ෂූන් වහන්සේලා මෙබඳු විවිධ අමනුෂ්‍ය උපද්‍රවවලට මුහුණ දුන් බව බණ පොත්වල සඳහන්ය. එහෙත් ශීල, සමාධි, ප්‍රඥ වශයෙන් වූ අධ්‍යාත්මික ශක්තිය වර්ධනය කරගැනීම මතින් ඒ සියලුම දෝෂ තත්වයන් මැඩ පවත්වා ගත හැකි බව බුදුරජාණන් වහන්සේ අවධාරණය කොට තිබේ. ඒ බුද්ධාවවාදය සෝම හිමියන්ගේ සිත තුළද පැවතිණ.

මෙබඳු ඇතැම් රාත්‍රී යාමයන්හි නිහඬ වන ගැබ තුළින් එකවරම විවිධ ශබ්ද නැගෙනු සෝම හිමියන්ටද ඇසේ. කිසිසේත් අපේක්ෂා නොකළ අන්දමින් එක්වරම නැගෙන එවන් ශබ්දවලින් ක්ෂණිකව සිතේ තිගැස්මක් ඇති වුවද සෝම හිමියන් කරන්නේ පසුදින අළුයමින්ම එම ශබ්දය නැගුණේ කුමකින් විය හැකිදැයි සොයා බැලීමය. වරක් මෙවන් අවස්ථාවක සෝම හිමියන්ට එක්වරම වනයම ගිගුම් දෙන ආකාරයේ හඬක් ඇසිණි. මේ මොහොතේද සෝම හිමියන්ගේ හිතට නැගුණේ බුදුරජාණන් වහන්සේ දුෂ්කර ක්‍රියා කළ යුගය පිළිබඳව මැනවින් විස්තර වූ අරියපරියේසන සූත්‍රයය. එහි දැක්වෙන අන්දමට මහ වන මැද

දුෂ්කර ක්‍රියාවෙහි යෙදෙන සිදුහත් තවුසාණන්ට මෙවැනි සිත කළඹවන අන්දමේ විවිධ නාදයන් ඇසෙයි. එහෙත් සිදුහත් තවුසා පසුදින එතැනින් නික්මෙන්නේ ඒ නාදය කුමක් නිසා නැගුණේදැයි හරියට නිශ්චය කරගැනීමෙන් පසුවය. මේ අනුව එය ඇතැම් විට වන සතකුගේ නාදයකි. නැතහොත් මොණරකු වැනි විශාල කුරුල්ලකු ඉගිල ගිය නාදයකි. මෙය සිහිපත් කළ සෝම හිමියෝද පෙරද රාත්‍රියේ නැගුණු ගිගුම් හඬ කුමක් නිසා නැගුණාදැයි පසුද උදයේම විපරම් කර බැලූහ. තහඩු කැබැල්ලකින් සෙවිලි කර තිබූ වැසිකිලි වහල මතට තුදුරින් වූ නා ගසින් අත්තක් කඩා වැටී ඇති බව සෝම හිමියන්ට පැහැදිලි විය. බුදුරජාණන් වහන්සේගේ දහමට අනුව කටයුතු කරන විට මහා වනයක් වුවද මිනිසාට බියකරු නොවන බව සෝම හිමියන්ට ඒ මොහොතේද හැඟුණි.

එම වනයෙහි තවත් බියකරු තත්වයක් වූයේ නයින්, මාපිලූන්, පොළඟුන් වැනි විසකුරු සර්පයින් නිරතුරු ගැවසීමය. අම්පිටියේ රාහුල නාහිමියන් මෙහි භාවනානුයෝගීව වැඩ හුන් පෙර කලෙක උන්වහන්සේ විසූ ගල් ලෙනෙහි පොළඟුන් දෙදෙනකුද වරින් වර පැමිණ වාසය කළ බව සෝම හිමියෝ දැන සිටියහ. එහෙත් උන්ගෙන් රාහුල නාහිමියන්ට කිසිදු අනතුරක් සිදුවූයේ නැත.

පෙරඹර පුන් සඳ පායා තිබූ එක් සැඳෑ යාමයක සෝම හිමියෝ ධර්ම ශාලාව වශයෙන් පැවැති විශාල ගල්ලෙනෙහි සක්මන් භාවනාවෙහි පසුවූහ. එහි ගණඳුර පහවී තිබුණේ ගල් ලෙන තුළට කාන්දු වී තිබූ සඳ කිරණෙහි සහන් එළියෙන් පමණි. අඳුරු ලෙන තුළ සක්මන් භාවනාවෙහි නිරත වෙමින් සිටි සෝම හිමියන්ට රිදී පැහැති රේඛාවක් තමා ඉදිරිපසින් වැටී ඇති අයුරක් පෙනිණි. එය ගල් ලෙනෙහි ගල් කුළු දෙකක් අතරින් පෙරී ආ සඳ කිරණක් විය යුතු යැයි සිතා ඒ පිළිබඳ තැකීමක් නොකර ඊට පය තබන්නටත් සිතා යළිදු එය කුමක්දැයි සැක හැර දැන ගැනීමේ ක්ෂණික සිතුවිල්ලක් උන්වහන්සේ තුළ පහළ විය.

පහනක් දල්වා එය රැගෙන විත් බැලූ විට තමන් වහන්සේ දුටු දසුනින් සෝම හිමියන් තුළ ඇති වූයේ ක්ෂණික තිගැස්මකි. ඒ සඳ කිරණ රේඛාවක් නොව දැවැන්ත ලේ මාපිලෙකි. එම සර්පයාට

එතැනින් යන්නට හැර සෝම හිමියෝ ආපසු හැරුණාහ.

මේ ආකාරයෙන් ඉතාමත් සැහැල්ලු සුවදායී මානසිකත්වයකින් යුතුව මහණ දම් පුරමින් සිටි සෝම හිමියන්ට තැපෑලෙන් ලියුම් කිහිපයක් ලැබුණේ හදිසියේමය. එය සෑහෙන කලකට පෙර තැපෑලට යොමු කළ, එහෙත් පමාවී ලැබී තිබූ ලිපි බව එහි සඳහන් වී තිබූ දින අනුව සෝම හිමියන්ට වැටහිණි. විවේකයක් ලද මොහොතක එය කියවා බලද්දී ඒ තරුණ ශීල සමාදනයට සම්බන්ධව සිටි තරුණියන් කිහිප දෙනකු පැවිදි වීමේ අභිලාෂයෙන් ලියන ලද ඒවා බව සෝම හිමියන්ට වැටහිණි. ඔවුන් ඒ සඳහා පෙළඹී තිබුණේ සෝම හිමියන්ගේ 'රාහුල මාතා' කෘතිය කියවීමෙන් පසුවය. මේ තරුණියන් සියලු දෙනාටම කරුණු පහදදීම සඳහා පොදුවේ එක ලිපියක් ලිවීමට සෝම හිමියෝ කල්පනා කළහ.

'පැවිදි වීමේ අදහස ඉතා උතුම් දෙයක්. නමුත් අපගේ ථෙරවාදී ශාසනික සම්ප්‍රදයට අනුව කාන්තාවකට භික්ෂුත්වය සහ උපසම්පදාව ලබාගැනීමේ අවකාශයක් නෑ. නමුත් භික්ෂුත්වය හෝ උපසම්පදාව ලද නොහැකි වුවත් ගිහි ජීවිතය අත හැරීමට, විදර්ශනා මාර්ගයට පිවිසීමට, සෝවාන ආදී මාර්ග ඵලයන්ට එළැඹ මහ රහත් භාවය ලැබීමට කාන්තාවනට නොහැකි යැයි කියා සඳහනක් නෑ. බුදුරජාණන් වහන්සේ මූලික වශයෙන් පැවිදි ප්‍රතිපදාව වගේම ගිහි ප්‍රතිපදාවකුත් පෙන්වා දී තිබෙනවා. ගිහියන් සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගයට ලෞකික වශයෙන් පිවිසීමට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කර තිබෙනවා. එනිසා දැනට දෙමාපියන් ආදී වූ පවුලේ අයට ඉටුවිය යුතු යුතුකම් ඉටු කරන්න. බුදුරජාණන් වහන්සේ පවා ඒවා ඉතා ඉහළින් අගය කළා. සිල්වත් ගිහි ජීවිතයක අගය බුදුන් වහන්සේ බෙහෙවින් වර්ණනා කළා. නිති පංච ශීලයේ පිහිටා කටයුතු කරන ගිහියන් නුවණැත්තන් හෙවත් පණ්ඩිතයන් වශයෙන් බුදුරජාණන් වහන්සේ හඳුන්වා දී තිබුණා. ඒ නිසා සිත කනස්සලු කරගන්න එපා. ලෞකික වශයෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගයට පිවිසිලා ගිහි ජීවිතයේ හිඳ කුසල් වඩවා ගන්න.'

සෝම හිමියෝ එලෙස උපදෙස් දෙමින් සිය ලිපිය තැපෑලට යොමු කළහ.

තරුණ ශීල සමාදනයේ පැවැත්වෙන දේශන සඳහා ශාසන සේවක සමිතිය මගින් විවිධ විද්වතුන් ගෙන්වීමට කටයුතු යොද තිබිණි. මෙම සමිතියට සම්බන්ධ ඇතැමුන් මෙම විද්වතුන් සමග සම්බන්ධතා ඇති කර ගැනීම තමාට ලද හැකි අති මහත් ගෞරවයක් ලෙස සැලකූහ. ඔවුහු ඒ පුද්ගලයන් සමග සමාජ සම්බන්ධතාවයන් වර්ධනය කරගනිමින් ධර්මායතනය මුල් කොට ගෙන හුදු සමාජමය කටයුතුවල නියැලුණහ. නමුත් සෝම හිමියන් එකල ධර්මායතනය තුළ ශාසනික කටයුතුවල යෙදුණේ ඊට මුළුමනින්ම පරිබාහිර වූ ස්ථාවරයක හිඳගෙනය. පුද්ගල සම්බන්ධතා සෝම හිමියන් කවදත් ඉහළින් සැළකුවේ නැත. සියල්ලන්ම එක හා සමාන ලෙස දකිමින් උන්වහන්සේ ඒ සෑම දහඩිය බිඳුවක්ම හෙලුවේ ශාසනික වශයෙන් කළ හැකි සේවාවන් අවංකවම ඉටු කිරීම උදෙසාය.

සෝම හිමියන්ව ඇතැමකු නොරිස්සුවේ උන්වහන්සේ තුළ වූ මේ සෘජු පැවතුම් නිසාමය. උන්වහන්සේ විසින් තමාට එවන ලද ලිපිවලට පිළිතුරු වශයෙන් එක් තරුණියක් වෙත යොමු කරන ලද ඉහත කී ලිපිය එම තරුණියගේ මව අතට පත්වූයේ මේ මොහොතේදීය. ලිපිය කියවූ එම මවට සිය දියණිය ගිහි ගෙය හැර යාවි යැයි බියක් ඇතිවිය. ඇය දියණියට විවාහ යෝජනා කළමුත් දියණිය එකහෙලාම එය ප්‍රතික්ෂේප කළාය.

# 13 දිසාපති නිවහනක් අද්දර නුග ගහක් යට සැතපෙයි

පැවිදි බිමට යොමු වීමේ අරමුණින් ඒ සම්බන්ධ උපදෙස් පතා සෝම හිමියන්ට ලිපි ලියූ යුවතියන් අතරින් එක් යුවතියක තුළ පැවිදි වීමේ අදහස තදබල ලෙසින්ම කා වැදී තිබිණි. එම අරමුණ යහපත් වුවත්, මෙරට මෙහෙණි සසුනක් නොමැතිවීම සහ ගිහි ජීවිතය තුළ මව්පියන් ආදීන්ට ඉටුවිය යුතු යුතුකම් පළමුව ඉටු කර පසුව ගිහිගෙයින් නික්මීම සුදුසු බව විස්තර කොට දක්වමින් සෝම හිමියන් පිළිතුරු ලිපියක් යොමුකර තිබුණේද ඇය වෙතමය.

මෙම යුවතියගේ මවට දැඩිව වුවමනා වූයේ සිය දියණිය වාසනාවන්ත යුග දිවියකට ඇතුළු වනු දැකීමය. එහෙත් ඇය එය එකහෙලාම ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් එම මවගේ කෝපයෙන් හරි අඩකටත් වඩා එල්ල වී තිබුණේ සෝම හිමියන් වෙතය. පසුව එම මව ලිපියද රැගෙන රාහුල නාහිමියන් බැහැ දුටුවාය.

"මේකෙ ඉතාම හොඳ අදහසක් ලියලා තියෙන්නෙ. මේ අනුව කටයුතු කරන එකේ කිසිම වරදක් නෑ" රාහුල නාහිමියෝ සෝම හිමියන්ගේ ලිපියෙහි වූ අදහස එකහෙලාම අනුමත කළහ.

ඒ කෙසේ වුවද සෝම හිමියන් තරුණ ශීල සමාදනයේ යුවතියකට ලිපියක් ලියා ඇති බව ශාසන සේවක සමිතියේ

වැඩිහිටි පිරිස අතර දවසට දෙකට වේගයෙන් පැතිර ගොස් තිබිණි.

'සෝම හාමුදුරුවො ගෑනු ළමයකුට ලියුමක් ලියලා ඒ ළමයගෙ අම්මට ඒක අහුවෙලා ලොකු හාමුදුරුවන්ටත් පෙන්නලා තියෙනවා.'

මෙය සත්‍යය තුළ සැඟවුණු බොරුවකි. සෝම හිමියන් ලිපියක් ලියූ බව සත්‍යයකි. එහෙත් එහි සැඟවුණු බොරුව වූයේ ලිපියෙහි අඩංගු අදහස්වලට පටහැනිව මිනිසුන් අතර පියාපත් ලබමින් පැතිර ගිය කට කතාය. බොහෝ මිනිසුන් තුළ සෙස්සන්ගේ වැරදි දැකීමට තිබෙන්නේ පුදුම ලොල් බවකි. එනිසාම කිසියම් හෝ වරදක් දුටු කල ඊට තම රුචිය පරිදි අදහස් එකතු කරමින් සිය අභිමතයට අනුව කතන්දර ගොඩ නගා ගැනීමට ඔවුහු වෙහෙසෙති. විශේෂයෙන් තමන් ප්‍රිය නොකරන පුද්ගලයකු සම්බන්ධයෙන් නම් මේ තත්වය තව කිහිප ගුණයකින් වැඩි වනු ඇත.

ශාසන සේවක සමිතිය තුළද මෙවැන්නෝ වූහ. පුද්ගලයන් කිහිප දෙනකු පිළිබඳව සැළකුවත් ඔවුන් එකිනෙකාගේ අදහස් විෂම වීම ස්වාභාවිකය. ඕනෑම තැනකට පොදු එම ධර්මතාව ශාසන සේවක සමිතිය සම්බන්ධයෙන්ද වෙනස් වූයේ නැත.

මෙබඳු එක් පුද්ගලයකු සෝම හිමියන් තරුණියකට ලිපියක් ලියා තිබීම සහ ඇගේ මවට හසුව තිබීම යනාදී වශයෙන් තම දෙසවනින් ඇසූ පුවතින් මහත් වූ සංතෘප්තිදායක තත්වයකට පත්ව තිබිණි. ඔහු කවදත් සෝම හිමියන්ව රිස්සුවේ නැත. හේතුව සෝම හිමියන් ධර්මායතනයේ සිටින තාක් කල් තම තමන්ට එහි තරුණ පිරිස අතර කැපී පෙනීමේ හැකියාව අහිමි වේයැයි සැළකීමය. මේ අනුව ඔහු රාහුල ලොකු හාමුදුරුවන් බැහැ දුටුවේ උන්වහන්සේ මේ කියන ලිපිය දුටු බවක් කිසිසේත් නොදැනය.

මේ පුද්ගලයා පැහැදිලි කරන කරුණු රාහුල හාමුදුරුවෝ නිහඬව අසා සිටියහ.

'මහත්තයෝ, මේකයි කාරණේ. ඔය කියන ලියුම මාත් මගේ ඇස් දෙකෙන්ම දැක්කනෙ. ඒකෙ තිබුණෙ ඉතාමත් හොඳ අදහසක්.

ඔය කියන විදිහෙ කිසිම නරක අදහසක් ඒකෙ තිබුණෙ නෑ.

රාහුල නාහිමියන් ලිපිය දුටු බව ඇසීම එම පුද්ගලයාට අලුත් ආරංචියකි. එහෙත් තමන් වෙත තටු සලා ආ ආරංචිය සහ රාහුල හිමියන්ගේ කීම අතර යම් පරස්පරතාවයක් පවතී. නැතහොත් උන්වහන්සේගේ කීම සත්‍යයක් වුවද එය පිළිගැනීමට තම යටි සිත පසුබාන තත්වයක් ඇතිවී තිබුණි.

නායක හාමුදුරුවනේ, ඔබවහන්සේ ඔය කියන්නෙ එක ලියුමක් ගැන වෙන්න ඇති. ඒකෙ ඔය කියන විදිහට හොඳ කාරණා කාරණා තියෙන්න ඇති. ඒත් ඒක නෙමෙයි තව ලියුමක් තියෙනවලු.

ඔහු නොඉවසුම් සහගත ලෙස එහෙත් රහසක් පවසන ආකාරයෙන් කීය.

සෝම හාමුදුරුවො හදිස්සියෙ ඔය ආරණ්‍යගත වුණේ නිකම්ම නෙමේ. උන්වහන්සේ එහාට වෙලා මොනවද කරන්නෙ කියලත් මෙහෙ කට්ටියක් බලන්න යන්නයි ඉන්නෙ.

රාහුල නාහිමියන් තුළත් යම් කුකුසක් වැඩෙන ආකාරයට තමන් තුළ වූ සිතුවිලි උන්වහන්සේ තුළ රෝපණය කරවන්නට අවසානයේ මේ පුද්ගලයා සමත්ව තිබිණි.

ධර්මායතනය යනු කවදත් ධර්මධර විනයධර භික්ෂූන් වහන්සේලා වැඩ හුන් පින් බිමකි. ඒ නිසාම එය නොයෙකුත් ගිහි විද්වතුන්ද රැස්වන රට පිළිගත් ස්ථානයක් විය. මේ තුළින් සමාජයේ ඉහළ තැනක වැජඹීමට අපේක්ෂා කළ ඇතැම් පුද්ගලයන්ට කවදත් බාධකයක් ලෙස පෙනුණේ සෝම හිමියන්ය. ඉහත සඳහන් කළ පුද්ගලයාද මේ ගණයට අයත් වූවෙකි. මෙලෙස මතුපිටින් වැඩි අහිතවත් බවක් නොපෑවත්, ඇතුළතින් සෝම හිමියන් ධර්මායතනයෙන් නෙරපා හැරීම පිළිබඳ තදබල අවශ්‍යතාවයක් දැක්වූ වැඩිහිටියන් කිහිප දෙනා දිගින් දිගටම මේ වැඩ පිළිවෙලෙහි නිරත වූහ. මේ වැඩ පිළිවෙල දැන නොසිටි නායක හිමිවරුද මේ තත්වය මත යම් අසරණ භාවයකට පත්වූහ.

එහෙත්, සෝම හිමියන් පිළිබඳව සැබෑ තත්වය නුවණින් වටහාගෙන සිටි අය අතර තරුණ මෙන්ම වැඩිහිටි පිරිසක්ද වූහ. මේ අයගේ මාර්ගයෙන් සෝම හිමියන්ටද තමා සම්බන්ධයෙන් ධර්මායතනයෙහි උද්ගතව ඇති තත්වය දැනගන්නට ලැබිණි.

මෙය මොනතරම් කෙලෙස්වලින් පීඩිත වූ ගැටුම්කාරී අර්බුදකාරී සමාජයක්දැයි සෝම හිමියන්ට හැඟුණි. වඩාත්ම උන්වහන්සේ තුළ කම්පාවක් ඇති කරවන්නට සමත් වූයේ තමා සිවුර ඉවතලා මෙම ප්‍රදේශයේම පදිංචි වී අදල යුවතිය විවාහ කරගෙන පවුල් ජීවිතයක් ගත කිරීමට සැරසෙතැයි පැතිර තිබූ කටකතාවය. එම යුවතියගේ සමීපතම මිතුරියක් මොණරාගල පදිංචිව හිඳියි. ඇගේ පියා මොණරාගල එවකට සිටි දිසාපතිය. මේ අයගේ උපකාරය ලබා තමා පෙර කී යුවතිය සමග විවාහයට සැරසෙන බවට පැතිර තිබූ මේ කට කතාව සෝම හිමියන්ට දැනගන්නට ලැබුණේද තමාට හිතවත් ධර්මායතනයට සම්බන්ධ තරුණයන් වෙතිනි.

විස්තර කළ නොහැකි තරමේ කම්පාවක් සිතට දැනුණත් මේවා පැහැදිලි කර දී මෙම අවුල සමථයකට පත්කිරීමට යළි අගනුවර පැමිණියහොත් එය තමන්ගේ මූලික අභිප්‍රායට බාධාවකි. තමන් මෙලෙස ආරණ්‍යගත වූයේ පැවිදි ප්‍රතිපදාවන් පිරීමේ පරම පිවිතුරු අධිෂ්ඨානය පෙරටු කරගෙනය. එය අත හැරද මේ අවුල් පසුපස හඹා යාම මගින් තම මූලික අපේක්ෂාව බිඳීයාමට පුළුවන. එනිසා උන්වහන්සේ මෙවන් තත්වයක් උද්ගත වී තිබෙන බවත්, මෙයින් කළබල නොවන ලෙසත් දන්වා සිද්ධිය විස්තර කොට දිසාපතිවරයාට ලිපියක් යැව්වේ ඔවුන් මෙය වෙනයම් ක්‍රමයකට දැන ගතහොත් තවත් විශාල අවුල් වියවුල් රැසකට හේතු විය හැකි යැයි සැළකූ බැවිනි.

උගත්, බුද්ධිමත්, සිවිල් පරිපාලන නිලධාරියාට එම ලිපිය කියවූ සැනින් සැබෑ තත්වය මැනවින් වටහා ගත හැකිවිය. ඔහු සෝම හිමියන්ව ඇසුරු කර නොතිබුණත් ධර්මායතනයට සම්බන්ධව සිටින අයකු බැවින් සෝම හිමියන් එහි කර තිබෙන අනුපමේය වූ සේවාව හොඳින්ම දැන සිටියේය. තමන් තුළ ඇතිවූ

මහත් වූ කම්පනය හේතුවෙන් ඔහු වහාම සෝම හිමියන්ට ලිපියක් ලියුවේ මොණරාගල ප්‍රදේශයට යම් දිනක වැඩම කළහොත් එදිනට හැකිනම් තමන්ගේ දිසාපති නිල නිවාසයටද වැඩම කරන ලෙසට වූ ආරාධනාවක්ද සමගිනි.

මෙය එක්තරා ආකාරයකින් සෝම හිමියන්ට දිරියක් විය. තමන් පිළිබඳ සත්‍ය තත්වය තේරුම් ගත් මෙවන් බුද්ධිමත් පුද්ගලයකු සිටීම මේ අවස්ථාවේ විශාල යහපතකි. එසේ නම් මේ දිසාපතිවරයා මගින් මේ අවුල යම් පමණකට හෝ නිරාකරණය කරගන්නට පිටිවහලක් ලබා ගැනීමට අසීරු වන්නේ නැත. විශේෂයෙන් තමා පෙර කී යුවතියට ලියුවේ යැයි කියන ලිපිය ප්‍රසිද්ධ කරන ලෙස හෝ වගකිව යුත්තන් පිරිසක් ඉදිරියේ ප්‍රසිද්ධියේ කියවන ලෙස ඔහු මගින් හෝ ඉල්ලා සිටිය හැක. සිත පුරා පැතිර තිබූ කම්පාව මතින්ම සෝම හිමියෝ එක්තරා දිනෙක මොණරාගල බලා වැඩියහ.

දිසාපති නිල නිවාසයට යනවිට බෙහෙවින් අඳුර වැටී තිබිණි. ඒ අඳුරේ දිසාපති නිල නිවස කිම්දී පවතී. ඉන් හැගවෙන්නේ නිවසේ කිසිවකු නොමැති බව විය හැක. කෙසේ වුවද සෝම හිමියෝ නිවසේ ඉදිරිපස දොරට තට්ටු කළහ. ඉන් කිසිදු ප්‍රතිචාරයක් නැගුණේ නැත. දොර ජනෙල් සියල්ලද වසා තිබේ.

මහන්සියෙනුත්, විඩාවෙනුත් සෝම හිමියන්ගේ ගතත්, සිතත් පෙළෙයි. කොයි මොහොතක හෝ දිසාපතිවරයා එනු ඇතැයි අපේක්ෂාවෙන් සෝම හිමියෝ නුදුරින් වූ විශාල නුග ගසක් යට වාඩි වූහ.

අහස පුරා පලසක් ඇතිරූ කලෙක මෙන් තරු පායා තිබිණි. එහෙත් තමන් වටා පැතිර තිබූ අන්ධකාරය ඉන් මුළුමනින්ම දුරු වූයේ නැත. බෙහෙවින් රෑ බෝවී ඇති බව පසක් කරවමින් පරිසරය පුරාම තීව්‍ර වූ නිහඬ බවක් පැවතිනි. දැඩිව නැගුණු විඩාව, කම්පාව සේම මින් නැගිට යා හැකි ප්‍රදේශයේ වෙනත් විහාරස්ථානයක් පිළිබඳ නොදැනීමද මතින් සෝම හිමියෝ තමන් වහන්සේගේ උරයේ වූ ගමන් මල්ලෙහි තිබූ දෙපට සිවුර ගෙන නුග ගස යට එළා එහි සැතපුණාහ.

මෙවන් ගසක් යට සැතපෙන්නට සිදුවීම පිළිබඳව සෝම හිමියන් තුළ මොහොතකට හෝ කම්පාවක් නැගුණේ නැත. බුදුරජාණන් වහන්සේ සිය ජිවිත කාලය තුළද වැඩිපුර සැතපුණේ මෙවැනි විසල් වෘක්ෂයන්හි සෙවන යටය. බුදුන් වහන්සේ පිරිනිවන් පෑවේද රුක් සෙවනකය. අල්පේච්ඡතාවයෙන් යුතු ශ්‍රමණයා පැවිද්දෙන් පොහොසතකු බවත් බහු භාණ්ඩිකත්වයෙන් යුතු ශ්‍රමණයා පැවිද්දෙන් දිළින්දකු බවත්, බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ඒ අනුව තමන් වහන්සේ පැවිද්දෙන් පොහොසතෙක්ය යන හැඟීම සෝම හිමියන්ගේ සිත පුරා අස්වැසිලි සහගත ලෙසින් පැතිරී ගියේය.

# 14 විරුද්ධවාදී දයකයෝ සෝම හිමියන් සොයා යති

මොණරාගල දිසාපති මැදුරේ නුග සෙවන යට සැතපී හුන් සෝම හිමියෝ අලුයමින්ම අවදි වූහ. දැන් මෙම ස්ථානයෙන් නික්ම යා යුතුව තිබේ. සුපුරුදු පරිදි දෙවුර වැසෙන සේ සිවුර හැඳ ගත් සෝම හිමියෝ උරයෙහි ගමන් මල්ලද ලා ගෙන පාත්‍රයද ගෙන මහ මගට බැස්සාහ.

නුදුරේ විහාරස්ථානයක් ඇති තැනක් උන්වහන්සේ දැන සිටියේ නැත. නමුත් පෙරමගට හමුවූ අයකුගෙන් මග අසාගෙන සෝම හිමියෝ විහාරස්ථානයක් කරා පිය නැගූහ.

'මම වෙහෙරගල ආරණ්‍යයේ වනවාසීව ඉන්න හාමුදුරු නමක්. ඊයෙ හැන්දෑවෙ මෙහෙ දිසාපතිතුමා හම්බ වෙන්න ආවා. ඒත් ඒ ඇත්තො බංගලාවෙ නෑ. වෙන යන්න තැනක් ගැන දැනගෙන හිටපු නැති නිසා ඒ වත්තෙ ගහක් යට සැතපිලා උදෙන්ම මේ ආවෙ.'

එම විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ වෙත සෝම හිමියන් තමන් පිළිබඳව හඳුන්වා දුන්නේ එසේය. තමා මහරගම ධර්මායතනවාසී භික්ෂු නමක බවත්, මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන්ගේ සහ අම්පිටියේ රාහුල නාහිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක බවත් පැවසුවොත් ඉන් විශාල සැලකුම් ලැබිය හැකි

බව සෝම හිමියෝ දනිති. එනිසාම ඒ පිළිවෙත සෝම හිමියන් අනුගමනය කළේ නැත. තමා පැලැනේ වජිරඤාන නාහිමිපාණන්ගේ වජිරාරාම සඟ පරපුරට අයත් භික්ෂූන් වහන්සේ නමක වීම සහ ධර්මායතනයේ වැඩ වාසය කිරීම තමන්ට ආභරණයක් කර ගන්නට සෝම හිමියන් නොපෙළඹුණි. උන්වහන්සේ කවදාවත් ඒ පිළිවෙත අනුගමනය නොකළ අතර තමන් පිළිබඳ එවැනි විස්තර හෙළි කරන්නේ එම භික්ෂූන් වහන්සේ තමන්ට බොහෝ හිතවත් වුවහොත් පමණි.

කෙසේ වුවද එදින තම විහාරස්ථානයේ සෝම හිමියන්ව රඳවා ගත් එහි නායක හිමිපාණෝ උන්වහන්සේට ආගන්තුක සත්කාර කරන ලෙස තම ගෝලයන්ට දන්වා සිටියහ. පසුදින අලුයමින්ම සෝම හිමියෝ වෙහෙරගල ආරණ්‍යය බලා පිටත් වූහ. තම නිවැරදි බව හෙළි කිරීමේ අදහසින් යළි අගනුවර බලා වැඩම කිරීමේ අදහසක් උන්වහන්සේ තුළ නොවිණි.

කෙසේ වුවද ඉන්පසු දිනක දැනගන්නට ලැබුණු පරිදි සෝම හිමියන් තමා හමුවීම පිණිස එදින වැඩම කරවන බවක් කලින් දැන නොසිටි බැවින් දිසාපතිවරයා සිය පවුලම සමග එම සති අන්තය අගනුවර ගත කරන්නට ගොස් තිබිණි. සෝම හිමියන් තමා හමුවීමට වැඩම කරවූ බව පසුව දැනගත් දිසාපතිවරයා මහත් සේ කම්පා වූයේ තමා නිසා සෝම හිමියන්ට මුහුණ දීමට සිදුවූ අපහසුව ගැන කියමිනි.

තමන් වහන්සේට නිරපරාදේ විඳින්නට සිදුවූ නින්ද අපවාද සම්බන්ධයෙන් ඒ වනවිට සෝම හිමියන්ගේ සිත මහත් වූ පීඩනයකට පත්ව තිබිණි. නමුත් මේ පීඩනය තුළම ගැලී සිටියහොත් තව තවත් ඉන් පීඩාවටම පත්වනු මිස ගැලවීමක් නැත. එමගින් සිදුවන්නේ තම මූලික අරමුණට බාධාවක් මිස කිසිදු ආකාරයක යහපතක් නොවේ. මේ ගැන කල්පනා කළ සෝම හිමියෝ හිත දැඩි කරගත්හ. උන්වහන්සේ තමන්ටම දැඩිව අවවාද කර ගනිමින් 'ශ්‍රමණය, මෙවැනි දේකිනුත් සැලෙනවා නම් ශ්‍රමණ ප්‍රතිපදාවන් තවදුරටත් රකින්නේ කොහොමද? නිර්වාණගාමී අරමුණු සිත පිහිටුවා ගත් ශ්‍රමණයෙක් ඒ ප්‍රතිපද මාර්ගය තුළ මේ

විදිහට කම්පාවට පත්වෙනවා නම් ඒ ශ්‍රමණයාගෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද? අටලෝ දහම ඔබට වෙනස් කළ හැක්කක් නොවේ. කළ හැක්කේ ඉන් කම්පා නොවී, නොසැලී හිඳීම පමණි' සෝම හිමියෝ එලෙස ස්වයං විවේචනයක යෙදුණි.

ඉන්පසු සිත එකඟ කරගත් උන්වහන්සේ බුද්ධානුස්සති භාවනාව වඩන්නට වූහ. නිතර නිතර බුදුගුණ මෙනෙහි කරමින් මෙසේ බුද්ධානුස්මෘතිය වැඩීම තුළින් තමන් වහන්සේගේ මනස අවුරා ගෙන තිබූ එම පීඩාකාරී සිතුවිලි කෙමෙන් කෙමෙන් ඉවත් වී යනු සෝම හිමියන්ට දැනුණි. මෙසේ මද කලක් ගතවෙත්ම මනසේ වූ ඒ දූක්බදයක ස්වභාවය මුළුමනින්ම සමහන්ව ඒ බුද්ධානුස්මෘතියෙන්ම සිත සමාධි ගතවන අයුරක් උන්වහන්සේට දැනිණි. සැබැවින්ම මෙය මින් පෙර අත් නොවිඳි ආශ්චර්යයකි.

බුද්ධානුස්මෘතිය ගැඹුරට හැදෑරීමේ අදහස සෝම හිමියන් තුළ මුලින්ම පැන නැගුනේ එම අත්දැකීම් සමුදය මතිනි.

ධර්මායතනයට සම්බන්ධ තමන්ට හිතවත් කිහිප දෙනකු තමන් වහන්සේ බැහැ දකින්නට වෙහෙරගල ආරණ්‍යයට පැමිණි මොහොතක තම ත්‍රිපිටක පොත් පෙළ මෙම ආරණ්‍යයට ලැබෙන්නට සලස්වන ලෙස උන්වහන්සේ ඉල්ලා සිටියේ ඒ අරමුණ පෙරදැරිවය.

මේ ආකාරයෙන් බුද්ධානුස්මෘතිය වඩමින්ද, ත්‍රිපිටක ග්‍රන්ථයන්ගෙන් උකහා ගතහැකි නව අරහාදී බුදු ගුණවලට සම්බන්ධ සියලුම කරුණු හදරමින්ද කල් ගත කළ සෝම හිමියන්ට කාලය ගෙවී යන බවක්වත් දැනුණේ නැත. අප්‍රමාණ සැනසිලි සහගත ස්වභාවයකින්ද, ප්‍රසන්න බවකින්ද උන්වහන්සේගේ සිත පිරී ගියේය. නව අරහාදී බුදුගුණ ගැඹුරින් විග්‍රහ කෙරෙමින් සෝම හිමියන් විසින් පසුකලෙක ග්‍රන්ථයක් වශයෙන් එළි දැක්වූ 'බුද්ධස්තූප-බුද්ධානුස්සති භාවනාවට අත්වැලක්' කෘතියෙහි මූලාරම්භය වූයේ මෙයයි. මේ සඳහා බුද්ධස්තූප යන නම යෙදීමේද විශාල අරුතක් ඇත. බුදුරජාණන් වහන්සේම දේශනා කර තිබෙන පරිදි බුද්ධානුස්සතිය වඩන තැනැත්තාගේ මුළු හදවතම බුද්ධ ස්තූපයකි. බුදුරජාණන් වහන්සේ උදෙසා කෙරෙන හරවත් වූද,

පලවත් වූද, බලවත් වූද ස්ථූපය නම් එයමය. බාහිර පෙනෙන බොහෝ ස්ථූපවලට වඩා එය ඉතාම රමණීයය, කමනීයය. මහත් ඵල මහානිසංසද වේ. මේ පිළිබඳ ගැඹුරු ලෙස විමර්ශනයක යෙදෙමින් ලියන්නට මුල පිරූ බුද්ධස්තූප ග්‍රන්ථය එළි දැක්වුණේ ඉන් සෑහෙන කලකට පසුවය.

මේ අයුරින් බෙහෙවින් සරලව, සැහැල්ලුව සෝම හිමියන්ගේ ආරණ්‍යගත ජීවිතය ගතවෙමින් තිබිණි.

මේ අතර ධර්මායතනයට සෝම හිමියන් නොමැති අඩුව වරින් වරම දැඩිව දැනෙන්නට විය. සෝම හිමියන් පෙරමුණ ගෙන මහත් උද්‍යෝගයෙන් කරගෙන ගිය තුරුණු සවිය වැනි වැඩසටහන් පවා මේ වනවිට පැවැතියේ කිසියම් අක්‍රිය තත්ත්වයකිනි. එසේම එහි විහාර මන්දිර ගොඩනැගිල්ල ඉක්මණින් නිම කිරීමේ වුවමනාවද මහා නායක හිමියන් තුළ බල පැවැත්විණි.

සෝම හිමියන් යළි මෙහි වැඩම කරවන්නට යාම උන්වහන්සේ කෙරෙහි නොකැමැත්තකින් පසුවූ කිහිප දෙනාට අසුබ ආරංචියක් විය. එනිසාම 'වෙහෙරගලට වෙලා තිකං ඉන්න එකක් නෑ' යනුවෙන් ඒ පැත්තෙන්ද යම් ආකාරයකට කටකතා සහ දූෂමාන ආරංචි පතුරු වන්නට ඔවුන් පසුබට වුණේ නැත. ඇත්තටම සෝම හිමියන් ගැන සොයා බලා වත්මන් තත්ත්වය පිළිබඳ මහා නායක හිමියන්ට සහ රාහුල නාහිමියන්ටද කරුණු දැක්විය යුතු යැයි මේ කිහිප දෙනකු තීරණය කර ගත්හ. මේ අතර සෝම හිමියන්ට යළි ධර්මායතනයට වැඩම කරවන ලෙස ආරාධනා කරන්නටත්, උන්වහන්සේ මැදිහත්වී නව විහාර මන්දර ගොඩනැගිල්ලේ කටයුතු කරගෙන යන ලෙසත් ඉල්ලා සිටින්නට එම විහාර මන්දිරය තැනීම සඳහා බරපැන දරන්නට එකඟව සිටි වන්ද්‍රසේන නමැති දයක මහතකුට අවශ්‍යව තිබිණි. එනිසාම සෝම හිමියන් බැහැ දකින්නට ඒ මහතා යොදගත් ගමනට තවත් කිහිප දෙනෙකුද සම්බන්ධව තිබිණි. මේ අතර සිටි එක් පුද්ගලයකු සෝම හිමියන්ව නොරිස්සූ උන්වහන්සේට නොයෙකුත් විරුද්ධකම් කළ අයෙක් විය. ඔහුගේ අභිප්‍රාය වූයේ ආරණ්‍යයට වී තරුණියන්ට ලිපි ලියමින්, දුකෙන්, වේදනාවෙන් කල්ගත කරන ශ්‍රමණ

ප්‍රතිපදාවලින් මුළුමනින්ම බැහැර යළි ගිහි ජීවිතයක් සඳහා කල්යල් බලමින් හිඳින හිමිනමක දැකීමය. ඒ අනුව සෝම හිමියන් කෙරෙහි මහත් ශ්‍රද්ධාවෙන්, ගෞරවයෙන් මේ ගමන ගොස් ඒ හිමියන්ට යළි ධර්මායතනයට වැඩම කරවන ලෙස ආරාධනා කරන්නට සැරසී හිඳින චන්ද්‍රසේන මහතාගේ දෑස් ඉදිරියේදීම සෝම හිමියන් යනු කවුදැයි ඔප්පු කරන්නට ඔහු මාන බලමින් සිටියේය. චන්ද්‍රසේන මහතා සමග හෙතෙමද ඒ ගමනට එක්වූයේ එබැවිනි.

# 15 බෞද්ධයෝ පිළිම හදන්නෙත් මිථ්‍යා විශ්වාස මුල්කරගෙන

තමා බැහැදැකීම පිණිස පැමිණි දයක පිරිස දැක සෝම හිමියනංගේ මුහුණෙහි ප්‍රසන්න සිනාවක් නැගුණි.

ජින ඩී. එම්. චන්ද්‍රසේන මහතාත්, තවත් මහතෙකුත් සෝම හිමියනට ඉතා හිතවත්ව කටයුතු කළ අය වූහ. එම දෙපළ සෝම හිමියන් ඉදිරියෙහි වැටී පසඟ පිහිටුවා වැන්දහ. තවදුරටත් බලා සිටින්නට නොහැකිකම මතින් සෝම හිමියන්ට පෙර සිට විරුද්ධව කටයුතු කළ අනෙක් පුද්ගලයාටත් මේ මොහොතෙහි සෝම හිමියන්ට නොවැඳ සිටින්නට බැරි සෙයක් දැනිණි. එබැවින් ඔහුද සෝම හිමියන්ට වැන්දේ සෘජුව උන්වහන්සේ දෙසවත් නොබලාමය.

එම කුඩා කුටිය පිළිවෙළය, ප්‍රසන්නය. එතුළ ත්‍රිපිටක පොත් පෙළ ක්‍රමානුකූලව තබා ඇත. පැවිදි ජීවිතය අතහැර යළි ගිහි ගෙට පිවිස විවාහ දිවියක් ගත කිරීමේ අරමුණින් සිටින්නකු දැකීම මෙකී තෙවැනි පුද්ගලයාගේ අපේක්ෂාව වුවද එවැන්නක සළකුණකුදු නොපෙනේ. ඔහු සිතා සිටියේ 'දැක්කනෙ සෝම හාමුදුරුවන්ගෙ වැඩ පිළිවෙළ. ඕක තමයි අපි මුල ඉඳන්ම කිව්වෙ. ඇස් දෙකටම බලා ගන්න පුළුවන් හින්ද තමයි මාත් මේ ගමනට එකතු වුණේ' ආදී වශයෙන් උදම් අනන්නටය. එහෙත්, ඒ පැතුම් සියල්ල දැන් කණපිට හැරී ඇත. මෙතැන වැඩ වෙසෙන්නේ තමන් මෙතෙක්

මනැසින් මවාගෙන සිටි දුසිල්වත් භික්ෂුවක නොවේ. ඊට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ශ්‍රමණයෙකි. සියල්ලටම වඩා මේ තැනැත්තාට ඉවසීමට නොහැකි වූයේ තමන් මෙතරම් වැරදි කර තිබියදීත් සෝම හිමියන් තමා දෙස හෙලන කාරුණික බැල්මය. උන්වහන්සේ තුළ සැබෑ භික්ෂූන් වහන්සේ නමක තුළ පැවතිය යුතු ප්‍රතිරූපය ඒ අයුරින්ම දිස් වේ.

සෝම හිමියන් පැමිණි පිරිසට අසුන් දක්වා ආගන්තුක සත්කාර කොට පොදුවේ සුවදුක් විචාරන්නට වූහ.

'ඔබවහන්සේ අලුත් විහාර මන්දිරයෙ වැඩ කටයුතු බලාගෙන කරන්න. මහානායක හාමුදුරුවොමයි කිව්වෙ ඔබවහන්සේට ආපහු ධර්මායතනයට වඩින්න කියලා.... ඔබවහන්සෙ නැතුව එහෙ වැඩ අවුල්වෙලා. අපි මේ මහානායක හාමුදුරුවන්ගෙ පණිවුඩේ අරගෙනයි ආවෙ' චන්ද්‍රසේන මහතා පැවසීය.

'එහෙමයි හාමුදුරුවනේ, අපි තකහනියෙම මෙච්චර දුරක් ආවෙ ඒකට තමයි' කලින් නොසතුටුව සිටි දයක මහතාද කීය.

'මං මෙහාට ආවෙ ලොකු අධිෂ්ඨානයක් ඇතුව. මං මේ දවස්වල දිගින් දිගටම බුද්ධානුස්මෘති භාවනාව වඩමින් ඒ සම්බන්ධ ධර්ම කරුණු ගැඹුරින් විමසලා පොතක් ලියන්න හිතාගෙන ඉන්නවා. ඒ කාරිය අවසන් වුණාම චාරිකා ධර්ම දේශනා මාලාවක් පවත්වන්නටත් මගේ අදහස තියෙනවා. මට එහෙ දයකයොයි, මෙහෙ දයකයොයි කියලා වෙනසක් නෑ. හරියකට බණක් දහමක් අහන්න නැති, මග පෙන්වන්නෙක් නැති බොහොම අහිංසක මිනිස්සු කොට්ඨාශයක් තමයි මේ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වෙන්නෙ. මං හිතනවා යහපත් මග පෙන්වීමක් මේ මිනිස්සුන්ට අවශ්‍යමයි කියලා. ඒ නිසා භික්ෂුවක් විදිහට මේ අහිංසක දුප්පත් මිනිස්සු වෙනුවෙන් මං අතින් විය යුතු යුතුකම් පැහැර අරින එක නුසුදුසු දෙයක් කියලයි මං හිතන්නෙ.'

සෝම හිමියෝ කරුණු පැහැදිලි කරන්නට වූහ.

'ඒත් ස්වාමීන් වහන්ස! ඔබවහන්සේ නැතුව මේ වැඩ මොකුත් කරන්න බෑ. මං සම්පූර්ණයෙන් මේ වෙනුවෙන් මුදල් වියදම්

කරන්න ලැස්තියි. ඔබවහන්සේ මේ වෙනුවෙන් හරි වඩින්න. අනික මේක මහානායක හාමුදුරුවන්ගෙත් ඉල්ලීමක්.˙

ඔවුහු අවධාරණය කළහ.

සෝම හිමියෝ කල්පනා කරන්නට වූහ.

මේ ගමන නොගිහින් සිටියහොත් එය දයකයන් හට එකට එක කිරීමක් වශයෙන් අනෙක් අය සිතනු ඒකාන්තය. මහානාහිමියන් සහ රාහුල නාහිමියන්ද එලෙස තමන් පිළිබඳව වරදවා වටහා ගැනීමට ඉඩ තිබේ. කෙසේ වුවද මේ පිරිස ඇරැයුම් කරන්නේ යහපත් කටයුත්තක් උදෙසාය. එනිසා මීට එකඟ නොවී හිඳීම අනුචිතය.

˙හොඳයි මම එන්නම්! ඒත් දැන්ම නෙමේ. සිංහල අවුරුද්ද පහුවෙලා. මේ සිංහල අවුරුද්දට මං මෙහෙ ඉඳියි කියලා මේ අහිංසක මිනිස්සු බලාපොරොත්තු වෙනවා. මෙච්චර කාලයක් මට සිව් පසයෙන් උපස්ථාන කරපු මේ අහිංසක අසරණ මිනිස්සුන්ගේ බලාපොරොත්තු කඩ කරන්න හොඳ නැහැ. ඒ හින්ද මං අවුරුදු පහුවුණු ගමන් එන්නම්. හැබැයි ඒ කටයුත්ත ඉවර වුණු ගමන්ම මං ආපහු එනවා. මං හිතාගෙන ඉන්න අරමුණ ඉෂ්ඨ කර ගන්න ඕනෙ.˙

සෝම හිමියන් පවසද්දී එම පිරිසට ඊට එකඟ නොවී සිටිය නොහැකි විණි.

˙මුල් ගල තියලා වැඩ පටන් ගන්න. ඒ අතරෙදි මං එන්නම්˙.

පිරිස පිටත් වන්නට සැරසෙන මොහොතේ සෝම හිමියෝ යළි පැවසූහ.

සිංහල අලුත් අවුරුදු සමය ආරම්භ වෙමින් තිබිණි. හේන් වගාවෙන් ජීවත්වූ එහි ගැමියෝ අස්වනුද නෙළා ගෙන අලුත් අවුරුද්ද සඳහා ලහි ලහියේ සූදනම් වෙමින් සිටියහ. මේ ගැමියන් තුළ නගරයේ තමා හඳුනා ගත් බොහෝ මිනිසුන්ට වඩා අව්‍යාජත්වයක් සෝම හිමියන්ට පෙනිණි. නගරයේ බඳු පුහු ආටෝප ඔවුන් තුළ නැත. බටහිර සංස්කෘතිය අනුව හැඩ ගැසුණු

නාගරිකයන්ගේ ආචාර විචාරද බොහෝවිටම බටහිර ක්‍රමයට අනුව හැඩ ගැසුණු ඒවාය. එහෙත්, නගරයෙන් බෙහෙවින්ම දුර බැහැර මෙබඳු පිටිසර ගම්මානවල විසූ අහිංසක දිළිඳු ගම්වැසියන්ට එවන් මුසුවීමක් නැත. ඔවුහු අව්‍යාජය. කියන්න ඇති දේ මුහුණටම කියති. එතැනින් එහාට තරහක් මරහක් සිත ඉතිරි කරගැනීම ඔවුන්ගේ සිරිත නොවේ. එහෙත් බොහෝ නාගරිකයෝ මතුපිටින් ආචාරශීලීව සිත යටින් ම්ලේච්ඡ ගති දක්වති.

පසළොස්වක පෝය දින සැන්දෑ යාමයට ගැමියෝ වැඩි දෙනෙක් වෙහෙරගල ආරණ්‍යයට පැමිණියහ. පසළොස්වක සඳ මුදුන්වී ගණඳුරු පරිසරයට නව ජීවයක් දෙමින් හිදින ඒ සැන්දෑ යාමයට ආරණ්‍යයේ ගල මත වාඩි වී හිඳින සෝම හිමියන්ට ගම්මානයේ ඈතින් ගමන් කරන හුළු එළි පෙනේ. විසල් ගස් අතරින් කුඩා ගිනිබෝල මෙන් දුරට පෙනෙන ඒවා කෙමෙන් කෙමෙන් ළං වෙයි. ගම්මානයේ දසතින් දිස්වන ඒ හුළු එළි සියල්ල ආරණ්‍යය කරා යොමුවී ඇත. ඒ එම ගම්වැසියන් පෝයට බණ අසන්නට පැමිණෙන අයුරුය. ගම්මානයේ එකලද විදුලි එළිය නොතිබිණි. ගෙතුළ අඳුර පලවා හරින්නට කුප්පි ලාම්පු යොද ගත් ගැමියෝ සැන්දෑ යාමයේ ආරණ්‍යයට පැමිණියේ හුළු එළි ආධාරයෙනි. ඉදහිට මෙබඳු අවශ්‍යතාවයකට මිස අවේලාවෙහි ගමන් බිමන් යාමක් ඒ ගැමියන් තුළ දක්නට නැත.

සිංහල අවුරුදු අවසන් වූ වහාම අප්‍රේල් 16 ද පොරොන්දු වූ පරිදිම සෝම හිමියෝ ධර්මායතනය බලා වැඩම කළහ.

මේ වනවිට චන්ද්‍රසේන මහතා විහාර මන්දිරයේ වැඩ කටයුතු ආරම්භ කොට තිබිණි. මෙම ඉදිකිරීම් කටයුතු සෝම හිමියන්ගේ අභිමතය පරිදි සිදුවනු දැකීම සුපුරුදු පරිදිම ශාසන සේවක සමිතියට සම්බන්ධ ඇතැම්හු නොරිස්සූහ.

'ඕවා ඔහොම ආවට ගියාට කරන්න හොඳ නෑ. මහානායක හිමියන්ට අපලයි' සමහරු එසේ කීහ.

'අපල කියන ඒවා ගැන බුදු හාමුදුරුවො තරම් හොඳින් පැහැදිලි කරලා දීපු වෙන කෙනෙක් මේ ලෝකෙ නෑ. අපි මේ

කරන්නෙ ඉතාම යහපත් කටයුත්තක්. යහපත් දේකින් යහපත් ප්‍රතිඵල මිසක් නරක ප්‍රතිඵල ලැබෙන්නෙ නෑ' සෝම හිමියෝ අවධාරණය කළහ.

'අනේ මන්ද මේ සෝම හාමුදුරුවො තවමත් හිතුවක්කාරයි. ඔය වගේ වැඩ වැරදුණොත් වස් වදින්නත් පුළුවන්' සමහරු එසේ කසුකුසු ගාන්නට වූහ.

'මේ වෙසක් පෝයට කොහොම හරි මේ ගොඩනැගිල්ලෙ වැඩ මට ඉවර කරගන්න ඕනෙ හාමුදුරුවනේ. වෙසක් පෝයට සිල් සමාදන් වෙන අයට සිල් සමාදන් වීමේ ඉඩ පහසුව සලසලා දෙන එක තමයි මගේ එකම අරමුණ.'

මේ ගොඩනැගිල්ල සඳහා බරපැන දැරූ චන්ද්‍රසේන මහතා සෝම හිමියන් හා පවසා සිටියේ තිර අදිටනකින් යුතුවය.

'විහාර කර්මාන්ත ඔහොම ආවට ගියාට දඩබ්බියේ කරන සිරිතක් නෑ. එහෙම වුණොත් ඕවයින් වස් වදින්න පුළුවන්. ඒවා බොහොම කල්පනාවෙන් කරන්න ඕන වැඩ.'

මෙලෙස වැඩිහිටි පුද්ගයන් අතරේ කසු කුසුවක් පවතින බව මේ අතරේ සෝම හිමියන්ට දැනගන්නට ලැබිණි.

'ඕවා තනිකරම මිථ්‍යා මත' සෝම හිමියෝ තදින්ම කියා සිටියහ. 'චේතනා හං භික්ඛවේ කම්මං වදාමි'. ඒ කියන්නෙ යම්කිසි ක්‍රියාවකට මුල්වන සිතුවිල්ලම කර්මය කියලයි බුදු හාමුදුරුවෝ අපට ඉගැන්නුවෙ. විහාර කර්මාන්තය සම්බන්ධයෙනුත් ඒක එහෙමම තමයි.'

'දඹදෙණි යුගයෙන් පස්සෙ, විශේෂයෙන් මහනුවර යුගයේදී හින්දු සංස්කෘතිය අපේ සංස්කෘතියට මිශ්‍ර වුණා. ඒ විදිහට ඒ කාලෙ විහාර කර්මාන්තයත් සංවර්ධනය වුණේ හින්දු ආභාෂය මතිනුයි. මේ තත්ත්වය අද වෙනකොට සෑහෙන්න වර්ධනය වෙලා. අපේ බෞද්ධයො බුදු පිළිමයක් හදන්නෙත් බුදු හාමුදුරුවොම එපා කියලා පිටු දැකපු මිථ්‍යා විශ්වාස පෙරදැරි කරගෙන. මෙහෙම කොහොමද බුද්ධ ශාසනය රකින්නෙ? ඔය ඇත්තො

බොහොම හොඳට හිතට ගන්න, බුදු පිළිම, විහාර මන්දිර කොච්චර තිබුණත් වැඩක් නැහැ අපේ හදවත් තුළ බුදු දහම නැතිනම්.˙

සෝම හිමියෝ දැඩි හඬින් කියා සිටියහ.

# 16 ලංකාවෙන් තුනෙන් එකක් පුරා පා ගමනින් වැඩම වීම අරඹයි

මහරගම සිරි වජිරඥාන ධර්මායතනයේ නිල දායක සභාව වූයේ ශාසන සේවක සමිතියය. මෙය අදත් මෙරට තිබෙන මුල් පෙළේ බෞද්ධාගමික සංවිධානයකි. මින් ධර්මායතනයේ මෙන්ම බුද්ධ ශාසනයේ ද අභිවෘද්ධිය උදෙසා ඉමහත් සේවයක් සිදු වෙයි.

නමුදු ඕනෑම පිරිසකගේ එකමුතුවක් තුළ විවිධ අදහස් දරන අය හිඳීම ස්වභාවයකි. මේ ධර්මතාවය ශාසන සේවක සමිතිය සම්බන්ධයෙන් පමණක් වෙනස් වන්නේ නැත. ධර්මායතනයේ කටයුතු සම්බන්ධයෙන් සෝම හිමියන් මැදිහත් වෙද්දී යම් යම් මතභේද තත්ත්වයන් ඇති කළේ ශාසන සේවක සමිතියට අයත් කිහිප දෙනෙකු පමණි. ඒ හැර සමිතියේ වැඩි පිරිසක් සෝම හිමියන්ට සහයෝගය දුන්හ. අපගේ බෞද්ධයන් තුළ දැකිය හැකි පොදු දුර්වලකමක් වන්නේ හැම විටම සම්ප්‍රදායානුකූලව කටයුතු කිරීමට දක්වන කැමැත්තය. නමුත් සැබෑ බෞද්ධ චින්තනය යනු හුදෙක් සම්ප්‍රදයට අනුව කටයුතු කිරීම නොව ඒ සම්බන්ධයෙන් බුදු දහමින් කියවෙන දේ විචාර පූර්වකව විමසා බැලීමය. විහාර කර්මාන්ත සම්බන්ධයෙන් සිදුවන යම් යම් අතපසු වීම්වලදී පවා වස් වැදීම, ගම් පිටින් පාළු වීම ආදී වශයෙන් පවතින සාම්ප්‍රදායික මතිමතාන්තර බොහොමයක් මීට වසර හත් අට සීයකට පෙර

හින්දූන්ගෙන් අප වෙත පැමිණි විශ්වාසයන්ය.

මෙබඳු මිථ්‍යා විශ්වාසයන් අත්හල යුතු දෑ වශයෙන් බුදුරජාණන් වහන්සේ පවසා තිබියදීත් බුදු වදන පැත්තක තබා වැඩි දෙනෙක්ම කරන්නේ එම සාම්ප්‍රදායික හින්දු විශ්වාසම කර තබාගෙන යාමය. සෝම හිමියන් සහ ඉහත කී වැඩිහිටියන් කිහිප දෙනා අතර මතභේදයන්ට බොහෝ විට බලපෑවේ මෙබඳු මතවාද අරගලයන්ය.

චන්ද්‍රසේන මහතා ඇතුළු සෙසු පිරිසගේත් මහත් වූ කැපවීමත්, උත්සාහයත් නිසාම බලාපොරොත්තු වූ පරිදි ගොඩනැගිල්ලේ වැඩ කටයුතු වෙසක් පුන් පෝයට පෙර අවසන් කර ගැනීමට සෝම හිමියන් ඇතුළු පිරිස සමත් වූහ. මෙම තරුණ හිමි නම ධර්මායතනයට පහන් ටැඹක් යන සිතුවිල්ල නැවතත් සෙසු පිරිසට අවධාරණය වන්නට මෙය මනා පිටිවහලක් විය.

වෙසක් පුන් පෝද වන විට ගොඩනැගිල්ල විවෘත වූ අතර හාර දහසකට අධික තරුණ පිරිසක් එහි ශීල සමාදනයේ යෙදුණහ.

එම කටයුත්ත නිම වීමෙන් පසු වෙසක් පුන් පෝයට පසු දිනම යළිත් සෝම හිමියෝ තමන් වහන්සේ බලාපොරොත්තුව සිටි පරිද්දෙන්ම වන වාසය කරා යාමට නික්මුණහ. මහනාහිමියන්ගේ මෙන්ම රාහුල නාහිමියන්ගේද ආශිර්වාදය සෝම හිමියන්ට මෙහිදී නොඅඩුව ලැබී තිබිණි. එහෙත් උන්වහන්සේ නොමැති අඩුව ධර්මායතනයට බෙහෙවින්ම දැනෙන බවද නාහිමිවරුන් වටහා ගෙන හිඳින්නට ඇත.

වෙහෙරගල ආරණ්‍යය පැවැති ස්ථානය හැඳින්වූයේ වෙහෙරගල කන්ද යනුවෙනි. මෙය ඉතා සුන්දර නිහඬ උස් භූමි භාගයක් විය. ඒ අවට ගම්මානය විරානතලාව නම් විය. උණු වතුර බුබුල ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් වූ මෙම විරානතලාව ගමේ වැසියන් මින් පෙර එහි වැඩ සිටි රාහුල නාහිමියන්ට සේම සෝම හිමියන්ටද දැක්වූයේ මහත් වූ ලෙන්ගතුකමකි. ඔවුන් වෙසක් පෝය අවසන් වනතුරු බලා සිටියේ සෝම හිමියන්ගේ යළි වැඩම කිරීම

ඔවුන්ට මහත් දිරියක් සහ සැනසිල්ලක් වූ නිසාය.

මේ ගම්වැසියන් වෙතින් පුද සත්කාර නොඅඩුව ලැබුණි. ඒ අතරින් සෝම හිමියන් පිළිබඳව වඩාත් සොයා බැලුවේ ආරණ්‍යයට නුදුරින්ම වූ නිවසක පදිංචිව සිටි ලොකු බණ්ඩා මුදලාලිය. හීල් දනය වශයෙන් ලොකු බණ්ඩා මුදලාලිගේ නිවසින් සෝම හිමියන්ට නොවරදවාම කොළ කැඳ කෝප්පයක් ලැබිණි. ඒ හැර දහවල් දනය පිණ්ඩපාතයේ වැඩම කොට සපයා ගත්තත් ලොකු බණ්ඩා මුදලාලිගේ ගෙදරින් සෝම හිමියන්ට අඩුපාඩුවක් තිබේදැයි නිරතුරු සොයා බැලීම සිදුවිය.

වන වාසය භික්ෂූන් වහන්සේ නමකට උචිතම ස්ථානය වශයෙන් බුදුරජාණන් වහන්සේද දේශනා කළහ. විශේෂයෙන් ගිහි වාසස්ථානවලින් ඈත්ව පිහිටි උස් කඳු මුදුන් භික්ෂූන් වහන්සේගේ වාසය පිණිස වඩාත් යෝග්‍ය වේ. වෙහෙරගල ආරණ්‍යයද මෙලෙස භික්ෂූන් වහන්සේලාට අතිශය යෝග්‍ය ස්ථානයකි. කඳු මුදුනේ ගස් වැල් අතරින් නිරන්තරව හමා ආ පිරිසිදු ඇල් සුළඟ ගතට සිසිල දනවයි. ඕනෑම පුද්ගලයෙකු සිත පහන් කරවන සුළු ස්වභාවයක් එම පරිසරය තුළ පවතී. අගනුවර සිට යළි වෙහෙරගල කරා වැඩම කළ සෝම හිමියන්ගේ සිතට මෙම නිරාමිස සුවය යළි යළිත් දැනෙන්නට විය.

එහෙත් මෙවර සෝම හිමියන් මෙහි වැඩම කළේ පෙර මෙන් දිගු කලක් පුරා එහි රැඳී සිටීමේ අපේක්ෂාවකින් නොවේ. රට පුරාම දුෂ්කර පළාත් ඔස්සේ චාරිකා කරමින් චාරිකා ධර්ම දේශනා මාලාවක් පැවැත්වීම උන්වහන්සේගේ අරමුණ විය. ඒ අනුව මසක් පමණ එහි වැඩ සිටි සෝම හිමියෝ චාරිකාවේ යාම සඳහා සූදානම් වූහ.

'මේ රටේ හුඟක් තැන්වලට පා ගමනින් වැඩම කරලා විශේෂයෙන් ගම්බද පළාත්වල ඇත්තනට බණ ටිකක් කියන්න මගේ අදහසක් තියෙනවා. මේ නැගෙනහිර පළාතෙන් ඌව හරහා දකුණු පළාතට යන්නයි මගේ අදහස.' සෝම හිමියෝ දයකයන්ට කීහ.

'ඔය ගමන පයින්ම වැඩම කරනවා කියන එක ලේසි දෙයක් නෙමෙයි ස්වාමීන් වහන්ස. ඔය ගමන හරිම දුෂ්කරයි. ඒ වගේම භයානකයි.'

සෝම හිමියන්ට මහත් ලැදිව සිටි ගුණේ අයියා නමැති පුද්ගලයා පැවසීය. සැබැවින්ම අසූවේ දශකය ආරම්භ වූ මෙම යුගයේ මහා මාර්ග පද්ධතිය මෙතරම්වත් දියුණු නොවූ අතර එම පළාත් බොහොමයක් වන ගතව පැවැති බැවිනි.

ලංකාවේ ඌව, දකුණ හා සබරගමු ආදී වශයෙන් පළාත් රැ සක් ආවරණය කරමින් පයින්ම කැළණිය දක්වා වැඩම කොට අවසන් කිරීමට නියමිත වූ මෙම චාරිකාව ලංකා සිතියමෙන් තුනෙන් එකකටත් වඩා ආවරණය වන්නකි. මෙම ප්‍රදේශයන්ට අයත් කැලෑ බද ස්ථානයන්හි වෙසෙන වන සතුන්ගෙන්, විශේෂයෙන් අලි ඇතුන්ගෙන් බේරී යාම තනි පුද්ගලයකුට කෙසේ වත් පහසු වන්නක් නොවේ. ඒ පිළිබඳව වනගත දිවි පෙවෙතක් හුරු ගැමියෝ තතු දනිති.

'හොඳයි මං හුගක්ම අනතුරු සහගත ප්‍රදේශ මඟ අරින්නම්. නමුත් මේ ගමන නම් වෙනස් කරන්නෙ නෑ. මේක හුහාක් කාලයක් තිස්සෙ මගේ තිබුණු ලොකු අධිෂ්ඨානයක්. විශාල පිරිසකට මගේ මේ ගමනෙන් ලොකු යහපතක් සැලසෙනවා. අනික කොහොමත් නගරබද අයට වඩා දුරබැහැර දුෂ්කර ප්‍රදේශවල ජීවත් වෙන අහිංසක මිනිස්සුන්ට ධර්මය ශ්‍රවණය කරන්න ලැබෙන අවස්ථාවල් හරිම අඩුයි. මං මේ චාරිකාව යන්නෙ අන්න ඒ වගේ මිනිස්සුන්ගෙ හිත සුවය වෙනුවෙනුයි. මේවා පැවිද්දන්ගෙ යුතුකම්.'

සෝම හිමියන් කියද්දී ඊට විරුද්ධ වීමේ හැකියාවක් ගුණේ අයියාට නොවිණි.

සෝම හිමියන් තම අභිලාෂය මුදුන්පත් කර ගනිමින් මහමඟට බසින දිනය උදාවිය. අළුයම අවදි වූ සෝම හිමියෝ සුපුරුදු පරිදි හෝරා දෙකක් භාවනානුයෝගීව වැඩ හුන්හ. සියලු කටයුතු නිම කළ උන්වහන්සේ ආරණ්‍යයෙන් නික්මෙන ලද්දේ පහන් පැයෙන් අළුයම හයටය.

පාත්‍රයත්, කුඩයත් හැරුණු විට උරයෙහි එල්ලා ගත් ගමන් මල්ලෙහි වූයේ තුන් සිවුර පමණි. පැවැත්මෙන් සැහැල්ලු වෙන තරමටම ශ්‍රමණයා පැවිද්දෙන් පොහොසත් වන බව සෝම හිමියෝ දනිති.

උන්වහන්සේගේ නික්ම යාම දුටු එතෙක් ලැදිව කටයුතු කළ ගම්වැසියන් තුළ ඇති කළේ සුළුපටු වේදනාවක් නොවේ. එසේම ශ්‍රී ලංකාවේ සුවිසල් භූමි භාගයක් පුරා චාරිකා කරමින් යන්නට යන මේ ගමනේදී අතරමග හමුවිය හැකි උපද්‍රව කිසිසේත්ම සුළු කොට තැකිය නොහැක්කකි. ගම්වැසියෝ සෝම හිමියන් බැහැ දැක උන්වහන්සේගේ දෙපා නැමද සමුදුන්හ.

'හරි පුදුම අදහස් තියෙන හාමුදුරු නමක්' ඔවුහු එකිනෙකා එසේ මුමුනන්නට ඇත.

වෙහෙරගල සිට සැතපුම් හතරක් පමණ මග ගෙවා උන්වහන්සේ පළමුව මහඔය නගරයට වැඩම කළහ. නගරයේ පදිංචිව සිටි සූරියආරච්චි නමැති තැපැල් ස්ථානාධිපතිවරයා පෙර සිටම සෝම හිමියන්ට මහත් සේ ලැදිව කටයුතු කළ අයෙකි. ඔහුටත් තමන්ගේ නික්ම යාම පිළිබඳව දන්වා සිටීම යුතුකමක් සේ සැළකූ සෝම හිමියෝ ඔහුගේ නිවහනට වැඩියහ. හදිස්සියේ වැඩම කළ සෝම හිමියන්ට උදේ තේ සකස් කර දුන් සූරියආරච්චි මහතාගේ නිවැසියන් වෙනුවෙන් කෙටි අනුශාසනාවක්ද කළ උන්වහන්සේ එම හිතවත් පිරිසගෙන් සමුගත්හ. සෝම හිමියන්ගේ නික්ම යාම ඔවුන්ගේ සිත් තුළද මහත් වේදනාවක් උපදවා තිබිණ.

'අද මං මේ විදියට ඔය ඇත්තන්ගෙන් ඈත් වෙලා ආපහු යන්න යන එක ගැන ඔය ඇත්තො දුක් වෙනවා. ඒත් මේක තමයි ශ්‍රමණයකුගේ ජීවිතයේ සැබෑ උරුමය. පැවිද්දෙකුට කිසිම තැනක ඇලීමක් නෑ. ඒ නිසා නියම පැවිද්දෙක් විදියට මට මේ ගත කරන්න ලැබුණු ජීවිතේ ගැන හිතලා මං සතුටු වෙනවා. ඒ නිසා ඔය ඇත්තො දුක් වෙන්න එපා.'

සෝම හිමියෝ කාරුණික හඬින් පැවසූහ.

මහඔය හන්දියෙන් නික්මුණු සෝම හිමියෝ පදියතලාව දෙසට

පා ගමනින්ම වඩින්නට වූහ. එම කුඩා නගරය පසු කළ සැනින් මහා මාර්ගය රුස්ස වනයක් තුළ ගිලෙයි. මෙම ප්‍රදේශවල නගර යනු මහ වනය විසින් සඟවා ගත් කුඩා ප්‍රදේශයන් බඳුය. නගරයෙන් ඔබ්බට ඇත්තේ එපමණටම රුස්ස වන ගහනයය. බස් ධාවනය වන ප්‍රධාන මාර්ගයක වුවද මිනිස් පුළුටක් දක්නට ලැබෙන්නේත් ඉඳහිටය. මේ කියන එක්දහස් නවසිය අසූ ගණන්වල මුල් භාගයේ අද තරම්වත් ජනගහනයක් හෝ වාහන සංඛ්‍යාවක් එම ප්‍රදේශවල නොවිණි. එම වනය වල් අලින්ගේ පාරාදීසයකි. එනිසාම මෙහි ඇති බියකරු බව දිවා කාලයේ වුව අඩු වූයේ නැත. සිත පැවැති අධිෂ්ඨානය මතින් පා ගමනින් වැඩම කරමින් සිටි සෝම හිමියන්ගේ සිතට ඒ භීතිය නොදැනුණාම නොවේ.

'මගේ අරමුණ යහපත් පිරිසිදු එකක්. ඒ නිසා බාධක හමුවේ පසුබට විය යුතු නැහැ.' උන්වහන්සේ එසේ සිතූහ.

# 17 පාන්තරේට වරකා මදුළු

මහඔය සිට පදියතලාව දෙසට වැටී තිබූ මහමග දෙපසම වූයේ ඝන කැලෑව හැරුණු විට තැනින් තැන වැටී තිබූ දිළිඳු ගම්මානය.

නාගරික පහසුකම් කිසිවක් තබා එදිනෙද අවශ්‍යතාවයන් සපුරා ගැනීමට වුව මෙම වැසියෝ අපමණ දුක් වින්දහ. ඔවුන්ගේ ජීවිකාව වූයේ වනය තැනින් තැන කපා කොටා සකසා ගත් හේන්වල කරන ලද කටුසර බෝග වගාවය. සත්ත්වයාට අත්‍යවශ්‍ය ජල පහසුව පවා සොබා දහම ඔවුන්ට සපයා දී තිබුණේ බෙහෙවින් අඩු මට්ටමකිනි. මෙම වැසියන්ගේ ජීවිත අනුව බැලූ කල ඔවුනට යම් හෝ පහසුවක් තිබුණා නම් ඒ එම ප්‍රධාන මාර්ගයෙහි ඉඳහිට එහා මෙහා දිවෙන බස් රථය.

මෙම දිළිඳු ගම්මාන පසු කරමින් පාද චාරිකාවෙහි යෙදෙමින් සිට සෝම හිමියන් මේ වනවිට එම මාර්ගයෙහි සෑහෙන දුරක් පැමිණ තිබිණ. උන්වහන්සේ වැඩම කරමින් සිටියේ පදියතලාව දෙසටය. හිරු නැගෙනහිර අහසේ යම් පමණකට මුදුන් වී තිබිණි. මධ්‍යහ්නයට තව දෙපැයකට ආසන්න කාලයක් ඇති බව ඒ අනුව සෝම හිමියන්ට වැටහිණි. නමුත් එම ප්‍රදේශවලට ආවේණික පරිද්දෙන්ම හිරු රැස් බෙහෙවින් පීඩාකාරී මට්ටමක පැවතිණි.

දෙපස වූ රුස්ස ගහ කොළ සිප හමා එන සුළඟ නිසා එම පීඩාකාරී බව යම් පමණකට අඩුවිය.

දහවල් දනය සපයා ගැනීම සඳහා පිණ්ඩපාතයේ යෙදිය යුතු වෙලාව එළඹ ඇත. පාත්‍රය දෝතට ගත් සෝම හිමියෝ නුදුරින් වූ දිළිඳු ගම්මානය වෙත වැඩම කළහ. මේවා ශ්‍රමණ ජීවිතයේ හිම්කම්ය. ගිහියන් තමන්ගේ දහඩිය මහන්සියෙන් උපයා සපයා ගත් යමකින් ශ්‍රද්ධාවෙන් පූජා කරනු ලබන කොටසකින් තම ජීවිතය පවත්වාගෙන යනවා විනා ආහාරපාන සපයා ගැනීමවත් ජීවන වෘත්තීන්හි යෙදීමවත් පැවිද්දන්ට කැප නැත.

එය ගෙවල්වල දහවල ආහාරය පිසින වේලාව බව අවටින් වරින් වර නැගුණු ආහාර සුවඳ කියා පෑවේය. පාත්‍රය දෝතින් ගෙන, බිමට නැඹුරු වූ දෙනෙතින් යුතුව සෝම හිමියෝ එක් නිවසක කඩුල්ල ඉදිරිපිට නැවතුණහ. ගෙහිමි කාන්තාව තම නිවස ඉදිරියෙහි වැඩ හිඳින භික්ෂූන් වහන්සේව දකින්නට ඇත. ඇය මහත් කලබලයෙන් එහාට මෙහාට යනු සෝම හිමියන්ට යන්තමින් පෙනිණි.

සෑහෙන වේලාවක් ගත විය. එහෙත් දනය වශයෙන් ඒ නිවසින් කිසිවක් ලැබුණේ නැත. නමුදු නිවැසියන් කලබලයෙන් එහාට මෙහාට යන ආකාරය අනුව ඔවුන් කුමක් හෝ යමක් සූදනම් කරන බව සිතිය හැක. ඒ අනුව එතැනින් නික්ම යාම නොකටයුතු දෙයකැයි සෝම හිමියන්ට වැටහිණි.

බොහෝ වේලාවකට පසු නිවසේ කාන්තාව එවෙලේ දොවා පිළියෙල කරගත් එළකිරි භාජනයක් සෝම හිමියන්ට පූජා කළාය. උන්වහන්සේ ඊට මඳක් ඈතින් තිබූ ඊළඟ නිවසට වැඩියහ. ඔවුන් පූජා කළේ වරකා මදුළු යම් ප්‍රමාණයකි. තවත් නිවසකින් තම්බන ලද බඩ ඉරිඟු කරලක්, තවත් නිවසකින් බත් ආදී වශයෙන් අසරණ ගැමියන් විසින් තමන් වහන්සේ වෙත පූජා කරන ලද ආහාර සහිත පාත්‍රය ගෙන උන්වහන්සේ ඊළඟට වැඩියේ ජල පහසුවක් ඇති ස්ථානයකටය. සුවිසල් රුකක් මුල අසුන් ගත් සෝම හිමියෝ දන් වළඳන්නට වූහ. එම කටයුත්ත හමාර වූ පසු උන්වහන්සේ ගමන් විඩාව දුරු කරගනු පිණිස එම රුක් සෙවනෙහිම මඳක්

සැතපුණහ. සැනසිල්ල අස්වැසිල්ල වුවමනාවටත් වඩා පිරී තිබූ මනස සෝම හිමියන්ට එම රුක් සෙවන යට සුවදයක නින්දක් උරුම කරදී තිබිණි.

මඳ වේලාවකට පසු සෝම හිමියෝ යළි ගමන් ඇරඹූහ. සැන්දෑ යාමය වනවිට කෙහෙල්උල්ල ගමට වැඩම කිරීමට සෝම හිමියන්ට හැකිවිය. මෙය කුඩා කඩමණ්ඩියකින් යුතු පිටිසර ගමකි. සැඳෑ ඇඳිරිය වැටෙන්නට ආසන්න වෙද්දී සෝම හිමියෝ එම ගමේ විහාරස්ථානය වෙත වැඩම කළහ. එය ඉතා නිස්කලංක පරිසරයක පිහිටි ඉපැරණි විහාරස්ථානයක් විය. එහි වැඩ හුන් මහළු වයස ආසන්නයේ සිටි නායක හිමියෝ සෝම හිමියන් පිළිබඳ වැඩි තැකීමක් නොකළහ. නමුත් පළමුව කැපකරුවන් ලවා ආගන්තුක සත්කාර කරවීම එම හිමියන් අතපසු කළේ නැත.

"මම වෙහෙරගල ආරණ්‍යයේ ඉඳලා ආවෙ....! ධර්ම චාරිකාවක යන ගමන්" සෝම හිමියන් තමන් පිළිබඳව හඳුන්වා දුන්නේ එසේය.

"ස්ථවිරයො අභිධර්මය එහෙමත් ඉගෙන ගෙන ඇතිනෙ?" නායක හිමියෝ විචාලහ.

"එහෙයි හාමුදුරුවනේ, යම් පමණකට ඉගෙන ගෙන තියෙනවා." පැවිදි වෙන්නටත් පෙර සිටම අභිධර්මය පිළිබඳ මනා දැනුමක් තිබුණද එය මෙතැනදී පැවසීමට නොසිතූ සෝම හිමියෝ පිළිතුරු දුන්හ.

"එහෙම නම් කියමුකො බලන්න කර්ම විපාක දෙන සිත් මොනවද කියලා?" නායක හිමියෝ සිය හාන්සි පුටුවේ පහසු ඉරියව්වකින් වාඩිවෙමින් විමසූහ.

මේවා සෝම හිමියන්ට බෙහෙවින් පහසු කරුණුය. උන්වහන්සේ එය මැනවින් විස්තර කරන්නට වූහ. තමන් වහන්සේ ඒවා එකින් එක පවසද්දී නායක හිමියන්ගේ එතෙක් නොපැහැදුණු විලාසයක් පෑ මුහුණ කෙමෙන් ප්‍රභාමත් වෙන ආකාරය සෝම හිමියන්ට පෙනිණි. ඉන්පසු බෙහෙවින් සුහද බවක් පළ කළ නායක හිමියෝ සෝම හිමියන් දෙසට හැරුණහ.

'ස්ථවිරයො වැඩම කරපු වෙලාවෙ මං වැඩි සතුටු මූණක් පෙන්නුවෙ නැත්තෙ අහිතකින් නෙමෙයි. අද නානා ප්‍රකාර උදවිය සිවුරු දරාගෙන මේ විදිහට පන්සල්වලට එනවා. අපේ ආරක්ෂාවයි, මේ ස්ථානවල ගරුත්වයයි තියෙන්න ඕන හින්දයි ස්ථවිරයො කවුද කියලා දැන ගන්න මං අර වගේ සැර පරුෂ විදිහට පොඩි රඟපෑමක් කළේ' යි කී නායක හිමියෝ ප්‍රසන්න සිනාවක් පෑහ.

තමන් කවුද, කොහේ වැඩ හිඳින හිමි නමක්ද, ගුරු හාමුදුරුවන් වහන්සේලා කවුරුන්ද වැනි තොරතුරු සෝම හිමියන් කීයේ නායක හිමියන් බෙහෙවින් හිතවත් වූ පසුවය. ඒ අසා නායක හිමියන්ට දැනුණේ අතිමහත් සතුටකි.

එදින රාත්‍රිය කෙහෙල්උල්ල විහාරස්ථානයේ ගල් පර්වතයක් මුදුනේ තැනුණු විහාර මන්දිරයෙහි ගත කළ සෝම හිමියෝ පසු දින අලුයම දන් වළඳ යළිදු චාරිකාව ආරම්භ කළහ.

'ස්ථවිරයො ආයෙත් මේ පළාතට වැඩියොත් නොවැරදීම අපේ පන්සලටත් වැඩම කරන්න' නායක හාමුදුරුවෝ සෝම හිමියන්ට පිටත් වෙද්දී පැවසූහ.

එදවසත් පෙර පරිදිම දහවල් දනය සපයා ගත්තේ පිණ්ඩපාතයෙනි. ඒ අයුරින් මග ගෙවාගෙන සැන්දෑ යාමය වනවිට සෝම හිමියෝ පදියතලාවට පැමිණියහ. පදියතලාව නාගරික ලක්ෂණ මැනවින් පළ කළ කඩ සාප්පු ආදියෙන් සපිරි නගරයකි. උන්වහන්සේ එදින රාත්‍රිය පදියතලාව පන්සලෙහි ගත කළහ.

සෝම හිමියන්ගේ මේ චාරිකාව අදියර කිහිපයකින් යුතුව සැලසුම් කොට තිබිණි. එහි මුල් අදියර වූයේ උණුවතුර බුබුල සිට මහඔය, කෙහෙල්උල්ල, පදියතලාව, ඇතිරියන්කුඹුර හරහා බිබිලේටය. මුලින් අම්බලන්තොට ප්‍රදේශයේ නෝනාගම තෙක් යාමට සැළසුම් කොට තිබුණද එම මග අතිශය දුෂ්කරවීමද, විශේෂයෙන් වන සතුන්ගෙන් ගහන විශාල කැලෑ ප්‍රදේශ හරහා යාමට සිදුවීමේ භයානක බවද හේතුවෙන් හිතවත් බොහෝ දෙනකුගෙන් සෝම හිමියන්ට මෙම ගමන් මග වෙනස් කරන ලෙස

ඉල්ලීම් ලැබී තිබිණි. මෙම චාරිකාව බිබිලේ හරහා යාමට සෝම හිමියන් තීරණය කළේ ඉන් අනතුරුවය. බිබිලේ සිට පස්සර හරහා බදුල්ලට යාම ඊළඟ පියවර විණි.

මෙම චාරිකාව තුළ එක් එක් විහාරස්ථානයන්හි ධර්ම දේශනා පැවැත්වීමද සෝම හිමියන්ගේ තවත් අභිලාෂයකි.

මේ අයුරින් මහත් දුෂ්කර මගක පාද චාරිකාවෙහි යෙදෙමින් සෝම හිමියන් ගත කරන බව ධර්මායතනයෙහි භික්ෂූන් වහන්සේලා මෙන්ම ඊට සම්බන්ධ ගිහි පිරිස්ද දැනගත්හ. පෙර සෝම හිමියන් කෙරෙහි අමනාපයෙන් පසුවූ අයගේ පවා සිත් සසල කරවීමට උන්වහන්සේගේ මේ ක්‍රියාව සමත් විය. එසේම සෝම හිමියන් ධර්මායතනයෙහි වැඩ හිඳිමින් ශාසනික අභිවෘද්ධිය සඳහා කරන ලද මෙහෙවර ගැන සිතන විට දැන් එම හිමියන් නොමැති අඩුව හොඳින් දැනේ. එබැවින් සෝම හිමියන් යළි ගෙන්වා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් සේම, උන්වහන්සේගේ මෙම දුෂ්කර සහ භයානකද විය හැකි පාද චාරිකාව වළක්වා ගැනීමේ වුවමනාවද උන්වහන්සේට හිතවත් පිරිස තුළ ඇතිවී තිබිණ. ඔවුන් කිහිප දෙනෙකු ගොස් මහනාහිමියන් බැහැ දුටුවේ මේ පිළිබඳව සැළ කිරීමේ අදහසිනි.

'මහනායක හාමුදුරුවනේ, ධර්මායතනෙට සෝම හාමුදරුවො නැති අඩුව නම් හුඟක්ම දැනෙනවා. උන්වහන්සේ බොහොම උනන්දුවෙන් ශාසනේ දියුණුව වෙනුවෙන් වැඩ කළා. මෙතනට සම්බන්ධ වැඩි පිරිසක් සෝම හාමුදුරුවන්ට කැමතියි. ඒ නිසා ඔය පාද චාරිකාව නවත්තලා සෝම හාමුදුරුවන්ට ආපහු වඩින්න කිව්වොත් නේද හොඳ?'

ගමනෙහි භයානකත්වය පිළිබඳව ඍජුව නොපවසා සෝම හිමියන් නැති අඩුව පමණක් මතු කරමින් පිරිසෙන් කෙනෙකු මහානායක හිමියන් හමුවේ පවසා සිටියේය.

'මහත්තයො, උන්වහන්සේගෙ පරමාර්ථය බොහොම උතුම් එකක්. අපි පැවිද්දො හැටියට ශාසනේ දියුණුවට වැඩ කරන අතරෙම තමන්ගෙ ශ්‍රමණ ප්‍රතිපදාවන් සම්පූර්ණ කරගන්නත් ඕනෙ.

ඒ නිසා උන්වහන්සේ ඒ කටයුත්ත සම්පූර්ණ කරලා ආපුවාවෙ.... අපි ඒ අරමුණට බාධා කරන එක නරකයි'.

මහනායක හිමියෝ පැවසූහ.

# 18 දඩුවම් විඳින විදුහල්පතිගෙන් බණකට ඇරැයුමක්

මේ වනවිට ඇකිරියන්කුඹුරට වැඩම කර සිටි සෝම හිමියෝ එදින රාත්‍රිය එහි විහාරස්ථානයේ ගත කළහ. පසුද අළුයමින්ම පිබිදුණු සෝම හිමියෝ බිබිල දක්වා ගමනාරම්භ කළහ. මේ ගමනේදී පිණ්ඩපාතය සපයා ගැනීම සම්බන්ධ ගැටළු ඇතිවිය හැකි බැවින් එම විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ විසින් සෝම හිමියන්ගේ දහවල් දානයද පිළියෙල කරවා දී තිබිණි.

මේ ගමන යා යුතුව තිබුණේ විශාල කැලෑබද ප්‍රදේශ හරහාය. එහි ගෙයක් දෙරක් හමුවූයේද කලාතුරකිනි. මෙසේ පෙරටද වඩා දුෂ්කර ගමනක යෙදෙමින් සිටි සෝම හිමියන්ට අතරමගදී එක් කාන්තාවක් මුණ ගැසිණි.

'හාමුදුරුවනේ, මේ පාරෙන් නම් වඩින්න එපා මේ වෙලාවෙ. අලියා දැන් මේ ඉමේම ඉන්නවා. ඒ හින්ද ටිකක් දවල් වුණාට පස්සෙ වැඩම කරන්න....'

සන්සුන් ගමනින් වැඩම කරන මෙම හිමිනම දැක උපදවා ගත් මහත් වූ ශ්‍රද්ධාවෙන් මෙන්ම අනුකම්පාවෙන් යුතුව එම කාන්තාව පැවසීය.

ඇය එසේ කියා ඇගේ ගමන යන්නට ගියාය. ආ ගමන යම්දෝ නොයම්දෝයි දෙගිඩියාවක් මුලදී ඇති වුවද යන්න ආපු ගමන ආපහු හැරෙන්නෙ නෑ, ඉදිරියටම යනවා මිසක් යනුවෙන් පසුව උන්වහන්සේ හිත හද ගත් සේක.

මග දෙපසම මහ ඝන කැලෑව මිස අන් කිසිවක් නොවිණි. වෙනත් ප්‍රදේශවලට මෙන් නොව වනාන්තරවලට හිරු එළිය ලැබෙන්නේ ප්‍රමාද වෙමින්ය. එබැවින් එම උදෑසනද වනාන්තරයෙහි වූ අඳුරු බව මුළුමනින්ම පහව තිබුණේ නැත.

වනයේ ඉදිරියටම යමින් සිටි සෝම හිමියන්ට වැඩි දුරක් යන්නට මත්තෙන්ම ගස්වල අතු පොඩි කර දමා ඇති බවක් පෙනිණ. අමු කොළ සහ අතු පාර දිගින් දිගටම වැටී තිබිණි. මෙසේ කොළ අතු පොඩි කරන්නේ මිනිසුන් නොවන බව පැහැදිලිය. එසේ නම් මීන් සෑහෙන වේලාවකට පෙර හමුවූ කාන්තාව පැවසූ පරිදි අලියා මේ ළඟම ගැවසෙන බවට මෙය පෙරනිමිත්තක් විය නොහැකිද? එහෙත් ආපස්සට යන්නට නොසිතූ සෝම හිමියෝ යන ගමන පෙරටම ගියහ. හදිසියේම වාගේ උන්වහන්සේගේ නෙත ගැටුණේ ඒ වනවිටත් දුම් දමමින් තිබූ අලි බෙටිය. ඒ අනුව මෙතැනින් මීට මඳ වේලාවකට පෙර අලියකු ගමන් කළ බවට සැකයක් නැත. එසේ නම් අලියා තවමත් නුදුරේම හිඳිනු ඇත. හිතට කිසියම් චකිතයක් පිවිසුණද ආපසු හැරීම ප්‍රතික්ෂේප කළ සෝම හිමියෝ ඉදිරියට වැඩම කළහ. වැඩි දුරක් එලෙස යාමට ලැබුණේ නැත. තමන් වහන්සේ යා යුතු මගෙහිම දැවැන්ත අලියෙක් හිඳිනු සෝම හිමියන්ට පෙනිණ. මරණය පිළිබඳ බිය සිතට දැනී සෝම හිමියන්ගේ ගත දහඩියෙන් නෑවී ගියේය. එහෙත් ආපසු හැරීම කළ නොහැක. ආපසු හැරුණත් නැවත යා යුතු වන්නේද මෙම මාර්ගයෙන්මය. විශාල පිරිසකගේ යහපත උදෙසා ගනු ලබන මේ චාරිකාව තම අයහපත උදෙසා හේතු වේ යැයි සිතිය යුතු නොවේ. සිතට දිරි ගත් සෝම හිමියෝ අලියා වෙතට ආසන්න වූහ. පුදුමයකි. ඒ අලියෙකු නොවේ. පාර හරහා පෙරදා රෑයේ ඇද වැටී ඇති දැවැන්ත මාර ගසකි. සෝම හිමියන්ගේ මුවෙහි සිනාවක් පහළ වූයේ ඉබේමය.

මේ අයුරින් දහවල් දනයද වනයෙහිම නතර වී වැළඳූ සෝම හිමියෝ කෙටි ගිමන් නිවීමකින් පසු යළි චාරිකාව ආරම්භ කළහ. එදින සන්ධ්‍යාවෙහි උන්වහන්සේට පා ගමනින්ම බිබිල නගරයට පැමිණිය හැකි විණි.

රාත්‍රිය ගත කිරීම සඳහා එම ප්‍රදේශයේ විහාරස්ථානයක් පිළිබඳව විපරම් කරමින් සිටි සෝම හිමියන්ට සේනාරත්න නම් මහතකු මුණ ගැසිණි. බිබිලේ පුරාණ විහාරයට යන මග සළකුනු කී හෙතෙම සෝම හිමියන්ගේ වගතුග විචාළේය. හිමියන් සමග කතාබස් කිරීමෙන් මහත් සේ සතුටට පත් සේනාරත්න මහතා සෝම හිමියන් පන්සලටම කැඳවාගෙන ගොස් එහි නායක හාමුදුරුවන් මුණ ගැස්වීය.

සේනාරත්න නම් වූ මෙම මහතා එම ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු බවත් බිබිල තානායම පවත්වාගෙන ගියේ ඔහු බවත් පසුව සෝම හිමියෝ දැන ගත්හ. ඔහු සෝම හිමියන් පිළිබඳව කොතෙක් පැහැදී සිටියේදැයි කිවහොත් පසුදින සැන්දෑවෙහි එම විහාරස්ථානයෙහි ධර්ම දේශනාවක් පවත්වන ලෙසට සෝම හිමියන්ට ආරාධනා කොට මෙම පුවත පළාතේ සෙසු අයට දැන ගැනීම උදෙසා නගරය පුරා අඬ බෙරයක්ද යැවීය. ඒ කෙටි කාලය තුළ පෙරහරක්ද සංවිධානය කළ ඔහු පසුදින සන්ධ්‍යාවෙහි පෙරහර පවත්වා සෝම හිමියන් ලවා ධර්ම දේශනාවක්ද කරවීය. මෙම චාරිකාවෙහි වරින් වර ධර්ම දේශනා පැවැත්වුවද විශාල ජනකායක් උදෙසා කළ ප්‍රථම ධර්ම දේශනය එය විණි.

එම රාත්‍රියත් එකී විහාරස්ථානයේ ගත කළ සෝම හිමියෝ සුපුරුදු ධර්ම යාත්‍රාව සඳහා සූදනම් වූහ.

'ඔබවහන්සේට දැන් සෑහෙන දුරක් වඩින්න වෙන්නෙ මහ කැලෑව මැද්දෙන්. ඒ හරියෙ ගෙවල් දොරවල් නෑ. ඒ නිසා පයින් වැඩම කළා කියලා තේරුමක් වෙන්නෙ නෑ. මං මගේ වාහනෙන් ඔබවහන්සේව ලුණුගලට ඇරලවන්නම්. එතන ඉඳලා ඔබවහන්සේට පුළුවනි පයින් වැඩම කරන්න' යැයි සේනාරත්න මහතා කරුණු පැහැදිලි කරන්නට විය. මිනිසුන් නැති මග චාරිකාවේ යෙදීම නිෂ්ඵල බව වටහා ගත් සෝම හිමියෝ ඔහුගේ බසට අවනත වූහ.

ඒ අනුව එතැන් සිට ලුණුගල විහාරස්ථානය තෙක් සෝම හිමියන් වැඩියේ සේනාරත්න මහතාගේ රථයෙනි.

මෙම දීර්ඝ වූ ධර්ම චාරිකාවෙහි සෝම හිමියන් වාහනයකින් වැඩම කරන ලද්දේ එම කොටස පමණි.

ලුණුගල විහාරස්ථානයෙහි රැයක් ගත කළ සෝම හිමියන්ට ඊළඟට වැඩම කරන්නට තිබුණේ ඊට මඳක් ආසන්නව පිහිටි යපම්මටය. ඒ වනවිටත් අනූ දෙහැවිරිදි වියේ පසුවූ යපම්ම විහාරස්ථානයෙහි නායක හාමුදුරුවෝ සෝම හිමියන්ව පිළිගත්තේ මහත් වූ සොම්නසකිනි.

'ස්ථවිරයො, මාත් මේ පන්සලේ තනියම ඉන්නෙ. ඒ හින්ද ටික දවසක් මෙහෙ වැඩ ඉන්න' නායක හිමියෝ පැවසූහ. උන්වහන්සේගේ ඉල්ලීම මත එහි දින කිහිපයක් ගත කරන්නට සෝම හිමියන්ට සිදුවිය.

'මගේ මේ ජීවිත කාලෙදි ඔබවහන්සේ වගේ කටයුතු කරන හාමුදුරුවරු මට හම්බුවෙලා තියෙන්නෙ බොහොම අඩුවෙන්' නාහිමියෝ කීහ.

මෙම චාරිකාවෙහිදී එක් එක් විහාරස්ථානවලදී මෙන්ම දන මාන පිරි නැමූ නිවෙස් සහ ප්‍රසිද්ධ ස්ථානවලදී මුණ ගැසෙන කිහිප දෙනා බැගින් වූ සුළු පිරිස්වලට ධර්ම දේශනා පැවැත්වූ සෝම හිමියන් විශාල පිරිසක් හමුවේ කළ දෙවන දම් දෙසුම පැවැත්වූයේ පස්සර විහාරස්ථානයේදීය. ඒ 1981 වසර ජූනි මස 21 දිනය. අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමියන්ගේ උපන් දිනය වෙනුවෙන් එදින බෝධි පූජාවක්ද පැවැත්වීමෙන් අනතුරුව කරන ලද ධර්ම දේශනාවට අතිවිශාල පිරිසක් සහභාගි වූහ.

'සෝම හාමුදුරුවො කියලා තරුණ හාමුදුරු නමක් පන්සලට වැඩම කරලා අපූරු බණ ටිකක් කිව්වා.'

ධර්ම ශ්‍රවණය කළ බොහෝ දෙනෙක් පසුද එසේ කතා බස් කළහ.

මේ හැරුණු විට මෙම චාරිකාවෙහිදී දැන හඳුනා ගන්නට ලැබෙන ගුරුවරුන් මෙන්ම ඇතැම් දෙමාපියන්ද ඒ ඒ ප්‍රදේශවල පාසල්වල ධර්ම දේශනා පැවැත්වීම සඳහා සෝම හිමියන්ට ඇරැයුම් කළහ. පා ගමනින් වැඩම කරමින් දහම් දෙසන එම සුවිශේෂ හිමිනම පිළිබඳ පුවත උන්වහන්සේට කලින් පෙරමගට පියඹන්නට විය.

පස්සර සිට සෝම හිමියන් වැඩම කිරීමට නියමිතව තිබුණේ බදුල්ලටය. ඒ එන ගමනේදීද විහාරස්ථාන මෙන්ම පාසල් කීපයකත් ධර්ම දේශනා පැවැත්වීමට සෝම හිමියන්ට අවස්ථාව සැළසිණි. මෙබඳු එක් අවස්ථාවක අහම්බෙන් හමුවූ විදුහල්පතිවරයෙක් සෝම හිමියන්ට බෙහෙවින් හිතවත් විය. කලාතුරකින් දැකිය හැකි අන්දමේ සුවිශේෂ ගති පැවතුම්වලින් යුතු වූ මෙම විදුහල්පතිවරයා පක්ෂ දේශපාලනය නිසා අසීමාන්තික ලෙස බැට කෑවෙකි. විශේෂත්වය වූයේ ඒවා දරා ගැනීමට ඔහු තුළ තිබූ අපූරු හැකියාවය.

"ආණ්ඩු මාරු වෙන මාරු වෙන ගාණට, ඇමැතිවරුන් මාරුවෙන ගාණට මාව ලංකාවෙ එක කොනක ඉඳලා අනිත් කොනට දනවා. බොහොම දුෂ්කර පළාත්වලට හාමුදුරුවනේ."

විදුහල්පතිවරයාගේ කතාව ඇරඹුණේ එබඳු සැහැල්ලු ස්වභාවයකිනි.

"ඔය දේශපාලනය කරන මිනිස්සු හිතනවා ඇති මාව මෙහෙම තැනින් තැනට දන එකෙන් මට රිදෙනවා කියලා. මෝඩ මිනිස්සු හාමුදුරුවනේ. ගුරුවරු වුණාම අපට කොයි ඉස්කෝලෙත් එකයි. හැම තැනම ඉන්නෙ අපේම දරුවො. මට කොහෙ ගිහිල්ලත් උගන්නන්න පුළුවන්. මගේ පුතා ශිෂ්‍යත්වෙ විභාගෙ පාස් වුණා හාමුදුරුවනේ. ඒ ළමයව මට කොළඹ රෝයල් කොලේජ් එකට පහසුවෙන්ම දන්න පුළුවන්. ඒත් මං ළමයව යවන්නෙ නෑ. ලොකු ඉස්කෝලවලට යැව්වා කියලා වැඩක් නෑ. ළමය හැදෙන්න ඕනෙ දෙමව්පියො ගාව."

මෑත කාලයේ දකින්නට ලැබෙන සුවිශේෂ චරිතයක් වශයෙන්

එම විදුහල්පතිවරයා පිළිබඳ සෝම හිමියන්ගේ මනසෙහි සනිටුහන් විය.

'ඔබවහන්සෙ කවුද, කොහෙ ඉඳලද වැඩම කළේ කියන එක හැරුණු කොට මං ඔබවහන්සෙ ගැන පැහැදිලි විස්තරයක් දන්නෙ නෑ. ඒත් සංඝයා වහන්සේ නමකගේ තිබිය යුතු උජුපටිපන්න ගුණය, සෘජු පිළිවෙත් ඔබවහන්සේ තුළ තිබෙන බව ඔබවහන්සේ කතා කරන කාරණාවලින් මට හොඳටම පැහැදිලි වුණා. ඒ නිසා ඔබවහන්සේ ලවා මගේ ඉස්කෝලෙ දරුවන්ට ධර්ම දේශනාවක් කරවන්න මම බොහොම කැමතියි. ඒ නිසා මං ඔබවහන්සේට ආරාධනා කරනවා මගේ ඉස්කෝලෙ දරුවො වෙනුවෙන් ධර්ම දේශනාවක් කරන්න කියලා. සමහර විට මේකත් මට නපුරට හිටින්න පුළුවන්. ඒත් මම මේ හැම දෙයක්ම කරන්නෙ අවංක චේතනාවෙන්' විදුහල්පතිවරයා පවසා සිටියේය.

# 19 කම්කරු යුවළක් පාන් කාලක් පූජා කරති

ධර්ම චාරිකාවෙහි යෙදෙමින් සිටි සෝම හිමියෝ මේ වනවිට බදුල්ල නගරයට වැඩම කොට සිටියහ. බදුල්ල පොල්වත්ත විහාරස්ථානය, මහරගම ධර්මායතනයේ භික්ෂූන් වහන්සේ බදුල්ලට වැඩම කළ විට බොහෝවිට වැඩ වෙසෙන ස්ථානයකි. ඒ වනවිට මෙහි අලුතින් ඉදි කොට තිබූ භාවනා කුටියෙහි මුල් වරට වැඩ විසීමේ අවස්ථාව එහි නායක ස්වාමීන් වහන්සේ විසින් සෝම හිමියන්ට සලසා දී තිබිණි. මේ සෑම විහාරස්ථානයක මෙන්ම පාසල්වලත් ධර්ම දේශනා පැවැත්වීමද සෝම හිමියන් වෙතින් නොකඩවාම සිදුවිය.

නමුත් ඇතැම් පාසල්වල විදුහල්පතිවරුන් සෝම හිමියන්ට ධර්ම දේශනා සඳහා තම පාසලේ ඉඩ සලසා දුන්නේ එය නොහැර බැරිකමට මෙනි. එනිසාම මුළු පාසලේම සිසුන් ඒ වෙනුවෙන් සහභාගි නොකරවා පන්ති කිහිපයක සිසුන් පමණක් ඒ සඳහා යොදවන ලදී. නමුත් බාධක අවහිර හොඳින් හුරුපුරුදු සෝම හිමියන් ඉන් සැලුණේ නැත. උන්වහන්සේ තමා කරන්නට ආ කාරිය නොපිරිහෙලා ඉටු කළහ. මේ අනුව ධර්ම දේශනාව අවසන් වනවිට එම විදුහල්පතිවරුන්ගේ මුහුණු තුළ වූ පසුතැවිලි සහගත බව සෝම හිමියන්ට දැකගත හැකි විය.

'මං හරිම කණගාටු වෙනවා ස්වාමීන් වහන්ස මගේ මුළු ඉස්කෝලෙම දරුවන් මේ වෙනුවෙන් සහභාගි කරවන්න බැරි වුණාට. ඔබවහන්සේ ආයෙමත් මෙහෙ වැඩම කරලා අපේ දරුවන්ට බණක් කියන්න....' එම ඇතැම් විදුහල්පතිවරු සෝම හිමියන්ගෙන් ඉල්ලා සිටියහ.

බදුල්ලෙන් දෝව දක්වා වැටෙන මගට අවතීර්ණ වූ සෝම හිමියෝ යළි සිය චාරිකාව ආරම්භ කළහ. පිණ්ඩපාතයෙන් සපයා ගත් දිවා දනය උන්වහන්සේ වැළඳුවේ අතරමගදී හමුවූ විහාරස්ථානයකට වැඩම කොටය.

මෙකී විහාරස්ථානයේ වැඩ විසුවේ වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේ නමකි. සෝම හිමියන්ගෙන් තොරතුරු විමසූ උන්වහන්සේ තුළ ඇති වූයේ මහත් සොම්නස් සහගත ස්වභාවයකි.

'බොහොම හොඳයි ස්ථවිරයො, බොහොම හොඳයි...' උන්වහන්සේ කීයේ එම සොම්නසින් යුතුවය. එහෙත්, ඉන්පසු උන්වහන්සේගේ මුහුණේ කිසියම් දෙම්නස් සහගත ස්වභාවයක් ඇඳී ගියේය.

'මේ ස්ථවිරයො කරන්නෙ බොහොම ශ්‍රේෂ්ඨ වැඩක්. ඕවා පැවිද්දො විදිහට අපි අතින් සිද්ධ වෙන්න ඕන යුතුකම්. මගෙත් තරුණ කාලෙ ඔය අදහස ඔය විදිහටම තිබුණා. ඒත් ඉතින් දවසින් දවස කාලෙ ගෙවිලා ගියා. ඒත් එක්කම මාත් වයසට ගියා. දැන් ඉතින් මේ වයසක මට එහෙම දෙයක් කරගන්න තරම් හයි හත්තියක් නෑ. ස්ථවිරයො වගේ තරුණ උදවිය මෙහෙම දේවල්වලට අත ගහන එක මේ බුද්ධ ශාසනය වෙනුවෙන් කරන ලොකු සේවයක්.'

එම වයෝවෘද්ධ හිමි නම පැවසූහ.

දෝව රජමහා විහාරයේද දිනක් ගත කළ සෝම හිමියෝ අනතුරුව කුඹල්වෙල හන්දියෙන් ඇල්ල පාරට වන්හ. ඉන්පසු ඇල්ල හරහා බණ්ඩාරවෙලට පා ගමනින්ම වැඩම කොට තිබිණ. මේ සෑම අවස්ථාවකදීම අතිවිශාල ජනකායකට නොවූවත් රැස්වන සුළු පිරිසකට වුවද ධර්ම දේශනා කළහ.

බණ්ඩාරවෙල සිට වැලිමඩ, නුගතලාව, කැප්පෙටිපොල, හග්ගල හරහා නුවරඑළියට යාම උන්වහන්සේගේ චාරිකාවේ ඊළඟ පියවර විණි. වැලිමඩ පසු කළ පසු කෙමෙන් දේශගුණය වෙනස් වන අතර එය ක්‍රම ක්‍රමයෙන් වඩා සිහිල් බවට පැමිණෙයි. තැනිතලා භූමියක සිට විශාල නැග්මක් සහිත වූ මේ ප්‍රදේශවල කඳුකරයට යනවිට කෙමෙන් සිංහල ජනාවාස අඩුවී යයි. මෙබඳු එක් අවස්ථාවක පිණ්ඩපාතයේ වඩිමින් සිටි සෝම හිමියෝ එක් වතු ජනාවාසයක නිවෙසක් අද්දර නතර වූහ. එහි වූ යුවළක් සෝම හිමියන් වෙත පැමිණියේ පාත්‍රයක් දැතින් ගෙන සන්සුන් ඉරියව්වෙන් බලා හිඳින මේ භික්ෂූන් වහන්සේ වෙත ඉටු කළ යුතු වූ යමක් නොදත් නිසාවෙනි.

'සාමි.... අපිට දන්නෙ නෑ සාමිලාට මොනවද දෙන්න ඕනෙ කියලා....'

දිළිඳු වතු කම්කරුවෙකු වන ගෙහිමියා සෝම හිමියන් හමුවේ පැවසුවේ බැගෑපත් විලාසයකිනි.

'අපේ ගෙදර කෑම නම් තවම උයලා නෑ. අපි සාමිට සල්ලි දෙන්නම්. තරහා නැනෙ සාමි' යැයි කියමින් යළිදු පැවසූ හෙතෙම බිරිඳට යමක් පවසා ගෙතුළට යැවීය. ඈය රුපියල් දහයේ නෝට්ටුවක් ගෙනැවිත් තිබිණි.

'අපට මුදල් බාරගන්න කැප නෑ. මං මේ පිණ්ඩපාතෙ යන්නෙ දවල් දනෙට යමක් සපයා ගන්නයි' සෝම හිමියෝ සංසුන් හඬින් පහද දුන්නේය. මෙම ද්‍රවිඩ ජාතික වතු කම්කරු යුවළ බොදු පිළිවෙත් සම්බන්ධයෙන් කිසිවක් නොදත් නිසාවෙනි.

තමන් සිංහල හෝ බෞද්ධාගමිකයන් නොවූවද මෙම තරුණ භික්ෂූන් වහන්සේගේ සන්සුන් පෙනුම, තිවුණු කටහඬ, මෙම ද්‍රවිඩ යුවළගේ සිත තුළ මහත් පැහැදීමක් ඇති කොට තිබිණි. භික්ෂූන් වහන්සේ නමකට දනක් පිරිනමා පුරුද්දක් හෝ එවැන්නක් පිළිබඳ කිසිදු හෝ දැනීමක් නොතිබුණද ඔවුහු තමන්ගේ උදේ ආහාරය පිණිස ගෙනා පාන් කාලක් අපමණ ගෞරවයෙන් යුතුව සෝම හිමියන්ට පූජා කළහ.

රාත්‍රී යාමයත් විහාරස්ථානවල ගත කරමින් තෙදිනක පමණ ගමනකින් පසු සෝම හිමියන් නුවරඑළිය නගරයට වැඩම කොට තිබිණි. මේ වනවිට පොද වැස්සක් පැවති අතර පරිසරය පුරාම වූයේ මඳ අඳුරක් මුසු දැඩි සිහිල් බවකි. දෙපයින් ඇවිද යන ගමනේදී දැකිය හැකි විඩාව පොද වැස්ස විසින් යටපත් කොට තිබිණි. එසේම ඇවිද යන නිසා පරිසරයේ වූ දැඩි සිහිල් බව දැනුණේද මද වශයෙනි.

රාත්‍රිය ගත කිරීම සඳහා උන්වහන්සේ වැඩම කළේ හාවාඑළිය විහාරස්ථානයටය.

මේ වනවිට සෝම හිමියන් ධර්ම චාරිකාවේ යෙදෙන මෙම ගමන් මාර්ගය පිළිබඳව ධර්මායතනයේ භික්ෂූන් වහන්සේලාද දැන සිටියහ. ඒ අනුව හාවාඑළිය විහාරස්ථානයට සෝම හිමියන් වෙත ධර්මායතනයෙන් පණිවුඩයක් තබා තිබිණි.

'ඔබවහන්සේ දැන් සෑහෙන දවසක ඉඳලා මේ ධර්ම චාරිකාවේ යනවනෙ. ධර්මායතනයෙන් පණිවුඩයක් දුන්නා ඔබවහන්සේට ධර්ම චාරිකාව අවසන් කරලා ඉක්මනින්ම ධර්මායතනයට එන්න කියලා' හාවාඑළිය විහාරස්ථානයේ වැඩ විසූ සේනානන්ද නමැති හිමි නමක් සෝම හිමියන් හමුවේ පවසා සිටියහ.

'එහෙ වැඩ කටයුතු ගොඩක් අඩාල වෙලාලු ඔබවහන්සෙ නැතුව. ඒ නිසා ඔබවහන්සේට ඉක්මනින්ම ආයෙමත් වඩින්න කියලා තමයි පණිවුඩේ දුන්නෙ....' යැයි උන්වහන්සේ යළිදු කීහ.

'මේක මගේ ලොකු අධිෂ්ඨානයක් සඵල කරගැනීමක් හාමුදුරුවනේ. ඒ නිසා මේ ගමන මං යන්නම ඕනෙ. ධර්මායතනයෙ හිටියත් ශාසනික වශයෙන් ලොකු සේවයක් වෙනවා තමයි. නමුත් ඊටත් වඩා විශාල පිරිසකට මගේ මේ ක්‍රියාවෙන් සේවයක් වෙනවා කියලයි මං නම් විශ්වාස කරන්නෙ. මගේ අධිෂ්ඨානය අතරමග බිඳ වැටෙන්න දෙන්න බෑ හාමුදුරුවනේ....'

සෝම හිමියන් පැවසුවේ ස්ථිර හඬකිනි. හාවාඑළිය විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේද ඉල්ලීම මත සෝම හිමියන් එහි තෙදිනක් ගත කළහ.

මෙම ධර්ම චාරිකාවෙහි හරි අඩකට වැඩි කොටසක් මේ වනවිට නිම වී තිබිණි. මෙතැනින් ඊළඟට තලවාකැලේ, ලිඳුල, කොටපොල හරහා හැටන් දක්වා යා යුතුවේ. එම මග සිංහල මෙන්ම ද්‍රවිඩ ජනාවාසද හමුවේ. පුපුරුදු පරිදි පිණ්ඩපාතයෙන් යැපෙමින් සැතපුම් ගණනක් මග ගෙවා කොටපොල විහාරස්ථානයට වැඩම කළ සෝම හිමියන්ව එම විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේද මහත් වූ ආදර ගෞරවයෙන් යුතුව පිළිගත්හ.

'ඔබවහන්සේ මගේ දයකයින්ටත් බණක් කියන්න ඕනෑ' යැයි නායක ස්වාමීන් වහන්සේ සෝම හිමියන්ට ආරාධනා කර සිටියහ. එම ආරාධනය සෝම හිමියන් පිළිගත්තේ ඉමහත් සතුටිනි.

'හැටන්වලින් පස්සෙ ගිනිගත්හේනට යනකල් බස් එකකින් යන එක තමයි හොඳ හාමුදුරුවනේ. ඔය පාරෙ දිගටම තියෙන්නෙ තේ වතුයි, ද්‍රවිඩ ජනාවාසයි විතරයි. ඔබවහන්සේ ධර්ම චාරිකාවේ ගියත් මිනිස්සුන්ට එයින් ප්‍රතිඵලයක් ලබන්නත් බෑ, ඔබවහන්සේට ප්‍රතිඵලයක් ලැබෙන්නෙත් නෑ. ධර්ම දේශනා කරන්නවත්, පිණ්ඩපාතෙටවත් සුදුසු වාතාවරණයක් නෙමේ එහෙ තියෙන්නෙ. ඒ දුර බස් එකෙන් ගිහින් ගිනිගත්හේනෙ ඉඳලා ඉතුරු ටික පයින් වැඩම කරන එක තමයි හොඳම වැඩේ.'

එම ස්වාමීන් වහන්සේගේ අවවාදය සෝම හිමියෝ පිළිගත්හ.

ගිනිගත්හේනෙන් පසු කඳුකර ප්‍රදේශය ක්‍රම ක්‍රමයෙන් නිම වෙයි. ඉන්පසු පිය මනින්නේ තැනිතලා ප්‍රදේශයකටය. පිටවල, කිතුල්ගල, හක්බෙල්ලාවක, යටියන්තොට, කරවනැල්ල පසු කර පැරණි සීතාවක පුරයට වැඩම කළ සෝම හිමියන්ගේ ඊළඟ නවාතැන වූයේ දෙහිඕවිට විහාරස්ථානයයි. එහි වැඩම කළ පළමු දිනයේදීම සෝම හිමියන්ට දුරකථන ඇමතුමක් ලැබිණි.

'මං මේ ධම්මසිරි හාමුදුරුවො කතා කරන්නෙ. ඔබවහන්සෙ දැන් සෑහෙන දුරක්, සෑහෙන කාලයක් ධර්ම චාරිකාව කළානෙ. ඔබවහන්සෙ දැන් ධර්මායතනයට අවශ්‍යම කාලෙ. මහානායක හාමුදුරුවොත් කිව්වා ඔබවහන්සේට ආපහු මහරගමට එන්න

කියලා...'

ධම්මසිරි හිමියෝ කීහ.

සෝම හිමියන් පත්වූයේ තීරණයක් ගත නොහැකි තත්ත්වයකටය. මහානායක හිමියන්ගේ ඉල්ලීමකට කෙසේ පිටුපාන්නද?

# 20 කැලණි නදිය අසබඩදී තොටියකුට දහම් දෙසයි

සෝම හිමියන් මෙම ධර්ම චාරිකාවට මුල පුරා තිබුණේ කලක් තිස්සේ සිතෙහි පැවැති අධිෂ්ඨානයක් අනුවය. ඒ වන විටත් මසක පමණ කාලයක් ඉක්ම ගොස් තිබූ මෙම චාරිකාව නිම වෙන්නට තව පැවතියේ මුළු ගමනින් පහෙන් එකකටත් වඩා අඩු ප්‍රමාණයකි. තම පරම පිවිතුරු අධිෂ්ඨානය අතරමග බිඳී යනු දකින්නට නොරිසි වූ සෝම හිමියෝ ධම්මසිරි හිමියන්ගේ දූරකථන ඇමතුමට පිළිතුරු දෙමින් ඉතා කෙටි කලකින්ම යළි ධර්මායතනයට පැමිණෙන බව දන්වා සිටියහ.

දෙහිඕවිට සිට යළි චාරිකාවෙහි යෙදෙන්නට වූ සෝම හිමියෝ ඉන්පසු අවිස්සාවේල්ල දක්වා පා ගමනින් වැඩම කළහ. එතැන් සිට කළුඅග්ගලද පසු කරමින් හයිලෙවල් පාරේ වැඩම කරමින් සිටි උන්වහන්සේ ඉන්පසු හංවැල්ල කරා දිවෙන ලෝ ලෙවල් පාරේ ගමන් ගන්නට වූහ. මේ කාලය තුළ උන්වහන්සේ දිවා දනය වැළඳුවේ පිණ්ඩපාතයෙනි.

මෙසේ ධර්ම චාරිකාවෙහි යෙදෙමින් සෝම හිමියෝ නවගමුවද පසුකර කැලණි ගඟේ තොටුපළක් කරා වැඩම කළහ. එතැනින් පාරුවක නැඟී ගඟෙන් එතෙරව ඉන්පසු යළිදු එතැන් සිට කැලණි විහාරය බලා පා ගමනින් වැඩම කිරීම උන්වහන්සේගේ අභිප්‍රාය

විණි.

තොටුපළෙහි නවතා තිබූ පාරුවක් අසළ තොටියා ඇන තබා වාඩිවී සිටියේය.

දෙවුර වැසෙන පරිදි සිවුර හැඳ එක් උරයකින් ගමන් මල්ලක් එල්ලාගෙන අනෙක් අතෙහි පාත්‍රයක්ද සහිතව උපශාන්ත ගමනින් තොටුපළට වැඩම කරන ලද භික්ෂූන් වහන්සේ දැක තොටියා හැඳ සිටි සරම ගසා දමමින් නැගී සිටියේය.

'හාමුදුරුවො එතෙරට වඩින්නද?' සෝම හිමියන් අභියස වැටී නමස්කාර කළ තොටියා බැගෑපත් හඬින් විමසීය.

'ඔව්. මම ධර්ම චාරිකාවේ යන කෙනෙක්. මම මෙතනින් එතෙර වෙලා පයින්ම කැලණි විහාරයට යන්නටයි බලාපොරොත්තු වෙන්නෙ' උන්වහන්සේ පැවසූහ.

සෝම හිමියන්ව හඳුනාගෙන නොසිටියද ඒ හිමියන්ගේ නිවුණු හඬත්, ප්‍රසන්න පෙනුමත් තොටියාගේ සිතෙහි අපමණ ශ්‍රද්ධා භක්තියක් උපදවා තිබිණි. අනතුරුව හෙතෙම උන්වහන්සේගේ ධර්ම චාරිකාව පිළිබඳව අසා මහත් විස්මයටත්, සොම්නසටත් පත්විණි.

'නගින්න හාමුදුරුවනේ, මං ඔබවහන්සේව එතෙර කරන්නම්.' තොටියා යළිඳු සෝම හිමියන්ට නමස්කාර කොට වහා පාරුව බැඳ තිබූ බැමි ලිහා දැමුවේය.

හාත්පස වූයේ එකම තිල්වන් පලසක් එලුවාක් බඳු ගස් කොලන්වලින් පිරී ගිය චමත්කාර ජනක පරිසරයකි. ගං තෙර වූ නාගස්වල පිරී තිබූ නාමල්වල සුගන්ධය සිසිල් සුළඟට මුසුව පරිසරය පුරා පැතිර ගොස් තිබුණේය. පරවී ගිය නාමල් ගංතෙර වූ සුදු වැලිතලාව පුරා වැටී තිබිණි.

කැලණි යනු උතුම් යන අර්ථයයි. කැලණි නදිය 'උතුම් නදිය' යනුවෙන් හැඳින්වෙන්නේ අපේ වංශ කතාවල සඳහන් වන පරිදි බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කළ මොහොතේ පැන් සනසාලූ නදිය වීමේ හේතුවෙනි. තොටියා විසින් මහත් ශ්‍රද්ධා

භක්තියෙන් යුක්තව සෝම හිමියන්ව මෙම නදියෙන් එතෙර කරවමින් සිටියේය.

කැලණි චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ශ්වේත වර්ණ කොත් කැරැල්ල ඈතට දිස්වෙයි. චෛත්‍යය යනුවෙන් බුදුන් වහන්සේ බුද්ධත්වයද හඳුන්වා දී තිබිණි. සූත්‍ර ගණනාවකම බුදුරජාණන් වහන්සේ සසර ගමන නදියට උපමා කොට තිබිණි. නදියෙන් එතෙර වූ පසු ගුවනේ දිදුලන ශ්වේත වර්ණ කොත් කැරැල්ල දුටු සෝම හිමියන් තුළ එද නැගී තිබුණේ එකම එක අදහසකි. එනම් මෙලෙසින් සසර නදියද එතෙර කොට යම් භවයක බුදු පසේ බුදු මහරහත් උතුමන් නිවී සැනසී පැමිණ වදළ අතිඋතුම් නිර්වාණයට පිවිසෙන්නට තමන් වහන්සේටද හේතු වේවා යන්නය.

තොටියා යළිදු සෝම හිමියන්ගේ දෙපා නැමදුවේය. උන්වහන්සේ තොටියාට කෙටි ධර්ම දේශනාවක් කොට තමන් වෙත කරන ලද මෙම උපකාරය වෙනුවෙන් පින් පැමිණ වූ සේක.

'අද මට හරිම සතුටුදයක දවසක් හාමුදුරුවනේ. සතුටක් විතරක් නෙමේ, හිතට ලොකු සැනසීමකුත් මට දැනෙනවා. මං මේ පාරුව පදින්න වෙලා දැන් අවුරුදු හතළිහක් විතර වෙනවා. ඒත් ඒ කිසිම දවසක මෙහෙම සතුටක්, සැනසිල්ලක් දැනුණෙ නෑ. ඒ විතරක් නෙමේ හාමුදුරුවනේ. ඔබවහන්සේව මේ පාරුවෙන් එගොඩ කරවන්න ලැබුණට පස්සෙ දැන් මට දැනෙනවා මේ රස්සාව මොන තරම් උතුම් රස්සාවක්ද කියලා.'

තොටියා තමන් අත්කරගත් කුසලය පිළිබඳව මහත් සේ සොම්නසින් පසුවිය. ඔහුට යළිදු ත්‍රිවිධ රත්නයේ පිහිට පැතූ සෝම හිමියෝ පා ගමනින් වැඩම කරන්නට වූහ.

උන්වහන්සේ කැලණි රජමහා විහාරයට වැඩම කරන විට දහවල් 2.00 පමණ වී තිබිණි. මේ සෝම හිමියන්ගේ අධිෂ්ඨානයෙහි මල්පළ ගැන්වෙන මොහොතය. එනම් දිගු ධර්ම චාරිකාවෙහි අවසන් පියවරය.

කැලණි විහාරය වැඳ පුද ගන්නට මල් ටිකක් සොයා ගන්නට

වටපිට බැලූමුත් ඒ මද්දහන් වෙලාවෙහි කිසිදු මල්කරුවකු දකින්නට නොසිටියේය. සෝම හිමියෝ ඔබ මොබ ඇවිද්දහ. එක් දැරියක කුඩා පිරිමි ළමයකු සමග මල් කිහිපයක් අලෙවිය පිණිස තබාගෙන හිඳිනු සෝම හිමියන් විසින් හදිසියේ දක්නා ලදී.

'හාමුදුරුවනේ මල් ඕනෙද?'

දැරිය ගෞරව සම්ප්‍රයුක්ත හඬින් විමසුවාය.

'මල් ටිකක් තිබුණා නම් හොඳයි.'

දැරිය සතුව ඉතිරිව තිබුණේ නෙළුම් මල් දෙක තුනක් පමණි. ඇය එය දෝතින්ම සෝම හිමියන්ට පිළිගැන්වූවාය. සෝම හිමියෝ සිය ගමන් මල්ල අතට ගෙන එහි වූ කාසි කිහිපයක් දැරිය වෙත පෑ මුත් ඇය එය තරයේ ප්‍රතික්ෂේප කළේ එම මල් තමන් පින් පිණිස පිදූ බව පවසමිනි. ඇයට පින් පමුණුවාලූ සෝම හිමියෝ කැලණි චෛත්‍යය වෙත ගමන් කළහ.

මෙවකට කැලණි රජමහා විහාරයෙහි අධිපතිත්වය දැරුවේ තලේවල විජිත ධම්මරක්ඛිත හිමියන්ය. උන්වහන්සේවද බැහැ දකින්නට සෝම හිමියෝ අමතක නොකළහ. ධර්මායතනයෙහි සංඝ පරම්පරාවෙන් පැවත එන සෝම හිමියන් කළාවූ මෙම අතිඋතුම් ධර්ම චාරිකාව පිළිබඳව ධම්මරක්ඛිත හිමියන් කතා කළේ මහත් වූ ප්‍රසාදයෙන් යුතුවය. ඉන්පසු සෝම හිමියන්ට සිව් පසයෙන් සංග්‍රහ කරවාලූ ධම්මරක්ඛිත හිමියෝ සෝම හිමියන් සිය පරම පිවිතුරු අධිෂ්ඨානය මල්වල ගන්වා ගෙන පිටත් වන ඒ මොහොතේ උන්වහන්සේට ආශීර්වාද කරන්නටද අමතක නොකළහ.

පුරා මාසයකුත් සතියක්, එනම් දින තිස් හතක් කරන ලද ධර්ම චාරිකාව එසේ අවසන් කළ සෝම හිමියෝ කැලණිය බස් නැවතුම් පළට වැඩම කළහ. එතැන් සිට බසයේ නැගී උන්වහන්සේ සිය වාසස්ථානය වූ මහරගම ධර්මායතනයට වැඩම කළහ.

# 21 නිදහසට කරුණු දක්වන කැසට් පටයක් !

මහඔය සිට කැළණි විහාරය දක්වා සැතපුම් දෙසීයද ඉක්මවන පා ගමනින් කරන ලද ධර්ම චාරිකාව අවසන් කළ සෝම හිමියන් යළි ධර්මායතනයෙහි වාසය පිණිස වැඩම කොට තිබිණි. ධර්මායතනයෙහි තමන් නොසිටි මාසයකුත් සතියක පමණ කාලය තුළ තම විරුද්ධවාදීන් කිහිප දෙනා නායක ස්වාමීන් වහන්සේලා බිඳවීම සඳහා විවිධ කටයුතු කර ඇති බව සෝම හිමියන්ට සැල වුණි. එහෙත්, උන්වහන්සේ ඒ පිළිබඳ තැකීමක් නොකර තමන්ගේ වැඩකටයුතු කරගෙන ගියහ.

නුවරඑළියේ අශෝකාරාමාධිපති ඌරුගමුවේ සේනානන්ද හිමියන් මීළඟ වස් කාලයට එහි වැඩම කරන ලෙස සෝම හිමියන්ට කල්තබාම ඇරැයුම් කොට තිබිණි. ඒ උන්වහන්සේ ධර්ම චාරිකාවෙහි යෙදෙන සමයේදීය. මේ අනුව තමා පිළිබඳව පළවී ඇති විවිධ විරුද්ධවාදී මත පිළිබඳ තැකීමක් නොකළ සෝම හිමියෝ සේනානන්ද හිමියන්ගේ ඇරැයුම් මත නුවරඑළිය බලා වැඩම කළහ.

නුවරඑළියේ අශෝකාරාමයේ වස් විසූ සෝම හිමියන් සෙසු සියල්ල අමතක කොට ඒ කාලය තුළ එක දිගටම පන්සිය පනස් ජාතක පොත් වහන්සේ පරිශීලනය කරන්නට පටන් ගත්තේ

එමගින් සකලවිධ වූ මනුෂ්‍ය ස්වභාවයන් කදිමට මූර්තිමත් වන බැවිනි. එසේම ජීවිතය හමුවේ එළැඹෙන අනේකවිධ වූ අර්බුදයන් විසඳ ගැනීමට බෞද්ධ සදචාර මාර්ගයෙන් ලැබෙන උපදෙස් එහි අඩංගු වී ඇත. සම්පූර්ණ වශයෙන්ම ජාතක පොත් වහන්සේ කියවූ පසු සෝම හිමියන්ට හැඟුණු එකම සිතිවිල්ල වූයේ මෙය ප්‍රබල මනෝවිද්‍යා ග්‍රන්ථයක් නොවේද යන්නය. නූතන මනෝවිද්‍යාවෙහි අඩංගු නොයෙකුත් අංග ඇතුළත් බෞද්ධ මනෝවිද්‍යාව ඊට වඩා බොහෝ දූර දිගක ගමන් කරන්නකි. මිනිසා තුළ අධ්‍යාත්මික සංහිඳියාවක් ඇති කොට මෙලෝ වශයෙන් පවා මිනිසාගේ මනෝකායික ව්‍යාකූලතා සමනය කිරීමට බෞද්ධ සදචාර පද්ධතියට හැක. එසේම සියලු මනෝ රෝගකාරකවලට මූල අප තුළ හට ගන්නා රාග, ද්වේෂ, මෝහ, ඊර්ෂ්‍යාව ආදී වශයෙන් වූ අයහපත් සිතිවිලිය. ඒ තුළින් හට ගන්නා මනෝකායික රෝගකාරක සඳහා බෝසතාණන් වහන්සේ විසින් දෙනු ලබන ප්‍රතිකර්ම ඉතාම වැදගත් සේම සියලූ කාලයටම ඔබිනු ඇත. ජාතක පොත් වහන්සේ කියවා ඇතිකරගත් එම ප්‍රසන්න වූ සිතිවිලි ඇතිව සිටි සෝම හිමියන්ට ඒ ඔස්සේ අලුතෙන් පොතක් ලිවීමේ අදහසක් පහළ විණි.

අශෝකාරාමයේ මඳක් පහළට ගිය කල රමණීය දිය ඇල්ලක් ගලා හැලෙනු පෙනෙයි. විශේෂයෙන් සැන්දෑ යාමයට එම පරිසරය ඉතාම මනස්කාන්ත බවකින් යුතුව දිස්වෙයි. බොහෝ දිනවල සවස් යාමය එහි ගත කරන සෝම හිමියන්ට ජාතක පොත් වහන්සේ අළලා තමන් විසින් රචනා කිරීමට අපේක්ෂිත කෘතියට අදළ විවිධ කරුණු පිළිබඳව කාව්‍ය සංකල්පනා පහළ වන්නට විය. අපවත් වී වදළ අග්ගමහා පණ්ඩිත තුඩාවේ අරියවංශ නාහිමියන්ගෙන්ද උපදෙස් ලැබූ සෝම හිමියෝ සූවිසි විවරණ සහ සම්බුදු සිරිත නම් වූ සිය නවතම බෞද්ධ ග්‍රන්ථය කාව්‍ය සංග්‍රහයක් වශයෙන් රචනා කළහ. මින් පෙර කිසි දිනෙක කවි ලියා පළපුරුද්දක් නොතිබුණද සෑම විවරණයකටම කවි දෙකක් වශයෙන් නිර්මාණය කර තම කෘතිය නිම කිරීමේ හැකියාව සෝම හිමියන්ට ලැබී තිබිණි. පසු කලෙක එම ග්‍රන්ථයද මුද්‍රණද්වාරයෙන් පිට විණි.

වස් නිමා වන්නේ කඨින පුණ්‍ය කර්මයෙනි. මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන් කඨින පිංකම් සඳහා වසරක් පාසා විහාරස්ථාන ගණනාවකටම වැඩම කිරීම සාමාන්‍ය සිරිතකි. නුවරඑළියේ අශෝකාරාමයේ කඨින පිංකම සඳහාද උන්වහන්සේ වැඩම කරවීමට නියමිතව තිබිණි.

මේ වනවිට තමන් පිළිබඳ විවිධ කටකතා ධර්මායතනයට සම්බන්ධ කිහිප දෙනෙකු විසින් මහානායක හිමියන්ටද දන්වා ඇති බව සෝම හිමියන්ට සැල විය. කලින් ඔවුන් කළේ අම්පිටියේ රාහුල ලොකු හාමුදුරුවන්ව තමා සම්බන්ධයෙන් බිඳවීමට උත්සාහ කිරීමය. එය නොහැකි වූ තැන ඔවුන් මහනාහිමියන් වෙත යොමුවී තිබිණ.

මෙවර නාහිමියන් නුවරඑළියට වැඩම කළ පසු සියලු තතු උන්වහන්සේ වෙත පවසා තම නිදෙස් බව අනාවරණය කිරීමේ අවශ්‍යතාවයක් සෝම හිමියන්ට තදින්ම දැනිණි. නමුත් මෙය උන්වහන්සේ හමුවී සාමාන්‍ය කට වචනයෙන් පැවසීම ඒ තරම් ඵලදායී නොවේ. කට වචනයෙන් කියන යමක් ඒ මොහොතේ මුවින් පිටවීමත් සමගම සුළඟේ පාවී යයි. එසේම යමක් කියන්නට ගොනුකර ගත්තත් එහි යම් යම් කොටස් අතපසු වීමට බොහෝ විටම ඉඩ තිබේ. එනිසා එසේ අතපසු නොවී කරුණු සියල්ල එළිදැක්වීම පිණිසත්, අවශ්‍ය වූ විට යළි යළිත් අසමින් හෝ ඒ සම්බන්ධ තෝරා බේරාගෙන සිතෙහි ධාරණය කර ගැනීම පිණිසත් යෙදිය යුතු හොඳම උපක්‍රමය වන්නේ තමන්ගේ නිදොස් බවට අදාළ ප්‍රකාශය කැසට් පටයකට ගැනීමය. සේනානන්ද හිමියන්ට සියලු පුවත් දැන්වූ සෝම හිමියෝ තමන්ගේ අවශ්‍යතාවය උන්වහන්සේට සැලකර සිටියහ.

'ස්ථවිරයන්ගෙ අදහස බොහොම හොඳයි. මං ඒ වැඩේ කරලා දෙන්නම්' සේනානන්ද හිමියෝ පැවසූහ. ඒ අනුව සෝම හිමියෝ එකල සිල් මාතාවක වීම සඳහා අවසර පතමින් තමන්ට ලිපියක් ලියූ යුවතියට යැවූ පිළිතුරු ලිපියේ සිට සියලු විස්තර කැසට් පටයට නැංවූහ. නියමිත දින පඤ්ඤාසීහ මහනාහිමියෝ නුවරඑළියේ අශෝකාරාමයට වැඩම කොට තිබිණි. උන්වහන්සේ වැඩම කළ

පළමු දිනයේම උන්වහන්සේව බැහැ දැකීමට ගිය සෝම හිමියන් පසග පිහිටුවා උන්වහන්සේට නමස්කාර කළහ. තම ගෝල හිමියන්ට ආශිර්වාද කළමුත් මහනාහිමියන්ගේ මුහුණේ වෙනද මෙන් ප්‍රසන්න පෙනුම නොවිණි. සිදුවී තිබෙන දෙය දැන සිටි නමුදු සෝම හිමියෝ ඒ මොහොතෙහි නිහඬ වූහ.

පසුදින උදයේද සෝම හිමියෝ මහනාහිමියන් බැහැ දකින්නට ගියහ. සෝම හිමියන් සමග කිසිවක් නොදෙඩූ මහනාහිමියෝ සෙමින් සෙමින් විහාර ගෙය දෙසට පිය මනින්නට වූහ.

විහාර ගෙය විචිත්‍රවත්ව තිබුණේ අග්ගිකන්දෝපම සූත්‍රය පිළිබිඹු කරන සිතුවම්වලිනි. මහනාහිමියෝ මෙම සිතුවම් නරඹමින් විහාර ගෙය තුළ සක්මන් කරද්දී සෝම හිමියෝද උන්වහන්සේ පසුපසින් වූහ.

'මේවත් හොඳයි අපේ සමහර ඇත්තන්ට හිතට අරන් හැදෙන්න....'

මහනාහිමියන් එසේ කීවේ තමන්ට බව සෝම හිමියන්ට වැටහුණි. උන්වහන්සේ තමන් පිළිබඳ වැරදි වැටහීමක හිඳින බවට වෙනත් සාක්ෂි අවශ්‍ය නැත.

බුදුරජාණන් වහන්සේ මෙම සූත්‍රය දේශනා කොට වදාළේ භික්ෂු සංඝයා වෙනුවෙනි.

වරක් භික්ෂූන් වහන්සේලා පිරිසක් කැටුව බුදුරජාණන් වහන්සේ මහ වන මැදින් ගමන් කරමින් සිටියහ. ඒ මොහොතේ ලැව් ගින්නෙන් ගිනිගත් ගසක්ද ගින්නෙන් දිලෙමින් තිබිණ. මේ ගස පෙන්වූ බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, මේ ගස වැළඳ ගැනීම සැපයක්ද, නව යොවුන් වියේ හිඳින රූමත් කාන්තාවක් වැළඳ ගැනීම සැපයක්දැ' යි විචාළහ. භික්ෂූන් එක හඬින් පිළිතුරු දුන්නේ 'ස්වාමීනි, රූමත් කාන්තාව වැළඳ ගැනීම සැපයකැ' යි යනුවෙනි. එතැන්හිදී බුදුරජාණන් වහන්සේ අග්ගිකන්දෝපම සූත්‍රය වදාරමින් පවසන ලද්දේ 'මහණෙනි, නුඹලා මේ ගස වැළඳ ගත්තොත් ඔබලා ඒ මොහොතේදී පමණක් පිළිස්සී මිය යනු ඇත. එහෙත් රූමත් කාන්තාවක් වැළඳ ගැනීම යනු සංසාරය පුරාම

පිළිස්සී පිළිස්සී ජීවත් වන්නට සිදුවීම' යි යනුවෙනි.

මහනාහිමියන්ට තම නිර්දෝෂී භාවය සනාථ කිරීම සඳහා මෙය සුදුසුම අවස්ථාව බව සෝම හිමියන්ට දැඩිව වැටහිණි.

'මහනායක හාමුදුරුවනේ, මට ඔබවහන්සේට කියන්නට දෙයක් තියෙනවා.'

මහනාහිමියන්ට නමස්කාර කළ සෝම හිමියෝ පැවසූහ.

'කියන්න සෝම' මහනාහිමියෝ සුපුරුදු කාරුණික හඬින් කීහ.

'මම කියන්න තියෙන සේරම විස්තරය කැසට් පටියකට ගත්තා. එතකොට ඔබවහන්සේට නැවත නැවතත් අහලා හරි මේක පැහැදිලිව අවබෝධ කරගන්න පුළුවන් වෙයි. මං මේ කැසට් එකට අරගෙන තියෙන්නෙ සම්පූර්ණයෙන්ම ඇත්ත විස්තරේ. මීට වඩා ඇත්තක් කොතනකවත් නෑ මහානායක හාමුදුරුවනේ. මේක අහලම ඔබවහන්සේ මං ගැන තීරණයක් ගන්න. අවශ්‍ය නම් ඔබවහන්සේට කැමති ඕනෑම කෙනෙකුට මේක අහන්න සලස්වලා මට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්න.' සෝම හිමියෝ මඩිහේ මහනාහිමියන්ට කැසට් පටය පිළිගන්වා පසග පිහිටුවා වැන්දහ.

# 22 ඕස්ට්‍රේලියාවෙන් ඇරයුමක්

තම නිවැරදි බව මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන් වෙත සවිස්තරව දක්වන්නට ලැබීමෙන් සෝම හිමියන් තුළ අපමණ සතුටක්, අස්වැසිල්ලක් හටගෙන තිබිණි. උන්වහන්සේ පසු දින උදයේ මහා නායක හිමියන් බැහැ දකින්නට ගියේද එම අස්වැසිල්ලෙන්ම යුතුවය.

සෝම හිමියන් අපේක්‍ෂා කළ පරිද්දෙන්ම උන්වහන්සේව දුටු මොහොතෙහි මහා නාහිමියන්ගේ මුවෙහි ප්‍රසන්න සිනාවක් ඇඳුණි. තම නිරවද්‍යභාවය මහා නාහිමියන් අවබෝධ කරගෙන ඇත. සෝම හිමියෝ මහා නාහිමියන්ට නමස්කාර කළහ.

'ඔහොම තමයි සෝම, සමාජයේ වැඩ කරන්න ගියාම ප්‍රශ්න ඇති වෙනවා. ඕවයින් කළකිරෙන්න හොඳ නෑ. ඔය විදිහෙ මිනිස්සුත් මේ සමාජයේ ඉන්න බව දැනගෙන වැඩ කරන එක තමුන්ගෙ ආරක්‍ෂාවටත් හොඳයි' මහා නාහිමියෝ අවවාද කළහ.

එම වස් කාලය අවසන් වූ පසු සෝම හිමියෝ නුවරඑළියේ අශෝකාරාමයේ සිට යළි ධර්මායතනය බලා වැඩම කළහ.

මේ වනවිට බම්බලපිටිය වජිරාරාමයේ වැඩ කටයුතු බලා කියා ගැනීමට නායක හිමි නමක සිටියේ නැත. ඊට හේතුව වූයේ ඉන් මාස කිහිපයකට පෙර එහි අධිපතිව වැඩ විසූ අතිපූජ්‍ය නාරද

හිමියන් අපවත්වීමය. වජිරාරාමාධිකාරී පූජ්‍ය පියදස්සී හිමියන් වජිරාරාමයේ වැඩ විසූවද උන්වහන්සේ ලොව විවිධ රටවල වැඩම කරමින් ජාත්‍යන්තර ධර්මදූත සේවාවෙහි යෙදී සිටියෙන් වජිරාරාමය පිළිබඳව සොයා බලා කටයුතු කිරීමේ හැකියාවක් නොවීය. භාෂා ගණනාවකින් ධර්ම දේශනා පැවැත්වීමේ විස්මිත හැකියාවක් පූජ්‍ය පියදස්සී හිමියෝ සතු වූහ.

කෙසේ වුවද වජිරාරාමයේ කටයුතු, විශේෂයෙන් වජිරාරාම දහම් පාසලේ කටයුතු සොයා බලා වැඩ කිරීම මහා නාහිමියෝ සෝම හිමියන්ට පැවරූහ. එවකටද වජිරාරාමාධිපතිත්වය දැරුවේ මහානාහිමියන් විසින් වුවද උන්වහන්සේ ධර්මායතනයෙහිද අධිපතිත්වය දැරූ බැවින් වැඩ වාසය කළේ ධර්මායතනයෙහිමය. සෝම හිමියන් වජිරාරාමයට වැඩම කළේ ඒ අනුවය.

මේ 1980 දශකයේ මුල් භාගයය. එය විවෘත ආර්ථිකය මෙරට සමාජය විසින් හිස් මුදුනින් පිළිගෙන තිබූ කාලයයි. විවිධ අරුමෝසම් භාණ්ඩ මෙන්ම අරුමෝසම් විලාසිතාද තරුණ පරපුර අතර සීඝ්‍රයෙන් ප්‍රචලිත වී පැවතිණ. මෙය යම් පමණකට පන්සල්, දහම් පාසල් කරාද රිංගා තිබිණි. ඒ හේතුවෙන් සුදු ළමා සාරිය, සුදු සරම, කමිසය අඳින වජිරාරාම දහම් පාසලේ සිසු සිසුවියන් අතරේ කිහිප දෙනෙකු වෛවර්ණ ඇඳුම් හැඳ අපිළිවෙලකට කොණ්ඩය විසිරුවාගෙන දහම් පාසලට පැමිණෙනු දැකිය හැකිවිය. මෙය සෝම හිමියන් අනුමත කළේ නැත. වජිරාරාම දහම් පාසල යනු මෙරට අති කීර්තිමත් දහම් පාසලකි. එහි ගරුත්වය ආරක්ෂා කළ යුතුය. එනිසා සෝම හිමියෝ දහම් පාසල සම්බන්ධව නව ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කළහ.

"දහම් පාසලට එන ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අතර විනයක් තියෙන්න ඕනෙ. වෛවාරන්න ඇඳුම් දහම් පාසලට අඳින්න බෑ. ඊළඟ සතියෙ ඉඳලා සියලුම ළමයි සුදු ළමා සාරියයි, සුදු සරම කමිසයයි අඳින්න ඕනෙ. ඒකට අකමැති ළමයෙක් ඉන්නවා නම් දහම් පාසලට නැවිත් නතර වුණාට කමක් නෑ. ඒ ඇඳුම සපයා ගන්න වත්කමක් නැති ළමයෙක් ඉන්නවා නම් වහාම මට දන්වන්න. අවශ්‍ය ප්‍රතිපාදන දහම් පාසලේ අරමුදල්වලින් සපයන්න පුළුවන්"

උන්වහන්සේ පැවසූහ.

සෝම හිමියන්ගේ මේ විනය නීති තදබල වැඩි යැයි දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා පවා චෝදනා කරන්නට විය. ඔවුන්ගේ අදහස වූයේ මේ මතින් දහම් පාසලට පැමිණෙන සිසු පිරිස අඩුවිය හැකි බවය.

"දහම් පාසලට ඕන විදියට ළමයි හැඩ ගැහෙනවා මිසක් ළමයින්ට ඕන විදියට දහම් පාසලක් හැඩ ගැහෙන්නෙ නෑ. එහෙම වුණොත් අන්තිමේ දහම් පාසලත් නෑ, ළමයිනුත් නෑ. අපේ රටේ බුද්ධාගමට වෙලා තියෙන්නෙත් ඕකම තමයි. ඒ නිසා මේ නීති මේ විදියටම ක්‍රියාත්මක වෙන්න ඕනෙ."

එය සෝම හිමියන්ගේ අවසන් නිගමනය විය. ඉන් ප්‍රධානාචාර්යවරයා ඇතුළු පිරිසකගේ සිත් බිඳිණි.

වජිරාරාමයට නිතිපතා දයකයන්ගෙන් දන මාන නොඅඩුව සැපයුණද දිගු කලක් පිණ්ඩපාතයෙහි වැඩම කරමින් දන මාන සපයා ගත් සෝම හිමියන් මෙහිදී අනුගමනය කළේද එම පිළිවෙතමය.

උදෙන්ම පිණ්ඩපාතයෙහි වඩින සෝම හිමියෝ එලෙස සපයා ගත් දනය වළඳ දහම් පාසලට පැමිණියහ. දහවල් එකොළහයි තිහට පමණ දහම් පාසලේ ඉගැන්වීම් කටයුතු අවසන් වුවද දහම් පාසල අවසන් වන්නේ සියලුම සිසු සිසුවියන් හට සෝම හිමියන් විසින් පොදුවේ කරනු ලබන අනුශාසනාවෙන් පසුවය. මෙම අනුශාසනාව අවසන් වන්නේ මධ්‍යාහ්න දෙළහද තික්මීමෙන් අනතුරුවය. දහවල් දෙළහ අවසන් වූ පසු භික්ෂූන් වහන්සේලා දනය වැළඳීම නොකරති. සෝම හිමියන් පිණ්ඩපාතයෙන් සපයා ගත් දනය උදෙන් වැළඳුවේ දහවලටත් ප්‍රමාණවත් වන්නට බැවින් උන්වහන්සේ උදේට සහ දවල්ට වශයෙන් දෙවරක් දනය වැළඳුවේ නැත. ආරණ්‍යවාසීව සිටින සමයේද දිනකට එක් වරක් දන් වළඳ සෝම හිමියන්ට පුරුදුය. නමුත් මේ බවක් නොදැන සිටි ඇතැමුන් සෝම හිමියන් දහවල් දෙළහ පසුවී විකාල භෝජනය කරන බවට සැක කළහ.

සෝම හිමියන්ගේ සෘජු සහ දැඩි ප්‍රතිපත්තිවලට අකමැතිව උන්වහන්සේ සමග හිත යටින් අමනාපව සිටි කිහිප දෙනකු මේ බව මහානායක හිමියන්ට දැන්වූහ. මහානායක හිමියන් සෝම හිමියන්ව කැඳවූයේ මේ පිළිබඳව විමසන්නටය.

'මහානායක හාමුදුරුවනේ. මම විකාල භෝජනය කරනවද නැද්ද කියලා මමනෙ දන්නෙ. ඔය කියන ඇත්තො කිසි කෙනෙක් ඒ ගැන කිසිම දෙයක් දන්නෙ නෑ' යි යනුවෙන් පැවසූ සෝම හිමියෝ තමන් අනුගමනය කරන පිළිවෙත මහානායක හිමියන් හමුවේ දන්වා සිටියහ.

'මං දන්නවා සෝම ඉතාම හොඳ අරමුණකින් වැඩ කටයුතු කරන බව. ඒත් අනිත් අයත් එක්ක ප්‍රශ්න ඇති කර ගන්න එපා.'

මහානාහිමියෝ අවවාද කළහ.

සෝම හිමියන්ගේ දැඩි විනය නීති, අවවාද අනුශාසනා වජිරාරාම විහාරස්ථානයට සම්බන්ධව සිටි බොහෝ වැඩිහිටි ගිහි පිරිස් අනුමත කොට තිබිණි. මේ නිසාම ගිහි දයක කාරකාදීන් අතර සෝම හිමියන් කෙටි කලක් තුළදීම ජනප්‍රියත්වයට පත්විය. එනිසාම විහාරස්ථානයට පැමිණෙන බොහෝ දෙනකු සෝම හිමියන් බැහැ දකින්නටද අමතක නොකළහ. නමුත් වජිරාරාමයේ සෝම හිමියන්ව නොරිස්සූ කිහිප දෙනෙකුට මේ ආකාරයට සෝම හිමියන්ට පිරිස එකතුවීම නොසතුටට කාරණයක් විණි. අමනාපය බොහෝ දෙනකු තුළ නොවූවත් එක් පුද්ගලයකු තුළ පැවතීම වුව බොහෝ දේවල් සිදුවීම සඳහා ප්‍රමාණවත් වන්නට පුළුවන. මේ අනුව සෝම හිමියන්ව වහාම වජිරාරාමයෙන් පිටමං කර නොහැරියොත් වජිරාරාමයේ ගිහි පැවිදි කොටස දෙපිලකට බෙදිය හැකි බවට පඤ්ඤාසීහ මහා නාහිමියන්ට කිසියම් පිරිසක් දන්වා යවා තිබිණි.

මේ හේතුව නිසා නැවත වරක් සෝම හිමියන්ව තමා හමුවට කැඳවන්නට මහා නාහිමියන්ට සිදුවිය.

'සෝමට මං ටික කාලෙකටයි වජිරාරාමෙ ඉන්න කිව්වෙ. ඒ නිසා දැන් ආපහු මෙහාට එන්න. ප්‍රශ්න ඇතිවෙලා පන්සල

දෙපිලකට බෙදෙන්න පුළුවන්.'

මහානාහිමියන් මෙසේ පවසන හේතුව සෝම හිමියෝ දනිති. උන්වහන්සේ තුළ ඇතිවූයේ ප්‍රබල කණගාටුවකි.

'මහානායක හාමුදුරුවනේ, වෙන ප්‍රශ්නයක් නම් මං එන්නම්. ඒත් තර්ජනවලට බයේ නම් මේ කරන වැඩ කොටස අතරමග නතර කරලා මම එන්නෙ නෑ. ඒක දහම් පාසලේ ළමයින්ට විතරක් නෙමේ, පන්සලට ලැදි දයකයින්ටත් කරන පාඩුවක්....'

සෝම හිමියන් පැහැදිලි කළ කරුණු අවසානයේ මහානායක හිමියෝ පිළිගත්හ.

එසේ වුවද සියලු කරුණු සිදුවෙමින් පැවතියේ සෝම හිමියන්ගේ සිත බිඳෙන අයුරිනි.

මේ අතර කලකට ඉහත ධර්මායතනයෙහි තුරුණු සවියට සම්බන්ධව කටයුතු කර පසුව විවාපත්ව ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගිය තරුණියත් මව්බිමට පැමිණි වකවානුවක ඇගේ සැමියාද සමග සෝම හිමියෝ හමුවූහ. සෝම හිමියන්ට උද්ගත වී තිබෙන ගැටළු ඔවුන්ටද සැලවී තිබිණි.

'ඔබවහන්සේව කාටවත් එපා නම් ඔබවහන්සේ ඕස්ට්‍රේලියාවට වඩින්න. එහෙ බෞද්ධයන්ට සේවයක් කරන්න ඔබවහන්සේට පුළුවනි. අපි සේරම සූදනම් කරලා දෙන්නම්' යනුවෙන් ඔවුහු පැවසූහ.

# 23 ඕස්ට්‍රේලියාවේ සිට මාතලේ ගල්ලෙනකට වැඩම කරති

ඕස්ට්‍රේලියාවට යාම සඳහා ලැබී තිබෙන ඇරැයුම පිළිගත යුතු යැයි සෝම හිමියෝ තීරණය කළහ. පසුගිය කාලය තුළ දිගින් දිගටම උද්ගත වූ ගැටළු උන්වහන්සේට එක්තරා ආකාරයකින් මනසට විඩාවක් වී තිබිණි.

මෙය බෙහෙවින් සංකීර්ණ සමාජයකි. මිනිසුන්ගේ ලෞකිකත්වය කෙරෙහි ඇති නැඹුරුව අසීමිතය. සමාජය මේ තරම් ගැටළු සහගත වී තිබෙන්නේ එබැවිනි. මෙය ජන සමාජයේ පොදුවේ පවතින උවදුරකි. මිනිසුන්ගේ ජීවන රටාවන්හි වැඩි නැඹුරුවක් පවතින්නේ අයහපතටය. තමන්ටද බලපෑ මේ සියලු දෙයින් විඩාවට පත්ව සිටි සෝම හිමියන්ට හය මාසයක් සඳහා ඕස්ට්‍රේලියාවට යාමට ලැබී තිබූ ආරාධනය පිළිගැනීම මැනැවැයි හැඟී ගොස් තිබිණි.

මේ ඇරැයුම උන්වහන්සේට මුලින්ම ලැබී තිබුණේ මහඔය උණුවතුර බුබුලෙහි ආරණ්‍යයේ වැඩ වසන සමයේදීය. එපමණක් නොව ඉන් පෙරත් ඇමරිකාවටත්, අප්‍රිකානු රටකටත් ඇරැයුම් ලැබී තිබූ අතර සිංගප්පූරුවට යාම සඳහාද අවස්ථාව උදාවී තිබිණි. නමුත් මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් භික්ෂූන් වහන්සේ නමක වශයෙන් කළ හැකි බොහෝ දේ තිබියදීත් ඒ සඳහා හැකියාවද

තිබියදීත් එය අතරමග නතර කොට විදේශ ගතවීම නොකට යුත්තක යැයි සිතූ සෝම හිමියෝ එම ඇරැයුම් ප්‍රතික්ෂේප කළහ. එසේ වුවද වර්තමානයේ තමන් මුහුණ දී සිටින තත්ත්වය ඊට වඩා වෙනස්ය.

වර්තමානයේ සැබෑ බුදු දහම ජනතාව අතරට ගෙන යාමට දරන උත්සාහය පවා ප්‍රබල අභියෝගයකි. ඒ සඳහා ප්‍රබල බාධක පවතී. සැබෑ බුදු දහම ලෙස මිනිසුන් අතර පවතින්නේ මිථ්‍යා දෘෂ්ටියයි. අද දේව වන්දනාව, සායි වන්දනාව මෙතරම් ප්‍රබල ලෙස ඉස්මතු වී තිබෙන්නේ ඒ හේතුවෙනි. භික්ෂූන් වහන්සේලා පවා ගිහියන්ගේ මේ ප්‍රවාහය හමුවේ අසරණව හිඳිති. 'භවතු සබ්බ මංගලම්....' ආදී වශයෙන් ගාථා පාඨයක්, දේශනා කරමින් පිරිත් නූලක් ගැට ගස්සවා ගැනීම, පාංශුකූලයට වැඩම කරවා ගැනීම වැනි සුළු කරුණු කිහිපයක් පමණක් භික්ෂූන් වහන්සේලා වෙතින් ඉටු කරවා ගන්නා තත්ත්වය දක්වා බුදු දහම බෞද්ධයන් විසින්ම හෑල්ලුවට ලක් කර ඇත.

සෝම හිමියෝ මේ සියලු කරුණු ගැන බොහෝ දුර මෙනෙහි කළහ. අනතුරුව උන්වහන්සේ වජිරාරාම දහම් පාසල් කටයුතු වෙනුවෙනුත්, විහාරස්ථානයට පැමිණෙන පිරිස වෙනුවෙනුත් පිරිසිදු බුදු දහම දේශනා කිරීම සම්බන්ධයෙනුත් පුළුල් මෙහෙවරක් ඉටු කරමින් සිටියදී ඇතිවූ අර්බුදකාරී බව හමුවේ ඕස්ට්‍රේලියාවෙහි කෙටි කලක් නතර වීම සඳහා තීරණයකට එළැඹ පඤ්ඤාසීහ මහානායක හිමියන් බැහැ දකින්නට ගියහ.

'ඒක බොහොම හොඳ අදහසක්....' මහානායක හිමියෝ සෝම හිමියන්ගේ අදහස අනුමත කරමින් පැවසූහ.

පැලෑනේ වජිරඥාන නාහිමිපාණන් අයත් සඟ පරපුර කවදත් ජාත්‍යන්තර ධර්ම ප්‍රචාරය සම්බන්ධයෙන් විශාල මෙහෙයක් ඉටු කළ, තවමත් ඉටු කරමින් හිඳින දේශයේ අභිමානවත් සඟ පරපුරකි. සෝම හිමියන්ට ඇරැයුම් ලැබී තිබූ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පිහිටි 'බුඩිස්ට් ඇසෝෂියේෂන් ඔෆ් වික්ටෝරියා' නමැති බෞද්ධ සංගමය මීට පෙර වජිරාරාමාධිපතිව වැඩ විසූ අපවත් වී වදාළ පූජ්‍ය නාරද හිමියන්වද ඕස්ට්‍රේලියාවට වැඩම

කරවා තිබිණි. මෙය විහාරස්ථානයක් නොවේ. ඕස්ට්‍රේලියානු ජාතිකයන් විසින් පවත්වාගෙන යනු ලබන බෞද්ධාගමික සංවිධානයකි. ඔවුන් වරින් වර විදෙස් ථෙරවාදී භික්ෂූන් වහන්සේලා කැඳවා ධර්ම ප්‍රචාරක කටයුතු කරවීම එහි ස්වභාවයයි. සෝම හිමියන්ට මේ ඇරයුම ලැබී තිබුණේ උන්වහන්සේට හිතවත්ව සිටි ශ්‍රී ලාංකික යුවළක් අදාළ බෞද්ධ සංවිධානය වෙතින් කරන ලද ඉල්ලීමකට ලැබී තිබූ අවසරයක් වශයෙනි.

1986 වෙසක් මස සෝම හිමියෝ පළමු වතාවට ඕස්ට්‍රේලියාවට වැඩම කළහ. ඒ හය මසක කාලයක් සඳහාය.

ඕනෑම ජාතියක ජන කොටසකට පිළිගත හැකි පරිදි නිරවුල්ව බුදු දහම දේශනා කිරීම සම්බන්ධයෙන් සෝම හිමියන් සතුව තිබුණේ අති දක්ෂතාවයකි. ඕස්ට්‍රේලියාවේ වැඩ වෙසෙමින් ශ්‍රී ලාංකික බෞද්ධයන්ට මෙන්ම ඕස්ට්‍රේලියානු ජාතිකයන්ටත් ධර්ම දේශනා කරද්දී ශ්‍රී ලාංකිකයන් තුළ පමණක් නොව මෙම සුදු ජාතිකයන් තුළ පවා සෝම හිමියන් කෙරෙහි ඇති වූයේ මහත් වූ පැහැදීමකි. ඒ අනුව එම සුදු ජාතිකයන් තුළද සෝම හිමියන්ව දිගටම රඳවා ගැනීමේ කැමැත්තක් ඇති විය. මුලදී මාස හයක කාලයකට සෝම හිමියන් ගෙන්වා ගත් ශ්‍රී ලාංකික යුවළ සහ අනෙකුත් ශ්‍රී ලාංකික බෞද්ධයන්ද තවත් මාස හයකට උන්වහන්සේගේ වීසා බලපත්‍රය දිගු කරන්නට සූදානම් වූහ.

'මං මෙහාට ආවෙ මාස හයකට. ඊට වඩා දවසක්වත් වැඩිපුර ඉන්න මගේ අදහසක් නැහැ. ඒ නිසා වීසා දික් කරන්න ඕනෙත් නෑ. අනික වීසා දික් කරලා ඉන්න පන්සලකුත් නෙමෙයිනෙ මෙතන. මේක බෞද්ධ මධ්‍යස්ථානයක් විතරයි. ඒ නිසා ඔයගොල්ලන් පන්සලක් හදලා මට එන්න කියන්න. එතකොට මං එන්නම්.'

සෝම හිමියෝ ඔවුන්ට පිළිතුරු ලෙස පැවසූහ.

'හාමුදුරුවනේ, අපට හරියකට ආගමික වත් පිළිවෙත් කරන්න තැනක් නෑ. ඒ නිසා අපි කැමතියි පන්සලක් හදන්න.'

මේ අවස්ථාවේ එතැනට රැස්ව සිටි ශ්‍රී ලාංකික පිරිස එකතුව සංගමයක් පිහිටුවා ගත්තේ විහාරස්ථානයක් ඉදිකර ගැනීමේ මතු අදහස සහිතවය.

ඕස්ට්‍රේලියාවේ සිටියදී සෝම හිමියන්ට බෙහෙවින් හිතවත්ව සිටි දයා ජයසිංහ නමැති වෛද්‍යවරයා නවසීලන්තයේද ටික කලක් නැවතී ධර්ම ප්‍රචාරක කටයුතුවල යෙදීම සඳහා සෝම හිමියන්ට මග සළසා දුනි. ඒ අනුව මාස හය ඉක්මෙන්නටද මත්තෙන් ඕස්ට්‍රේලියාවෙන් පිටව නවසීලන්තයට වැඩම කළ සෝම හිමියෝ එහි ටික කලක් රැඳී හිඳ තායිලන්තය හරහා යළි ශ්‍රී ලංකාවට වැඩම කළහ.

ඉන්පසු සෝම හිමියන් යළිත් බම්බලපිටියේ වජිරාරාමයේ වැඩ වෙසෙමින් පෙර සාර්ථකව කරගෙන ගිය දහම් පාසලේ කටයුතු නැවත වරක් කරගෙන යාම සඳහා මුල පුරා තිබිණි. නමුත් යළිදු පෙර තිබූ අර්බුද ටිකින් ටික පැන නැගෙන්නට විය. බුදු දහම තමන්ට අවශ්‍ය ලෙස හැඩ ගස්වා ගෙන සමාජීය වශයෙන් කැපී පෙනෙන්නට බුද්ධාගම යොදා ගන්නා පිරිස සෝම හිමියන්ව නොරිස්සූහ. බුදු දහම, බුදු සසුන සම්බන්ධයෙන් මේ පවතින තත්ත්වය එක් තැනකට හෝ කිහිප තැනකට සීමා වූවක් නොවේ. මෙය අප රට පුරාම පැතිරී පවතින බුදු සසුන සම්බන්ධ වූ ඛේදනීය තත්ත්වයකි. එහෙත් ඒවා හමුවේ ධෛර්ය සම්පන්නව මුහුණ දෙමින් සෝම හිමියෝ ඊළඟ වස් කාලය එළඹෙන තුරුම වජිරාරාමයේ වැඩ විසූහ.

ඇන්ඩෲ සිල්වා නමැති ධර්මායතනයට සම්බන්ධ දයක මහතකු සතුව මාතලේ මාහිංගමුවෙහි විශාල වතු යායක් වෙයි. කෙන්ට් වත්ත නමින් හැඳින්වූ එහි ගල්ලෙන් කිහිපයක්ද වූ අතර සිල්වා මහතා විසින් එතැන භාවනානුයෝගීව වැඩ විසීම සඳහා භික්ෂූන් වහන්සේලාට උචිත සෙනසුනක් ඉදි කොට තිබිණි. සෑම වස් කාලයකදීම එම සෙනසුනට භික්ෂූන් වහන්සේ නමක වැඩම කරවා වස් හිඳුවා උන්වහන්සේට සිව් පසයෙන් උපස්ථාන කරවීම සිල්වා මහතාගේ සිරිතක්ව තිබිණි. එම වස් සමය සඳහා ඒ මහතා ඇරයුම් කළේ සෝම හිමියන්ටය. සතියකට වරක් ඉරු දිනයේ

බම්බලපිටියට පැමිණි දහම් පාසලේ කටයුතු කරන අදිටන ඇතිව සෝම හිමියෝ එම ඇරයුම පිළිගෙන මාහිංගමුවේ කෙන්ට් වත්ත බලා වැඩම කළහ. එම ගල්ලෙන් කුටි තුළ වැඩවිසීම උන්වහන්සේට මහත් අස්වැසුම් දයක විණි. මේ අතර සෝම හිමියන්ට තවත් අගනා අදහසක් පහළ වී තිබිණි.

ඛුද්දක නිකායට අයත් ධම්මපදය යනු බුදු දහමේ අත් පොත වශයෙන් සැලකෙන මාහැඟි ග්‍රන්ථ රත්නයකි. බෞද්ධ සදචාරය, බෞද්ධ දර්ශනය පිළිබඳ ඉතාම සරල අයුරින් උපමා රූපක මාර්ගයෙන් විග්‍රහ කර ඇති මෙය හරියටම නිවැරදිව අවබෝධ කර ගතහොත් ජීවිතය හමුවේ එළැඹෙන ගැටළු හැම එකකටම පාහේ විසඳුම් සොයා ගත හැකි වෙයි. එම මාහැඟි ධර්ම ග්‍රන්ථය ඕනෑම කෙනෙකුට අවබෝධ කර ගත හැකි සරල බසින් ලිවීම උන්වහන්සේ මෙම වස් කාලය තුළ ආරම්භ කළහ. පසුකාලීනව මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වූ උන්වහන්සේ විසින් ලියන ලද ධම්ම පද්‍ය ග්‍රන්ථය රචනා කිරීමේ මූලාරම්භය සිදුවූයේ එලෙසිනි.

මේ කාලය තුළදී උන්වහන්සේට තවත් දුක්බර සිදුවීමකට මුහුණ දීමට සිදුවිණි. ඒ හදිසියේ හටගත් හෘදයාබාධයක් හේතුවෙන් උන්වහන්සේගේ ඩඩ්ලි නමැති ලොකු මල්ලී මිය යාමය. එය සෝම හිමියන්ගේ ජීවිතයේ තවත් නොමැකෙන සිහිවටනයකි.

# 24 මව්බිමේදී හටගත් සංවේගය ඕස්ට්‍රේලියාවේදී තුනී වෙයි

මාතලේ මාහිංගමුව චෛතියගිරි ආරණ්‍යයෙහි වස් කාලය ගත කළ සෝම හිමියෝ යළි වජිරාරාමයට වැඩම කළහ.

මේ කාලය වන විට අතීතයේ මිනිසුන් තුළ පැවැති සරල සිතුම් පැතුම් ජීවන රටාව වෙනස් වී පැවතිණ. විශේෂයෙන් 1977 මෙරට සිදුවූ සමාජ ආර්ථික පෙරළියෙන් පසුව මිනිසුන්ගේ සිතුම් පැතුම් උඩු යටිකුරු විය. පාරිභෝගිකවාදය සමග මිල මුදලේ අගයද සීඝ්‍රයෙන් ඉහළ නැංවෙන විට ඊට සාපේක්ෂව මිනිසත් බව පහළට වැටිණි.

මේ විපර්යාසය විහාරස්ථාන කරාද වේගයෙන් පැමිණෙන්නට විය. ඇතැම් දයක කොටස් මෙම විපර්යාසය දෙස නිහඬව බලා සිටියදී ඇතැම් දෙනෙක් ඉන් උද්දමයට පත්ව විහාරස්ථානය තුළද කැපී පෙනීමට උත්සාහ ගත්හ. බුදු දහමට අනුව හැඩගැසීම නොව බුදු දහම තමන් අනුව හැඩ ගස්වා ගනිමින් තම එදිනෙදා කටයුතු තමන්ට රිසි අයුරින් කර ගැනීම මේ බොහෝ දෙනකුගේ අරමුණ වී තිබිණි.

නමුත් වරද කරන්නා කවුරුන් වුවද පුද්ගල භේදයක් නැතිවම ඒ වරද විවේචනය කිරීම සහ නිවරද පෙන්වා දීම සෝම හිමියන් තුළ කවදත් පැවැති සිරිතකි. ජන සමාජය ලෝභ, ද්වේෂ, මෝහ

යන අකුසල මූලයන්ගෙන් ගහන වූවකි. බුදු දහම ඒ අකුසල පක්‍ෂය අනුව යන දහමක් නොවේ. බුදුරජාණන් වහන්සේ බුදු දහම ඉදිරිපත් කොට ඇත්තේ එම අකුසල මූලයන්ට එරෙහිව ගමන් ගන්නා පටිසෝතගාමී දහමක් වශයෙනි.

මේ ආකාරයෙන් සමාජයේ වැරදි සෘජුවම පවසමින් පෙන්වා දෙන විට ඇතැම් දෙනෙක් සෝම හිමියන් පිළිබඳව කිපුණාහ. එසේම සෝම හිමියන්ගේ මූලිකත්වයෙන් ගොඩ නැගූ තුරුණු සවිය සංවිධානයේ තරුණ කොටස් තමන් වෙත නම්මවා ගැනීමට විවිධ වක්‍ර මාර්ග ඔස්සේ වෙර දරන්නෝද මේ අතර වූහ. ඔවුන් ඉන් පෙරද වරක් කර තිබූ පරිද්දෙන් තමන්ට අනුගත වේ යැයි සිතෙන සාමාජිකයන්ට ප්‍රසිද්ධියකින් තොරව බුදු පිළිම බෙද දී තිබුණේ ඔවුන් තමන් වෙත නම්මවා ගැනීමේ රිසියෙනි. මාතලේ මාහිංගමුවේ වැඩ වෙසෙද්දී සිදුවූ මේ සිද්ධියෙන් සෝම හිමියන්ගේ සිතට පිවිස තිබුණේ දැඩි සංවේගයකි.

'බෞද්ධ සදචාර මාර්ගයට පිටුපාලා කවුරු හරි බුදු පිළිම සමරු භාණ්ඩ වශයෙන් තියා ගන්නට දීම ප්‍රයෝජනවත් දෙයක් නෙමේ. බෞද්ධකම රැකෙන්න නම් ධර්ම මාර්ගය අනුවම යන්න ඕනෙ. ඒ හැරුණු කොට වෙනත් විකල්ප නැහැ.'

සෝම හිමියෝ ප්‍රසිද්ධියේම කීහ. මේ අරගලවලට මැදිහත්වීම පැවිද්දකු වශයෙන් තමන්ට තරම් නොවන බව සිතූ සෝම හිමියෝ පසුව මහ නායක හිමියන්ටද දන්වා තුරුණු සවිය සංවිධානයෙන් තාවකාලිකව ඉවත් වූහ. මේ ආකාරයට ජන සමාජය බුදු දහම තමන්ට රිසි ලෙසින් යොද ගනිමින් කටයුතු කිරීමේ ශාසනික ඛේදවාචකය ලෝකයේ වෙනත් රටවලද ඕනෑ තරම් දක්නට ලැබේ. තායිලන්තය වැනි ථෙරවාදී බුදු දහම පවතින රටකත් ඇතැම් ව්‍යාපාරිකයෝ තම සහල් නිෂ්පාදන මලුවල බුදුන් වහන්සේගේ රූපයේ මුද්‍රාවක් තබති. එයින් ඔවුන් අරමුණු කරගන්නේ බුදු රුවේ අනුහසින් සහල්වලට කෘමි උවදුරු ඇතිවීම වළකා ගැනීමය. අපගේ බෞද්ධකමත් මේ තත්ත්වයට පත් කිරීමට අපේ ඇතැම් බෞද්ධ කොටස් වෙරදැරීම මොන තරම් ඛේදවාචකයක්දැයි සෝම හිමියන්ට හැඟිණි. මේ ඉතාම සුළු පිරිසක් අතර සිදුවූ

ක්‍රියාකාරකම් කිහිපයකි. නමුදු වැඩි පිරිසක් සෝම හිමියන්ගේ අදහස් අනුමත කරමින් අහිංසක ලෙස නිහඬව සිටියහ.

මෙවැනි තත්ත්වයක් මත, නූතන නවීකරණයෙන් විපරිත භාවයට පත් නොවූ නිසංසල ප්‍රදේශයකට ගොස් සිය ශ්‍රමණ පිළිවෙත් පිරීම කළයුතු යැයි සෝම හිමියන්ට හැඟිණි. කිසිසේත් නොසිතූ පරිදි ඕස්ට්‍රේලියාවට වැඩම කිරීම සඳහා ඇරැයුම් කළ ලිපියක් සෝම හිමියන්ට ලැබුණේ එබඳු ස්ථානයක් පිළිබඳව සෙවිල්ලෙන් සිටින අතරතුරය.

වන වාසයට යාම සඳහාද මේ අතරේ සෝම හිමියන්ට ඇරැයුම් කිහිපයක්ම ලැබිණි. ඒ අනුව ඕස්ට්‍රේලියාවට ගොස් බුදු දහම ජාත්‍යන්තර වශයෙන් පතුරුවාලීම උදෙසා කටයුතු කරනවාද, නැතහොත් වනවාසය තෝරා ගෙන ශ්‍රමණ ප්‍රතිපදාවන් සම්පූර්ණ කරගැනීම උදෙසා වෙහෙසෙනවාදැයි පැනයක් සෝම හිමියන් තුළ ඇති විය.

ඕස්ට්‍රේලියානුවන් අපගේ ශ්‍රී ලාංකිකයන් බඳු අය නොවේ. ඔවුන් නව චින්තනය කෙරෙහි නිරන්තරව නැඹුරු වූවෝ වෙති. නිතරම අලුත් දෙයක් සොයා වෙහෙසෙන ඔවුන් බෞද්ධ දර්ශනය කෙරෙහි දක්වන නැඹුරුව ඕස්ට්‍රේලියාවට පළමු ගිය ගමනේදී සෝම හිමියන්ට වැටහී තිබිණි.

කෙසේ වුවද මහානායක හාමුදුරුවන්ට මේ පිළිබඳව දන්වා සිටීම අවශ්‍ය බැවින් සෝම හිමියෝ මහානායක හිමියන් බැහැ දකින්නට ගියහ.

"සෝමට තියෙන දක්ෂතාවයන්ගෙන් ජාත්‍යන්තර වශයෙන්ම මහජනතාවට සේවයක් කරන්න පුළුවන් නම් ඒක ඉතාම හොඳ දෙයක්. අපි ශ්‍රමණයො වශයෙන් පිරිසිදු බුදු දහම මිනිස්සුන්ට දෙන එක අපේ වගකීම. නමුත් වනවාසයට යනවා නම් ඒක අධ්‍යාත්මික සංවර්ධනයට ඉතාමත්ම හොඳයි." මහනාහිමියෝ පැවසූහ.

දින කිහිපයක් පුරාම මේ පිළිබඳ කල්පනා කරමින් සිටි සෝම හිමියන් අවසානයේ එක් තීරණයකට එළඹුණි. වනවාසයට

ගියහොත් එය තමන්ට පමණක් කරගන්නා යහපතක් වනු ඇත. එහෙත්, ඕස්ට්‍රේලියාවට ගියහොත් එහි දහම් පිපාසයෙන් පෙළෙන ශ්‍රී ලාංකිකයන් සේම ඕස්ට්‍රේලියානුවන්ද උදෙසා සේවයක් කරන අතරේම බණ භාවනා කටයුතු කරගැනීමේ අසීරුවක්ද නොවනු ඇත. ඒ අනුව ඕස්ට්‍රේලියාවෙහි වාසය සඳහා යාමට සෝම හිමියෝ සූදනම් වූහ.

1989 වසරේ වෙසක් පෝ දිනයට පෙර දිනයේ සෝම හිමියෝ ඔස්ට්‍රේලියාවට වැඩම කළහ.

එහි ස්ප්‍රිංවේල් ප්‍රදේශයෙහි කාමර තුනක් සහිත නිවසක් විහාරස්ථානයක් වශයෙන් තාවකාලිකව කුලියට ගැනීමට එහි සිංහල බෞද්ධ සංවිධානයක් සමත්ව තිබිණි. ඔවුන් සෝම හිමියන්ව ඕස්ට්‍රේලියාවට වැඩම කරවා ගත්තේ සෝම හිමියන් එහි පදිංචි කරවාගෙන උන්වහන්සේගේ අනුදැනුම හා උපදෙස් මත විහාරස්ථානයක් ඉදිකරවා ගැනීමේ අරමුණෙනි. ශ්‍රී ලංකාවෙන් පිටත් වනවිට අඩි තුනක් පමණ උසැති බුදු පිළිමයක්ද එහි තැන්පත් කිරීම සඳහා සෝම හිමියෝ රැගෙන ගියහ.

වෙසක් පෝ දිනයේ එකසිය පණහක පමණ පිරිසක් එම විහාරස්ථානයේ සිල් සමාදන් වී සිටි අතර සැන්දෑවේ පැවැත්වෙන සෝම හිමියන්ගේ ධර්ම දේශනයට පන්සීයක පමණ පිරිසක් සහභාගි වී සිටිනු දැකිය හැකි විය. ඒ අතර සිංහල බෞද්ධයන් මෙන්ම ඕස්ට්‍රේලියානුවෝද වූහ. මෙය ඉතාම සුබවාදී වූවකි. මිනිසුන් තුළ දහම පිළිබඳ මේ තරම් උනන්දුවක් ඇත්නම් පිරිසිදු බුදු දහම ජාත්‍යන්තර වශයෙන් පතුරුවාලීම ඒ තරම් අසීරු කාර්යයක් නොවේ.

'ඔය ඇත්තන් බණ අහන්න දක්වන මේ උනන්දුව ගැන මට තියෙන්නෙ ලොකු සතුටක්. මේ විදිහට ඔය ඇත්තො උනන්දු වෙනවා නම් ලෝකෙටම බුදු දහම දෙන්න මධ්‍යස්ථානයක් මේ රටේ ඇති කරන්න මම කැපවෙනවා' සෝම හිමියෝ පැවසූහ.

# 25 ඕස්ට්‍රේලියාවේ ඇතැම් සිංහලයනට සෝම හිමිගේ ඇත්ත තිත්ත වෙයි

ඕස්ට්‍රේලියාවේ තාවකාලිකව විහාරස්ථානයක් වශයෙන් පිළියෙල කර ගෙන සිටි නිවසින් නික්ම විහාරස්ථානයක් ඉදිකරගෙන එහි වැඩ වාසය කිරීමේ වුවමනාව සෝම හිමියන්ට බෙහෙවින් දැනී තිබිණි. දැනට මෙහි ශාසනික වශයෙන් පවතින එකම ලක්‍ෂණය වන්නේ තමන් වහන්සේ ශ්‍රී ලංකාවෙන් නික්ම එනවිට රැගෙන ආ අඩි තුනක පමණ උසින් යුතු බුදු පිළිම වහන්සේ පමණි. ඒ හැර බෞද්ධ විහාරස්ථානයක පවතින ලක්‍ෂණ කිසිත් මෙහි නැත. ගිහි ජීවිතයෙන් නික්ම පැවිදි දිවියට ආ තමන් යළිදු බෞද්ධාගමික පරිසරයෙන් මිදුනාක් බඳු මානසික අසරණ බවක් සෝම හිමියන්ට ඒ වනවිට වැඩි වැඩියෙන් දැනෙමින් තිබිණි. එනිසා විහාරස්ථානයක් ඉදිකර ගැනීම ඉක්මණින් කළ යුතුව ඇත. කුලියට වෙසෙන නිවසක හැඩ තල අවශ්‍ය පරිදි වෙනස් කළ නොහැකි බැවින් තමන් වැඩ සිටි එම නිවස, නිවසක් මිස භික්‍ෂූන් වහන්සේ නමක් සඳහා උචිත සංඝාරාමයක් වශයෙන් වෙනස් කිරීමද කළ නොහැක.

බණ අසන්නට පැමිණෙන පින්වතුන්ගෙන් ලැබෙන පිරිකර එහි විශාල වශයෙන් ගොඩ ගැසී තිබිණි. මේ තුළ අවශ්‍ය දේ මෙන්ම අනවශ්‍ය දේද බොහෝය. උපභෝග පරිභෝග සම්පත් පිළිබඳ කටදත් අල්පේච්ඡව සිතූ සෝම හිමියන්ට මේවා එක් රැස්කර ගෙන

ඇති ඵලය කුමක්දැයි නිරතුරුවම සිතිණි. එබැවින් තමන්ට මින් මතුවට පිරිකර සඳහා වැය කරන මුදල් විහාරස්ථානය තැනීම සඳහා පරිත්‍යාග කරන ලෙස සෝම හිමියෝ දයකයන් හට දන්වා සිටියහ.

සියලු දෙයට පළමුව මෙහි ආරාමයකට සුදුසු පරිසරයක් තනා ගත යුතුය. ලංකාවේ පන්සල්වලට හත්‍ර පේරුවේ දයකයෝ සිටිති. මේ රට තුළ එවැනි තත්ත්වයක් නොමැත. එබැවින් මුලින්ම දයක සභාවක් පිහිටුවා ගෙන ඒ මතින් විහාරස්ථානය ගොඩනැංවීම සඳහා අරමුදලක් ඇති කර ගත යුතුවේ.

මේ විහාරස්ථානය තනන්න මම උත්සාහ කරන්නෙ ඔය ඇත්තන්ගෙ හිතසුව පිණිසයි. එතකොට ඒ විහාරස්ථානය හැමදමත් ඔය ඇත්තන්ට.... ඔය ඇත්තන්ගෙ දරුවන්ට ඉතිරි වේවි. ඔය ඇත්තො මෙහෙ ඇවිත් සල්ලි හම්බ කරනවා වගේම නැති නාස්ති කරන හැටිත් මට පේනවා. ඒ හින්ද මං හිතනවා ඔය ඇත්තන්ම කමිටුවක් පිහිටුවාගෙන ඔය නැති නාස්ති කරන මුදල්වලින් මාසෙකට ඩොලර් දහය ගානෙ විහාරස්ථානය වෙනුවෙන් පූජා කරනවා නම් මට පුළුවනි පන්සලක් හදන්න.

සෝම හාමුදුරුවෝ විහාරස්ථානයට රැස්වන ගිහියන් අමතා පැවසූහ.

උන්වහන්සේගේ අදහසට වැඩි පිරිසක් කැමැත්ත පළකොට තිබිණි. එනිසාම මාස කීපයක් ගත වනවිට ඩොලර් දහය බැගින් මාස්පතා සැපයූ ගිහි පින්වතුන්ගේ ප්‍රමාණය සියයක් පමණ වුණි.

විහාරස්ථානයකට ආධාර කිරීම යනු එහි වෙසෙන භික්ෂූන් වහන්සේලාට කරන ආධාරයක් වශයෙන් සලකන්නට ඇතැම් බෞද්ධයන් පුරුදු වී සිටිති. මේ නිසාම තමන් පන්සලට ආධාර කරනවා නම් හාමුදුරුවන් තමන්ට අවශ්‍ය පරිදි කටයුතු කළ යුතුය යන පටු හැඟීමක්ද මේ ඇතැමුන් තුළ ඇත. රට වෙනස් වුවත් පරිසරය වෙනස් වුවත් ඕස්ට්‍රේලියාවේ විසූ සමහර ශ්‍රී ලාංකිකයන්ගේ මෙවැනි අදහස් වෙනස් වී තිබුණේ නැත. ඇතැමුන් හට අවශ්‍යව තිබුණේ තමන් පංච දුෂ්චරිතයෙහිම ගැලී සිටියත් හාමුදුරුවන්

සිල්වත් වීමය. එසේ සිල්වත්ව හිඳ පිරිත් නූලක් බැන්ද පමණින් පිරිත් පැන් ටිකක් බිවූ පමණින් තම ජීවිතයට වැඩි වැඩියෙන් යස ඉසුරු උදකර ගන්නට එය ප්‍රමාණවත් වේ යැයි ඔවුන් සිතන්නට ඇත. ඒ ආකාරයට ඔවුන්ගේ සිත් සතුටු කළා නම් ඔවුන් වෙතින් වටිනා පිරිකර ලබා මුදල්ද එකතු කර ගෙන යළි මව් රටට පැමිණීමට ඕනෑ තරම් අවකාශය සෝම හිමියන්ට තිබිණි. එහෙත්, සෝම හිමියන් කවදත් එවැනි සැප සම්පත් පිළිබඳව අංශු මාත්‍රයක තැකීමක් කළේ නැත. තමන්ට මොන තරම් අවාසිදයක වුවද ඕනෑම කෙනකුගේ මුහුණටම වරද පෙන්වා දීමේ ලක්‍ෂණය සෝම හිමියන් තුළ කවදත් පැවතිණි.

'මම සිල්වත් වුණා කියලා ඒකෙන් ඔය ඇත්තන්ට යහපතක් වෙන්නෙ නෑ. මගේ සීලයෙන් යහපත සිද්ධ වෙන්නෙ මට. ඔය ඇත්තන්ට යහපතක් වෙන්නෙ ඔය ඇත්තො සීලයෙහි පිහිටලා සදචාර මාර්ගයෙ පිහිටියොත් විතරයි. ඒකට තමයි බුදුහාමුදුරුවො ආර්ය අෂ්ටාංගික මාර්ගයක් පෙන්වලා දුන්නෙ. ඒ මාර්ගයට පිවිසිලා ඒ දහම පිළිපදිනවා මිසක් වෙන කෙනකුට සිල්වත්කම දෙන්න තව කෙනෙකුට බෑ. මම මගේ සීලය රැකගන්නම්. ඔය ඇත්තො මගේ සීලය ගැන විතරක් නොහිතා සුචරිත මාර්ගයට පිවිසෙන්න. මට කරන්න පුළුවන් ඒ මාර්ගය කියා දෙන එක විතරයි. මම සිල්වත්ද, මම මේ සල්ලි එකතු කරගෙන යන්න යයිද? මං සිවුරු හරින්න හදනවාද? මං රැට දනෙ වළඳනවද? ඕවා නෙමෙයි ප්‍රශ්න.... මං ආවෙ මගේ මහණකම රැකගන්න අතරේ ඔය ඇත්තන්ට ධර්ම මාර්ගය පහදලා දෙන්න. එයින් ප්‍රයෝජනය ගන්න ඔය ඇත්තො දැනගන්න ඕනෙ....'

සෝම හිමියන්ගේ වදන් වදින තැන්වලට වැදී රිදෙන තැන්වලට රිදී තිබිණි. ඒ නිසාම ඒ රිදුණු පිරිසක් සෝම හිමියන් සමග යටි සිතින් අමනාප වූහ.

'සෝම හාමුදුරුවො හදන්නෙ නීති රීති දලා අපිව මට්ටු කරන්න. ඒවා කොහෙද?' සමහරු එසේ කීය.

'තමුන්ගෙ අධ්‍යාත්මික අසරණ බවවත්, පරිහානියවත් පන්සලේ ඉන්න හාමුදුරුවන්ගෙ සීලයෙන් පිටු දකින්න පුළුවන් කමක් නෑ.

තමන්ගෙ දෙලොව යහපත උදාකර ගන්න නම් ඔය ඇත්තොත් සදචාර මාර්ගයට පිවිසෙන්නම ඕනෙ. ඩොලර් දහයක් දීලා හාමුදුරුවන් සිල් රක්කවලා ඒ හාමුදුරුවෝ හරිම සිල්වත් පිරිත් නූලක් බැන්දත් ඇති කිව්වට ඔය ඇත්තන්ට ඒක පිහිටක් වෙන්නෙ නෑ. මේවා හොඳට තේරුම් ගන්න. බුදු බණ වැරදි කොනින් අල්ලා ගන්න එපා.'

සෝම හිමියන් වැඩිදුරටත් පැවසූ වදන් මේ වැඩි දෙනකුට බලවත් සිත් රිදීමට කාරණයක් වී තිබිණි.

නමුත් වෙනත් භික්ෂූන් වහන්සේලා තුළ නොමැති මේ ඍජු පිළිවෙත විශේෂයෙන් විප්ලවවාදී අදහස් දරන තරුණ පිරිසගේ බෙහෙවින් සිත් ගත්තේය. ගිහියන්ගේ බසට අවනත වී ඔවුන්ව යාප්පුවෙන් තබා ගෙන තමන්ගේ කාරිය කරගැනීමේ ව්‍යාපාරික පිළිවෙතක් මේ අලුත් හාමුදුරුවන් තුළ නොමැත. හෙට මහමගට බසින්නට සිදුවුවත් ඊට වුවද සිනාමුසු මුහුණින් සූදානම්ව හිඳින, වරද ඍජුව කියාපාන මේ හිමියන් වෙත ඉංජිනේරු සහ කාර්මික ආදී ක්ෂේත්‍රයන්හි රැකියාවන්වල, පුහුණු වෙමින් නියුතුව සිටි ශ්‍රී ලාංකික තරුණයන් ඇදුනේ මහත් පැහැදීමෙන් යුතුවය. 'පැත්ත ගියත් ඇත්ත කතා කරන හාමුදුරු නමක්' තරුණයෝ එසේ කතිකා කරගත්හ.

මේ අතර සෝම හිමියන් කෙරෙහි කිපී සිටි අය එකිනෙකා දුරකථනවලින් කතාබහ කරගනිමින් උන්වහන්සේට ලැබෙන ආදායම ආදිය ගණන් බලන්නට වූහ. ඒ සියල්ල ශත පහක වංචාවක් නැතිව ඕනෑම කෙනකුට අය-වැය වශයෙන් බලා කියා ගැනීමට අරමුදලක් ලෙසින් තිබියදීත් ඔවුන් කීවේ 'කොහොමද වැඩේ? සෝම හාමුදුරුවො දැන් අපිටත් වඩා හම්බ කරනවනෙ' යනුවෙනි. ඉන් නොනැවතුණු කිහිප දෙනෙක් 'පන්සල පැත්තෙ යන්න බෑ. සල්ලි ඉල්ලන එකමයි වැඩේ. අලුතෙන් ආපු කොල්ලො එහෙම ළං කරගෙන ඉන්නෙ. දැන් සල්ලි ටික සේරම පොදි ගහගෙන ලංකාවට පතීද දන්නෙ නෑ. අපිත් හරිම උගුලක තමයි අහුවුණේ' යනුවෙන්ද පවසා ඇති බව සෝම හිමියන්ට දැනගන්නට ලැබිණි.

`මිනිස්සු කවුරුත් අනික් අය දිහා බලන්නෙ තමන් මූලික කරගෙන. අනික් අය වැරදිකාරයො විදිහට පේන්නෙ තමන් වැරදි කරන කොට. අකමැති පිරිසක් ඉවත් වුණාවෙ. කැමති පිරිසක් උන්නම ඇති. බුදුහාමුදුරුවන්ට වුණත් මුළු ඉන්දියාවම බෞද්ධ කරන්න බැරි වුණා. මේ දහම පිළිපදින්න කැමති අය විතරක් මා එක්ක හිටියම ඇති` සෝම හිමියෝ පිළිතුරු වශයෙන් පැවසූහ.

# 26 සෝම හාමුදුරුවන් නෙරපීමේ කුමන්ත්‍රණයක් !

සෝම හිමියන්ට විරුද්ධ පිරිසක් ඇති වන්නට මූලික වශයෙන්ම බලපෑවේ උන්වහන්සේගේ ඍජු පිළිවෙත්ය. පන්සලේ හාමුදුරුවන් තම අත්අඩංගුවේ තබාගෙන හාමුදුරුවන්ට දන් හා පිරිකර පිරිනමමින් අවශ්‍ය අවස්ථාවකදී පිරිත් නූලක් බන්දවා ගැනීම, පාංශු කූලයට වැඩම කරවා ගැනීම පමණක් බෞද්ධකම යැයි සිතන බෞද්ධයන් දැන් බොහෝ හිඳිති. නමුත් සෝම හිමියෝ මේ පිළිවෙත් තරයේම හෙළා දැක්කා පමණක් නොව ඒවාට ප්‍රසිද්ධියේම පහර ගැසීමටද අමතක නොකළහ.

'ඔය ඇත්තන් මාව අත්අඩංගුවේ තියාගන්න උත්සාහ කළාට හිතන්න එපා තෙරුවන් අත්අඩංගුවේ තියාගන්න පුළුවන් කියලා. අපේ සමහර බෞද්ධයෝ උදේට සායි බාබා වඳින්න යනවා. දවාලට විෂ්ණු දෙවියන්ට පූජා වට්ටි තියනවා. හවසට පන්සලට එනවා. තුනෙන් කොයි එකකින් හරි තමන්ගෙ වැඩේ හරියයි කියලා හිතාගෙන....'

සෝම හිමියන්ගේ මේ දේශනා ඇතැමුන්ගේ මනස පතුලටම කිඳා බසින හී පහරවල් බඳු විණි.

මේ කාලය වනවිට සෝම හිමියන් වටා ඕස්ට්‍රේලියාවේ පදිංචි තරුණ පිරිස් විශාල වශයෙන් එකතු වී සිටියහ. එසේම ඩොලර්

දහය බැගින් මාස්පතා පිරිනමන්නට බාර ගත් පිරිස්ද ක්‍රමයෙන් වැඩිවී අලුතින් විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලට ගැනීමට සෑහෙන පමණ මුදල්ද එකතු වී තිබිණි. කල් නොයවාම නව විහාරස්ථානයක් ඉදිකරවීම මැනවැයි සෝම හිමියෝ තීරණය කරගත්හ. මේ පිළිබඳව මහත් සේ පැහැදුණු දයා සිල්වා නමැති මහතෙකුත්, චන්ද්‍රා පීරිස් නමැති මහත්මියකුත් ඩොලර් පන්දහස බැගින් පරිත්‍යාග කළ අතර ඉන්පසු තවත් කිහිප දෙනෙක්ම ඩොලර් දහය, පන්සීය, සීය ආදී වශයෙන් මුදල් පරිත්‍යාග කළහ.

විහාරස්ථානයක් ඉදිකර වීමට බැංකු ණයක් ලබාගැනීම සඳහා මූලික ප්‍රාග්ධනයක් අවශ්‍යය. මේ සෑම කටයුත්තක්ම ආරම්භ කිරීමට පෙර කළමනාකරණ කමිටුවක්ද පිහිටුවා ගත යුතුවේ. එසේම තමන් වහන්සේගේ පදිංචිය නීත්‍යානුකූල කරගැනීමද අවශ්‍ය කරුණකි.

සෝම හිමියන්ට හිතවත්, කමිටුවේ ප්‍රධාන නිලධාරීන් කිහිප දෙනකු සමග උන්වහන්සේ පුවත්පත් දැන්වීම් බලමින් විහාරස්ථානයකට ගැලපෙන ස්ථානයක් සොයන්නට පටන් ගත්හ. ඒ වනවිට සෝම හිමියන් පදිංචිව සිටි ස්ථානයට නොදුරින් වික්ටෝරියා ප්‍රාන්තයේම මෙල්බර්න් නුවර බෙසම් වීදියේ පර්චස් 20 ක ඉඩමක් සහ ගෙයක් විකිණීමට දමා තිබිණි. එහි මිල ඩොලර් එක්ලක්ෂ දහතුන් දහසක් වූ අතර එය ඩොලර් එක්ලක්ෂ තුන්දහකට දීමට අයිතිකරුවන් අවසානයේ එකඟ වී තිබිණි.

ඒ සඳහා මෙතෙක් එකතු වී ඇති මුදලින් අත්තිකාරම් මුදලක් ගෙවා ඩොලර් එක්ලක්ෂ අසූපන් දහසක බැංකු ණයක් ගෙන ඉතිරිය පියවා විහාරස්ථානය ඉදිකරන්නට සෝම හිමියෝ ලහි ලහියේ කටයුතු සංවිධානය කළහ.

මේ වනවිට කමිටුවේ පිරිස සෝම හිමියන්ට නීත්‍යානුකූල පදිංචිය ලබාගැනීම පිණිස අවශ්‍ය ලියකියවිලි සූදනම් කළ අතර ඊට මහානායක මඩිහේ පඤ්ඤාසීහ හිමියන්ගේ අවසරය සහිත ලිපියක්ද ගෙන්වා ගැනීමට සෝම හිමියන්ට හැකිවිණි. මේ අතරේ සෝම හිමියන්, උන්වහන්සේගේ ගෝල හිමිනමක ලෙස එහි වැඩ සිටි රත්නපුරේ ධම්මානන්ද හිමියන්ද සමග එක්ව තමන්

වහන්සේලාට පිරිකර වශයෙන් ලැබුණු සියලුම මුදල් එකතු කර ඉන් බැංකු ණය ගෙවීමටද කටයුතු කරගෙන යමින් සිටියහ.

නව විහාරස්ථානයට විශාල වශයෙන් තරුණ පිරිස් ඇදී ඒම, ඔවුන් සෝම හිමියන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම කමිටුවේ ආරම්භක සාමාජිකයන්ගේ නොරිස්සුමට හේතු විණි. ඔවුහු මුල සිටම ඊට විරුද්ධ වූහ. තමන්ගේ නිලතල, තමන්ට විහාරස්ථානයෙහි හිමිව තිබෙන ස්ථානයත් තරුණයන් නිසා අහිමි වේයැයි සමහර වැඩිහිටියන් සිතන්නට ඇත. එබැවින් තමන්ගේ අවසරය නැතිව කිසිවක් නොකළ යුතුය යන්න ඔවුන්ගේ අදහස විණි.

'නිලතල දැරුවට කමක් නෑ. නමුත් ඒ නිලතල ශාසනික සේවය වෙනුවෙන් යොද ගන්නවා මිසක් කුලල් කා ගන්න ආයුධයක් කරගත යුතු නෑ. විහාරස්ථානයක් කියන්නෙ ඕනෑම කෙනකුට පොදු ස්ථානයක්. ඒ නිසා විහාරස්ථානයකට එන කිසිම කෙනකුව පලවා හැරීමක් භික්ෂූන් වහන්සේලා අතින් සිද්ධ වෙන්නෙ නෑ. මාව කීකරු කරගෙන ඔය ඇත්තන්ගෙ ආගමික අවශ්‍යතාවන් ඉටුකර ගන්න බෑ. දහමට අනුව භික්මෙන්න කැමති ඕනෑම කෙනකුට මෙතන ඉන්න පුළුවන්. බැරි කෙනෙක් ඉන්නවා නම් පිටවෙලා යන්න. මං වස්තු සම්පත් බලාගෙන මේ බුද්ධ චීවරය ඇඟට දගත්තු කෙනෙක් නම් නෙවෙයි. මට මෙතනත් එකයි. වන වාසයත් එකයි.'

සෝම හිමියන් කිසිසේත් තම සිතුම් පැතුම්වලට මෙල්ල කරගත හැකි කෙනෙක් නොවේය යන්න මේ වනවිට උන්වහන්සේට යටින් විරුද්ධවාදිකම් කළ පිරිසට මැනවින් වැටහී තිබිණි. මේ වනවිට සෝම හිමියන්ගේ නීත්‍යානුකූල පදිංචිය සඳහා මූලික කටයුතු සැකසී තිබුණත්, උන්වහන්සේ මෙහි පදිංචි කරවා ගැනීම නැවත වරක් සිතා බැලිය යුතු බව මේ ඇතැම්හු කියන්නට වූහ.

සෝම හිමියන් තමන්ට රිසිසේ මෙල්ල කරගෙන තම අවශ්‍යතා සඳහා යොද ගත නොහැකි බැවින් උන්වහන්සේ පලවා හරින්නටද ඇතැම් විරුද්ධවාදී කොටස් කටයුතු කරන්නට පටන් ගත්හ. එවිට ඒ වෙනුවට ඔවුන්ගේ අභිමතයට හිස නවන භික්ෂූන් වහන්සේ

නමක කැඳවා ගත හැක.

'අපි ඔබවහන්සේව රඳවා ගන්නවද, නැද්ද කියන එක කළමනාකරණ කමිටුවේ රහස් ඡන්දයක් මගින් තීරණය කරනවා' අවසානයේ කමිටුවේ සමහරු පැවසුහ.

මොවුන්ගේ යටි අදහස සෝම හිමියන්ට රහසක් නොවේ. එනිසාම ඒ කිසිවකින් හෝ උන්වහන්සේව සසල කිරීමට ඔවුන්ට හැකියාවක් නොවිණ.

'කමිටුවක් කියන්නෙ සුළු පිරිසක්. සුළු පිරිසකගේ ඡන්දයක් මත රැඳෙන්නවත් ආපසු යන්නවත් මම සූදනම් නෑ. දෙමව්පියකුට වුණත් දරුවෙක් ජාතක කරන්න අයිතියක් තිබුණට ඒ දරුවා මරා දමන්න අයිතියක් නැහැ. මටත් මානව හිමිකමක් තියෙනවා. මහානායක හාමුදුරුවන්ගෙ අවසරය සහිත ලියකියවිලිත් මට තියෙනවා. ඔය ඇත්තො හදනවා නම් මාව කොහොම හරි මෙහෙන් ආපහු ලංකාවට යවන්න ඕනෙ කියලා මං ඒකට සූදනම් නෑ.' කිහිප දෙනකුගේ විරෝධතා ප්‍රබලව එල්ල වුවද සෝම හිමියන්ව මැනවින් අවබෝධ කරගෙන සිටි පිරිසද අඩුවක් වූයේ නැත.

'ඔබවහන්සේ ක්‍රියාකරන විදිහ හරියටම හරි හාමුදුරුවනේ. ඔබවහන්සේ සුචරිතයෙ හැසිරෙන්න කියලා මිනිස්සුන්ගෙ මනසට කෙලින්ම වදින්න බණ කියන කොට සමහරුන්ට ඒවා රුස්සන්නේ නෑ. ඒ අය ආවේශ වෙලා තියෙන්නෙ ඒකයි. සමහර හාමුදුරුවරුන්ගෙ වගේ ඔබවහන්සේගෙ කට වහන්න බැරිවුණු නිසා දැන් ඒ අය හිත් යටින් අසරණ වෙලා. මෙහෙට එන සමහර හාමුදුරුවරුන් මෙහෙ රැඳෙන්න තියෙන ආසාවට, දුසිරිතට යොමුවුණු අයට බණ කියනවා වෙනුවට ඒ අයගෙන් බණ අහලා ඒගොල්ලන්ට අවශ්‍ය විදිහට පිළිපදින තත්ත්වයට පත්වෙලා. එහෙම හාමුදුරුවන්ගෙන් ඒ මිනිස්සුන්ටවත්, ශාසනේටවත් පලක් නැති බව ඒ දෙගොල්ලොම තේරුම් අරන් නෑ. මෙහෙ සමහරු හිතාගෙන ඉන්නෙ හාමුදුරුවරු කියන්නෙ ඒ අයගෙ පාරිභෝගික වස්තුවක් කියලා.'

සෝම හිමියන් වටා අවංකවම එක්රොක් වී සිටි පිරිස

නිරතුරුවම සෝම හිමියන්ව දිරිමත් කළහ.

බොහෝවිට භික්ෂූන් වහන්සේ නමකට පහර ගැසීමට අවශ්‍ය වූ විට ගිහියන් කවදත්, කොතැනත් යොදා ගන්නා සාම්ප්‍රදායික චෝදනා පත්‍රයක් තිබේ. ඒ රාත්‍රියට දන් වැළඳීම, කාන්තාවන් සමග අනවශ්‍ය හිතවත්කම් පෑම සහ මහජන ආධාර යටි මඩි ගැසීම යන මේවාය. මේවා සෝම හිමියන්ටද එල්ල කිරීමට ඔවුන් උත්සාහ දැරුවද එය සිතූ තරම් පහසු කරුණක් නොවීය.

කෙසේ හෝ අවසානයේ කළමනාකරණ කමිටුවේ කිහිප දෙනකුගේ මූලිකත්වයෙන් ඔවුනොවුන් අතරේම රහස් ඡන්දයක් තබා එක් ඡන්දයකින් සෝම හිමියන්ව පරාජය කිරීමට සමත් වූහ.

මින් සෝම හිමියන්ට හිතවත් වූවෝ වඩාත් කැළඹුණහ. ඔවුන් ඒ ඒ අයගේ නිවෙස්වලට ගොස් සෝම හිමියන්ගේ නිරවද්‍යභාවයත්, ශාසනයට අවංක සේවයක් කිරීම සඳහා උන්වහන්සේ තුළ තිබූ කැමැත්තත් ඒ පුද්ගලයන්ට පැහැදිලි කර දුන්හ. එවිට ඔවුන් එය අර්ථකථනය කරන ලද්දේ 'සෝම හාමුදුරුවන්ගෙ මැරයො ගෙවල්වලටම ඇවිත් අපට තර්ජනය කරනවා' යනුවෙනි. හොඳට වඩා නරක අධි වේගයෙන් සමාජය පුරා පැතිරේ. නමුත් මීට කලිනුත් සිය ඍජු ප්‍රතිපත්තීන් හේතුකොටගෙන බෙහෙවින් කරදර, නින්දා, අපහාස ආදියට ලක්වී සිටි සෝම හිමියෝ මේ කිසිවකින්වත් නොසැලී 'අදහම නොව දහම' යන ප්‍රතිපත්තියෙහිම එල්බ සිටියහ.

කළමනාකරණ කමිටුවේ විරුද්ධවාදීහු සෝම හිමියන්ට ස්ථිර වීසා බලපත් නිකුත් කිරීම නතර කරන ලෙස ඕස්ට්‍රේලියාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුවටද දන්වා සිටින්නට පසුබට වූයේ නැත.

මේ නිසාම සෝම හිමියන්ට පක්ෂ අය එක්වී මේ සම්බන්ධයෙන් පෙත්සමක් ගොනු කළහ. හයසියයක පමණ ශ්‍රී ලාංකිකයන් පිරිසක් මේ පෙත්සම සඳහා තම අත්සන් යොදා තිබිණි. සෝම හිමියන්ට ඉතාම හිතවත්ව කටයුතු කළ ස්ටැන්ලි රණසිංහ නමැති මහතෙකු මින් මහත් චිත්ත වේගයක් ඇති කරගෙන සිටියේය.

'මං මහ ලොකු පෝසතෙක් නෙවේ හාමුදුරුවනේ. නමුත් මේ අසාධාරණේ බල බලා නිකං ඉන්න මං සූදනම් නෑ. මේකට උසාවි යන්න වුණොත් මං ගේයි, ඉඩමයි උකස් තියනවා. හෙට පාරට බහින්න හරි මං සූදනම්. මම මේ කතාකරන්නෙ ඔබවහන්සේ වෙනුවෙන් නෙවෙයි, යුක්තිය, සාධාරණත්වය වෙනුවෙන්' යනුවෙන් රණසිංහ මහතා පවසා තිබිණි.

# 27 සෝම හාමුදුරුවන් මෙල්ල කරන තැන වරදියි

තමන් වටා රැස්වී සිටියත්, මේ ඇතැම් අය බුදු දහමට අනුව හැඩගස්වා ගැනීම බොහෝ අසීරු වූවක් බව සෝම හිමියන්ට හැඟුණි. ඔවුන්ට බුදු දහම අවශ්‍යව තිබුණේ තම ඇවශ්‍යතා ඉටුකර ගැනීමට හැකි මෙවලමක් වශයෙන් පමණි. මේ අතර ඕස්ට්‍රේලියාවේ ඉහළ පැළැන්තියේ ඇතැම් ශ්‍රී ලාංකික බෞද්ධයෝ සායි වන්දනාවද විලාසිතාවක් වශයෙන් කරගෙන ගියහ. එය ඔවුන්ට මහේශාක්‍ය බව පෙන්වන තවත් සංකේතයක් බඳු විය.

බුදු දහමෙන් ජීවිතය පෝෂණය කර ගැනීම වෙනුවට අගතිගාමී ලෙස ජීවත් වෙමින් සිය ආගමද ඒ සඳහා උපයෝගී කර ගැනීමට එරෙහිව සෝම හිමියෝ දරුණු ලෙසම සිය දේශනා මගින් පහර දුන්හ.

'මේ ඉන්න ඇත්තන්ගෙන් සමහරු බෞද්ධ 'හාගවල්', බෞද්ධ 'කාලවල්'. සමහරු උදේට බුදු හාමුදුරුවෝ වඳිනවා, හවසට සායි වඳිනවා. ඒ හාග බෞද්ධයෝ. සමහරු බුදු හාමුදුරුවෝ, සායි, කතරගම දෙවියෝ, විෂ්ණු දෙවියෝ, මේ හැමෝම කැමති කැමති වෙලාවට අදහනවා. ඒ 'කාලේ' බෞද්ධයෝ. බුදු හාමුදුරුවෝ බෞද්ධ 'කාලක්' වෙන්නවත්, බෞද්ධ 'හාගයක්' වෙන්නවත්

ධර්මය දේශනා කළේ නෑ. බුදු හාමුදුරුවො මහානාම කියන ශාක්‍යයාට වතාවකදී දේශනා කළා 'යම් තැනැත්තෙක් ත්‍රිවිධ රත්නයේ සරණ යනවා නම් ඒ තැනැත්තා උපාසකයෙක්. ඒ කියන්නෙ බෞද්ධයෙක්. ත්‍රිවිධ රත්නයේ සරණ ගිය තැනැත්තාට අන් සරණක් අවශ්‍ය නැහැ කියලා.'

සෝම හිමියන්ගේ වදන් ඇතැමුන්ගේ ළය පතුලටම ඇනී ගියේය. මේ නිසාම ඔවුන් තුළ කසුකුසු නැගිණි.

'සායිතුමා අදහන එක ගැන ඔබවහන්සෙ බොහොම තරහින් කතා කරන්නේ? නමුත් බුදුහාමුදුරුවො වගේම සායිතුමා දේශනා කරන්නෙත්, මිනිසුන්ට පන්සිල් රකින්න කියලයි.'

එක් අයකු වරක් නැගිට ප්‍රශ්න කළේය.

මින් සෝම හිමියන් කුපිත වූයේ නැත. උන්වහන්සේගේ මුහුණ පුරා පැතිරුණු ප්‍රසන්න සිනාවේ හෝ සිහින් ස්වරයෙන් නැගෙන හඬේ කිසිදු වෙනසක් ඇතිවූයේද නැත.

'බොහොම හොඳයි මහත්තයා ඔය ප්‍රශ්නය අහපු එක. බුදුරජාණන් වහන්සේ ලෝකයට පහළ වුණේ පන්සිල් දේශනා කරන්න නෙමේ. පන්සිල් මේ ලෝකෙ බුදුරජාණන් වහන්සේ පහළ වෙන්නත් කලින් තිබුණා....' සෝම හිමියෝ සූත්‍ර පිටකය ඇසුරින්ම මෙය පැහැදිලි කර දුන්හ.

'බුදු කෙනෙක් ලෝකෙට පහළ වෙන්නෙ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ලෝක ධර්මතාවයන්ගෙන් මිදීමේ මාර්ගය පහද දෙන්නයි. ඒක තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන්නෙ. ඒකෙ පළවෙනි එක තමයි සම්මා දිට්ඨිය. ඒ කියන්නෙ නිවැරදි දැකීම. බුදුන් වදාළ, නිවැරදි දැකීම ගැන සිහිපත් කරන කොට සායි වන්දනාව වැරදි දැකීමක්. ඒ කියන්නෙ මිථ්‍යා දෘෂ්ඨියක්!'

සෝම හිමියන් ගැන අමනාපයෙන් සිටි උන්වහන්සේ නිසා රිදුණු අය මින් නැවතුණේ නැත. සායි බාබා පිළිබඳව ශ්‍රී ලංකාවේ නායක ස්වාමීන් වහන්සේලා කිහිප නමක් විසින් ලියන ලද පොත් ඔවුන් ඇතැමුන් අතරේ බෙද දෙන්නට පටන් ගත්තේ ඒ අනුවය.

මේ බව සෝම හිමියන්ටද හිතවත් අයගේ මාර්ගයෙන් දැනගන්නට ලැබිණි. සෝම හිමියෝ තමන්ට සුපුරුදු ප්‍රසන්න සිනාවෙන්ම මේ සඳහා පිළිතුරු දුන්හ.

"බුදුහාමුදුරුවො දේශනා කරලා තියෙන්නෙ අහවල් මහා ශ්‍රමණයා කිව්වා කියලා වත් පිළිගන්න එපා, මම කියන දේ නිවැරදිද බලන්න ධර්ම විනය අනුව පරීක්ෂා කරන්න කියලයි."

මේ අවස්ථාවේදී සෝම හිමියෝ, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් මංචකයේදී වදාරන ලද මහෝපදේශ හතර පිළිබඳවද මතක් කළහ. ඒ අනුව යම් අවස්ථාවකදී තමන් වහන්සේ විසින් දේශනා කොට වදාරන ලද ධර්මය පිළිබඳව යම් සැකයක් ඇති වුවහොත් එය ධර්ම විනය හා සසඳ බලා සැකය දුරුකර ගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

"ඔය ඇත්තො මේ ධර්ම විනය හා සසඳනවද අනුන් කියන දේ පිළිගන්නවද?" සෝම හිමියෝ විචාළහ.

මේ සිද්ධීන් මෙසේ එකින් එක සිදුවෙමින් තිබිණි. මේ අතර සෝම හිමියන්ට ඥතීත්වයෙන් නැන්ද වන කාන්තාවකට ඕස්ට්‍රේලියාවෙන් දුරකථන ඇමතුමක් ලැබිණි. එම කාන්තාව විසුවේ කළුබෝවිලය.

"අපි මේ කතා කරන්නෙ සෝම හාමුදුරුවන්ගෙ පන්සලට සම්බන්ධ දයකයො පිරිසක්. ඔයාගෙ දුවත් එක්ක සෝම හාමුදුරුවන්ගෙ සම්බන්ධයක් තියෙනවා. අපි ඒ ගැන හොඳටම දන්න නිසයි මේ කියන්නෙ. සෝම හාමුදුරුවන්ව ළඟදිම අපි මෙහෙනුත් පිටුවහල් කරනවා... ඉක්මණට මොකක් හරි පියවරක් ගන්න."

තමන්ට පුතණුවන් කෙනකු වූ සෝම හිමියන්ගේ ස්වභාවය මෙම කාන්තාව හොඳින් දනී. තම සැමියා පිළිකා රෝගියකුව සිටින බැවින් වරින් වර ඔහුගේ රෝග තත්ත්වය විමසා සෝම හිමියන් තම නිවසට ඕස්ට්‍රේලියාවේ සිට දුරකතන ඇමැතුම්ද දෙනු ලබයි.

'සෝම හාමුදුරුවන් ගැන මම හොඳට දන්නවා. සෝම හාමුදුරුවො මගේ පුතෙක්. ඒ හින්ද සෝම හාමුදුරුවන්ගෙයි, මගේ දුවගෙයි සම්බන්ධයක් තියෙනවා නම් ඒ ගැන මං බලාගන්නම්. මමනෙ මගේ දුවගෙ අම්මා. ඒ හින්ද ඔහේලා ඒ ගැන කරදර වෙන්න වුවමනා නෑ' ඇය ඔවුන්ට වේගවත් පිළිතුරක් දී නිහඬ වූවාය.

සෝම හිමියන්ට ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකිකයන්ගෙන් යම් යම් කරදර සිදුවන්නේ යැයි මේ වැඩිහිටි කාන්තාව තුළ බියක් ඇතිවිය. ඇය කල් නොයවාම සෝම හිමියන්ට දුරකථන ඇමැතුමක් දුන්නාය.

'ඔබවහන්සේට ඔහෙ මිනිස්සුන්ගෙන් කරදරයිද?' ඇය විමසුවේ කම්පාවෙනි.

'කරදර කාටද නැත්තෙ නැත්දෙ? මං ඕවා ගණන් ගන්න කෙනෙක් නෙමේ' සෝම හිමියන්ගේ හඬ සුපුරුදු ලෙසින්ම සංවර විය. ප්‍රසන්න විය. ඉන්පසු ඇය තමාට ලැබුණු දුරකථන පණිවුඩය පිළිබඳ පුවත උන්වහන්සේට හෙළි කළාය. උන්වහන්සේ කළේ පිළිතුරු ලෙසින් සිනාසීමය.

දිනක් සෝම හිමියන්ට අහිතවත් අය සේම හිතවත් අයගේද එකතුවෙන් ඔවුන්ගෙන් කෙනකුගේ නිවසක රැස්වීමක් සංවිධානය කොට සෝම හිමියන්ව ඊට කැඳවා තිබිණි. උන්වහන්සේද ඊට සහභාගි වූහ.

'ඔබවහන්සේට විරුද්ධව ලොකු චෝදනාවක් තියෙනවා. ඔබවහන්සේ ටෙලිෆෝන් එක පාවිච්චි කරනවා වැඩියි. ලංකාවට නිතරම ටෙලිෆෝන් කෝල්ස් ගන්නවා. සමහර වෙලාවට පැය භාගයක් විතර එක දිගට කතා කරනවා. අපි ළඟ බිල් තියෙනවා....'

තමා මෙහි ගෙන්වූ කාරණය සෝම හිමියන්ට වැටහිණි. තම විරුද්ධ වාදීන්ට අවශ්‍යව ඇත්තේ තම හිතවතුන් ඉදිරියේ තමා වැරදිකාරයකු කිරීමටය.

'මෙහෙ දූරකථන ගාස්තු මොනවද? ඒවා ගෙවන්නෙ කොහොමද? මේ හැම දෙයක්ම මං දන්නවා. මං පුංචි ළමයෙක් නෙවේ. මම මෙහාට ඇවිත් ඉන්නෙ සේවයක් කරන්න. ඉතින් මගේ අවශ්‍යතාවයකට මට ටෙලිෆෝන් කෝල්ස් ගන්න ඕනෙ. ඒක නෙමේ ඔය ඇත්තත් මේ කරන්න හදන්නෙ. මාව මේ රටෙන් පිටුවහල් කරන්න චෝදනා එකතු කිරීමක්.'

සෝම හිමියෝ සෘජුවම පැවසූහ.

ඕස්ට්‍රේලියාව තුළ උන්වහන්සේගේ ප්‍රේම සම්බන්ධතාවයක් සම්බන්ධව සැක සිතිය හැකි පසුබිමක් නොමැති වූයෙන් විරුද්ධ වාදීන්ට අවශ්‍ය වූයේ ලංකාවෙහි හෝ එවැන්නක් ඇති බව දක්වා දයකයන් උන්වහන්සේ කෙරෙහි බිඳවීමය. එහෙත් ඔවුන්ගේ ඒ තැතත් අසාර්ථක විය.

ඉන් ටික කාලයකට පසු විධායක කමිටුවේ රැස්වීමක් පන්සලේ පැවැත්වීම සඳහා ඔවුහු සෝම හිමියන්ගෙන් අවසරය ඉල්ලා සිටියහ. සෝම හිමියන්ගෙන් ඊට විරුද්ධත්වයක් පැන නැගුණේ නැත. පසු දිනෙක සෝම හිමියන්ට ඉතා හිතවත්ව සිටි ස්ටැන්ලි රණසිංහ මහතා උන්වහන්සේ බැහැ දැක්කේය.

'මෙහෙ රැස්වීමක් සංවිධානය කරලා නේද?' ඔහු සෝම හිමියන්ගෙන් විමසීය.

'ඔව්.... රැස්වීමක් ගැන මටත් මතක් කළා' සෝම හිමියෝ පිළිතුරු දුන්හ.

'ඔබවහන්සෙ දන්නවද මේ පාර ඔය මිනිස්සු කරන්න හදන වැඩේ? ඔබවහන්සේට විරුද්ධව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරලා, ඒක රැස්වීමක් පවත්වලා ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරලා ඒවාට ඔබවහන්සේගෙන් උත්තර අරන් ඒවා රෙකෝඩ් කරන්න මේ මිනිස්සු වැඩ පිළිවෙලක් ලැස්ති කරලා. ඕකට නම් කීයටවත් ඉඩ දෙන්න බෑ.'

ස්ටැන්ලි රණසිංහ මහතා වේගවත් හඬින් පැවසීය. ඔහු පැවසූ පරිදි සෝම හිමියන්ට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා අතර

ප්‍රධාන ඒවා වශයෙන් ඔවුන් සඳහන් කොට තිබුණේ සෝම හිමියන් ඕස්ට්‍රේලියාවේ සිට ලංකාවට රහසේ මුදල් එවන බව, ලංකාවේ තරුණියක සමග ප්‍රේම සම්බන්ධතාවයක් පවත්වන බව, දනයකදී මාංශ නිෂ්පාදන ඉල්ලූ බව සහ පන්සල තමන්ගේ නමට ලියවා ගන්නට උත්සාහ කළ බව ආදියයි. ස්ටැන්ලි රණසිංහ මහතා මේ චෝදනා පිළිබඳව පවසන විට සෝම හිමියන්ගේ මුව පුරා පුළුල් සිනාවක් පැතිර ගියේය.

'කමක් නෑ. රැස්වීමක් තියන්න කියමු. එතකොට මට පුළුවනි පිරිස ඉදිරියෙදිම මේවා නිවැරදි කරන්න' සෝම හිමියෝ එම සිනාවෙන්ම යුතුව පැවසූහ.

'ඔබවහන්සේට ඔය තරමටම නිග්‍රහ කරන්න මං ඉඩ දෙන්නෙ නෑ. ඔබවහන්සේ භික්ෂූන් වහන්සේ නමක්' ස්ටැන්ලි රණසිංහ මහතා අවධාරණයෙන් කීය.

'මේ මිනිසුන්ව ඔබවහන්සේ දහමෙන් හික්මවන්න හදන කොට ඒකට විරුද්ධ වෙලා ඒ අය උත්සාහ කරන්නෙ ඒ අයට අවශ්‍ය විදිහට ඔබවහන්සේව අදහමෙන් හික්මවා ගන්න. ඒකට ඔබවහන්සේ අවනත නැති නිසා දැන් ඔබවහන්සේව පන්නලා ඒ අයට එහෙයි කියන්න සූදනම් හාමුදුරු කෙනෙක්ව ගෙන්න ගන්නයි මේ හදන්නෙ' ඔහු පැවසීය.

සමිතියේ ව්‍යවස්ථාවට අනුව විධායක කමිටුවේ සතර දෙනකු නැතිව සමිතිය රැස්විය නොහැක. මේ නිසා රණසිංහ මහතා විධායක කමිටුවේ නිලධාරියකු හමුවේ මෙය පැහැදිලි කර පවසා 'හැබැයි රැස්වීමට එනවා නම් උසාවියටත් යන්න ලෑස්ති වෙලාම එන්න' යි අවසන් වශයෙන් කීය. මින් බිය වූ ඔහු රැස්වීමට සහභාගි නොවිණි. රැස්වීම පැවැත්වීම එතැනින් ඇන හිටියේය. මින් කුපිත වූ විරුද්ධවාදීන් කළේ ඉහත කී චෝදනා පත්‍රය ප්‍රසිද්ධ කර බෙදා හැරීමය.

'මම මේ රටට ආවෙ පන්සල් අයිති කරගෙන, දේපල බඳගෙන සල්ලි හම්බ කරගෙන වැජඹෙන්න නෙමේ. මගේ තුන් සිවුරයි, පාත්තරෙයි අරගෙන ඕන වෙලාවක මට එළියට බහින්න පුළුවන්.

ලෞකිකත්වයට තියෙන බැඳීම් දුරු කර ගන්නට තමයි මං මහණ වුණෙත්. ඒත් මේ තත්ත්වය උඩ නම් මං මෙහෙන් කීයටවත් යන්නෙ නෑ. මං කවද හරි මේ රටෙන් යන්නෙ මගේ නිවැරදි බව ඔප්පු කරලයි' සෝම හිමියෝ අදිටන් කර ගත්හ.

# 28 අකටයුතුකම්වලට එරෙහිව කාම්බෝජ කතක් ඉදිරිපත් වෙයි

ඕස්ට්‍රේලියාවේ විසූ කිසියම් ශ්‍රී ලාංකිකයන් පිරිසක් තමාව එම රටින් සූක්‍ෂම ලෙස පිටමං කිරීමට කටයුතු යොදන බව සෝම හිමියන්ට දැනගන්නට ලැබිණි. නමුත් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව ඉතාම ප්‍රබල හේතුවක් මත මිස ආගමික නායකයකුව රටකින් පිටුවහල් කළ නොහැක. ඒ බව දැන සිටි සෝම හිමියෝ නිහඬවම සිදුවන දේවල් බලා සිටියහ.

මේ අතර ඇතමුන් පන්සල වර්ජනය කරන්නට විය. ළඟදීම පැවැත්වෙන මහා සභා රැස්වීමේදී නව නිලතල භාර ගැනීමෙන් වැළකී හිඳීම ඔවුන්ගේ අභිප්‍රාය බව දැනගන්නට ලැබිණි. මේ අතර සෝම හිමියන් තරුණයන් සමග එකතු වී පන්සල විකුණා මුදල් ටික බෙදාගෙන ලංකාවට පැන ගැනීමට සැරසෙන බවටද ඇතැම් පිරිසක් කතා පතුරුවන්නට වූහ.

'මේ කතා පතුරුවන ඇත්තො මොන තරම් මෝඩද? ඔක්කොටම ඉස්සෙල්ලා බලන්න ඕනෙ මේ පන්සල කාගෙ නමටද තියෙන්නෙ කියලා. මේක තියෙන්නෙ සමිතියෙ නමට. සමිතියෙ නමට තියෙන එකක් මං විකුණන්නෙ කොහොමද? ඒවා ගන්න තරම් මේ ඕස්ට්‍රේලියාවේ මිනිස්සු මෝඩද?'

සෝම හිමියන් ඔවුන්ට එලෙස පිළිතුරු දී තිබිණි.

කෙසේ හෝ ඊළඟ මහා සභා රැස්වීමට මුල් දායකයන් සහභාගි නොවන්නට තීරණය කර තිබුණේ එවිට සෝම හිමියන් තනිවේවි යන යටි අදහස මතය. නමුත් සිදු වූයේ අනෙකකි. සෝම හිමියන්ට හිතවත්ව සිටි තරුණයෝ ඉදිරිපත්වී නිලවරණයට පෙනී සිටීම සඳහා කටයුතු කළහ. බලාපොරොත්තු නොවූ මේ දෙයින් ප්‍රතිවාදීහු කැළඹී ගියහ. ඔවුන් කළේ නිලවරණයට කලින් දින රාත්‍රියේම නියමිත අයදුම් පත් පුරවා භාරදීමය. ඒ අනුව සභාපති තනතුර සඳහා හත් දෙනකුත්, ලේකම් තනතුර සඳහා තුන් දෙනකුත් ඉදිරිපත්ව සිටියහ. රට වෙනස්ව තිබුණත් ඔවුන්ට ශ්‍රී ලංකාවේ පුරුදු ගති ස්වභාවයන් අත්හැර ගන්නට බැරිවූ සෙයකි. දෙපැත්තේම ඡන්ද සටන උණුසුම් අයුරින් පැවැත්විණි. අවසානයේ පළමුව පත්ව සිටි විරුද්ධවාදී දායක පිරිසම සටනින් දිනූහ. සෝම හිමියන් කළේ මේ සියල්ලන් දෙස උපේක්ෂා සහගතව බලා හිඳීමය.

මීළඟට මේ අලුත් තනතුරු ලබාගත් පිරිස කළේ සෝම හිමියන්ට පසුව හිතවත්වූ පිරිස පන්සලෙන් පිටමන් කිරීම සඳහා පන්සලට දානය සැපයීම ඔවුන්ට අහිමි කිරීමය. මින් සෝම හිමියන්ට දානය ලැබීම සීමා කිරීමේ යටි අරමුණද ඔවුන් තුළ විණි.

'පන්සලට දානෙ දෙන්න ඕනෙ පන්සල හදන්න උදව් කරපු පිරිස විතරයි' කී ඔවුහු දන් ලැයිස්තුව තමන් භාරයට ගත්හ. මෙය කොයිතරම් දුර දිග ගොස් තිබුණේදැයි කිවහොත් පැරණි දායකයකු සහ අලුත් දායකයකු අතර මේ නිසා ගුටි බැට හුවමාරුවක්ද සිදුව ඇති බව සෝම හිමියන්ට සැල විණි.

'පන්සල හදපු අයම දානෙ දෙන්න ඕනෙ කියලා බුදුහාමුදුරුවො දේශනා කරලා නෑ. දානෙ පිරිනමන්නේ බුදු පසේ බුදු මහ රහත් ප්‍රමුඛ අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නය වෙනුවෙන්. ඒ හින්ද කැමති ඕනෑම කෙනකුට පන්සලට දානය පූජා කරන්න පුළුවන්. ඔයගොල්ලන් ඔය කරන්නෙ බුද්ධ ශාසනේට පව්‍ා නින්දාවක්. ඒ හින්ද කරුණාකරලා ඔය ලැයිස්තුව මට දෙන්න. කැමති ඕනම කෙනෙකුට පන්සලට ඇවිත් මගෙන් විමසලා දානෙ භාරගන්න පුළුවන්.'

සෝම හිමියෝ දන් ලැයිස්තුව තමන් භාරයට පමුණුවා ගත්හ.

මින් කිපී සිටි පිරිස තවදුරටත් කිපුණහ. නමුත් පන්සල තනන්නට ඩොලර් පන්දහසක් බැගින් පරිත්‍යාග කළ දයා සිල්වා, චන්ද්‍රා පීරිස් ප්‍රමුඛ කිහිප දෙනා යථා තත්ත්වය සැබෑවටම අවබෝධ කරගෙන සිටියහ.

කෙසේ හෝ සෝම හිමියන්ට දනය සීමා කිරීමට පිරිසක් එසේ සැලසුම් කරන විට මේ පිළිබඳව විමසිල්ලෙන් සිටි තවත් බොහෝ දෙනකු මීන් මහත් කම්පාවට පත්වූහ. එහි ප්‍රතිඵලය වූයේ දිනපතාම එක් එක් පුද්ගලයන් සෝම හිමියන්ගේ හීල් දනය සහ දවල් දනය පිළිබඳව දුරකථනයෙන් විමසමින් ඒ සියල්ල කිසිදු අඩුපාඩුවක් නැතිව සම්පූර්ණ කිරීමය. අවසානයේ සෝම හිමියන්ට දනය සීමා වීම නොව සිදුවූයේ වෙනදටත් වඩා වැඩියෙන් දනය ලැබීමය.

ප්‍රතිවාදීන්ගේ ඒ තැනත් එලෙසින් ව්‍යර්ථ විණි. ඔවුන්ගේ අවසන් තුරුම්පුව වූයේ සෝම හිමියන්ට ඕස්ට්‍රේලියාවේ ස්ථිර වශයෙන් නතර වීම සඳහා වීසා බලපත් ගැනීම නතර කිරීමය. එවිට උන්වහන්සේට ඉබේම ඕස්ට්‍රේලියාවෙන් පිට වීමට සිදුවනු ඇත. ඔවුන් මේ සඳහා රහසේම රැස්වීමක් පවත්වා සෝම හිමියන්ට ස්ථිර වීසා බලපත් ගත යුතුද නැත්ද යන්න තීරණය කිරීමට රහස් ඡන්දයක් පැවැත්වූහ. සෝම හිමියන්ව ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගත්තේ මෙම සමිතිය බැවින් ස්ථිර වීසා බලපත් ගැනීමේ කාර්යයත් සමිතිය මගින්ම කළ යුතු විණි. කෙසේ හෝ මේ රහස් ඡන්දයෙන්ද ඔවුන්ටම දිනුම හිමි විය. ඒ අනුව සෝම හිමියන්ට ස්ථිර වීසා බලපත් නොදිය යුතු බවට ලියවිලි සකස් කොට ඔවුහු ඕස්ට්‍රේලියාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුවට එය භාර දුන්හ.

මෙය සෝම හිමියන්ටද තම හිතවත් පිරිසගේ මාර්ගයෙන් දැන ගන්නට ලැබිණි. ඔවුහු මේ සම්බන්ධයෙන් බෙහෙවින්ම කිපී සිටියහ.

'අපි මේක නිකන් අරින්න දෙන්නේ නෑ හාමුදුරුවනේ. මේ මිනිස්සු මහ පුදුම ජාතියක්. තමන්ට ඕන විදිහට හාමුදුරුවන්ව නම්මා ගන්න බැරි වෙනකොට එලව ගන්න හදනවා.'

මේ ආදී වශයෙන් ඔවුහු කෝපයෙන් දැවෙමින් අන්තගාමී ලෙස කටයුතු කරන්නට සූදනම් වෙද්දී සෝම හිමියෝ කාරුණිකව එය වැළැක්වූහ.

`ඔය ඇත්තො අවංකවම පිළිගන්නවා නම් මගෙන් ඔය ඇත්තන්ට සේවයක් වුණා කියන එකයි, මට විරුද්ධව ඉදිරිපත් කරලා තිබුණු චෝදනා අට අසත්‍යයක් කියන එකයි, ඔය ඇත්තන් ඒ ගැන කරුණු පහදලා දෙන එක වරදක් නෙමේ. නමුත් මේ වෙනුවෙන් කා එක්කවත් ප්‍රශ්න ඇති කරගන්න එක හොඳ නෑ.`

කෙසේ වුවද සෝම හිමියන්ගේ අවවාදය පිළිගත් ඔවුහු ඊළඟට කළේ පෙත්සමක් සකස් කිරීමය. ඒ අනුව සෝම හිමියන්ගෙන් ඒ රටට අවංකවම සේවයක් වූ බවට පිළිගන්නේ නම් සහ උන්වහන්සේට විරුද්ධව ප්‍රචාරය කර හැර තිබූ චෝදනා අට සත්‍යයෙන් තොර බව පිළිගන්නේ නම් ඒ පෙත්සමට අත්සන් කරන ලෙස පන්සලට සම්බන්ධ අයගෙන් ඉල්ලීමක් කර තිබිණි. මීට මොනතරම් පිරිසක් එකඟව සිටියේද යත් හයසියයද ඉක්ම වූ පිරිසක් ඊට අත්සන් යොදා තිබිණි. සෝම හිමියන් හා කෙළින්ම සටන් කිරීමට අවතීර්ණව සිටි පිරිස හා සෘජුව මුහුණ නොදුන්නද මේ සියල්ලෝම සෝම හිමියන්ව අවබෝධ කරගත්, උන්වහන්සේට ගෞරව කළ, උන්වහන්සේගේ මතය එක හඬින් පිළිගත් අය වූහ. මේ පෙත්සමද එරට ආගමන විගමන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරිණි.

විරුද්ධවාදීන්ටද අහම්බෙන් මෙන් මේ පිළිබඳ දැනගන්නට ලැබිණි. ඔවුහු මින් මහත් සේ සසල වූහ.

නිතර සෝම හිමියන්ගේ පන්සලට යන එන කාම්බෝජ ජාතික කාන්තාවක් වූවාය. ඇයට ද මේ ප්‍රශ්නය යම් පමණකට දැනගන්නට ලැබිණි. මින් මහත් කම්පාවට පත්වූ ඇය දිනක් සෝම හිමියන්ව බැහැ දුටුවාය.

`මොකක්ද හාමුදුරුවනේ මෙහෙ ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙන්නෙ?`

සෝම හිමියන්ට වැඳ එකත්පස්ව වාඩි වූ ඇය විමසුවාය.

සෝම හිමියෝ කෙටියෙන් එය පැහැදිලි කළහ.

˙හාමුදුරුවනේ ඔබවහන්සේයි, මමයි රටවල් දෙකක ජාතීන් දෙකක් වුණාට අපි අදහන ආගම එකයි. ඒ හින්ද කොයි රටේ හිටියත්, කොයි ජාතියට අයිති වුණත් සංඝයා සංඝයාමයි. අපි සංඝයා වහන්සේට ගරු කරනවා. මට හරි කණගාටුයි ඔබවහන්සේට විරුද්ධව මේ කරන දේවල් ගැන. මං වැඩ කරන්නෙ නීතිඥ සමාගමක. ඔබවහන්සෙ වෙනුවෙන් මට කළ හැකි උපකාරයක් තියෙනවා නම් කියන්න මං කරන්නම්.˙

එම කාම්බෝජ කාන්තාව අධිෂ්ඨාන පූර්වක හඬින් පැවසුවාය. සෝම හිමියෝ ඒ වනවිට තමා පත්ව සිටි තත්ත්වය එම කාන්තාවට විස්තර කරදුන්හ.

˙මං අදම ගිහින් අපේ සමාගමේ නීතිඥ මහත්මයෙක් එක්ක මේ ගැන සාකච්ඡා කරනවා˙ ඇය පිටත් වූයේ එලෙස ප්‍රතිඥ දෙමිනි.

# 29 වික්ටෝරියා ප්‍රාන්තයේ නව විහාරයක් අරඹයි

සෝම හිමියන් ඕස්ට්‍රේලියාවේ එවකට විසූ පන්සල වික්ටෝරියා ප්‍රාන්තයෙහි ස්ප්‍රිංවේල් හි පිහිටා තිබිණි. මෙය නම් කර තිබුණේ 'ශ්‍රී ලංකා බෞද්ධ විහාරය' යනුවෙනි.

සෝම හිමියන්ට උපකාර කරන්නට ඉදිරිපත් වූ කාම්බෝජ කාන්තාව තම නීතිඥ සමාගමේ නීතිඥයකු සෝම හිමියන්ට මුණ ගැස්විය.

'මේකෙදි ගැටලු දෙකක් තියෙනවා හාමුදුරුවනේ. එකක් මේ පන්සලේ නම ශ්‍රී ලංකා බෞද්ධ විහාරය. ඒ හින්ද මේකෙන් හැඟවෙන්නෙ ශ්‍රී ලාංකිකයන්ගෙ පන්සලක් විදිහට. අනික හාමුදුරුවනේ ඔබවහන්සේව මෙහාට ගෙන්නාගෙන තියෙන්නෙ සමිතියෙන්. මේ කාරණා නිසා අපට නීතිමය වශයෙන් පියවරක් ගන්න අමාරුයි. නමුත් එක විදිහක් තියෙනවා. ඔබවහන්සේ සරණාගතයෙක් විදිහට ඇප්ලිකේෂන් එකක් පුරවලා දෙන්න. එතකොට පහසුවෙන්ම ඔබවහන්සේට වීසා හදගන්න පුළුවන්.'

අද බොහෝ දෙනෙකු සරණාගතයන් ලෙස මෙබඳු රටවලට පැමිණ ව්‍යාජ ලිපිලේඛන ඉදිරිපත් කරමින් වීසා ලබාගෙන නතර වී සිටින බවත්, එපමණක් නොව සරණාගතයන් ලෙස විවිධ සුඛසාධන පවා හිමි කරගන්නා බවත් සෝම හිමියෝ දනිති. නමුත්

එලෙසින් හෝ එහි රැඳී සිටීමට තරම් අවශ්‍යතාවයක්වත්, මානසික අසරණ බවක්වත් සෝම හිමියන්ට නොවිණි.

'මම සරණාගතයෙක් නෙමෙයි. මට ලංකාවෙ හොඳින්ම ඉන්න පුළුවන්කම තියෙනවා. මට අද වුණත් ලංකාවට යන්න පුළුවන්. අනික මං මෙහාට ආවෙ මහණදම් පුරන ගමන්ම සේවයක් කරන්න. ඒ හින්ද මං කොහොමටවත් සූදානම් නැහැ සරණාගතයෙක් විදිහට මෙහෙ රැඳෙන්න' යැයි සෝම හිමියෝ අවධාරණයෙන් පැවසූහ.

ඉන්පසු සෝම හිමියන් විසින් වෙනත් නීතිඥවරයකු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුවට සියලු විස්තර දන්වා ලිපියක් ඉදිරිපත් කරනු ලැබිණි. සෝම හිමියන්ව ගෙන්වා කරුණු විමසූ එම ආයතනයේ අධ්‍යක්ෂවරයා උන්වහන්සේට ශ්‍රී ලාංකිකයන් පිරිසකගෙන්ම උද්ගත වී තිබූ අනේක විධ කෙනෙහිලිකම් පිළිබඳව අසා මහත් පුදුමයට පත්විය.

'මට හරි පුදුමයි මේ මිනිස්සු තමන්ගෙ රටේ පූජකවරයකුට මේ විදිහට කරදර කරන එක ගැන. මේ මිනිස්සු බල්ලො වගේ පොර කකා බුරා ගන්නා ජාතියක්....' ඔහු පැවසුවේ සෝම හිමියන් කෙරෙහි හටගත් මහත් වූ කම්පාවෙන් යුතුවය. තමන්ගේම ජාතීන් සම්බන්ධයෙන් විදේශිකයකු පැවසූ එවදන් සෝම හිමියන්ගේ සිත පතුළටම කිඳ බැස්සේය.

කෙසේ වුවද සෝම හිමියන්ගේ ගැටළුව සම්බන්ධයෙන් කළ හැකිව තිබූ එකම පියවර වූයේ උන්වහන්සේ වෙනත් පන්සලක් සාද ගැනීමය. සෝම හිමියන්ට විරුද්ධව එවා තිබූ පෙත්සම් විශාල ප්‍රමාණයක් සහිත ලිපිගොනු කවරය පෙන්වූ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා,

'මේවායෙ තියෙන්නෙ මොනවද කියලා මං දන්නවා. ඔබවහන්සේට පක්ෂව අත්සන් හයසිය ගණනක් සහිත පෙත්සමත් මගේ ළඟ තියෙනවා. මේ හැමෝටම වැඩිය බලයක් ඔබවහන්සේට තිබෙන බවට ඒක හොඳම සාක්ෂියක්. ඒ හින්ද ඒ පිරිස එක්ක

එකතුවෙලා ඔබවහන්සෙ අලුත් සංගමයක් පිහිටුවා ගන්න. ඊට පස්සෙ පර්මනන්ට් රෙසිඩන්ස්ලි මං හදලා දෙන්නම් යනුවෙන් පැවසීය.

නැවත සංගමයක් පිහිටුවා ගෙන අලුතින් පන්සලක් ආරම්භ කිරීමේ අදහස සෝම හිමියන් තුළ ස්ථිර වන්නට උන්වහන්සේට හිතවත් දයකයන්ගේ උපදෙස්ද බලපා තිබිණි. මේ පන්සලේ ගත කළ කාලයෙන් පසුගිය වසර තුනක් පමණ ගත වූයේ විවිධාකාර හැල හැප්පීම් මැදය. ඒ අනුව කුළල් කා ගැනීම්වලින් තොරව මුලු ලොවටම පිරිසිදු බුදු දහම බෙදදීම සඳහා මුලින්ම තිබූ අදිටන සඵල කරවා ගැනීම උදෙසා අලුතින් විහාරස්ථානයක් ගොඩ නැගීමට උන්වහන්සේ තීරණය කළහ. මේ සඳහා උදව් කරන්නටද හිතවත් දයකයන් පොරොන්දු වී තිබිණ.

ශ්‍රී ලංකා බෞද්ධ විහාරය තුළ විවිධ හැල හැප්පීම් මතුවන විට ස්ටැන්ලි රණසිංහ මහතාගේ උපදෙස් පරිදි සෝම හිමියෝ එම පන්සල වෙනුවෙන් කරනු ලබන සෑම ආධාරයක් උදෙසාම ආධාර කරන්නවුන්ගේ අත්සන් සහිතව ලිපියක් ලබාගෙන ඒ සියලු ආධාර මුදල් නියමිත ගණන් මිම්ද සහිතව වෙනම තැන්පත් කර තිබිණි. තමන් වහන්සේට පිරිකර වශයෙන් ලැබුණු මුදල් හදල් පමණක් සෝම හිමියෝ වෙනමම එකතු කළහ. ඒ අනුව මේ වනවිට ඩොලර් හයදහසක පමණ මුදලක් උන්වහන්සේ සතු විය. ලැබෙන්නට නියමිතව තිබූ ආධාරද සමග මුළු මුදල ඩොලර් පහලොස් දහසක් පමණ වනු ඇත. මේ අනුව පන්සලක් සඳහා නිවසක්, බැංකු ණයක් මත ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සෝම හිමියෝ ඒ සඳහා සුදුසු ස්ථාන පුවත්පත් දැන්වීම් මාර්ගයෙන් සොයන්නට වූහ.

වික්ටෝරියා ප්‍රාන්තයේම නෝබල් පාක්හි පිහිටි එක්තරා නිවසක් පිළිබඳව සෝම හිමියන්ට දැන ගන්නට ලැබුණේ මේ අතරතුරදීය. එවකට එය බද්දට ගෙන ශ්‍රී ලාංකික යුවළක් පදිංචිව සිටියහ.

'ඔබවහන්සේට පන්සලක් හදගන්න නම් අපි හෙට වුණත් දෙන්න කැමතියි. අපිට සතියක් කල් දෙන්න හාමුදුරුවනේ තැනක් හොයා ගන්න කල්' ඔවුහු පැවසූහ.

ඩොලර් හැත්තෑ දෙදහස් පන්සීයකට ගෙය විකුණන්නට එහි අයිතිකරුවාද එකග විණි. ඊළඟට කළ යුත්තේ බැංකුවකට කතා කිරීමය. බැංකු කිහිපයකටම ගොස් අවසානයේ උන්වහන්සේ වෙනුවෙන් ණය මුදලක් දෙන්නට ඕස්ට්‍රේලියාවේ කොමන්වෙල්ත් බැංකුව කැමැත්ත පළ කොට තිබිණි. නමුත් ඊටද ඇපකරුවකු අවශ්‍ය විය. සමන් කුමාර නමැති ශ්‍රී ලාංකික ඉංජිනේරුවකු මෙහිදී ඇපයට අත්සන් කිරීමට කැමැත්ත පළ කළමුත් සෝම හිමියන් ඊට එතරම් එකගතාවයක් නොදැක්වූයේ භික්ෂූන් වහන්සේ නමක වශයෙන් තමන් තවත් පුද්ගලයකු ඇපයට තබා ගැනීම නොකළ යුත්තකැයි හැඟුණු බැවිනි. පසුව උන්වහන්සේ එම බැංකුවට කරුණු විස්තර කළහ. ඉන්පසු එම බැංකුව වෙස්පැක් නමැති බැංකුවේ නියෝජිතවරයකුට මේ පිළිබඳව දන්වනු ලදුව එහි වගකිව යුතු නිලධාරියෙක් සෝම හිමියන් බැහැ දකින්නට උන්වහන්සේ වැඩ විසූ පන්සලටම පැමිණියේය.

සෝම හිමියෝ සියලුම විස්තර ඔහු වෙත දන්වා 'මහත්තයෝ, මං හාමුදුරු කෙනෙක්. මං හාමුදුරු කෙනකුගේ ගෞරවය රැකගන්නත් ඕනෙ, ශාසනේ ගෞරවය රැක ගන්නත් ඕනෙ. මාව විශ්වාස කරගෙන මට හිතවත්ව ඉන්න සංගමයෙ අයගෙ ගෞරවය රකින්නත් ඕනෙ. ඒ හින්දයි මං ඇපකාරයෙක් නැතුව මේක මගෙ නමටම ඉල්ලන්නෙ' යි පැවසූහ.

ඒ අනුව ඔහු දැනට සෝම හිමියන් සතුව ඇති මුදලෙන් බැංකුවේ ගිණුමක් අරඹන්නට උපකාර කොට අතිකුත් ලියකියවිලිද සියල්ල ගෙන සෝම හිමියන්ගේ ණය මුදල ලබාදීම සඳහා මහත් වෙහෙසක් දරා ක්‍රියා කළේය.

මේ අයුරින් බැංකුවලින් ණයට මුදල් නොගෙන සෝම හිමියන්ට විශාල මුදලක් හිමිකර ගැනීමට පහසු අවස්ථාවක් ඊට

පෙර උදව් තිබිණ. නමුත් උන්වහන්සේ එය එකහෙලාම ප්‍රතික්ෂේප කළහ.

සෝම හිමියන්ට විරුද්ධව චෝදනා අටක් සහිත චෝදනා පත්‍රයක් උන්වහන්සේට අහිතවත්ව සිටි පිරිස ප්‍රසිද්ධ කළ අවස්ථාවේ මේ සියලු චෝදනා මුළුමනින්ම අසත්‍ය බව පැහැදිලිවම දන්නා නීතිඥවරයෙක් මෙයට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගන්නට එකල සෝම හිමියන්ට යෝජනා කර තිබිණි. ඒ අනුව ඩොලර් ලක්ෂ පහක වන්දියක් ඔවුන්ගෙන් ලබා දෙන්නටද නීතිඥවරයා එකඟ විය.

'උසාවි ගිහිල්ලා මට මගේ නිවැරදි බව ඔප්පු කරලා ඔය කියන මුදල නම් ගන්න පුළුවන් වෙයි. ඒත් එහෙම කරනවා නම් ඒ මුදලත් අරන් මං ආපහු මෙහෙන් යන්න ඕනෙ. එතකොට මං පරාදයි. අනික මං කොහොමද ඔය මිනිස්සුන්ගෙන් එහෙම සල්ලි ගන්නෙ? මං මේ සල්ලි හම්බ කරන්න ආපු ගමනක් නෙමේ. මිනිස්සුන්ට යහපතක් කරන්න ආපු ගමනක්. ඒ හින්ද මට ඔය විදිහට සල්ලි ගන්න උවමනාවක් නෑ. මගේ නිවැරදිභාවය කවද හරි ඔප්පු කරන්න පුළුවන් මට' උන්වහන්සේ තම හිතවතුන්ට පැවසූහ.

සෝම හිමියෝ එසේ පිළිතුරු දෙමින් එද අධිකරණයට යාමේ ක්‍රියාමාර්ගය වළක්වාලූහ.

ලැබී තිබූ උපදෙස් පරිදි අලුතෙන්ම සමිතියක් පිහිටුවා ගන්නට සෝම හිමියෝ සමත් වූහ. ස්ටැන්ලි රණසිංහ මහතා ඇතුළු බොහෝ දෙනෙකුගේ ඉල්ලීම පරිදි එහි සභාපතිත්වය සෝම හිමියන්ටම පැවරිණි.

සති තුනක් ඇතුළතදීම සෝම හිමියන්ගේ බැංකු ණය සම්මත විය. ණය මුදල වශයෙන් ඩොලර් අසූදහක් දීමට බැංකුවෙන් එකඟතාවය පළ වුවත් සෝම හිමියන් ලබා ගත්තේ හැට දහසක් පමණි. මිලදී ගනු ලබන නිවසේ වටිනාකම ඩොලර් හැත්තෑ දෙදස් පන්සීයක් වූ අතර ඉතිරි මුදල උන්වහන්සේට ආධාර වශයෙන්

ලැබී තිබිණි.

මේ 1994 මැයි මාසය විය.

එම වෙසක් පුර පසළොස්වක පෝය පසුවන විටම වාගේ සෝම හිමියෝ තමන්ගේම නමට ගත් අලුත් නිවාසයෙහි විහාරස්ථානයක් ඉදිකොට එහි පදිංචියට ගියහ. වික්ටෝරියා ප්‍රාන්තයෙහි නෝබල් පාක්හි පිහිටි එය වික්ටෝරියා බෞද්ධ විහාරය වශයෙන් නම් කෙරිනි. මේ දක්වා එකදිගට වසර අටක් ඕස්ට්‍රේලියාවෙහි ගත කළ උන්වහන්සේට වසර තුනකට වැඩි කාලයක්ම විවිධ කරදර බාධක රැසකට මුහුණ දෙන්නට සිදුවිය. එම සියලු බාධක අභියෝග ඉතා යහපත් ආකාරයෙන් ජයගත් උන්වහන්සේ වික්ටෝරියා බෞද්ධ විහාරය ආරම්භ කළේ ලොවටම පිරිසිදු බුදු දහම බෙදදීමේ උතුම් පරමාර්ථය පෙරදැරි කරගෙනය.

එම වසරේ අතිඋත්කර්ෂවත් අන්දමින් වික්ටෝරියා බෞද්ධ විහාරයෙහි කඨින පිංකම පවත්වන ලද අතර අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන්ද ඒ සඳහා සහභාගි කරවා ගන්නට සෝම හිමියෝ සමත් වූහ. එසේම සෝම හිමියන්ට මෙම විහාරස්ථානය ආරම්භ කිරීමෙහිලා මහත් ඇප උපකාර කළ ඕස්ට්‍රේලියාවේ ආගමන විගමන දෙපාර්තමේන්තුවේත්, ණය මුදල් ලබාදුන් බැංකුවේත් නිලධාරීන්ටද මේ සඳහා ඇරයුම් කොට තිබිණි.

සෝම හිමියන්ට හිතවත් විශාල පිරිසක් අලුතෙන් එක්වූ අතර පැරණි විරුද්ධවාදීන්ගෙන්ද ඇතැම්හු ටිකෙන් ටික සෝම හිමියන්ට ළං වූහ.

"අපි නොමග ගිහින් හිටියෙ හාමුදුරුවනේ. දැන් අපි ආවෙ අවංකවම ඔබවහන්සේට සහයෝගය දෙන්නයි" ඔවුහු බැගෑපත් හඬින් කියා සිටියහ.

"ඒ කාලෙ පන්සලට අලුත් කට්ටිය එකතු වෙනකොට ඔය ඇත්තො විරුද්ධ වුණා. නමුත් මං ඒ කාලෙත් කිව්වා පන්සලක්

කියන්නෙ ඕනෑම කෙනෙකුට පොදු තැනක් කියලා. මංවත්, දැන් ඉන්න දයකයොවත් ඔය ඇත්තො එනවට විරුද්ධ නෑ. බුද්ධ ශාසනය කියන්නෙ දෙරවල් වහලා දපු මැදුරක් නෙමේ. ඒක කිසිම භේදයක් නැතුවම සියලු දෙනාටම විවර වුණු, කාටත් දෙලොව යහපත උදකරගන්න පුළුවන් තැනක්.

සෝම හිමියෝ තමන්ට කවදත් හුරුපුරුදු ප්‍රසන්න සිනාවෙන්ම යුතුව පැවසූහ.

**නිමි**

හොඳ පොතක් නම් දයාවංශ ජයකොඩි පොතක් ම ය
මුද්‍රණය: දයාවංශ ජයකොඩි සහ සමාගම – මුද්‍රණ ශිල්පියෝ